**ධර්ම දානය සඳහා නොමිලයේ බෙදා දීම පිණිසයි.**



පෘතග්ජනයාට බාහිර පවතින හෝ නො පවතින සතර මහා ධාතුවක් ගැන කතා කළ හැක. එසේම සිතෙන්ම සාදන ලද පවතින හෝ නො පවතින සතර මහා ධාතුවක් ගැනද, සමහර විට කතා කරනු ඇත. බාහිර රූපයක් නැත ඇත්තේ සතර මහා ධාතුවයි යන්න භෞතික වාදයට අදාළ වන අතර සිතෙන් හදන දෙයක් ඇත හෝ නැත යන්න විඤ්ඤාණ වාදයට වැටෙයි. සම්මුති, ලක්ඛණ, ආරම්මණ, සසම්භාර යනු එසේ භාරගන්නා ආකාර සතරකි (මඤ්ඤති). අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරු කළ රහතන්වහන්සේට මේවා නො පිහිටන අතර (න මඤ්ඤති), සද්ධර්මය ශ්‍රවනය කළ සේඛ පුද්ගලයාට එය පිහිටියත් එයින් මිදීම සඳහා වැයම් කරයි (මා මඤ්ඤති). තම තමන්ගේ මානසික මට්ටම හඳුනාගැනීමට මූලපරියාය සූත්‍රය කදිම පිටුවහලකි. ලැබූ ක්ෂණ සම්පත්තියෙන් ප්‍රයෝජන ගත යුත්තේ දහම නුවණින් විමසා පෘථග්ජන ස්වභාවයෙන් මිදීම සඳහා යි.

බුදුරජාණන්වහන්සේ කච්චායන හාමුදුරුවන්ට දේශනා කරනවා, 'කච්චායන, මේ සත්ත්වයා හටගන්නා හැටි දකින නිසා තියෙනවා කියනවා. ඒ මතයට යනවා. දෘෂ්ටියට යනවා. නිරුද්ධ වෙනවා දැකලා නැහැ කියනවා. [illegible]ට යනවා, දෘෂ්ටියකට යනවා. ශාස්වතයි, උච්ඡේදයි' තථාගතයන් ඔය [illegible] නො පැමිණ පටිච්චසමුප්පාදයක් දේශනා කරනවා. පටිච්චසමුප්පාදය දැක්කා නම් ඔය එකකටවත් වැටෙන්නේ නැහැ.

රූප විසිඅටක් තියෙනවා නම් ඕකෙන් එකක් තමයි වර්ණ රූපය. උපාදාය රූප වලින් එකක්. දැන් ඇහැට අහුවෙන්නෙ වර්ණ යි. අපි ඇහැ පාවිච්චි කරලා නම් දැනගත්තේ වර්ණ රූපයට අමතරව ඔය විසිඅටෙ ඉතුරු විසිහතෙන් එකක්වත් අහුවෙනවා ද? ඇත්ත හොයාගන්න නම් ආයතන විදියට බලන්න කියනවා බුදුරජාණන් වහන්සේ. ඔන්න මාර්ගය පෙන්නනවා. ඇහේ කෘත්‍යය හඳුනාගන්න; එතකොට අර දෘෂ්ටිවලට වැටෙන්නෙ නෑ. ඇහේ කෘත්‍යය වර්ණ ස්වභාවයක් පෙන්වන එක යි. කණ්ණාඩියේ ප්‍රතිබිම්බයක් දැක්කා වගෙයි. එච්චර යි. ඔය ප්‍රතිබිම්බය අල්ලන්න පුළුවන් ද? රස බලන්න පුළුවන් ද? මොන වගේ ද? රස්නෙද, සීතලද කියන්න පුළුවන් ද? එතකොට ඇහේ කෘත්‍යය හඳුනගත්තොත් දිට්ඨෙ දිට්ඨමත්තං කියන්නේ මොකක්ද කියලා තේරෙයි. එදාට ඕවා තියෙනවා කියන්න යන්නෙත් නෑ, නෑ කියන්න යන්නෙත් නෑ. ඔය දෙකම දෘෂ්ටි. ඇහෙන් දැකලා විතරක් නම් කියන්නෙ, අපට කියන්න වෙනවා ඔක නම් දැකීම ඉක්මවා ගිය මඤ්ඤණාවක් කියලා.

ISBN 978-955-41184-6-1

රවින්ද්‍ර කොග්ගලගේ
http://ravi.harimaga.com

# බුදු දහම දැකගනිමු - 5

## සතර මහා ධාතුවේ සතර ආකාර මඤ්ඤනාව

(මූලපරියාය සූත්‍රය ඇසුරෙන්)




රවින්ද්‍ර කොග්ගලගේ

# බුදු දහම දැක ගනිමු - 5

## *සතර මහා ධාතුවේ සතර ආකාරය*

**(මූලපරියාය සූත්‍රය ඇසුරෙන්)**

**2015 දෙසැම්බර්**

ප්‍රථම මුද්‍රණය : 2015 දෙසැම්බර් (පිටපත් 5000)

**ISBN 978-955-41184-6-1**

පොත පිළිබඳ විමසීම්:

මහාචාර්ය රවින්ද්‍ර කොග්ගලගේ
Email: koggalage@yahoo.com
Web: http://ravi.harimaga.com
Mobile : 0777234239

මුද්‍රණය:
කොලිටි ප්‍රින්ටර්ස්
17/2, පැඟිරිවත්ත පාර, ගංගොඩවිල
නුගේගොඩ
දු.ක: 011 4 870 333

ධර්ම දානය සඳහා නොමිලයේ බෙදා දීම පිණිසයි.

## සබ්බ දානං ධම්ම දානං ජිනාති

### සියළු දානයන් අතරින් ධර්ම දානය උතුම්වේ

## පුණ්‍යානුමෝදනාව

කුලියාපිටිය දණ්ඩගමුව විසූ විශ්‍රාමලත් පාඨශාලා පරීක්ෂක, බාලදක්ෂ කොමසාරිස්, ඒ. ඒ. සිරිවර්ධන පියාණන්ට සහ බී. ඒ. මුතුමැණිකේ මෑණියන්ට, ගිරිඋල්ල විල්හැර විසූ විශ්‍රාමලත් විදුහල්පති ලි. ප. කි. බන්ඩා පියාණන් සහ සුමනා වෙන්ඩකෝන් මෑණියන් ඇතුළු පවුලේ මියගිය සියලුම ඥාතීන්ට පිං පිණිස, කොළඹ විශ්වවිද්‍යාලයේ දේශීය වෛද්‍ය විද්‍යාලයේ ජ්‍යේෂ්ඨ කථිකාචාර්යවරුන් වන ආචාර්ය දයානි සිරිවර්ධන සහ ආචාර්ය එල්. පී. ඒ. කරුණාතිලක ඇතුළු දූ දරුවන් විසින් කරන ධර්ම දනයකි.

එසේම මේ සඳහා දයකවූ සෞම්‍යා, මිලින්ද පතිරණ සහ කාංචනා ආරියසිංහටත්, පද්මා නානායක්කාර මහත්මියටත් චතුරාර්ය සත්‍යය අවබෝධය පිණිස මෙම පින හේතු වාසනා වේවා!

නැසීගිය කපිතාන් පී. ඩබ්ලිව්. පෙරේරා මහතාට සහ එල්. ටී. පෙරේරා මහත්මියට පිං පිණිස සහ උතුම් චතුරාර්ය සත්‍යය අවබෝධය පිණිස මෙම ධර්මදනමය කුසලය උපනිශ්‍රය වේවා! මියගිය ස්වාමිපුරුෂයා හා දෙමව්පියන් ඇතුළු සියලුම මියගිය ඥාතී පිරිසට පිං පිණිස, හේමා විදනගේ මිය විසින්ද මෙම ධර්ම දනමය කුසලය සඳහා දයකත්වය දරන ලදී.

සෝමසිරි සමරවික්‍රම, ප්‍රේමා කුලතුංග යන අපගේ පරලෝසැපත්, අකුරැස්සේ දෙදියගල ජී. බී. සමරවික්‍රම පියාණන්, එමලියානා වික්‍රමසිංහ මෑණියන්, ප්‍රේමසිරි සමරවික්‍රම සහෝදරයා ඇතුළු සියළුම මියගිය ඥාති මිත්‍රාදීන්ට සහ පරලෝසැපත්, මාතර වේරගම්පිට පියදස කුලතුංග පියාණන්, කේ. සමරසිංහ මෑණියන්, බන්දුමතී කුලතුංග සහෝදරිය ඇතුළු සියළුම මියගිය ඥාති මිත්‍රාදීන්ට මෙම ධර්මදනමය කුසලය අනුමෝදන් කරමු. මෙම කුසල් අප නමින් පරලෝසැපත් සියලුම ඥාති මිත්‍රාදීන්ටත් අප සැමටත් උතුම් චතුරාර්ය සත්‍යය ධර්මය අවබෝධය පිණිසම හේතුවේවා.!!!

ඇසල උයණ, ගෙපල්ලව, උහුමීය පදිංචි ඉංජිනේරු මිල්ටන් විජේසුන්දර, වෛද්‍ය රේණුකා විජේසුන්දර සහ දූ දරුවන් විසින් මියගිය දෙමාපියන්ට පිං පිණිස මෙම ධර්මදනමය පුණ්‍යකර්මයට දයකවන ලදී. එසේම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ සේවයේ නියුතු ඉංජිනේරු මිත්සිරි දයානන්ද රාජපක්ෂ මහතා සහ විජයන්ති රාජපක්ෂ මහත්මිය, විශ්ව බුද්ධික රාජපක්ෂ යන පවුලේ සැම විසින් මියගිය දෙමව්පියන් ඇතුළු ඥතීන්ට පිං පිණිස සහ සුජීවත්ව සිටින දෙමව්පියන්ට ආශිර්වාද පතා මෙම පුණ්‍යකර්මයට දයක වන ලදී.

අනුත්තර වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ ගුරු උපදේශ රහිතවම අවබෝධ කොටගෙන අනන්ත සසර දුකට පත් සත්වයින් ඉන් මුදලනු වස් දේශනා කොට වදළ උතුම් ශ්‍රී සද්ධර්මයේ අරුත් සැඟවී යා නොදී, ඇප-කැප වෙමින් අපගේ දහම් ඇස පාදන මහාචාර්ය රවීන්ද්‍ර කොග්ගලගේ මැතිතුමාට මේ කුසල බලයෙන් උතුම් චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා.

එමෙන්ම මේ ධර්ම දනමය කුසල බලයෙන් අප මෙලොවට බිහි කළ ආදරණීය දෙමාපියන් වන බී. ඒ. රංජනී මානෙල් හා එච්. එල්. එම්. නන්ද පොඩිමැණිකේ යන මැණිවරු සහ එල්. ජී. එස්. බණ්ඩාර හා ඩබ්. ජී. පුන්චිබණ්ඩා යන පියවරු නිදුක් වේවා, නිරෝගී වේවා. උතුම් චතුරාර්ය සත්‍ය අවබෝධ වේවා.

තවද පරලෝ සැපත් එච්. එල්. එම්. මුදියන්සේ පියාණන් සහ බී. ඒ. ටිකිරිමැණිකේ මැණියන් ඇතුළු අප නමින් මිය ගිය සියළුම ඥති හිතමිත්‍රාදීන්ට මේ පින් අනුමෝදන් වී උතුම් නිර්වාණ අවබෝධය ලැබේවා.

මේ ධර්ම පුස්තකය පරිහරණය කොට අවසන ඔබ වැනිම වූ දහම් පිපාසිත බුදු සව්වෙකුගේ පරිහරණය සඳහා මෙය පරිත්‍යග කරනු ඇතැයි අප බලාපොරොත්තු වෙමු.

අවසන මේ උතුම් ධර්ම දනමය පින්කම අපගේ ධර්මාවබෝධය වැඩිදියුණු වීම පිණිසද, ආර්ය අෂ්ඨාංගික මාර්ගයට උපනිශ්‍රය වනු පිණිසද, උතුම් වූ නිර්වාණ අවබෝධය පිණිසද හේතුවේවා. (ඩබ්. ජී. සී. බී. වල්පොල සහ එල්. ජී. එන්. එච්. කේ. ලියනගෙදර)

# පෙරවදන

අප සමථ විදර්ශනා භාවනා වල යෙදෙන්නේ ලෝකය පිළිබඳ වැරදි දෘෂ්ටි වලින් මිදී නිර්වාණාවබෝධය සඳහායි. මෙහි දී රූපය පිරිසිඳ දැකීම සඳහා කායානුපස්සනාව යටතේ නොයෙකුත් භාවනා වල යෙදෙයි. දෙතිස් කුණපය, ධාතුමනසිකාරය, නවසීවථිකය ආදී භාවනාවල දී ලෝකයට අයිති රූපයකින් පටන්ගෙන එය තවදුරටත් විමසා බලනු ලබයි. මෙහි දී බොහෝ විට යම් දෙයක් ඇත යන දෘෂ්ටියේ සිට එය නැත යන දැක්ම දක්වා භාවනාව වඩනු ඇත. නමුත් මෙය බුදු රජාණන්වහන්සේ විසින් කච්චායනගොත්ත සූත්‍රයේ දී ප්‍රතික්ෂේප කළ ශාස්වත හා උච්ඡේද වාදය අතර දෝලනයකි. අප බොහෝ මහන්සි වී භාවනාවේ ප්‍රතිඵලයක් ලෙස ළඟා වී ඇත්තේ නැත යන උච්ඡේද වාදයට විය හැකිය. බාහිර රූපයක් නැත, ඇත්තේ සතර මහා ධාතුවයි යන්න භෞතික වාදයට අදාළ වන අතර, සිතෙන් හදන දෙයක් ඇත හෝ නැත යන්න විඤ්ඤාණ වාදයට වැටෙයි. මෙම දෘෂ්ටීන් සියල්ලන්ගෙන් මිදුණු පටිච්චසමුප්පාද ධර්මය අවබෝධය සඳහා මෙම සතර මහා ධාතු පිළිබඳ සාකච්ඡා උදව් වනු ඇතැයි යන අදහසින් බුදු දහම දැක ගනිමු 5 පොත මෙසේ එළිදැක්වෙයි.

**“ඉධ, භික්ඛවෙ, අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදෙ අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදෙ සප්පුරිසධම්මෙ අවිනීතො - පථවිං පථවිතො සඤ්ජානාති; පථවිං පථවිතො සඤ්ඤත්වා පථවිං මඤ්ඤති, පථවියා මඤ්ඤති, පථවිතො මඤ්ඤති, පථවිං මෙති මඤ්ඤති, පථවිං අභිනන්දති. තං කිස්ස හෙතු? ‘අපරිඤ්ඤතං තස්සා’ති වදාමි....”**

**“යොපි සො, භික්ඛවෙ, භික්ඛු සෙක්ඛො අප්පත්තමානසො අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානො විහරති, සොපි පථවිං පථවිතො අභිජානාති; පථවිං පථවිතො අභිඤ්ඤාය පථවිං මා මඤ්ඤි පථවියා මා මඤ්ඤි, පථවිතො මා මඤ්ඤි, පථවිං මෙති මා මඤ්ඤි, පථවිං මාභිනන්දි. තං කිස්ස හෙතු? ‘පරිඤ්ඤෙය්‍යං තස්සා’ති වදාමි....”**

**“යොපි සො, භික්ඛවෙ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, සොපි පථවිං පථවිතො අභිජානාති; පථවිං පථවිතො අභිඤ්ඤාය පථවිං න මඤ්ඤති, පථවියා න මඤ්ඤති, පථවිතො න මඤ්ඤති, පථවිං මෙති න මඤ්ඤති, පථවිං නාභිනන්දති. තං කිස්ස**

**හෙතු? 'පරිඤ්ඤාතං තස්සා'ති වදමි...''** (මූලපරියාය සූත්‍රය, මජ්ඣිම නිකාය 1).

මජ්ඣිම නිකායේ මූලපරියාය සූත්‍රයට අනුව, පෘථග්ජනයා පඨවිතෝ මඤ්ඤති. සේඛ පුද්ගලයා **මා මඤ්ඤති**. රහතන්වහන්සේ **න මඤ්ඤති**. පෘථග්ජනයාට බාහිර පවතින හෝ නො පවතින සතර මහා ධාතුවක් ගැන කතා කළ හැක. එසේම සිතෙන්ම සාදන ලද පවතින හෝ නො පවතින සතර මහා ධාතුවක් ගැනද, සමහරවිට කතා කරනු ඇත. බාහිර රූපයක් නැත, ඇත්තේ සතර මහා ධාතුවයි යන්න භෞතික වාදයට අදාළ වන අතර සිතෙන් හදන දෙයක් ඇත හෝ නැත යන්න විඤ්ඤාණ වාදයට වැටෙයි. **සම්මුති, ලක්ඛණ, ආරම්මණ, සසම්භාර යනු එසේ භාරගන්නා ආකාර සතරකි (මඤ්ඤති). අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරුකළ රහතන්වහන්සේට මේවා නො පිහිටන අතර (න මඤ්ඤති), සද්ධර්මය ශ්‍රවනය කළ සේඛ පුද්ගලයාට එය පිහිටියත් එයින් මිදීම සඳහා වෑයම් කරයි (මා මඤ්ඤති). තම තමන්ගේ මානසික මට්ටම හඳුනාගැනීමට මූලපරියාය සූත්‍රය කදිම පිටුවහලකි.**

රූප විසිඅටක් තියෙනවා නම් ඕකෙන් එකක් තමයි වර්ණ රූපය. උපාදය රූප වලින් එකක්. දැන් ඇහැට අහුවෙන්නේ වර්ණයි. අපි ඇහැ පාවිච්චි කරලා නම් දැනගත්තේ වර්ණ රූපයට අමතරව ඔය විසිඅටේ ඉතුරු විසිහතෙන් එකක්වත් අහුවෙනවා ද? ඇහැට පුළුවන් වර්ණ රූපය දැනගන්න විතරයි. ඉතුරු විසිහතම ඇහැට අහුවෙන්නේ නෑ. පඨවි අහුවෙනවා ද? අපෝ අහුවෙනවා ද? තේජෝ අහුවෙනවා ද? රස්නෙයි කියලා අහුවෙනවා ද ඇහැට? ඇහැට හැකියාව තියෙන්නේ වර්ණය දැනගැනීම විතරයි. දැකීමේ මට්ටම විතරයි. ඉතුරු රූප විසිහතම අහුවෙන්නේ නෑ. ඒවා කොහාට ද අහුවෙලා තියෙන්නේ? හිතටයි. හිතෙන් නේද දැනගෙන තියෙන්නේ? ඕක ගැන හිතලා නේද අනික් කරුණු ටික කියන්නේ? වර්ණ ධාතුව විතරයි ඇහැට අහුවෙන්නේ. එතකොට ඒ විසිහත දන්නේ නැති වුණත්, දැන් විද්‍යාවෙන් කිව්වොත්, ප්‍රතිබිම්බයක් හදලා දීලා. ඔය ප්‍රතිබිම්බය නේද හිතට දැනගන්න පුළුවන්. දැන් ඔය ප්‍රතිබිම්බය දිහා බලලා, එළියේ තියෙන්නේ මේකයි කිව්වොත් වැරදියි. එළියේ මොකුත් තියෙනවා කිව්වත්, ඒක මතයක්. දැකලා තියෙන්නේ ප්‍රතිබිම්බය; ඕක දිහා බලලා එළියේ තියෙන දෙයක් ගැන කියනවා. ඒක මතයක්. ඒ මතයක් කියන එකට තමයි දෘෂ්ටියක් කියන්නේ. ඇත්ත ඇතිහැටි නෙවෙයි. හිතෙන දෙයක් මේ කියලා තියෙන්නේ. ඕක දැකලා එළියේ දෙයක් නෑ කිව්වොත්? ඒකත් දෘෂ්ටියක්. තියෙනවා ද, නැද්ද කියන එක මෙතැන අහුවෙන්නේ නෑ. බාහිරයට ගිහින් නෑ නේ. ඇහැට

පුළුවන්, ඇහේ කෘත්‍යය අපි හඳුනාගන්න ඕන. ඇහැට පුළුවන් වර්ණ ස්වභාවයක් පෙන්නන්න විතරයි. වර්ණ ස්වභාවය දැකලා වෙනින් දේවල් ගැන කතා කරනවා නම් තියෙනවා හරි, නෑ කියලා හරි මොනවා හරි කියනවා නම්, ඕක මතයක්, දෘෂ්ටියක් මිසක් ඇත්ත ඇති හැටි වෙන්න බැහැ. එහෙනම් තේරෙනවා ද ඇහෙන් දෙයක් දැකලා එළියේ පවතින ස්වභාවයක් ගැන කියනවා කියන එක දෘෂ්ටියක්. කියන්න බැහැ. අපි තත්ත්වයක නෑ එළිය ගැන කතා කරන්න. එහෙනම් සතර මහා ධාතුව එළියේ තියෙනවා කිව්වත්, දෘෂ්ටියක්. සතර මහා ධාතුව එළියේ නෑ කිව්වොත් එකත් දෘෂ්ටියක්. දැකීම ඉක්මවා ගිය **මඤ්ඤනාවක් පමණයි. ලැබූ ක්ෂණ සම්පත්තිය අපතේ නොයවා දහම ණුවනින් විමසා පෘථග්ජන ස්වභාවයෙන් මිදීම සඳහා මෙය උපකාරයක් වේවා!**

පොත මුද්‍රණ තත්වයට ගෙන ඒම සඳහා වෙහෙස නොබලා පරිඝනකගත කිරීම සහ මුද්‍රණයට සකස් කරදීමට උරදුන් අමරතුංග මහතාටත්, දිල්රුක්ෂි මහත්මියටත්, පිටකවරය සකස්කොට දුන් අමීල් මහතාටත් මෙම කුසලය තව තවත් ධර්ම දානමය කටයුතු වල යෙදීම සඳහා අවශ්‍ය ශක්තිය ධෛර්යය සහ නිදුක් නිරොගීභාවය ලැබීම පිණිසත්, නිවන් අවබෝධය සඳහාත් හේතු වාසනා වේවා! අපගේ මෙතෙක් පැවති අවබෝධය නිරවුල් කරදීම සඳහා බෙහෙවින් උපකාරී වූ මෙවැනි දහම් කරුණු හෙළි කරදීම සඳහා ධර්ම සාකච්චා වල යෙදුණු ගරුතර ස්වාමීන්වහන්සේටත්, රූපසිංහ මහතාටත්, භාවනා වැඩසටහන් වලට සහභාගී වූ සැමටත් මෙම කුසලය නිවන් පිණිසම උපනිශ්‍රය වේවා!! දැනට 95 වෙනි වියේ පසුවන දයාබර පියාණන්ටත්, සියලු සහෝදර සහෝදරියන් ඇතුළු ඥාති හිතමිත්‍රාදීන්ටත් නිදුක් නිරෝගී භාවය සහ දහම් අවබෝධය පිණිසත්, සියලුදෙනා නමින් මිය පරලොව ගිය ඥාති හිතමිත්‍රාදීන්ට හිතසුව සහ දහම් අවබෝධය පිණිසත් මෙම ධර්ම දානමය කුසලය හේතු වාසනා වේවා!!!

ධර්ම දානයක් වශයෙන් මෙම පොත නැවත මුද්‍රණය කොට නොමිලේ බෙදාහැරීමට ඕනෑම අයෙකුට අවසර ඇති අතර මුදලට විකිණීම සපුරා තහනම්ය. මෙහි පිටපතක් අන්තර්ජාලයෙන් ලබා ගැනීමට පහත සඳහන් වෙබ් අඩවියට පිවිසෙන්න.

**රවීන්ද්‍ර කොග්ගලගේ**
Email: koggalage@yahoo.com
Web: http://ravi.harimaga.com
Mobile : 0777234239

# සතර මහා ධාතු සහ එහි සතර ආකාරය
# (මූලපරියාය සූත්‍රය ඇසුරෙන්)
# 17-10-2015 දින නුගේගොඩ සුභද්‍රාරාමයේදී
# පැවැත්වුනු ධර්ම සාකච්ඡාව

ආයතන ක්‍රියාත්මක වෙනකොට ඒවා මවු කුසයේ දීම ක්‍රියාත්මක වෙනවා ද, නැත්නම් බිහිවුනාට පස්සේ විතර ද ක්‍රියාත්මක වෙන්නේ? අපේ හිතක් හැදෙන්න නම් - හිත කියන එක අපි තව විදියකට හඳුන්වනවා විඤ්ඤාණය : සිතේ එක අවස්ථාවක් විඤ්ඤාණය කියන එක. එතකොට විඤ්ඤාණය කියනකොටත් සිතක්. එතකොට සිතකට පහළවෙන්න බැහැ ආයතනයක් නැතුව. ඒක හොඳට තේරුම් ගන්න. විඤ්ඤාණයක් පහළවෙන්න බැහැ ආයතනයකින් තොරව. මොකද අපි දන්නේ සිත් හයයි නේ. චක්ඛු විඤ්ඤාණ සිත, සෝත විඤ්ඤාණය, ඝාන විඤ්ඤාණය, ජිව්හා විඤ්ඤාණය, කාය විඤ්ඤාණය, මනෝ විඤ්ඤාණය. ඔන්න ඔය කියන සිත් හය තමයි අපි දන්නේ. ඊට අමතරව සිතකින් කිසිම දෙයක් දැනුවත් වෙන්න බැහැ. අපි මොනවා හරි දැනගත්තා නම්, හොඳට බැලුවොත් පෙනෙයි, කොයි ආයතනය නිසා ද ඔහොම දැනගත්තේ, ඔය සිතක් හැදුනේ මොන ආයතනය නිසා ද. ඇහැ වෙන්න පුළුවන්, කන වෙන්න පුළුවන්, නාසය, දිව, ශරීරය, මනස. ඔය හයෙන් එකක් උදව් කරගෙනමයි සිතක් හැදෙන්නේ. මේ තාක් යම්කිසි සිතක් හැදිලා තියෙනවා නම්, ඔය විදියට ඇරෙන්න හිතක් හැදෙන්න බැහැ. ආයතන හයෙන් එකක් උදවු කරගෙනමයි හිතක් හැදෙන්නේ.

එතකොට තේරුම් ගන්න, මවු කුසයේ දී හිතක් හැදුනා නම්, ඒකත් එහෙමයි. දිව්‍ය ලෝකයේ දී හිතක් හැදුනා නම්, ඒත් එහෙමයි. අපායේ ඉන්න කාලයේ හිතක් හැදුනා නම් - මතකද දන්නේ නෑ - ඒත් ඔය ආයතනයක් උදවු කරගෙනමයි. බ්‍රහ්ම ලෝකයේ ඉද්දි හිතක් හැදුනා නම්, ඒත් ආයතන උදවු කරගෙනමයි. හැබැයි, ඒ එක එක තැන උපදින්න පුළුවන් ආයතනත් තියෙනවා. සමහර ආයතන උපදින්නේ නෑ. දැන් අපි අරූපාවචර බ්‍රහ්මලෝක මට්ටම ගත්තොත්, හිත විතරයි වැඩ කරන්නේ, මනායතනය විතරයි. ඇහැ, කන, නාසය, දිව, ශරීරය - ඒවායින් අරමුණු ගන්නේ නෑ. ඒකයි ඒකට අරූපාවචර මට්ටම කියන්නේ. අරූපාවචර භූමියේ.

රූපාවචර මට්ටමේ හිටියා නම් එතකොට කියනවා, මේ මනසයි, ඇසයි, කනයි - ඔය කියන ආයතන තුන. දෙක දෙක ගත්තොත් ආයතන හයයි.

ඒ කියන්නේ, ඇසයි රූපයයි, කනයි ශබ්දයයි, මනයි ධම්මයි කියලා ඒ හය විතරයි එතැන වැඩ කරන්නේ. ආයතන විදියට ගත්තොත් ඒ ජාති තුනයි. ඒ රූපාවචර භූමියේ.

දැන් අපි ඉන්නේ මොන භූමියේ ද? කාමාවචර භූමියේ යි. කාම භූමි කියනවා. ඒවායේදී තියෙනවා ආයතන හයම. ඒ කියන්නේ දොළොස් ආයතනය. දෙළහක් වෙන්නේ අභ්‍යන්තර ආයතනයයි, බාහිර අරමුණ යි. දෙක දෙක ගත්තොත් ඒ හයට දෙළහක් වෙනවා. ඇහැයි රූපයි, කණයි ශබ්දයි, නාසයයි ගඳ සුවඳයි, දිවයි රසයි, කයයි ස්පර්ශයි, මනයි ධම්මයි. දොළොස් ආයතනම වැඩ කරන, ක්‍රියාත්මක වෙන ස්වභාවය පිහිටන තැනට කියනවා කාමාවචර භූමි, කාම භූමි. එතකොට කාම භූමි කියනකොට මොනවාද අයිති වෙන්නේ - මනුෂ්‍ය ලෝකය, දිව්‍ය ලෝක හයම තියෙනවා, සතර අපාය තියෙනවා - දැන් තිරිසන් සතෙක් ගත්තත් ආයතන හයම වැඩ කරනවා. එතකොට දොළොස් ආයතන පිහිටන තැනට පොදුවේ දෙන නම - කාම භූමිය. ඇයි? ආයතන හයෙන්ම අරමුණු ගැනීමේ හැකියාව තියෙනවා. එක මොහොතක හයෙන්ම ගන්නවා නෙවෙයි. එක මොහොතක එකයි. ඒ වුනාට ආයතන හයම වෙන වෙනම ක්‍රියාත්මක වීමේ හැකියාව තියෙනවා. එතකොට ආයතන හය උදවු කරගෙන හිත් හැදෙන්න පුළුවන්.

ඒ වුනාට සමහර අවස්ථා තියෙනවා: දැන් අපි හිතමු, ඇස් අන්ධවෙලා ඉන්න කෙනෙක්ගේ චක්ඛායතනය වැඩ කරන්න බැහැ. එතකොට ඇහැයි රූපයි කියන ඒ ආයතන දෙක නෑ. අනිත් ටික වැඩ කරන්න පුළුවන්. දැන් හිතාගන්න පුළුවන් නේද ඒක ගැන. මවු කුසයක හරි කොහේ හරි ඉන්නකොට එතැන වැඩ කරන ආයතන තියෙනවා නම් ඒවාට අදාල හිත් ටික හැදෙනවා. එතකොට අපි ආයතන ටික වැඩ කරන්න හදාගෙන ඉන්නකොට ඒවායින් අරමුණු ගන්න පුළුවන්.

මවු කුසයේදී සඳහන් වෙන්නේ, තව විස්තර ඕනෑ නම් ප්‍රතිසන්ධිය ලබන වෙලාවේ දී අර රූප දශක කලාප තුනයි හටගන්නේ. කාය දශකයයි, භාව දශකයයි, වත්ථු දශකයයි කියලා. ඇයි දහයක් කියන්නේ? දහයේ පොදි. ඒ දහය වෙන් කරන්න බැහැ. දහයේ මිටි.

දැන් කාය දශකය කියනකොට ශුද්ධාෂ්ටකයේ අටක් තියෙනවා; තව ජාති දෙකක් තියෙනවා. ශුද්ධාෂ්ටකය කියන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා. ඊළඟට දැන් කාය දශකය කියලා කියන්නේ කායායතනයට අදාළ රූප නේ. එතකොට අර අටට අමතරව යෙදෙනවා - ජීවිත ඉන්ද්‍රිය කියන එකත් යෙදෙනවා, මොකද පන තිබුණොත් තමයි

කායායතනය වැඩ කරන්නේ, හිතක් හැදෙන්න පුළුවන්. ජීවිත ඉන්ද්‍රියයි, කාය ප්‍රසාදයට අයිති ඒ රූපය. එතකොට දහය හරි නේද? ශුද්ධාෂ්ටකයට අමතරව තියෙනවා ජීවිතඉන්ද්‍රිය රූපයයි, කාය ප්‍රසාදයට අයිති ඒ රූප ගතිය යි.

වත්ථු දශකය කියන කොට ඒ ශුද්ධාෂ්ටකයයි, ජීවිත ඉන්ද්‍රියයි, වත්ථුරූපය යි. ඔය හිත හැදෙන්න ඕන වස්තු දශකය කියලා කියන්නේ, හෘදය වස්තුව නෙවෙයි ඒක. වත්ථු දශකය යි. මොකද දැන් ප්‍රතිසන්ධිය ගන්නකොට හෘදය වස්තුවක් නෑ. එක ශෛලයක් විතරයි, ඇහැටත් පෙනෙන්නේ නැති අර අශ්ව ලොමකින් ගත්ත තෙල් බින්දුවක් වගෙයි කියන තරම් පුංචි, ඇහැටත් නො පෙනෙන මට්ටමේ සිද්ධියක් මේ කියන්නේ. එතකොට හෘදය වස්තුව කියලා එකක් නෑ. හෘදය වස්තුව නෙවෙයි. හිත ඇතිවීමේ ශක්තිය දෙන යම්කිසි රූපකලාපයක්. ඒකට කියනවා වත්ථු රූප කියලා. අර ශුද්ධාෂ්ටකය - පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා අටයි. ජීවිත ඉන්ද්‍රියයි, වත්ථු රූපය යි.

ඒ වගේ භාව දශකය කියන කොට, භාව දශකයට හිත් හදන්න බැහැ. ඒකෙන් පෙන්නන්නේ ස්ත්‍රී පුරුෂ භාවය පෙන්නන යම්කිසි ගතියක්. එතකොට ඒකේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ, වර්ණ, ගන්ධ, රස, ඕජා, ජීවිත ඉන්ද්‍රියයි, භාව රූපයයි, කියන ඒ දහයෙ මිටි. දර මිටි වගේ තියෙනවා. දැන් අපට හිතෙනවා ඔහොම කියන කොට මේ මිටි මිටි තියෙනවා කියලා. කොහෙද තියෙන්නේ - එළියේ තියෙනවා කියලා හිතෙනවා. මොනවායින් හරි හැදිලා තියෙනවා කියලා. ඕක තමයි ඔය ගොඩාක් දැනගත්තහම වෙන ප්‍රශ්නය. ඕවා දැකලා නෙවෙයි නේ කියන්නේ. ඔය කොහෙන්දෝ එකතු කර ගත්තු දැනුමක්.

ඉතින් ඒක මෙහෙමයි : දැන් රූප ගැන හිතෙන විධි කීපයක් තියෙනවා. රූප ගැන හිතෙන විදි. රූප කියන්නේ මොනවාද? සතර මහා ධාතුවෙන් සකස්වුන දේවල්වලට රූප කියනවා. සතර මහා ධාතු, පඨවි, ආපෝ, තේජෝ, වායෝ. ඊළඟට ඒවායේ උපාදාය රූප. වර්ණ, ගන්ධ, රස, ඕජා කියන්නේ. සතර මහා ධාතුව තියෙන තැනක උපාදාය රූප පෙන්නුම් කරනවා. දැන් මේ වචන කිව්වාට බයවෙන්න එපා. දන්න අයට දන්න දේ හරියට දැනගන්න තමයි මේ කියන්නේ. දැන් ඔහොම හිතාගෙන ඉන්නේ, දැන් මේ එළියේ තියෙන රූප ගැන මේ කතා කරන්නේ කියලා. ඒක හරි. ඉතින් ඒක ලෝකයට අයිති දැක්මක්.

හැබැයි ඕක ලෝකෝත්තර දැක්ම නෙවෙයි. ඒකත් පැත්තක තියාගන්න. ලෝකයට අයිති කෙනෙකුට ඔය කතාව කිව්වහම හරි. ඔය තවම ආර්ය

මාර්ගයට වැටුනේ නැහැ. ශරීරය මොනවායින් හරි හැදිලා තියෙනවා. ඕක කඩාගෙන කඩාගෙන ගියහම මේ තියෙන පොඩිම දෙයක් අහුවෙනවා. විද්‍යාවෙන් නම් ඕක පරමාණුව හරි තව මොනවා හරි ඒකත් කඩලා මොනවාහරි කියයි. දැන් අපිත් ඒ විදියට හිතන්න පුරුදුවෙලා. ඉතින් බුද්ධාගමෙනුත් මොකක් හරි අල්ලාගන්නවා. ඕකට කියනවා 'රූප කලාපය' කියලා, පොඩිම දෙයට. ඇයි රූප කලාපය කියන්නේ? ඒකෙත් මොනවාද ප්‍රකට වෙන්නේ? පඨවි, ආපෝ, තේජෝ, වායෝ, ඔය හතර වෙන්කරන්න බැහැ. වෙන්කරන්න බැරි නම් ඔය හතර වෙන වෙනම ඇවිල්ලා මේවා හැදෙන්න පුළුවන් ද? ඒකත් බැහැ කියලා තේරුම් ගන්න. ස්වභාව හතරක් විතරයි, ගති හතරක්. රූප කලාපයේ මෙන්න මේ ගති හතර පෙන්නුම් කරනවා. ඔය ගති හතර එකකට එකක් වෙන්කරන්න බැහැ. මේ පඨවිය, ඔන්න පඨවිය වෙන් කළා කියලා ගන්න බැහැ, ඉතුරු ටික නැතුව. පඨවි කිලෝ එකක් කඩෙන් ගන්න බැහැ! ගන්නකොට අනිත් ටිකත් ඕකේම ඇලිලා තියෙනවා. ඒවා වෙනම වෙන් කරන්න බැහැ. එහෙනම් කවුරු හරි කියනවා නම් ඔය හතරම එකතු වෙලා කොහෙන්ද ඇවිල්ලා අර වැලි ගඩොල් සිමෙන්ති එකට අනලා බිත්තිය බැන්ද වගේ එහෙම සකස්වීමක් නෙවෙයි. මොකද එහෙම හිතෙනවා අපට ඕවා අහන කොට. ඒ වුනාට එහෙම ගතියක් නෙවෙයි මේක.

ඔය සතර මහා ධාතුව ගැන සඳහන් වෙනවා ක්‍රම හතරක්. අහලා තියෙනවා ද? නෑ නේ. සතර මහා ධාතුව දන්නවා - පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා. ඔය සතර මහා ධාතුව මොන වගේ දෙයක් ද? දකින්න බැහැ. වෙන්කරන්න බැහැ. එකටම පවතිනවා, එකටම උපදිනවා, එකටම මැරෙණවා. එහෙමත් කියනවා. ඒවාටත් ආයුෂ කාලයක් දීලා, රූප කලාපයක ආයුෂ මේකයි, චිත්තක්ෂණ දහතයි තියෙන්න පුළුවන්. ඔය ලොකු විස්තර ගොඩක් තියෙනවා. ඉතින් ඕවා කියන්න පුළුවන්. හැබැයි ඕක කවදවත් දකින්න පුළුවන් එකක් නෙවෙයි. මේ ආයතනවලට අහුවෙන්නේ නෑ. ඇහෙන් දකින්න බැහැ. කනට ඇහෙන්නේ නෑ. ත්‍රිලක්ෂණ, ලක්ෂණ කියන්න පුළුවන්. අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියලා කියන්න පුළුවන්. සතර මහා ධාතුවේ රූප කලාපයත් අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියලා කියන්න පුළුවන්. ඒක කිව්වාටම දහම අවබෝධ වෙයි ද කියන එක නුවණින් හිතලා බලන්න ඕන. ඒකත් හිතින් හද දැනගත්තු එකක් ද? ඒවා ටිකක් අපට හොයන්න වෙනවා දහමට අනුව. ඕවා දකින්නත් බැරි නම්, එක ආයතනයකටවත් අහුවෙන්නත් බැරි නම් කොහෙන් දැනගත්තු එකක් ද මේ කියන්නේ? හිතාගත්තු එකක් තමයි ඔය කියන්නේ. හිතාගන්න හේතු යෙදුන හින්ද හිතාගත්තා. කොහෙන් හරි

අහලා තියෙනවා මේක මෙහෙමයි කියලා, ඒ හින්ද ඒ අනුව හිතනවා. එහෙම සිද්ධියක් නේද වෙලා තියෙන්නේ?

ඔහොම දැනගත්තා කියලා නිවන් දකින්න බැහැ. මේ දහම, ආර්ය අෂ්ඨාංගික මාර්ගය, වෙනමම එකක්. මේවා කඩාගෙන කඩාගෙන ගිහිල්ලා රූප කලාප මට්ටමට දැක්කා. මම දැක්කා රූප කලාප ටික. මේක ඇතිවෙනවා, පවතිනවා, නැතිවෙනවා කියලා දැක්කා. මේක කැඩි කැඩී, බිඳි බිඳී යනවා දැක්කා. දකින්න පුළුවන්. අපට හිතෙන් ඕනෑ එකක් දකින්න පුළුවන් නේ. හීන දකිනවා නේ, ඕන තරම් නේ. ඒවා දැක්කාට නිවන නම් අවබෝධ වෙන්නේ නෑ. එහෙම වෙන්නේ නැත්තේ ඇයි කියලා මම කියන්නම්. දහමට අනුව විමසන කෙනෙකුට, නුවණින් විමසන කෙනෙකුට. දෙස්තරවරු, විද්‍යාඥයෝ, ෆ්ලොරසන්ට් බල්බ් හදන අය එහෙම ඕවා ඇතුලේ ඉලෙක්ට්‍රෝන පනින හැටි, ශක්ති මට්ටම් වෙනස් හැටි, මේ අපි දකිනවාට වඩා ගොඩාක් එහාට දකිනවා. මේ තරංග ගොඩාක් තියෙන්නේ, වෙනස් වෙනවා ශක්තීන්, මේ දකින වෙනස්වීමට වඩා ඒ ගොල්ලෝ ප්‍රායෝගිකව දකිනවා මේක. හැබැයි ඒ ගොල්ලන්ට පුළුවන් ද නිවන් දකින්න? සෝවාන් වෙන්න? ඕවා හොයාගත්ත අය සෝවාන් වුනාද? නෑ. අපි ඕක හොයලා සෝවාන් වෙන්න හදනවා. රූපකලාප වෙනස් වෙනවා දැකලා, ඒකේ ත්‍රිලක්ෂණය දැකලා. ත්‍රිලක්ෂණය කියපු ගමන් ඒකේ හිතෙන්නේ හරි, ත්‍රිලක්ෂණය දැක්කා නම් හරි. ඒ ගොල්ලෝ අනිත්‍යයත් දැකලා නේ. මේ අපටත් වඩා. සෝවාන් වුනාද? ඔය අයින්ස්ටයින් එහෙම, නේද? රූපයක් ශක්තියකට පෙරලන්න පුළුවන්. පරමාණු බෝම්බ එහෙම හැදුවේ. ශක්තිය කියන්නේ මේ තරංග ගොඩක්. නිතර වෙනස් වෙනවා. එක මොහොතක දකින දේ තව මොහොතක එතැන දකින්න බැහැ. ඕක ඒ අය අවබෝධ කළා. ප්‍රත්‍යක්ෂ කළා. අපි නම් ඒගොල්ලෝ කියපු එක අහලා නේ දැනගෙන තියෙන්නේ. හොයාගත්තු අය, ඒක ප්‍රත්‍යක්ෂ කළා නේද? සෝවාන් වුනාද? නෑ. ඉතින් නුවණින් බලන්න.

අපිත් දැන් ඔන්න ඔය වගේ වැඩක් කරන්න ගිහිල්ලා මේ එළියේ තියෙන එකක් කඩාගෙන කඩාගෙන ගිහිල්ලා මේවා මේවායින් හැදිලා තියෙන්නේ, මේවා වෙනස් වෙනවා කියන එක හොයාගෙන ගියාට මේක අවබෝධ වෙයි ද? හොයන්න එපා කියනවා නෙවෙයි. හොයන එකේ ප්‍රශ්නයක් නෑ. ඒක තමන්ගේ දැණුමට හොඳයි. ප්‍රශ්නය තියෙන්නේ, ඔතැන තියෙන්නේ බුදුදහම ද? බුදුකෙනෙක් ලෝකයාට හෙළිකරලා දෙන, සැඟවිලා තියෙන සත්‍යය ද? චතුරාර්ය සත්‍යය ද? සසරෙන් ගැලවෙන හැටි ඔතැන තියෙනවා ද? ඕක තමයි අපි නුවණින් හොයන්න ඕන.

එතකොට ඔය ධාතු ගැන තව ලක්ෂණ හතරක් සඳහන් වෙනවා. (ඉතින් තව දැණුමක් එකතුකරගන්න දැන් ඉතින් හරි ආශාවෙන් බලාගෙන ඉන්නවා. ඕක එකතු කරගත්තා කියලා අමුතු දෙයක් වෙන්නේ නෑ. තව ටිකක් ගොඩගහගන්නවා.) එතකොට අපේ මේ සම්මුතියේ තියෙන ධාතු හතරක් තියෙනවා. ඔයගොල්ලෝ නම් කියන්නේ පරමාර්ථ කියලා. ඒ වුනාට **සම්මුතියේ එන ධාතු** : පඨවි, ආපෝ, තේජෝ, වායෝ. ඊළඟට තව ජාතියක් තියෙනවා **සසම්භාර ධාතු** කියලා. ඒ මොකක් ද කියලා මම කියන්නම්. තව තියෙනවා **ලක්ඛණ ධාතු** කියලා. මම කිව්වේ අර ලක්ෂණයෙන් දැනගන්න, තද ගතියෙන් දැනගන්න. මේ අපට දැනෙන ගතියක් තමයි ඔය. ලක්ඛණ ධාතු කියලා කියන්නේ. තවත් එකක් තියෙනවා **ආරම්මණ ධාතු** කියලා. අරමුණු වෙන විධියට ධාතු ස්වභාවය දැනගන්නවා.

එතකොට සම්මුතියෙන් දන්න ටික තමයි ඔය අපට හිතාගන්න පුළුවන් පඨවි, ආපෝ, තේජෝ, වායෝ. ඒ ටික දන්නවානේ. ඒක වැඩිය විස්තර කරන්න ඕන නැහැ නේ. 'පඨවි' කියන එක තද ගතිය. 'ආපෝ' කියන්නේ වැගිරෙන බව, 'තේජෝ' කියන්නේ උෂ්ණය, රස්නය. 'වායෝ' කියන්නේ විසිරෙන බව. එතකොට අර පොළොව කියන්නේ පඨවි. වතුර කියන්නේ ආපෝ. ගින්දර කියන්නේ තේජෝ. මේ හුළඟ කියන්නේ වායෝ. ඔහොම විස්තර කිරීමක් තියෙනවා නේ. එහෙම විස්තර කරන එක සම්මුති සතර මහා ධාතු.

එතකොට අපේ කෙස්, ලොම්, නිය, දත් මේවා පොළවට අයිතියි, පඨවියට අයිතියි. ඔය විදියට බෙදන ඉගැන්වීමක් තියෙනවා නේ. අහලා ඇති නේ. ඒක එතකොට ඒ සම්මුතියට අනුව ඔය විදියට කියාදෙන්න පුළුවන්. ඔය කතාව ඉතින් බුදු දහමේම වෙන්න ඕන නැහැ. ඉන්දියාවේ ඒ කාලෙත් තිබුණා. දැන් අපේ ඉන්නවා නේ අර නො දියුණු ජාති කියලා ආදිවාසීන්. ඒ වගේ මට හම්බවුනා අර ඕස්ට්‍රේලියාවේ ඉන්න ආදිවාසීන්, ඇබොරිජිනීස් කියලා කියන්නේ. ඒ අය ඔවුන්ගේ ස්වභාවය අනුව ජීවත් වෙනවා පරිසරයත් එක්ක. ඒ ගොල්ලත් එක්ක කතා කරනකොට, ඒ ගොල්ලෝ දැන් ලොකු ගිනි ගොඩක් ගහගෙන ඉන්නවා. ඉතින් කිව්වා අපිව ආරක්ෂා කරන්නේ මෙන්න මේ ගොල්ලෝයි. කවුද, ගින්දර, වතුර, පොළොව, වාතය. අපි ඒ අයට ගරු කරන්න ඕන. ඒ අයත් දන්නවා මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ ගැන. එතකොට ඒවා මේ ලෝකයේ තියෙන සම්මුතියට අදාළ දේවල්. අපිත් ඉතින් ඒ අයගේ මට්ටමට යන්න හදනවා බොහොම අමාරුවෙන් ඉගෙනගෙන. මෙන්න මෙහෙම ජාති හතරක් තියෙනවා කියලා. සමහරවිට ඒ අය අපට වඩා දියුණුයි මනස පැත්තෙන්. ඒ අය පරිසරයට හානි කරන්නේ නෑ. කියන්නේ ඒවා ආරක්ෂා

කරගෙන අපි ඉන්න ඕන කියලා. ඒ අය ඒවාට දෙවියන්ට වගේ සලකනවා. පුද පූජා තියනවා, ඒ වගේ. ඒවා ආරක්ෂා කරනවා. හැබැයි ඒ අය දන්නවා ඒ අය තමයි අපව ආරක්ෂා කරන්නේ කියලා. අපේ අය කරන්නේ ඒවා විනාශ කරලා දන එක නේ.

එතකොට දැන් තේරෙනවා නේද, **සම්මුති** පඨවි, ආපෝ, තේජෝ, වායෝ. නැත්නම් සතර මහා ධාතු.

ඊළඟට මොකක්ද කිව්වේ? **සසම්භාර**. සසම්භාර කියන්නේ අපි දැන් ඔන්න ඇහෙන් දැනගන්නවා නේ, මොකක් ද දැනගන්නේ? වර්ණ සම්බන්ධව දැනගන්නවා නේ. වර්ණය කොහෙද තියෙන්නේ? සාමාන්‍ය ලෝකයේ දී හිතෙන්නේ මේ කනුව සුදු පාටයි. අර ගහේ කොළ, කොළ පාටයි. දැන් ඒ ඇහෙන් දකින එක නිකම් රඳ පවතින්න මොනවා හරි ඕන නේද? මේ වර්ණය පෙන්නන්නේ මෙන්න මේ ධාතු ටික යි. මේ ධාතුන් තියෙන තැනක ඇහෙන් වර්ණය පෙන්නනවා කියලා අදහසක් තියෙනවා නේද? එතකොට ඒ වර්ණය රඳ පවතින්න, පිහිටන්න තැනක් ඕන නේ. ඔන්න ඕකට ධාතු කියනවා. (ඕකත් අහන ප්‍රශ්නයක් නේ නේද) වර්ණය තියෙන්නේ සතර මහා ධාතු තියෙන තැනක නේද කියලා ඕකත් සෑහෙන්න අහනවා නේ. දැන් අන්න ඒ අදහසින් ධාතු ගන්නකොට **සසම්භාර** ධාතු. මේ පෙනෙන එක රඳ පවතින්නේ ධාතුවේ. ධාතුව තියෙන තැනක අපට ඇහෙන් දකින්න පුළුවන්. කනෙන් ශබ්දය අහන්න පුළුවන්. ඇහෙන් හැම තැනම දකින්න බැහැ නේ එක පාට ම. එතකොට කොහේද ඕවා තියෙන්නේ කියලා අහනවා නේද? එළියේ මොනවා හරි නො තිබුණා නම් කොහොමද පෙනෙන්නේ කියලා අහනවා නේ. මොනවාද ඒ තියෙන්නේ? සතර මහා ධාතුව කියලා හිතනවා. එහෙම මතයකට යනවා. ඒ ආකාරයට සතර මහා ධාතුව දැනගන්න කොට **සසම්භාර** ධාතු. ඔය ඇහෙන් දැනගන්න රූපය තියෙන්නේ කොතැනද කියලා අපි හිතනවා නේ. තියෙන තැනක් කියන්න. දැන් අපි මොකුත් නැති තැනක, හිස් අවකාශයේ ටෝච් එකක් ගැහුවොත් මොකුත් පෙනෙයි ද? මොනවා හරි වැදුණොත් තමයි වර්ණය පෙනෙන්නේ. වදින්නේ මොනවාද කියල ඔන්න අහනවා. එතකොට අපට හිතෙනවා මොනවා හරි තියෙන්න ඕන. ඒ තියෙන ජාතියට එතකොට කියනවා සසම්භාර යි. මේවා රඳවාගන්න ගතියක් වගේ. ඒ ගතියට කියනවා සසම්භාර ධාතු. ඒ තව වර්ගයක්.

ඊළඟට මොනවද තියෙන්නේ? **ලක්ඛණ ධාතු.** ලක්ඛණ කියන එක ලක්ෂණ, ගති. තද ගතිය කියන එක ගතියක්. හඳුනාගන්න පුළුවන් ගතියක්. රස්නෙ ගතිය, තේජෝ ගතිය. මේ හිත දැනගන්න ගති.

හඳුනාගන්න පුළුවන්. මේ අපේ ආයතනවලට අහුවෙන ගති ටිකක්. ඒ විදියට සතර මහා ධාතු හඳුනගන්න කොට ලක්ඛණ ධාතු.

**ආරම්මණ ධාතු** - ආරම්මණ කියන්නේ මොනවාද? අරමුණු වෙන මට්ටමේ දී. ඕක පොතේ නම් සඳහන් වෙන්නේ, අටුවාවල එන්නේ අර අපි කසින භාවනා කියලා ජාතියක් කරනවා නේ. කොහොම ද ඒවා කරන්නේ? කසින මණ්ඩලයක් හදල, එළියේ තියාගෙන, ඕක දිහා බලාගෙන, දැන් පාට නම්, කහ පාට නම් කහ පාට හදලා ඕක දිහා බලන් ඉන්නවා. නිල්පාට නම් නිල්පාට දෙයක් හදලා ඕක දිහා බලන් ඉන්නවා. ටිකක් වෙලා බලන් ඉඳලා බලන් ඉඳලා හොඳට හිතට ගන්නවා ඕක, ඒක විතරක් එන විදියට බලන් ඉන්නවා. ඊට පස්සේ ඇස් දෙක වහනවා. වහලත් අරක පේනවාද බලනවා. ඔහොම ඉතින් ඕක පුරුදුකරන කොට පුරුදුකරන කොට මොකද වෙන්නේ, ඇස් වහගෙනත් අර කසින මණ්ඩලයම පෙනෙන ගානට ගන්න පුළුවන්. දැන් පෙනෙන්නේ ආරම්මණ ධාතුවක්. අරමුණක්. ඔය විදියට තමයි ඒ පොතේ සඳහන් වෙන්නේ. හැබැයි අපි ඊට වඩා එහාට දකින්න ඕන ඕක.

අපට මොකක් හරි පෙනෙන කොට, අරක ඇස් වහගෙන නේ, ඇස් ඇරගෙනත් ඔය ආරම්මණ ධාතුව එන්න පුළුවන්. අපට ගිනි ගොඩක් පෙනෙනවා. දැන් හිතනවා හරී රස්නෙයි, පිච්චෙනවා. තේජෝ ධාතුව කොහෙද එතකොට හටගත්තේ? ඇඟැට දැනුනාද රස්නේ? චිත්තයේ. හිතට පෙනුනා ධාතු ගතියක්. ඒකත් අරෙහෙ තියෙනවා කියලා හිතෙන්නේ. අර ගිනි ගොඩේ හරි රස්නේ ඇති. දැන් රස්නේ ආරම්මණ ධාතුවක් වෙලා. උඩරට පැත්තේ ගිහිල්ලා, දිය ඇල්ලක් දිය පාරක් දකින කොට ඔය වතුර හරී සීතල ඇති කියලා හිතලා මෙහේ ඉඳන් වෙවුලනවා. සීත ගඟුල දැකලා මෙහේ ඉඳන් වෙවුලනවා. අල්ලලා බලලා නෙවෙයි. ඒ වගේ එකක් තියෙනවා. ඔන්න ඔය මට්ටමෙන් එන්න පුළුවන්. ඔය වගේ එතකොට ඒ ධාතු සතර ආකාරයකින් සඳහන් වෙනවා.

එතකොට ඔය ධාතු ගැන අහලා දැනගත්ත ටික සුතමය ඥානය. ඔය ටික කියන කොට හරී ලස්සනට මේ එළියේ තියෙන ඒවා මැවිලා පේනවා. සතර මහා ධාතුවෙන් හැදිලා තියෙන රූප. දැන් ඔතන ලෝකයට අයිති දැක්මකුත් තියෙනවා, ලෝකෝත්තර දැක්මකුත් තියෙනවා. ඔය ධාතු කියලා කථා කරන්නේ රූප ගැන. ඒ කියන්නේ සතර මහා ධාතුවයි ඕවයේ උපාදය රූපයි නේ රූප කියලා කියන්නේ. ඔය රූපය පිරිසිඳ දකින්න අපට ඔන්න බුදුරජාණන් වහන්සේ පෙන්නනවා භාවනාවක යෙදෙන්න. අර කිච්චේ ත්‍රිලක්ෂණය. එයින් එකක් තමයි අනිච්ච සංඥාව. එතකොට අපි ලෝකයට අයිති අනිච්ච සංඥාව දන්නවා. මොකක්ද, අර එළියේ තියෙනවා

රූපයක්, ඕක වෙනස් වෙනවා. හැබැයි බුදුහාමුදුරුවෝ පෙන්නන අනිච්ච සංඥාව නම් ඊට වඩා වෙනස්. අර එළියේ තියෙන දේ වෙනස් වෙනවා කියන එක ලෝකයට අයිති ප්‍රතිපදාවක්. ඒකට අපි කියනවා පූර්ව ප්‍රතිපදාව කියලා. ශරීරයක් තියෙනවා, වෙනස් වෙලා යනවා. ඇහැ, කන, නාසය ඒවා තියෙනවා. ඒ තිබුණාට ඕක වෙනස් වෙනවා. අපට ඉතින් සතර ඉරියව්වේම පවතින ඇහැක් තියෙනවා. ඉඳගෙන ඉන්නකොටත් ඇහැ තියෙනවා, නිදාගෙන ඉන්නකොටත් ඇහැ තියෙනවා. නින්ද ගියහම තියෙනවාද දන්නේ නැහැ නේ. තිබිලා තියෙනවා නේ. නැත්නම් ඇහැ ඇරිනකොට තියෙන්න විදියක් නෑ නේ. ඇවිදිනකොට, සක්මන් භාවනාව කරන කොට ඇහැ තිබුණා ද? සතර ඉරියව්වේම පවතින ඇහැක් තියෙනවා. ඔය තියෙන ඇහැ ඉතින් අපි බලනවා, අනිත්‍යයි, වෙනස්වෙනවා. ඔය ඇහැ කවදද හම්බවුනේ? උපදින කොට යි. කවදද නැතිවෙන්නේ? මැරෙණ කොට යි. ජීවිත කාලයටම තියෙන ඇහැක් තියෙනවා. ඉතින් බලන්න හදනවා 'ඔය තිබුණාට ඕක වෙනස් වෙනවා නේ. වෙනස් වෙනවා තමයි. කවුද වෙනස් වෙන්නේ නෑ කිව්වේ? ශරීරය බැලුවත් වෙනස් වෙනවා. පොඩි කාලයේ හිටිය හැටි නෙවෙයි දැන්. තව ටිකක් වයසට යනකොට එහෙම වෙනවා. කොයි වෙලාවෙද වෙනස් වෙලා තියෙන්නේ? හැම මොහොතෙම. ක්ෂණයක් ක්ෂණයක් පාසා, මොහොතක් මොහොතක් පාසා වෙනස් වෙනවා.'

හැබැයි ඕක දැක්කාට නිවන් දකින්න නම් බැහැ. ඉස්සරත් ඕක බලලා තියෙනවා. ඒ කාලයේ තිබුණු ඒවා බුදුදහමට එකතුවෙලා තියෙනවා. එකතු කරලා තියෙනවා.

එහෙම බලන්නත් ඕන. ඒකෙත් ප්‍රයෝජනයක් තියෙනවා. මොකද, ඒ බැලීමෙන් අපේ නීවරණ යටපත් කරන්න පුළුවන්. ලොකු තරහක් තිබුණා නම් ඕක අඩුකරලා දෙන්න පුළුවන්. තරහකාරයා අනිත්‍යයි, අනිත්‍යයි කියලා බැලුවහම තරහ පොඩ්ඩක් අඩුකරගන්න පුළුවන්. අර මම කියනවා නේ වතුරට එබෙන බල්ලා දැන් බුරන්නේ තරහ අරං ද නැද්ද? තරහ අරං. කවුරු එක්ක ද? වතුරේ ඉන්න බල්ලා එක්ක. බල්ලෙක් වතුරට එබිලා බුරන්නේ වතුරේ ඉන්න බල්ලා එක්ක තරහ අරං නේද? ඌ ටිකක් මොලේ තියෙන බල්ලෙක් නම් අපට පොඩ්ඩක් ඌට භාවනාව උගන්වන්න පුළුවන්. අපි කරන භාවනාව. ඔය වතුරේ ඉන්න බල්ලා හිටියාට ඕකා වෙනස් වෙනවා. අනිත්‍යයි. අනිත්‍ය බල්ලෙක්. ඌ අනිත්‍ය බැලුවොත්, 'ඔය බල්ලා වෙනස් වෙනවා. මොකටද මම තරහ ගන්නේ' කියලා තරහා අඩුකරගන්න පුළුවන්. බැරිකමක් නෑ. ඇලීමක් තිබුණා නම් ඇලීම අඩුකරගන්න පුළුවන්. ඇලීම් ගැටීම් අඩුවෙනවා අනිත්‍යය බලනකොට, ඒ වෙනස්වෙනවා කියලා බලනකොට.

නමුත් මුළාව දුරුවෙයි ද? වෙන්නේ නෑ. ඔන්න ඕක තමයි තේරුම්ගන්න ඕන. තියෙන දෙයක් වෙනස්වෙනවා කියලා බැලුවාට අපි දැන් තියෙනවා කිච්චේ කොහොමද කියන එක බැලුවේ නැහැ නේ. වතුරේ බල්ලෙක් පිහිටියේ කොහොමද කියන එක හෙව්වේ නැහැ නේ. ඉන්න බල්ලා වෙනස් වෙනවා. නැත්නම් බලන්න පුළුවන් ඔය ඉන්න බල්ලා මොනවායින් ද හැදිලා තියෙන්නේ? කෙස්, ලොම්, නිය, දත් ඕවායින් හැදිලා තියෙන්නේ. එහෙම නැත්නම් ඒ කෙස්, ලොම්, නිය, දතුත් හැදිලා තියෙන්නේ සතර මහා ධාතුන්ගෙන්. ධාතු මනසිකාරයත් වඩත හැකි යි. දැන් මොනවාද ඕවායින් අඩුවෙන්නේ? ඇලීම්, ගැටීම්. මෝහය? අවිද්‍යාව දුරුවෙයි ද? දැන් තේරෙනවාද, ඒ විදියට බලලා නම් නිවන් දකින්න බැහැ.

මේ ශරීරයේ තියෙන්නේ ධාතු කලාප ගොඩක්. රූප කලාප ගොඩක්. සතර මහා ධාතු. ඕක වෙනස් වෙනවා. ඕකේ ත්‍රිලක්ෂණය බලලා නම් ඇත්ත අවබෝධ වෙයි ද කියන එක නම් වෙනම හොයන්න ඕන. ඒකට තමයි දහමක් අහලා නුවණින් හොයන්න කියන්නේ. කරන්නත් වාලේ කරගෙන ගියාට හරියන්නේ නැහැ. අපට දහමක් අහන්න ලැබිලා තියෙනවා. නුවණ තියෙනවා.

බුදුහාමුදුරුවෝ කියන්නේ, ඔය නුවණින් විමසන්න මේ දහම. දහමට විනයට ගළපලා බලන්න ඔය හිතාගෙන ඉන්න එක හරි ද කියලා. අපි හිතාගෙන ඉන්නවා, ත්‍රිලක්ෂණය වැඩුවහම ඉතින් හරි මේ නිවන් අවබෝධ වෙයි. අවබෝධ වෙනවා නම් දැන් අවබෝධ වෙන්න කලුත් ඇති ඔය වඩපු විදියට. තවම වැඩුවා මදි කියලා තමයි හිතෙන්නේ. තව ටිකක් ඕකම කර කර ඉන්න ඕන. ඉතින් ඔය නිසා තමයි අපි ඊට වඩා මේක නුවණින් විමසන්න ඕන. සම්මා දිට්ඨිය ඇතිකරගන්න ඕන. දහමක් අහලා නුවණින් දකින්න. අහගත්ත දේ හරිද කියලා තමන්ට ප්‍රත්‍යක්ෂ කරගන්න ඕන. එහෙම කෙනාට තමයි මාර්ගයක් වඩන්න පුළුවන්.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u> :- ඕක වෙනස්වෙන බව දැක්කම කියමු. ඔය විද්‍යාඥයෝ දකිනවා නේ නොයෙක් උපකරණ හොයාගෙන, කියනවා නේ වෙනස් වෙනවා කියලා. දැන් නීල්බෝ එහෙම කියල තියෙනවා. එක දෙය දෙපාරක් දකින්න බැහැ කියලා. ඒ තරම් වේගයකින් වෙනස්වීමක් මේකේ තියෙන්නේ. නීල්බෝ කියලා තියෙනවා ඒක. අර පරමාණුවේ ආකෘතිය හොයාගත්තේ. එයා වෙනස්වීම දැක්කේ බාහිරෙන්, තමන් තුළින් නෙවෙයි. වෙනස්වීම දැක්කා කියලා ලෝකයෙන් එතෙරවෙන්න හම්බවෙන්නේ නෑ. ඇයි? වෙනස්වෙන බව දැනගන්නේ කවුද? මම. 'ආ මම අලුතෙන් දෙයක් හොයාගත්තා' කියලා කියන්න නම් පුළුවන්. සක්කාය දිට්ඨිය. එතකොට අපි අඩුගානේ සක්කාය දිට්ඨියවත් කැඩෙන මාර්ගයකටවත් වැටෙන්න

ඕන. එළියේ තියෙන දෙයක් වෙනස්වුනා කියලා ඕක කැඩෙන්නේ නෑ. වතුරට එබෙන බල්ලා, අර බල්ලා කොච්චර වෙනස් වෙනවා කියලා කිව්වත්, ඔය සතර මහා ධාතුවෙන් හැදිලා තියෙන්නේ කිව්වත්, කොච්චර දැක්කත්, සෝවාන් වෙන්න නම් හම්බවෙන්නේ නෑ. බල්ලෙක් හින්ද බැහැ කියලා කියයි. අපි ඕක කළොත්, අපිත් අර පෙනෙන දේ තියෙනවා කියලා නේද හිතාගෙන ඉන්නේ? ඒ තියෙන දේ කඩලා බිඳලා බැලුවොත්, ඕක වෙනස් වෙනවා, වෙනස් වෙනවා කියලා බැලුවොත්, මොනවා හරි අවබෝධ වෙයි. සක්කාය දිට්ඨිය කැඩෙයි ද? ඒක තමයි නුවණින් හොයන්න ඕන. අඩුම ගානේ අපි සක්කාය දිට්ඨිය කැඩෙන මාර්ගයකටවත් වැටෙන්න ඕන නේද? නැත්නම් දහමක් අහලා ප්‍රයෝජනය ගත්තේ නෑ. ක්ෂණ සම්පත්තියෙන් ප්‍රයෝජනය ගත්තේ නෑ.

එහෙම නම් අපිට දැන් හොයන්න තියෙනවා, හොයන්න උදව්වෙන්න බුදුරජාණන් වහන්සේ දේශනා කරලා තියෙනවා, ස්කන්ධ විදියට බලන්න, ආයතන විදියට බලන්න, ධාතු විදියට බලන්න. ස්කන්ධ, ආයතන, ධාතු. ඉතින් ඕවා බලන්නත් පුළුවන්. මේවා තියෙන දේවල් විදියට බලන්නත් පුළුවන්. එළියේ තියෙන දේවල් විදියට, මොනවායින් හරි හැදිලා තියෙන දේවල් විදියට බලන්නත් පුළුවන්. ඒ බැලීම ලෝකයට අයිති දැක්මක්. ඕක තමයි පූර්ව ප්‍රතිපදාව කියන්නේ.

ඊළඟට ආර්ය ප්‍රතිපදාව වෙන්නේ ඒවා කොහොමද හටගත්තේ? සමුදය මොකක් ද? නිරෝධය, නැත්නම් අත්ථඞ්ගමය මොකක් ද? කියන එකත් බලනවා. ඕකට තමයි බුදුදහමේ හැටියට අනිත්‍ය සංඥාව[1] වඩනවා කියලා කියන්නේ. රූපය ගැන බලනවා නම්, රූපයේ අනිච්ච සංඥාව. රූපය කියන්නේ මෙන්න මේකයි. **ඉති රූපං.** ඒ රූපය හටගත්තේ මෙහෙමයි. **ඉති රූපස්ස සමුදයො.** ඒ රූපය නැතිවෙන්නේ - **අත්ථඞ්ගමො** මෙන්න මෙහෙම යි. මේ සමුදය නැත්නම් මේක පිහිටන්නේ නෑ. අන්න එහෙම නුවණක් එන විදියට බැලුවොත් නම් අර බල්ලා ඕක කළත් අවබෝධ වෙන්න ඕන. බල්ලෙක් පිහිටියේ බල්ලා කියන්නේ මේක. ඌ එළියේ ඉන්නවා කියලා හිතන එක. ඒක පිහිටියේ කොහොම ද? සමුදය මොකක් ද? මේ සමුදය නො යෙදුනා නම් ඕක පිහිටන්න බැහැ, කියල බැලුවොත් මෝහය දුරුවෙයි. පටිච්චසමුප්පන්න බවක් පෙනෙන්නේ. මේ හේතු ප්‍රත්‍යයන් නිසාමයි ඔහොම විද්‍යමාන වෙන්නේ. හේතු ප්‍රත්‍යය යෙදෙන කොට ඵලය තියෙනවා.

---

[1] අනිච්ච සඤ්ඤා සූත්‍රය, සංයුක්ත නිකාය, ඛන්ධ වග්ගය, ඛන්ධ සංයුක්තය, පුප්ඵ වර්ගය

**<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>** :- දැන් ඕක අතීතය ද කියලා අහන ප්‍රශ්නයට, අතීතය ගෙවිලා ඉවරයි. අනාගතය පැමිණිලා නෑ. අතීතය ගැන බලලා වැඩකුත් නෑ, අනාගතය ගැන බලලා වැඩකුත් නෑ. **පච්චුප්පන්න** වර්තමානය ඒ ඒ මොහොතෙදී විදර්ශණය කරන්න. **තත්ථ තත්ථ විපස්සති. පච්චුප්පන්න යො ධම්මං තත්ථ තත්ථ විපස්සති**[2]. අතීතය ගෙවිලා ඉවරයි, අනාගතය පැමිණිලා නෑ, වර්තමානයේ ඒ ඒ ධර්මතාවය ඒ ඒ තැන විපස්සනය, විදර්ශණය කරන්න, නුවණින් දකින්න. ඇත්ත ඇති හැටි දකින්න. **පච්චුප්පන්න යො ධම්මං තත්ථ තත්ථ විපස්සති.** ඕක තමයි මාර්ගය විදියට පෙන්නන්නේ. හැබැයි විදර්ශණය කරන්න නුවණක් ඕන. අන්න බල්ලෙක් ඉන්නවා, එහෙම කිය කියා බැලුවාට විදර්ශණය වෙන්නේ නැහැ. ඔය බල්ලා කෙස්, ලොම්, නිය, දත්වලින් හැදිලා තියෙනවා කියලත් බලන්න පුළුවන්. ඔය බල්ලා සතර මහා ධාතුවෙන් හැදිලා තියෙනවා කියලත් බලන්න පුළුවන්. බල්ලාගේ සංඥාවෙන් මිදෙන්න කෙස්, ලොම්, නිය, දත් අල්ලාගන්නවා. කොටස් ටික. ඒ කොටස්වලින් මිදෙන්න සතර මහා ධාතු අල්ලාගන්නවා. දැන් මොකටද අහුවුනේ? සතර මහා ධාතුවට යි. එළියේ සතර මහා ධාතුව තියෙනවා. ඒක අත්දකින්න මේ පැත්තේ 'මම' ඉන්නවා. එකකින් එකකට පැනලා විතරයි නේද?

තව පැත්තකින් බැලුවොත් අපි ඉන්නේ මොන භූමියේ ද? කාම භූමියේ. කාම භූමියෙන් මිදෙන්න පුළුවන් රූප භූමියට යන කොට. ධ්‍යාන වඩලා යන්න පුළුවන් නේ. ධ්‍යාන වඩද්දී මොකක් ද කරන්නේ? අපි රූප භූමිය අරමුණු කරනවා. එතකොට මේ කාම භූමියෙන් මිදෙනවා. රූපයෙන් මිදෙන්න ඊළඟට අරූපය අරමුණු කරනවා. අරූපයේ හිත තිබ්බහම රූපයෙන් මිදෙන්න පුළුවන්. රූපයට හිත යන්නේ නැති මට්ටමට සමාධිය දියුණුවෙන කොට අරූපයේ හිත තියලා රූපයෙන් මිදෙනවා. කාම භූමියෙන් මිදෙන්න රූප භූමියේ හිත තියනවා. රූප භූමියෙන් මිදෙන්න අරූප භූමියේ හිත තියනවා. අරමුණු කරනවා. එතකොට ඒ අරමුණ බලවත් වෙනකොට ඒ කියන්නේ අනිත් ඒවාට දුවන්නේ නැති තරම් සමාධිය බලවත් නම් ඒ ඒ ධ්‍යානවලට සමවදින්න පුළුවන්. අරූපයෙන් මිදෙන්න මොකක්ද කරන්න ඕන? හිත තියන්න තැනක් නෑ. කාම භූමියෙන් මිදෙන්න රූප භූමියේ හිත තිබ්බා. ඒ කියන්නේ සතර මහා ධාතුවේ හිත තිබ්බා නම් කාමයෙන් මිදෙන්න පුළුවන්. ඔක්කෝම හැදිලා තියෙන්නේ සතර මහා ධාතුවලින් කිව්වහම ඕක හරියට දකිනකොට කාම භූමියට අහුවෙන්නේ නැහැ. ධාතුවේ හිත තියලා එතකොට රූප භූමියට

[2] භද්දේකරත්ත සූත්‍රය (මජ්ඣිම නිකාය, උපරි පන්නාසකය, විභඞ්ගවර්ගය)

යන්න පුළුවන්. රූපයෙන් මිදෙන්න අරූපයට හිත තිබ්බහම, එළියේ මොකුත් නෑ, සතර මහා ධාතුවත් නෑ කියලා ඔන්න හිත විතරයි තියෙන්නේ. ආකාසානඤ්චායතනය වෙන්න පුළුවන්. විඤ්ඤාණය විතරයි තියෙන්නේ කියලා විඤ්ඤාණඤ්චායතනය ඒක අරමුණු කරන්න පුළුවන්. හිස් දෙයක් කියලා, මොකුත් නෑ කියලා අරමුණු කරලා ආකිඤ්චඤ්ඤායතනයට යන්න පුළුවන්. ඇත්තෙත් නෑ, නැත්තෙත් නෑ ගතියට ගියහම නෙවසඤ්ඤානාසඤ්ඤායතනය. ඕකේ තමයි ගිහිල්ලා අන්තිමට ඉන්නේ. හිත තියන්න පුළුවන් ඔච්චරයි. අරකෙන් මිදෙන්න හිත තියන්න තැනක් දන් නෑ.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u> :- ඒවා හැමෝටම බැහැ ඉතින්. ඒක ලොකු උත්සාහයක් යොදලා, සිත එකඟ කරගෙන සමාධිය බොහොම අමාරුවෙන් හදාගෙන කරන්න ඕන දේවල්. ඒවායින් පුළුවන් කෙලෙස් යටපත් කරන්න. කාමයන් යටපත් කරන්න. පඤ්චකාමය යටපත් කරන්න පුළුවන්. ඒවායේ ඉන්න තාක් කල් කෙලෙස් මතුවෙන්නේ නෑ. බොහොම උසස්. උසස් වුනාට ආයෙ එනවා මේවාටම. ඒ ගතිය නැතිකරලා නෑ. අවිද්‍යාව නැතිවෙලත් නෑ, අනුසය නැතිවෙලත් නෑ. කෙලෙස් මට්ටම් හැංගිලා තියෙනවා. ඕවා කොච්චර යටපත් කරගෙන හිටියත් ආයේ සතර අපායට යන ගතිය නැතිවෙලා නෑ. මේ තිස්එක් තලයේ ආයෙ ආයේ උපදින එක, සංසාරයේ යන ගතිය නැතිවෙලා නෑ. ජරා මරණ ආදි ඕවායින් මිදිලා නෑ.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u> :- අනුසය කියන්නේ, දන් තරහා තියෙනවාද? නෑ. මේ වෙලාවේ තරහ නෑ. දන් හෙව්වොත් හොයාගන්න පුළුවන් වෙයිද අනුසයක්වත්. බැහැ. මේ වෙලාවේ බැහැ. හැබැයි තමන්ට තරහා යන ගතිය සම්පූර්ණයෙන්ම නැතිවෙලා ද? ඒත් නෑ. කොහෙන් ද ඒ එන්නේ? අනුසය. අනුසය කියන්නේ ඔන්න ඕකට යි. මතුවෙන්න තියෙන හැකියාව නැතිවෙලා නෑ. මේ මොහොතේ හෙවුවොත් හොයාගන්නත් බැහැ. හැබැයි හටගන්න තියෙන හැකියාව දුරුවෙලා නෑ. ඒකයි කියන්නේ තාම අවිද්‍යාවෙයි ඉන්නේ කියලා. අවිද්‍යාව සම්පූර්ණයෙන්ම දුරුවුන දවසකට තමයි, රහතන්වහන්සේට විතරයි කියන්න පුළුවන් තවත් කළ යුතු දෙයක් නෑ. නැවත උපදින්නේත් නෑ. **කතං කරණීයං.**

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u> :- කොහේ හිටියත් ඕක ඔහොමම තමයි. ඒ ටිකේ යටපත් වෙලා. මාර්ගඵල ලබලා නම් කතාව වෙනස්. අනාගාමී කෙනෙක් නම් ආයෙ එන්නේ නෑ. අනාගාමී කියන්නේම ආයෙ එන්නේ නෑ කියන එකයි. **ආගාමී - අනාගාමී. ආගාමී** කියන්නේ ආයෙ එනවා. **අනාගාමී** කියන්නේ ආයෙ එන්නේ නෑ. එතකොට අපි යටපත් කරගත්තාට

හරියන්නේ නැහැ. අනුසය තිබුණොත් ආයෙ එනවා. සතර අපායටත් යන්න පුළුවන්. අලුයට සැඟවුනු ගිනිපුපුර වගෙයි කියන උපමාව කිව්වාට, මේක අර ඒ වෙලාවෙ හෙව්වාට හොයාගන්නත් බැහැ. මතුවෙන ගතිය නැතිවෙලත් නෑ.

<u>**ප්‍රශ්නයකට පිළිතුරක්**</u> :- ස්කන්ධ, ආයතන, ධාතු, ත්‍රිලක්ෂණය බැලීම පූර්ව ප්‍රතිපදාවෙත් තියෙනවා, ආර්ය ප්‍රතිපදාවෙත් තියෙනවා. තමන්ගේ ප්‍රඥාව කොච්චර වැඩිලාද, සම්මා දිට්ඨිය කොච්චර තියෙනවාද කියන එක අනුව යි ඒක වෙනස් වෙන්නේ. දහමක් අහල තේරුම් අරන් නම් ඒක ආර්ය ප්‍රතිපදාව වෙනවා.

<u>**ප්‍රශ්නයකට පිළිතුරක්**</u> :- හරියට සම්මා දිට්ඨිය තිබුණොත් එකක් බැලුවහම ඇති. අනිත්‍යය බැලුවහම ඇති. හැබැයි ඒ සම්මා දිට්ඨිය ඇතුව. එළියේ තියෙන දේ වෙනස් වෙනවා කියන එක නෙවෙයි. ඒකට බුදුරජාණන් වහන්සේ කියන්නේ **විපරිණාමය** කියලා. වෙනස් වෙනවා කියන එකට විපරිණාම වෙනවා කියනවා. එතකොට විපරිණාම දුක්ඛ කියලා එකක් තියෙනවා. වෙනස්වීම නිසා ඇතිවෙන දුකක් තියෙනවා. ඒක වැරැදි නෙවෙයි. එහෙම දෙයකුත් තියෙනවා. ඒකයි ඒක බැලුවහම යටපත් කර ගන්න පුළුවන් කෙලෙස් තියෙනවා.

<u>**ප්‍රශ්නයකට පිළිතුරක්**</u> :- රහත් වෙන්න නම් උපාදානය නැතිවෙන්න ඕන නේ. තිබුණොත් දුක නැතිවෙලා නෑ නේ. නැතිකරන්න මාර්ගයක් දේශනා කරලා තියෙනවා. ඒක තමයි බුදුකෙනෙක් පැහැදිළි කරලා දෙන්නේ. බැහැයි කියලා නෑ. පුළුවන්. පුළුවන් වෙන්නේ මාර්ගය වඩන කෙනාට යි. මාර්ගය වඩන්න පුළුවන් දහමක් අහලා තේරුම් ගත්ත කෙනාට යි. **සම්මා දිට්ඨිය** ඇතිකර ගත්තු කෙනාටයි. සිතුවිලි හටගන්න එක නවත්තන්න හම්බ වෙන්නේ නෑ. දුක හටගන්න එක නවත්වන්න පුළුවන්.

<u>**ප්‍රශ්නයකට පිළිතුරක්**</u> :- පුළුවන් ද, ඒක මගෙන් අහලා හරියන්නේ නෑ. තමන් කරලා බලන්න ඕන. දැන් ඒවා තේරුම්ගන්න තමයි අපි ඉන්නා මුළාවන් ටික හඳුනගන්න ඕන. ධාතුන්වල දකින්න පුළුවන් අවස්ථා හතරක් තමයි ඔය කිව්වේ. ඔය හතරම එළියේ තියෙන ලෝකයට අහුවෙලා දකින්නත් පුළුවන්. බාහිර දේවල් වලින් ඕක දකින්නත් පුළුවන්. එහෙම නැත්නම්, හිතෙන් හදලා දෙන ඒවායින් ඔය ටික දකින්නත් පුළුවන්. සම්මුති හෝ **සසම්භාර** කියන කොට, එළියේ තියෙන දෙයක්මනේ. ඒවා ගිහින් පිහිටන්න තැනක් නේ කියන්නේ. ඒ විදියට ධාතුන් තියෙනවා කියලා හිතන්නත් පුළුවන්. එහෙම නැත්නම් අර **ලක්ඛණ හෝ ආරම්මණ ධාතු** පැත්තෙන් ගත්තහම මේවා මේ හිතෙන්

හදලා පෙන්නන ඒවා නේ, අපි ඔය එළියේ තියන්නේ. එහෙම දකින්නත් පුළුවන්. දැනට හිතන් ඉන්නවා අරකට වඩා මේක හරි කියලා. එළියෙ මොකුත් නෑ. හිතෙන් හදන එක තමයි එළියේ තියෙන්නේ. එහෙම නේද දැන් හිතාගෙන ඉන්නේ? එළියෙ මොකුත් නෑ. හිතෙන් හදන එක තමයි එළියෙන් තියන්නේ. හරි ද? එළියේ මොකුත් නෑ කියන එක හරි ද? ඒක වැරදි යි. වැරදියි කියන්නේ ඇයි? එළියේ දෙයක් තියෙනවා ද? එළියේ දෙයක් තියෙනවා කියන එක හරි ද? තියෙනවා කියනවා **සසම්භාර** ධාතුවට හිතලා. ඒවා තියෙනවා කියලා දැනගත්තේ කොහොම ද? එළියේ තියෙන හින්ද ද දැනගත්තේ?

එක පැත්තකින් තේරුම් ගන්න, බාහිර දෙයක් තියෙනවා කිව්වත්, නෑ කිව්වත් ශාස්වතයි, උච්ඡේදයි කියලා නම් දෙකකුත් තියෙනවා. ඕවයේ එහෙට මෙහෙට පනිනවා. ඕක තමයි අපට වෙලා තියෙන්නේ. එකකින් බේරෙන්න අනිකට පනිනවා. බුදුහාමුදුරුවෝ කච්චායන හාමුදුරුවන්ට කියනවා[3], 'කච්චායන, මේ සත්ත්වයා හටගන්නා හැටි දකින හින්ද තියෙනවා කියනවා. ඒ මතයට යනවා. දෘෂ්ටියට යනවා. නිරුද්ධවෙනවා දැකලා නැහැ කියනවා. මතයකට යනවා, දෘෂ්ටියකට යනවා. ශාස්වතයි, උච්ඡේදයි'. තථාගතයෝ ඔය දෙකටම නො පැමිණ පටිච්චසමුප්පාදයක් දේශනා කරනවා. පටිච්චසමුප්පාදය දැක්කා නම් ඔය එකකටවත් වැටෙන්නේ නැහැ. ඕක දැකලා නැති හින්ද තමයි එහාට මෙහාට පැන පැන ඉන්නේ. එක්කෝ තියෙනවා කියයි, තියෙනවා කියන එකෙන් මිදෙන්න, නෑ කියයි.

මම මුලින්ම කිව්වා මොනවාහරි දෙයක් දැනගත්තා නම් දැනගෙන තියෙන්නේ ආයතන හයෙන්. එක ආයතනයකටවත් පුළුවන් ද එළියේ තියෙන්නේ මොකක් ද කියලා කියන්න? ඇහැට පුළුවන් ද එළියේ තියෙන්නේ මේකමයි කියලා කියන්න? ඒක කියන්න ගිහිල්ලා තමයි අර බල්ලා වතුරට එබිලා බුරන්නේ. නැත්නම් මිරිඟුව දැකලා, වතුර තියෙනවා කියලා වතුර පස්සේ එළවන්නේ ඇහෙන් දැකලා, රැවටිලා. දැකපු දේ තියෙනවා කියන මුළාවට ගිහිල්ලා. ඒ කියන්නේ, බාහිර තියෙන දෙයම තමයි මේ දැනගත්තේ, කියන මුළාවට ගිහින්. එතකොට අපි ඇහෙන් බලලා මොනවා හරි එළියේ තියෙනවාමයි කියලා කිව්වොත්, ඔය තියෙන දේ මයි දැනගත්තේ කිව්වොත් ඒක මුළාවක්. මොකද, දැන් අපි දන්න විද්‍යාවෙනුත් ඕක තේරුම්ගන්න පුළුවන්. බුදු දහමට නො ගියත්. ඇහැට පුළුවන් මොකක් ද? වර්ණ ප්‍රතිබිම්බයක් හදලා දෙන එක විතරයි. මේ ඇහේ කාචයක් තියෙනවා ඒකෙන් හැදෙන්නේ ප්‍රතිබිම්බයක්.

[3] කච්චානගොත්ත සූත්‍රය (සංයුක්ත නිකාය, නිදාන වර්ගය, අභිසමය සංයුක්තය, අහාර වර්ගය)

දෘෂ්ටිවිතානයේ ප්‍රතිබිම්බයක් හැදෙනවා. වර්ණ සටහනක් වැටෙනවා. හිත දකින්නේ එළියේ රූපය ද, ඔය හදන වර්ණ ප්‍රතිබිම්බය ද? මේ දෘෂ්ටිවිතානයේ වැටෙන වර්ණ ප්‍රතිබිම්බයමයි හිතට දකින්න පුළුවන්. දැනගන්න පුළුවන්. එතකොට ඒක සතර මහා ධාතු ද? නෑ. ඒක ප්‍රතිබිම්බ මාත්‍රයක් විතරයි. එළියේ තියෙන රූපය නම් සතර මහා ධාතු කියන්න පුළුවන් නේ. මේක නිකම් වර්ණ ඡායාවක් විතරයි. අර කන්නාඩිය ඇතුළේ ප්‍රතිබිම්බය වගෙයි. කන්නාඩිය ඇතුලේ ප්‍රතිබිම්බය අපට අල්ලන්න පුළුවන් ද? බැහැ. ඒකේ සද්දයක් අහන්න පුළුවන් ද? බැහැ. රසක් බලන්න පුළුවන් ද? බැහැ. කරන්න පුළුවන් එකම දේ මොකක් ද? දකින එකයි. දැකීමට අමතරව, රූපයකට අදළයි කියන වෙන එකම ලක්ෂණයකටවත් අහුවෙන්නේ නෑ. ඇහෙන් දැකලා දැනගන්න බැහැ.

රූප විසිඅටක් තියෙනවා නම් ඕකෙන් එකක් තමයි වර්ණ රූපය. උපාදය රූපවලින් එකක්. දැන් ඇහැට අහුවෙන්නේ වර්ණ රූපය. අපි ඇහැ පාවිච්චි කරලා නම් දැනගත්තේ වර්ණ රූපයට අමතරව ඔය විසිඅට තුළ ඉතුරු විසිහතෙන් එකක්වත් අහුවෙනවා ද? ඇහැට පුළුවන් වර්ණ රූපය දැනගන්න විතරමයි. ඉතුරු විසිහතම ඇහැට අහුවෙන්නේ නෑ. පඨවි අහුවෙනවා ද? අපෝ අහුවෙනවා ද? තේජෝ අහුවෙනවා ද? රස්නෙයි කියලා අහුවෙනවා ද ඇහැට? නැහැ. ඇහැට හැකියාව තියෙන්නේ වර්ණය දැනගැනීම විතරයි. දැකීමේ මට්ටම විතරයි. ඉතුරු රූප විසිහතම අහුවෙන්නේ නෑ. ඒවා කොහාට ද අහුවෙලා තියෙන්නේ? හිතටයි. හිතෙන් නේද දැනගෙන තියෙන්නේ? ඕක ගැන හිතලා නේද අනික් කරුණු ටික කියන්නේ? වර්ණ ධාතුව විතරයි ඇහැට අහුවෙන්නේ. එතකොට ඒ විසිඅට දන්නේ නැතිවුනත්, දැන් විද්‍යාවෙන් කිව්වොත්, ප්‍රතිබිම්බයක් හදලා දීලා. ඔය ප්‍රතිබිම්බය නේද හිතට දැනගන්න පුළුවන්. දැන් ඔය ප්‍රතිබිම්බය දිහා බලලා, එළියේ තියෙන්නේ මේකයි කිව්වොත් වැරදියි. එළියේ මොකුත් තියෙනවා කිව්වත්, ඒක මතයක්. දැකලා තියෙන්නේ ප්‍රතිබිම්බය; ඕක දිහා බලලා එළියේ තියෙන දෙයක් ගැන කියනවා. ඒක මතයක්. ඒ මතයක් කියන එකට තමයි දෘෂ්ටියක් කියන්නේ. ඇත්ත ඇති හැටි නෙවෙයි. හිතෙන දෙයක් මේ කියලා තියෙන්නේ. ඕක දැකලා එළියේ දෙයක් නෑ කිව්වොත්? ඒකත් දෘෂ්ටියක්. තියෙනවා ද, නැද්ද කියන එක මෙතැන අහුවෙන්නේ නෑ. බාහිරයට ගිහින් නෑ නේ. ඇහැට පුළුවන්, ඇහේ කෘත්‍යය අපි හඳුනගන්න ඕන. ඇහැට පුළුවන් වර්ණ ස්වභාවයක් පෙන්නන්න විතරයි. වර්ණ ස්වභාවය දැකලා වෙනින් දේවල් ගැන කතා කරනවා නම්, තියෙනවා හරි, නෑ කියලා හරි මොනවා හරි කියනවා නම්, ඕක මතයක්, දෘෂ්ටියක් මිසක් ඇත්ත ඇති හැටි වෙන්න බැහැ. එහෙනම් තේරෙනවා ද ඇහෙන් දෙයක් දැකලා එළියේ පවතින

ස්වභාවයක් ගැන කියනවා කියන එක දෘෂ්ටියක්. කියන්න බැහැ. අපි තත්ත්වයක නෑ එළිය ගැන කතාකරන්න. එහෙනම් සතර මහා ධාතුව එළියේ තියෙනවා කිව්වත්, දෘෂ්ටියක්. සතර මහා ධාතුව එළියේ නෑ කිව්වොත් එකත් දෘෂ්ටියක්.

ඇත්ත හොයාගන්න නම් ආයතන විදියට බලන්න කියනවා බුදුරජාණන් වහන්සේ. ඔන්න මාර්ගය පෙන්නනවා. ඇහේ කෘත්‍යය හඳුනගන්න; එතකොට අර දෘෂ්ටිවලට වැටෙන්නේ නෑ. ඇහේ කෘත්‍ය වර්ණ ස්වභාවයක් පෙන්වන එකයි. කන්නාඩියේ ප්‍රතිබිම්බයක් දැක්කා වගෙයි. එච්චරයි. ඔය ප්‍රතිබිම්බය අල්ලන්න පුළුවන් ද? රස බලන්න පුළුවන් ද? මොන වගේ ද? රස්නෙ ද, සීතලද කියන්න පුළුවන් ද? එතකොට ඇහේ කෘත්‍යය හඳුනගත්තොත් **දිට්ඨෙ දිට්ඨමත්තං** කියන්නේ මොකක් ද කියලා තේරෙයි. එදට ඕවා තියෙනවා කියන්න යන්නෙත් නෑ, නෑ කියන්න යන්නෙත් නෑ. ඔය දෙකම දෘෂ්ඨි. ඇහෙන් දැකලා විතරක් නම් කියන්නෙ, කියනවා නම් අපට කියන්න වෙනවා ඕක නම් දැනගත්තේ වෙන ආයතනයකින් කියලා. ඇහෙන් පුළුවන් වර්ණයක් ගැන කතා කරන්න විතරයි. අර වතුරේ ඡායාවක් ගැන කතා කරන්න විතරයි. (ටෙලිවිෂන් එකෙත් ඕවා බලලා තමයි අර, දෘෂ්ටි ටිකට ගිහිල්ලා තමයි ඕවා රස විඳින්නේ. ඇහෙන් දැකලා තියෙන්නේ වර්ණය විතරයි.) ඕවා තේරුම්ගන්න තමයි මේ ධර්මය තියෙන්නේ. **තජ්ජො සමන්නාහාරෝ** - මහා හත්ථිපදෙපම සූත්‍රය එහෙම බලන්න ඕන ඕවත් එක්ක මේ ආයතන පිරිසිඳ දකින්න.

<u>**ප්‍රශ්නයකට පිළිතුරක්**</u> :- ඔය විස්තර කරපු ඒවාම තමයි පොතේ තියෙන්නේ, මෙතැනම කියපු ඒවා. ඔතන තියෙන්නේ මේ දකින්නේ මෙතැනින්ම පැන නඟින ස්වභාවයකි **තජ්ජො** කියන්නේ. කොහෙන්වත් ආවාත් නෙවෙයි, එළියේ තිබුණාත් නෙවෙයි. (ශබ්දයක් කරමින්--) මේ සද්දෙ කොහෙන්ද ආවෙ? මෙතැනින්ම පැනනැංගා මිසක්. ඒ හේතු යෙදෙන හින්ද පටිච්ච සමුප්පන්නයි. හේතු ප්‍රත්‍යයන් යෙදුන හින්ද ඒක විද්‍යමාන වුනා. ඒ දැන් කොහේද ගියේ ඒ සද්දේ? කොහේ හරි ගියා කිව්වොත් දෘෂ්ටියක් නේ. පටිච්චසමුප්පන්න බව දැක්කේ නැති කෙනා අහන්න පුළුවන්, 'ඔය සද්දේ දැන් කොහාට හරි ගියා' කියලා. ඒක ඔප්පු කරන්නත් අද උපකරන හදනවා. ඒක පටිගත කරලා මේ තියෙන්නේ කියලා දලා පෙන්නත හැකි යි. අර සද්දෙමද ඒ? නෑ. ආයෙ ඒ වගේ එකක් උපද්දන්න හේතු සකස් කරනවා. එතකොට පහන් දැල්ල වගේ තමයි. පටිච්ච සමුප්පන්න බව, මේ පටිච්චසමුප්පාදය දකින්නයි කියන්නේ ඕකයි. එතකොට ඇත, නැත මොකුත් කතාවලට වැටෙන්නේ නෑ. ධර්මය දකිනවා. ධර්මය දකින්න නම් පටිච්චසමුප්පාදය දකින්න කියන්නේ ඒකම

තමයි. මොනවා කරන්න ද? අපි ධර්මය දකින්නේ නැති එකයි මේ ප්‍රශ්නය. අරක තියෙනවා ද? එළියේ සතර මහා ධාතුව තියෙනවා නේද, මොනවා හරි තියෙන්න ඕන නේද, අපි එළියෙන් හොයන්න යනවා. බුදුහාමුදුරුවෝ කියන්නේ බාහිරෙන් හොයලා නම් ඕක දකින්න බැහැ. කොහෙන්ද හොයන්න කියන්නේ? මේ බඹයක් පමණ ශරීරය තුළින්මයි ලෝකය දකින්න ඕන. ලෝකයයි, ලෝකය හටගැනීමයි, ලෝක නිරෝධයයි, නිරෝධ කරන මාර්ගයයි හතරම තියෙන්නේ මේ බඹයක් පමණ ශරීරය තුළයි (රෝහිතස්ස සූත්‍රය). අපි ඉතින් අර එළියේ තියෙන ඒවායින් හොයන්න යනවා. කඩලා කඩලා රූප කලාප කියයි. සතරමහාධාතු කියයි. ඔහොම කියන අය වැටෙන මත ටික තමයි අර කිව්වේ. සතර ආකාර සතර මහා ධාතු.

ඉතින් කට්ටියක් කියනවා, එළියේ තියෙන දේවල් ගැන කතා කරනවා. ඒකට කියනවා භෞතික වාදය කියලා. එළියේ තියන දේවල් ගැන කතා කරනවා. වාද කරන්නත් පුළුවන්. කෙනෙක් කියයි ඔය ටික තියෙනවා කියලා. කෙනෙක් කියයි නෑ කියලා. ඔය දෙකම භෞතික වාදය යි. බාහිරයෙන් ලෝකය හොයන්න යන කට්ටිය අහුවෙන තැන. බුදුහාමුදුරුවෝ එපා කියපු තැන්. ඕකෙන් නම් කවදාවත් ඇත්ත දකින්න බැහැ කිය කියා, තව කොටසක් යනවා හිතෙන් හදන එක තමයි එළියේ තියෙන්නේ කියන විඥ්ඥාණ වාදයට. අරක භෞතික වාදය, දැන් විඥ්ඥාණ වාදය. ඔය තියෙනවා කියලා හැදුවට හිතෙන්, නෑ කියලා හැදුවෙත් හිතෙන්. දැන් මේ දෙකම කතා කරලා තියෙන්නේ බාහිරය ගැන නේද? හිතෙන් තමයි. අර ගින්දර දැකලා රස්නේ එළියේ තියෙනවා කියලා හිතෙන් හැදුවා කියලාත් දන්නවා. ඒ වුනාට මේ කතා කරන්නේ, ආයෙ එළියේ තියෙනවා කියලා යි. හිතෙන් හැදුවා කියලාත් දන්නවා. හිතෙන් හදපු රස්නේ එළියේ තියෙන්නේ. තාම මොකකටද අහුවෙලා නේද?

එතකොට එළියේ රස්නේ තියෙනවා කිව්වත් හිතෙන් හදලා, විඥ්ඥාණ වාදය. එළියේ රස්නේ නෑ කිව්වත් ඒත් විඥ්ඥාණ වාදය යි. මොකද මේ එළිය ගැනයි කතා කරන්නේ ආපහු. මෙහෙන් තමයි හදලා තියෙන්නේ. හැදුවාට බාහිරේ ගැන කතා කරනවා. දැන් බාහිරේ ගැන කතා කරන්න පුළුවන් ද මේ ආයතන හරහා? බැහැ. ඒ වුනාට අපි කරන්නේම ඕක නේ! දැනගත්තේ ආයතන වලින්, කතා කරන්නේ එළිය ගැන යි. නොදන්න දෙයක් නේද, අත් දකින්න බැරි දෙයක් ගැන නේද ඔය කතා කරන්නේ? ජීවත්වෙන්න ඕන හින්ද තමයි ඔය ටික කරන්නේ. සසර යන්න ඔය ටික ඕන.

ඕක හරි සියුම් තැනක්. කරපු ඔක්කෝම දැන් නවත්වන්න වෙන්නේ නේද? ඒ හින්ද තමයි අපට මේ දහම බොහොම පරෙස්සමින් අරගෙන හොයන්න ඕන. 'මම' ඔතැන ඉන්නවා. මේක ඇතිවුනේ ඇයි? මේ බව දැනගත්තේ කොහොම ද?' කියන එකයි අපි හොයන්න ඕන. එළියේ තියෙනවා කිව්වා නම් ඒ කිව්වේ ඇයි? එළියේ නෑ කිව්වා නම් ඒ කිව්වේ ඇයි? මොනවා හේතු වෙලාද? මේ පැත්තෙන් දකින්න පටිච්චසමුප්පන්න බව. පටිච්චසමුප්පාදය දැකීම තුළින් තමයි ඇත්ත ඇතිහැටිය, යථාභූත ඥානය ඇතිකරගන්න පුළුවන්. ඒකට බුදුරජාණන් වහන්සේ කියනවා, ඇහේ යථාභූත ස්වභාවය දකින්න, ඇහැ පිරිසිඳ දකින්න. ඇහෙන් දැනගන්නා රූපවල ඇත්ත ඇතිහැටි දකින්න. යථාභූත ස්වභාවය. ඊළඟට ඒ නිසා හටගන්නා විඤ්ඤාණයේ ඇත්ත ඇතිහැටි දකින්න. ඕවා හටගන්නා එක නවත්වන්න යන්න එපා. ඒක කරන්න පුළුවන් වැඩක් නෙවෙයි. හිත් ඇතිවෙන එක නවත්වන එක කරන්න බැහැ. ඇහැ නම් වහලා දන්න පුළුවන්, අන්ධ කරන්න පුළුවන්. කනත් එහෙම කරත හැකියි. ආයතන පහම ඕක කරයි. හිත නවත්වන්න මොකද කරන්නේ? නින්ද ගියත් හීන පෙනෙයි. නවත්වන්න බැහැ ඒක.

නවත්වන විදිය බුදුරජාණන් වහන්සේ පෙන්නනවා, මේ ආයතන පිරිසිඳ දකින්න. ආයතන ඉක්මවන්න. ආයතන ඉක්මවා යනකොට අර රැවටිලා මුලාවෙන් හදන ටික නැතිවෙනවා. අපි ලෝකයට අයිති ඒවා නේ දැන් හදන්නේ. ලෝකයට අහුවෙන්නේම මුලාව යි. පේනවා නේ දැන් - එක ආයතනයක මුලාවෙන් නේ අපි ලෝකය ගැන කතා කරන්නේ. ඇහේ මුලාවෙන් ලෝකය ගැන කතා කරනවා. ඔය විදියටම තමන්ට බලත හැකියි කනෙන්, නාසයෙන්, දිවෙන් මේ එක එකක් වෙන වෙනම ගත්තොත් එළිය ගැන දැනගන්න පුළුවන් ද බැරි ද? කිසිම ආයතනයකින් බාහිරය දැගන්න බැහැ. අපි හරියට මේ බිත්තර කටුව ඇතුළේ ඉන්නේ. බිත්තර කටුවෙන් එළිය දකින්න බැහැ. කටුව තුලට project වෙන ටික විතරයි අපට දකින්න පුළුවන්. කටුව ඇතුළට. මේක ඇතුළට හදලා දෙන්නේ ආයතන ටිකෙන්. ඔය ටික දැකලා තමයි අපි එළිය ගැන බොහෝම ලස්සනට විස්තර කරන්නේ.

එළිය ගැන මොනවා කතා කළත් ඒක මතයක් විතරයි. පිහිටන්නේ නෑ කිව්වත් ඒකත් මතයක් නේ. පිහිටනවා ද, නැද්ද කියලා දැනගන්න විදියක් නෑ. තවම ආයතන හය ඇතුලේ ඉන්නේ. ආයතන හයෙන් පිට ගැන අපි කතා කරන්න දක්ෂ වුනාට ඕවා ඔක්කෝම දෘෂ්ටි. ඔය **සම්පජඤ්ඤ** - නුවණ තමයි දහමක් අහලා එන්නේ : පටිච්චසමුප්පන්න. මෙහෙම පෙන්නුම් කිරීමේ හැකියාවක් තියෙනවා. ඇහැට පුළුවන් වර්ණයක් පෙන්නුම් කරන්න. කනට පුළුවන් ශබ්ද ගතියක් ඇහෙන බව පෙන්නුම්

කරන්න. ඇසීම විතරයි. ඊට අමතරව කිසිම දෙයක් කරන්න බැහැ. ඇහැට කරන්න පුළුවන් පෙනීම කියන සිද්ධිය විතරයි. ඇහැ මුල්වෙලා. කන මුල්වෙලා ඇසීම කියන සිද්ධිය විතරයි. නාසය මුල්වෙලා නම් ආඝ්‍රාණය, දැනීම කියන එක. දැනෙන්නේ මොනවාද කියන්න ගියොත් ඒ ආයතනයෙන් එහාට ගිහිල්ලා. නාසයේ කෘත්‍යයෙන් එහාට ගිහිල්ලා. පෙනෙන්නේ මොනවාද කියන්න ගියොත් ඇහේ කෘත්‍යයෙන් එහාට ගිහිල්ලා. ඇහෙන්නේ මොනවාද කියන්න ගියොත් කනේ කෘත්‍යයෙන් එහාට ගිහිල්ලා. දැනෙන්නේ මොනවාද කිව්වොත් ඒ ආයතනයෙන් එහාට ගිහිල්ලා. ආයතනයේ හැකියාවෙන් එහාට ගිහිල්ලා. හිතෙන එක ගැන ඉතින් කියන්න දෙයක් නැහැ නේ. හිතට අරමුණුවෙන දෙයක් හිතනවා. දැන් හිතට අරමුණුවෙන දේවල් කවදාවත් එළියේ තියෙන්න පුළුවන් ද? බැහැ. අපි ලෝකයට අයිති දැක්මේදී ඕවා ඔක්කෝම එළියේ තියෙන දේවල් තමයි අපි දැනගෙන තියෙන්නේ. ඒවා ගැන තර්ක කර කර, විතර්ක කර කර ඉන්නවා.

ඊළඟට ප්‍රපංච කරලා ඒවායින් අපව පාලනය කරනවා. **චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං, තිණ්ණං සංඝති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා** (මධුපිණ්ඩික සූත්‍රය) - පටිච්චසමුප්පන්න දේවල් ටිකක් ඔය කියන්නේ.

ඊළඟට තමයි **යං වෙදෙති** - ඔන්න පොඩ්ඩක් වෙනස් වෙනවා. යමක් විඳියි ද, දැන් නිකං කවුද රිංගනවා ටිකෙන් ටික ඔතෙන්ට නේද? එතෙන්ට එනකං නිකං හේතුඵල විතරයි. **ඵස්ස පච්චයා වෙදනා** ඃ කවුරුත් නෑ නේ. **යං වෙදෙති** කියන කොට යමක් විඳියි ද, ඔන්න පොඩ්ඩක් දැන් විඳින කෙනෙක්ව පොඩ්ඩක් රිංගවලා තියෙනවා. **යං වෙදෙති තං සංජානාති** යමක් විඳියි ද ඕක තමයි හඳුනගන්නේ. යමක් විඳියි ද කියන කොට විඳින දේ අර කලින් කියාපු එකකටවත් අයිති ද? විඳින්නේ ඇහැ ද? විඳින්නේ රූපය ද? විඳින්නේ විඤ්ඤාණය ද? විඳින්නේ ඵස්සය ද? නෑ. ඒ මොකවත් නෙවෙයි. යමක් විඳියි ද කියන කොට අමුතුම ධර්මතාවක්. අර එකකටවත් අයිති නෑ ඒක. එය පටිච්චසමුප්පන්න යි. යමක් විඳියි ද ඃ එතැනින්ම පැනනැංගා අර එකකටවත් අයිති නැති දෙයක්. ශබ්දය අත නිසා කියන කොට ඒ ශබ්දය මේ අතට අයිති ද? නෑ. ශබ්දය ඵලයක් ලෙස ආවට ශබ්දය මේ හේතු එකකටවත් අයිති නෑ. හැබැයි එතැනින් පැනනැගුණු ධර්මතාවක්. පටිච්චසමුප්පන්න යි. හේතු ඵල වුනාට ඵලය හේතු එකකටවත් අයිති ද? නෑ. ඵලයෙන් හේතු ගැන කියන්න පුළුවන් ද? බැහැ. අත්දකින්නේ ඵලය විතරයි. යමක් විඳියි ද **යං වෙදෙති තං සංජානාති** - ඒක තමයි හඳුනගන්නේ. ශබ්දය හඳුනගත්තාට අත හඳුනගෙන නෑ. ඵලය

සඳහා යෙදුන හේතුව හඳුනගෙන නෑ. සද්දෙ නම් හඳුනගෙන. **යං වෙදෙති තං සංජානාති** - යමක් විඳියිද, ඒක හඳුනගන්නවා. ඒක කියන කොට ඇහැත් නෙවෙයි, රූපයත් නෙවෙයි, විඤ්ඤාණයත් නෙවෙයි, ඵස්සයත් නෙවෙයි. ඒවා නිසා හටගත්ත යම්කිසි පටිච්චසමුප්පන්න ධර්මතාවක්. එතන සත්ත්ව පුද්ගල භාවයක් නෑ. අපි දැන් ටික ටික දනවා ඒක. දන්නේ මේක අරකට අයිතිකරලා. පරණ දේවල් වලටයි අයිති කරන්නේ. දැන් ඔන්න හඳුනගන්න ස්වභාවයක් තියෙනවා. හඳුනගන්න ස්වභාවය එළියේ එකකටවත් අයිති ද? නෑ. අපි තමයි මේ හඳුනගත්තේ අර රූපය කියලා එළියට දන්නේ.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u> :- ඇත්ත ඇති හැටි දැක්කා කියන එකේ මෙහෙම කරුණක් තියෙනවා. දැන් යථාභූත ස්වභාවය ලෝකයා දකින විදිය නෙවෙයි. හැබැයි යථාභූත ස්වභාවය ආපු කෙනා, මේක හඳුනගත්තු කෙනාට ඕන නම් ලෝකයා දකින විදිය බලන්නත් පුළුවන්. දැන් වතුරට එබෙන බල්ලා රැවටෙනවා නේ. අපි රැවටෙන්නේ නෑ නේ. ඒ වුනාට අපට ඕන නම් බල්ලා දකින හැටි හිතාගන්න පුළුවන්. ඒ කියන්නේ රැවටුනා නෙවෙයි.

රූපාවචර භූමියේ ඉන්න කෙනාට ඕන නම් කාමාවචර භූමියේ කෙනා මෙහෙම හිතනවා කියලා හිතාගන්න පුළුවන් වෙයි. හැබැයි කාමාවචර එක්කෙනාට බැහැ රූපාවචර එක්කෙනා කොහොම ද කියලා දකින්න. ඊළඟට අරූපාවචර එක්කෙනාට රූපාවචර මට්ටම මේ විදියයි, කාමාවචර මට්ටම මේ විදියයි කියලා ඕන නම් හිතාගන්න පුළුවන්. හැබැයි පල්ලෙහා ඉන්න අයට අර මට්ටම දකින්න බැහැ. ධර්මය අහලා අනුමාන ඥානයක් ගන්නවා නම් බුදුහාමුදුරුවෝ ගැන ශ්‍රද්ධාවෙන්මයි. ධර්මය ගැන ශ්‍රද්ධාවෙන්මයි මෙහෙම අනුමාන ඥානයක් ගන්නේ.

අපි කාමභූමියේ ඉඳන් අර ආර්‍ය්‍ය භූමියේ, අපරියාපන්න භූමිය ගැන ඉතින් අනුමාන ඥානයක් ගන්නවා මිසක් අත්දැකලා නෙවෙයි කියන්නේ. අනුමාන ඥානය අපි බුදුහාමුදුරුවන් ගැන ශ්‍රද්ධාවෙන්මයි, මේ ඇත්තමයි කියලා තියෙන්නේ කියලා ශ්‍රද්ධාව යි. ප්‍රත්‍යක්ෂය නෙවෙයි. අනුමාන ඥානයක් ගන්න පුළුවන්. ඒක තමයි අපට උදව් වෙන්නේ එතැන්ට යන්න. මෙහෙම තත්ත්වයකුත් තියෙනවා කියලා ශ්‍රද්ධාවෙන්. නැත්නම් මේ ආයතන ගැන අපට කවදාවත් දකින්න බැහැ මේක. මේ ආයතන අපව රවට්ටනවා කියන එක රැවටීමේ ඉඳගෙන දකින්න බැහැ. තව තවත් මුළාවට වැටෙනවා, අපි අර ලෝකය ගැන හොයන්න ගිහින් මුළාවට වැටෙනවා. බුදුහාමුදුරුවෝ ගැන ශ්‍රද්ධාවෙන්මයි ඔය ආයතන දකින්නේ. ඒකත් මේ බඹයක් පමණ ශරීරය තුළින් හොයන්න. ඕක බුදු කෙනෙක් කියා නො දුන්නා නම්, අපි

ඇහුවේ නැත්නම්, අපට තනියෙන් හිතාගන්න පුළුවන් එකක් නෙවෙයි. ඒ ශ්‍රද්ධාව මත ඉඳගෙන තමයි අපි මෙහෙම වෙන්න ඇති කියලා අනුමාන ඥානයක් අරගෙන ඒක ගන්න නම් මෙහෙමයි යන්න ඕන කියලා අර සත්‍ය ඥානය ඇතිකරගන්නේ. චතුරාර්‍ය සත්‍යයේ සත්‍ය ඥානය. මේක දුකයි, මේක දුකට හේතුවයි - සමුදය, මේක නිරෝධය, මේක මාර්ගයයි කියලා අනුමාන ඥානයක් ගන්නවා. මේකට කියනවා සත්‍ය ඥානය කියලා. චතුරාර්‍ය සත්‍යය පිළිබඳව නුවණක්. නුවණක් කියන්නේ ප්‍රත්‍යක්ෂ කරලා නෙවෙයි. ඒ නුවණ උදව්වෙනවා ඔන්න දැන් ඒ සඳහා කරන්න ඕන දේවල් කරන්න. මේ අවබෝධය ගන්න නම් මොකක්ද කරන්න ඕන කියලා. එතකොට අර දිබ්බචක්ඛු, දිබ්බසෝත ඒවා අර ලෝකයට අයිති දේවල් ගැන ඕන නම් බලලා කියන්න පුළුවන් ඒ නුවණ තියෙන කෙනාට. එහෙම කිව්වාට ඒකෙන් කියන්නේ නෑ එයා මුළාවෙලා කියලා. මෙහෙම යි. ඔය නුවණ නැති කෙනාටත් ඔය ඥාන ගන්න පුළුවන්. එයා එතකොට ඒවා එහෙම මයි කියලා පිළිඅරගෙනයි කතා කරන්නේ. ආර්‍ය දර්ශණයේදී එයා දන්නවා මේවා මේ මට්ටමෙන් බැලුවොත් එහෙම යි. ඔය ආයතන, ආයතනයක් උපද්දලාම නේ ආයතනයේ හැකියාවෙන් මේ දකින්නේ. අන්න ඒ ධර්මයත් තේරුම්ගන්න ඕන. දැන් යමක් එළියේ තියෙන හින්දමද දකින්නේ, නැත්නම් මේ ආයතනය ඉපදුනේ නැත්නම් දැනගන්න පුළුවන් වෙයි ද? ඇහැ ඉපැද්දුවේ නැත්නම් වර්ණයක් ගැන කිසිම දෙයක් හිතාගන්න බැහැ නේ. එතකොට මේ ආයතනය උපද්දලාමයි අපි දකින්නේ. අන්ධ පුද්ගලයාටත් බැහැ.

අපි දැන් තේරුම්ගන්න ඕන ආයතනයක් උපද්දලාමයි දැනගත්තා නම් දැනගත්තේ. කවුද ආයතනය උපද්දන්නේ? අපිම හදාගන්නා ආයතනයකින් තමයි අපි බලන්නේ. එතකොට බුදුහාමුදුරුවෝ පෙන්නනවා, ආයතනය උපද්දන්නෙත් අවිද්‍යාවෙන්. අවිද්‍යා, කර්ම, තණ්හා, ආහාර ඔහොම හේතු පෙන්නන්නේ.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u> :- ආයතනයක් උපද්දන්න ගොඩාක් හේතු තියෙනවා. අනිවාර්‍යයෙන් අවිද්‍යාව තියෙන නිසායි උපද්දන්නේ.

රූපය නිසා ආයතනය උපදිනවා ද, ආයතනය නිසා රූපය උපදිනවා ද කියන එක බලන්න. පටිච්ච සමුප්පන්න කියන එක තේරුම් ගත්තොත් ඔය ප්‍රශ්නය ඇහෙන්නේ නෑ. දැන් අපේ විඤ්ඤාණය උපදින්න කලින් රූපයත් තියෙන්න ඕනද? ඇහැත් තියෙන්න ඕනද? **තජ්ජෝ සමන්නාහාරෝ.**

__ප්‍රශ්නයකට පිළිතුරක්__ :- ඕවා දැන් වචන වලින් කියන කොටයි, අදහසෙයි වෙනසක් තියෙන්න පුළුවන්. වචන වලින් හරි ස්කන්ධ ක්‍රියාත්මක වෙනවා, ආයතන ක්‍රියාත්මක වෙනවා. ධාතු ක්‍රියාත්මක වෙනවා. ඔය සිද්ධිය නුවණින් දකීමේ දී අපි අර හිතාගෙන ඉන්න ඒවා නෙවෙයි. ස්කන්ධ වෙන වෙනම තියෙනවා, ආයතන වෙන වෙනම තියෙනවා. ධාතු වෙන වෙනම තියෙනවා. එහෙම කතාවක් නෙවෙයි. මේක පටිච්චසමුප්පන්නයි. පටිච්චසමුප්පන්න කියන්නේ ඒ මොහොතේ හේතු යෙදුන හින්ද එතැනින් පැන නගින එහෙම ස්වභාවයක්. ඕක දැක්කොත් ඕවා තියෙනවා කියන්නත් බැහැ. නෑ කියලා කියන්නත් බැහැ. ඒකයි ඒ දෙකම දෘෂ්ටි කියල කියන්නේ. පටිච්චසමුප්පන්න යි. එච්චරයි කියන්න පුළුවන්. මේ හේතු යෙදෙනවා නම් ඒක පැන නගිනවා, එච්චරයි. ඒවා කොහෙන්වත් එනවත් නෙවෙයි, යනවත් නෙවෙයි, හේතු යෙදෙන කොට හටගන්නවා. හේතු නැතිවෙන කොට ඉතුරුවක් නැතුවම නිරුද්ධ වෙනවා කියන ධර්මතා ටික. පටිච්චසමුප්පාදය දකින කොට ඔය ධර්මතා ටික ඔක්කෝම දකින්න පුළුවන්. පෙර නො තිබීම හටගන්නවා : **අහුත්වා සම්භූතං. හුත්වා න භවිස්සති**[4] : ඒකෙන් පස්සේ ඉතුරුවක් නැතුවම **අසෙස** - ශේෂයක් නැතුවම නිරුද්ධ වෙනවා. පෙර නො තිබීම මයි හටගන්නේ. එතැනින්ම පැන නගිනවා. ඒක ඔය ස්කන්ධ ඔක්කෝටම පොදුයි. හේතු ටිකයි, ඵලයයි සේරටම පොදුයි ඔය ධර්මතාවය. විඤ්ඤාණය පටිච්චසමුප්පන්න නම් ඒ මොහොතේ එතැන හටගන්නවා, විද්‍යමාන වෙනවා විතරයි. ඊට කලින් කතාවක් නෑ. විඤ්ඤාණයෙන් කෙරෙන හැම දේම පටිච්චසමුප්පන්නයි. සංඛතයි, පටිච්චසමුප්පන්නයි, ඔය ධර්මතා ඒවාට යෙදෙනවා. ලෝකයට අයිති ඕනම දේකට ඔය ධර්මතා පොදුයි. නිවනට විතරයි ඕවා අදාල නැත්තේ. ඔක්කෝටම ඔය ධර්මතා පොදු යි.

අර එක්කෙනක් කිව්වා **සමුදාචරන්ති** - **පපඤ්චසඤ්ඤාසඞ්ඛා සමුදාචරන්ති**[5] කියන එක තව ටිකක් විස්තර කරන්න කියලා. දැන් මේ ආයතනයක් ගැන බලනකොට එකම ධර්මතාව තියෙන්නේ. ඇහැයි, රූපයයි නිසා චක්ඛු විඤ්ඤාණය හටගන්නවා. ඔය තුනට කියනවා ඵස්සය කියලා. **ඵස්සපච්චයා වෙදනා.** ඔය ටික මොන ආයතනයට ගත්තත් එකයි නේද? කනයි, ශබ්දයයි නිසා සෝත විඤ්ඤාණය, ඔය තුනට කියනවා ඵස්සය - සෝත සම්ඵස්සය කියලා. **ඵස්ස පච්චයා වෙදනා.** නාසයයි, ඝාණාරම්මණයයි නිසා ඝාණ විඤ්ඤාණය, ඔය තුනේ එකතුව ඵස්සය. ඝාණ සම්ඵස්සය කියලා කියනවා. **ඵස්සපච්චයා වෙදනා.** දිව, රස නිසා ජිව්හා විඤ්ඤාණය. **තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා.** කය,

---

[4] පටිසම්භිදාමග්ගපාළි, 1. මහාවග්ගො, 1. ඤාණකථා, 15. වත්ථුනානත්තඤාණනිද්දෙසො
[5] මධුපිණ්ඩික සූත්‍රය (මජ්ඣිම නිකාය, මූල පන්නාසකය, සීහනාද වර්ගය)

නැත්නම් පොට්ඨබ්බය, නිසා කාය විඤ්ඤාණය **තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා.** මන, ධම්ම ඒ දෙක නිසා මනො විඤ්ඤාණය, **තිණ්ණං සඞ්ගති ඵස්සො. ඵස්සපච්චයා වෙදනා.** එකම ධර්මතාවය. ආයතනය විතරයි වෙනස්. ඒකයි මම කිව්වේ, එකක් තේරුම් ගත්තොත් අනික් ටිකටත් ඕවා දලා බලන්න පුළුවන්. එතකොට **ඵස්සපච්චයා වෙදනා** එක්ක ඊළඟට කියන්නේ **යං වෙදෙති තං සඤ්ජානාති.** මේ මධුපිණ්ඩික සූත්‍රයේ කියන්නේ. **යං වෙදෙති තං සඤ්ජානාති යං සඤ්ජානාති තං විතක්කෙති.** යමක් හඳුනා ගනීද ඕක ගැන කල්පනා කරනවා, විතර්කනය කරනවා. **යං සඤ්ජානාති තං විතක්කෙති.** දැන් එතකොට විතර්ක කරන්නේ මොකක් ගැන ද? කල්පනා කරන්නේ මොකක් ගැන ද? හඳුනාගත්තු දේ ගැන. හඳුනගත්ත දෙය ඊට කලින් එකක්වත් ද? නෑ.

මේ අළුත් ධර්මතාවක්. හඳුනාගැනීම කියන එකත් පටිච්චසමුප්පන්න ධර්මතාවක්. ඒක ගැන තමයි දැන් හිතන්නේ. හැබැයි හිතනකොට පුළුවන්, හඳුනාගන්නා දේ ගැන හිතනවා කිව්වාට ඒ දේ ට අපි දපු ඒවත් ඕන නම් එකතු කරගන්න පුළුවන්. ඇහැ එකතු කරගන්න පුළුවන්. රූපය එකතු කරගන්න පුළුවන්. විඤ්ඤාණය එකතු කරගන්න පුළුවන්. වේදනාව එකතු කරගන්න පුළුවන්. සංඥාව ගැන විතරක් නෙවෙයි, ඒකට අදාළ අනික් ටිකත් ඕන නම් දගන්න පුළුවන්. හිතන කොට ඕන එකක් දගන්න පුළුවන් නේ. හඳුනාගත්තු දේට අපි ඕකේ මේ වේදනාව තියෙනවා කියලා හිතන්නත් පුළුවන්. **යං වෙදෙති තං සඤ්ජානාති.** ඒක හිතේ වැඩක්. හිතට කරන්න පුළුවන් වැඩක්. ඒකට තමයි කල්පනා කරනවා කියන්නේ. කල්පනා කරලා හොඳට පුරුදුයි නේ, නේද, මොකක් හරි වුනහම, ඕක කළේ මෙයා තමයි. මේ හින්ද තමයි ඕක වුනේ. ඔක්කොම වැරදි ටිකට අර කැකිල්ලේ තීන්දු දෙනවා නේ. මම බේරිලා, අනිත් අය තමයි වැරැදි කරලා තියෙන්නේ, කියලා වටේ අයට බනින්න අපට හොඳට පුරුදුයි නේ. ඔය දේ මෙතැනත් වෙන්නේ. සංඥාව ගැන හිතුවාට වටේ ඉන්නා අයවත් ඕකට දගන්නවා. ඒ වුනාට ඇත්ත තත්ත්වය, සංඥාව ගැන තමයි දැන් හිතන්නේ. **යං සඤ්ජානාති තං විතක්කෙති.**

**යං විතක්කෙති තං පපඤ්චෙති.** යමක් කල්පනා කරයිද, ඕක තමයි ප්‍රපඤ්ච බවට පත් කරන්නේ. පාලි වචනය **පපඤ්ච.** අපි සිංහලට තමයි ප්‍රපඤ්ච කියන්නේ. **යං විතක්කෙති තං පපඤ්චෙති.** ප්‍රපඤ්චය බවට පත්වෙනකොට මොකද වෙන්නේ? **යං පපඤ්චෙති තතොනිදානං** - මෙන්න මේක තමයි නිදානය. 'නිධානය' නෙවෙයි නිදානය. හාරලා ගන්න නිධාන නෙවෙයි. රෝග නිදානය වගේ - ලෙඩට හේතුව. මේකමයි මේකට මුළ, හේතුව. **තතොනිදානං පුරිසං** - පුරුෂයාව, **පපඤ්චසඤ්ඤාසඞ්ඛා** -

ප්‍රපඤ්ච සංඥා කියන ජාතියෙන් **සමුදාචරන්ති** - ඔන්න ඕක තමයි වැදගත් එක - **සමුදාචරන්ති** කියන්නේ අභිභවා යනවා, ඉක්මවා යනවා. කාවද අර පුරුෂයාව. මේවා කරපු පුරුෂයාව ඉක්මවා යනවා **පපඤ්චසඤ්ඤාසඞ්ඛා** වලින්, **සමුදාචරන්ති**. ඉක්මවා යනවා කොහොම ද, **අතීතානාගතපච්චුප්පන්නෙසු චක්ඛුවිඤ්ඤෙයෙයසු රූපෙසු** (මධුපිණ්ඩික සූත්‍රය), අතීත රූප කියලා වෙන්න පුළුවන්, අනාගත රූප කියලා වෙන්න පුළුවන්, වර්තමාන රූප කියලා වෙන්න පුළුවන්. ඒවාට පුළුවන් ඕවාම හදපු පුරුෂයාව, කෙනාව අභිභවා යන්න, ඉක්මවා යන්න. එයාව පාලනය කරන්න. අපිම රොබෝ කෙනෙක් හදලා, රොබෝ අපිව පාලනය කරනවා. අපිම ලෝකය හදලා, ලෝකය අපිව පාලනය කරනවා.

දැන් වතුරට එබෙන බල්ලාට ඕකම නේද වෙන්නේ? බල්ලාම අර වතුරේ බල්ලෙක් හදලා, ඌට පුළුවන් මූව තරහා ගස්සන්න. බල්ලාව බුරවන්නේ, එයාම හදපු බල්ලාම නේ. එයාම බල්ලෙක් මවලා, ඌට බුරනවා ඌත් එක්ක තරහ වෙලා. පේනවාද කරන වැඩේ. අපිම ලෝකය හදලා, ලෝකය අපිව පාලනය කරනවා. අපිව සතුටු කරනවා හරි, දුක් කරනවා හරි. ඔන්න ප්‍රපංචයේ වැඩේ. ප්‍රපංච වෙනකොට ලෝකය හදලා. එළියේ තියෙන දෙයක් කියලා භාර අරගෙන. භාරගත්තු ගමන් ඒකට පුළුවන් අපව සතුටු කරන්න හරි, දුක් කරන්න හරි. ඕක තමයි ලෝකයට අහුවෙනවා කියන්නේ. අටලෝදහමට අහුවෙනවා දැන්. අපිම ලෝකය හදගෙන, ලෝක ධර්මතාවලට අපි නටනවා. අටලෝදහමට. එක්කෝ අඬනවා, එක්කෝ සතුටුවෙනවා.

එතකොට ඕක තමයි, මේ බුදුහාමුදුරුවෝ පෙන්නලා දෙන්නේ. මේ ආයතන හයෙන් ඕන ආයතනයක් ගත්තහම සිද්ධවෙන්නේ ඔන්න ඔය ටික තමයි. ප්‍රපංචයක් හදන මට්ටමට යනකං අපි ගෙනියනවා. ප්‍රපංචය කියන්නේ දැන් ලෝකයට අයිති දෙයක් හැදුවා. විශ්වාස කළා. ලෝකයට අහුවුනාට පස්සේ මොකද වෙන්නේ, ලෝකයට අයිති සැපට අපි කැමැති යි. දුකට අකැමැති යි. ඔන්න මනාප අමනාප ඇතිවෙනවා. ඇහෙන් රූප දැකලා මනාපය ඇතිවෙන්නත් පුළුවන්, අමනාපය ඇතිවෙන්නත් පුළුවන්. නැත්නම් ඒ දෙකේ මැද හරිය. රූප දන්නේ නෑ, ඔය මොකක්වත්. රූපයත් අපිම නේ හදලා තියෙන්නේ. වතුරේ ඉන්න බල්ලා ඔය මොනවත් දන්නේ නෑ මේ බල්ලා මොනවා කරනවාද කියලා. මේ බල්ලා තියෙනවා ඉන්නවා කියලා හිතුවත් එයා මොකවත් දන්නේ නෑ. අපි හදපු රූප ටික ඇත්තටම තියෙනවයි කියලා හිතුවත් ඒ රූප දන්නේ නෑ අපි මොනවා හිතනවාද කියලා. අපි මනාප වුනා ද, අමනාප වුනා ද, නැත්නම් මැදහත් වුනා ද, කියලා ඒ රූප දන්නේ නෑ.

**<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>** :- සසරේ යන්න හේතු. අපව සසරේ ගෙනයන්න හේතු ටික හැදෙන්නේ ඔහොම යි. එවාට කියනවා සසරේ ගෙනියන කර්ම කියන්නේ අභිසංකරණක සංඛාර. මේකේ ඇත්ත දකින එක තමයි ප්‍රයෝගය. පයෝග අභිසංඛාර. ඒවා නවත්වන විදියට මේක බලන්න ඕන. ඒක තමයි මාර්ගය වඩනවා කියන්නේ. එහෙම බලන්න පුළුවන් මේක තේරුම්ගත්ත කෙනාට විතරයි. තේරුම්ගන්න පුළුවන් දහම අහලා නුවණින් විමසාපු කෙනාට විතරයි. සද්ධර්මශ්‍රවණයයි, යෝනිසෝමනසිකාරයයි. ඒක හැමෝටම කරන්න බැහැ. මේක අහලා තේරුම්ගත්ත කෙනාට විතරයි. කට්ටිය නම් කියනවා අපි නම් යෝනිසෝමනසිකාරය කරනවා. අරකයි මේකයි. හැබැයි දහම අහලා ද තේරුම් අරන් ද කියන එක. සම්මා දිට්ඨිය ආවේ නැත්නම් ඕක කරන්න බැහැ.

**<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>** :- ඒක තමන් දකින්න ඕන. ධර්මය අහන්න පුළුවන් බාහිරෙන්. පොතකින් කියවන්න පුළුවන්. දකින්න ඕන තමන්. ඒක දැක්ක කෙනාට විතරයි යෝනිසෝමනසිකාරය කරන්න පුළුවන්. මෙහෙම සිද්ධිය, මේක අවබෝධ කරපු කෙනාට මේ ප්‍රපංච මේ විදියට හැදෙනවා. හැදෙන්න මුල්වුනේ අර ඇහේ ඉඳන් එන්න පුළුවන්, කනේ ඉඳන් එන්න පුළුවන් ආයතන හයෙන් ඕන එකකින් එන්න පුළුවන්. එතකොට ඒක ආයතන විදියට මෙනෙහි කරන්න පුළුවන්කම තියෙනවා. ඒකයි බුදුහාමුදුරුවෝ පෙන්නන්නේ, එක පැත්තක් නිවන් දොරටුවක්, මේ ආයතන විදියට බලනකොට. පළමුවෙනි දේ, තේරුම්ගන්න ඕන. ඕක හැම මොහොතෙම දකින්න කියන එක, ඒක හිතන්නවත් එපා. කරන්න පුළුවන් නම් හොඳයි. හැම මොහොතෙම තියා, ඉස්සෙල්ලා එක මොහොතක දකින්න. අවුරුද්දක් අරන් හරි මේක තේරුම්ගන්න. තේරුම්ගත්ත කෙනාට එක සිද්ධියක ඕකයි බලන්න පුළුවන්. ඒක බලලා ඉවර වුනාම තව සිද්ධියක බලන්න පුළුවන්. ඒ අතරේ ඕන තරම් මුලාවුනාට කමක් නැහැ. අර දකින ක්ෂණය වටිනවා කියනවා දන සීයක් දෙනවාට වඩා. බුදුහාමුදුරුවන්ටම පිළිගන්වන දනවලටත් වඩා වටිනවා කියනවා එක ක්ෂණයක ඕක දකින්න පුළුවන් නම්. ඒකයි මේ දහම අහන්න ලැබුණ එකේ, ක්ෂණ සම්පත්තියේ ප්‍රයෝජනය කියන්නේ. එතකොට අපි ඕක නුවණින් හොයන්න කියනවා. ඕවා හොඳට පැහැදිළිව ඔය සූත්‍රවල තියෙන දේවල්. අපි නුවණින් බලන්නේ නැති එකයි ප්‍රශ්නය.

**<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>** :- පේන්නේ නැත්තේ එක එක දෘෂ්ටි දගෙන බලන හින්ද. දැන් අපි දගත්තු ටික අයින් කරලා මේ කියන්නේ මොකක් ද? ඒ විදියට බලලා එතකොට තමයි බුදුහාමුදුරුවෝ ගැන ශ්‍රද්ධාව එන්නේ.

මේක එක පාරට පෙනෙන්නේ නෑ. හැබැයි අපට අනුමාන ඥානයක් ගන්න පුළුවන් බුදුහාමුදුරුවෝ මේක දේශනා කරලා තියෙන හින්ද.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u> :- නවත්තන එක කරන්න එපා. අපි හදන්නේම ඕක නවත්වන්න යි. ඉස්සෙල්ලා තේරුම්ගන්න, මෙන්න මෙහෙම සිද්ධියක් වෙන්නේ. මෙන්න මෙහෙම රැවටීමක් වෙනවා. දැන් අපි රැවටීම නවත්වනවා, මම රැවටෙන්නේ නෑ කියලා හරියන්නේ නෑ. රැවටෙන්නේ කොහොමද කියලා ඉස්සෙල්ලා හොයාගන්න ඕන, හේතු ඇතුව. මෙන්න මෙහෙමයි මාව රැවටෙන්නේ. අන්න අරයා බොරුවක් ගොතලා කියලා. ඒක මම එයාව විශ්වාස කරලා, ඔහොම ඔහොම හොයාගත්ත දවසට නේ එයා කියන එක විශ්වාස නො කර ඉන්නේ. නිකම්ම හිතට කියලා හරියන්නේ නැහැ එයාව විශ්වාස කරන්න එපා කියලා. අපි ඒක හේතු ඇතුව පෙන්නන්න ඕන. මෙන්න මේ මේ කරුණු හින්ද අපි රැවටෙනවා. ඒකයි ඒක අවබෝධ කරන්න ඕන. අවබෝධ නො කර නවත්වන්න ගියාට බැහැ කරන්න. අවබෝධ කළොත් නවතින්නේ ඉබේම යි. ඒක ප්‍රතිපලයක්. රැවටෙන එක නවතින්නේ අවබෝධය තුළින්. දැන් බල්ලා වතුරට එබිලා රැවටෙන්නේ නැතුව ඉන්නේ කවුරුවත් කිව්ව හින්දවත්, භාවනා කරපු හින්දවත් නෙවෙයි. අර ඇත්ත දැක්ක දවසට රැවටෙන්නේ නැතුව ඉන්නවා. එහෙනම් අපි ඇත්ත පෙන්නන්නයි තියෙන්නේ. ඔහොම රැවටුනාට මෙතැන තියෙන්නේ මෙහෙම සිද්ධියක්. රැවටෙන එක නවත්තලා හරියන්නේ නැහැ. මෙතැන ඔහොම පිළිගත්තේ මෙන්න මේ මේ හේතු යෙදුන හින්ද. සමුදය පෙන්නන්න ඕන. දුකේ ඉන්නවා නම් දුක්ඛ සමුදයයි අපි පෙන්නන්න ඕන. එහෙම නැතුව දුක නැතිකරනවා කියලා එකක් නෑ. සමුදය දැක්ක දවසට, සමුදය හදන්නේ නැති දවසට දුක හට නො ගෙන තියේවි. ඒ හින්ද අපි ලෝකෙට අහුවෙනවා නම් ලෝකෙට අහුවෙන්න හේතු ටික පෙන්නන්න. ලෝකය හැදෙන්නේ කොහොම ද? ලෝකයට අහුවෙන්නේ කොහොම ද? එතකොට මේ ප්‍රපංච හැදෙන්නේ මේ විදියටයි. එතැනට එනකම් එන්නේ මේ ඇහෙන් දැකීමේ සිද්ධියේ ඇත්ත දැක්කේ නැති හින්ද. දැන් අපට ඕක බලන්න වෙන්නේ රැවටුනාට පස්සේ.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>:- එහෙම තමයි දකින්න පටන්ගන්න ඕන. නැතුව මම ලෝකයට අහුවෙන්නේ නෑ කියලා එහෙම හිටියාට හරියන්නේ නැහැ. එතකොට අර එළියේ මොකුත් නෑ. ඔය තියෙනවා කිව්වාට නෑ කිය කියා තමන්වම රවට්ටා ගන්නවා. තියෙනවා තියන එක නෑ කියන්න හදනවා, නෑ කියන එක තියෙනවා කියන්න හදනවා. ඉතින් තර්ක කර කර ඉන්නවා. දෘෂ්ටිවලට, එහෙට මෙහෙට පැන පැන ඉන්නවා. මේ සිද්ධවෙන ක්‍රියාවලිය, මේක පටිච්චසමුප්පන්න බවක්, කියන එක හිතට

පෙන්නන්න ඕන. ඒ පෙන්නන්න තමයි මේක තේරුම්ගන්න ඕන පුළුවන් තරම්. ධර්මය තේරුම්ගන්න.

එතකොට ඒ මධුපිණ්ඩික සූත්‍රයෙනුත් එහාට ගිය එකක් තමයි මේ මහා හත්ථිපදෙපම සූත්‍රයේ ඊටත් වඩා කරුණු ටිකක් තියෙනවා. දැන් එහෙම කිව්වා කියලා ඒ ඔක්කෝම දැනගන්න ඕනත් නෑ. එහෙම අවශ්‍ය කෙනෙකුටයි ඒ ටික. කෙනෙකුට ප්‍රයෝජන වෙන්න පුළුවන්.

(අන්න බල්ලෙක් බුරනවා.) කොහෙද බල්ලා ඉන්නේ? දැන් තමන් ලෝකයට අහුවුනහම ලෝකයට පුළුවන් තමන්ව පාලනය කරන්න. **සමුද්‍ද චරන්ති**. ප්‍රපංචය හැදුවාට පස්සේ, වතුරට එබෙන බල්ලා හැදුවාට පස්සේ ඒ බල්ලා තමයි මෙයාව තරහ ගස්සන්නේ. දැන් ඒකේ කොහොමද බලන්නේ? දැන් වතුරේ ඉන්න බල්ලා එක්ක හරි තරහයි. බල්ලා එලවන්න ඕන. වතුරට එබිලා බුරනවා වගේ තමයි දැන්. නිරුද්ධවුනා, ඉන්න එකාම තමයි නිරුද්ධවුනේ. එක්කෝ ඉන්නවා, එක්කෝ නෑ කියන්න හදනවා. ඔය හිත රවට්ටාගන්නයි. ඔය ධර්මතාවය පෙන්නන්නේ කොහාම ද? කොහොම ද බල්ලෙක් ඉන්නවා කියලා දැනගත්තේ? ඇහුන සද්දේ බල්ලෙක් හිටියා ද? කවුද හැදුවේ බල්ලා? තමන්ම හැදුවා. තමන්ම හදපු බල්ලා තමන්වම තරහ ගස්සනවා.

දැන් උගන්නපු එක දැන් දකින්න බැහැ. ඒක තමයි කියන්නේ තාම, ඒක දකින්න පුළුවන් වෙන්නේ තේරුම් ගත්තොත්. බල්ලාගේ මානසිකත්වයේ ඉඳන් බලන්න බැහැ. ලෝකයට අහුවෙලා. ඒක බලවත්. කෙලෙස් බලවත්. වැඩක් නෑ කතා කරලා. ඒකයි මම කිව්වේ, මේක නැවැත්වුවා නම් හරි කියලා කියන්න පුළුවන්. කොහේ නවත්වන්න ද?

<u>**ප්‍රශ්නයකට පිළිතුරක්**</u>:- දැන් පුළුවන් වෙයිද එහෙනම් තරහ නවත්තලා හිටියා නම් හරි නේද කිව්වා නම් හරි. දැන් කියන්නේ තරහා එන එක නෙවෙයි. අපි බල්ලෙක් හදන්නේ නැතුව හිටියා නම් හරි නේද කියලා කියන්නේ. පුළුවන් ද? මේකේ අනුපිළවෙලක් තියෙනවා මෙතැනට එන්න. එතැනට තමයි යන්න ඕන. යන්න අනුමාන ඥානය ලබාගන්න තමයි මේ අපි ධර්මය සාකච්ඡා කරලා ගන්නේ. හැබැයි ඒකේ අන්තිම තැනින් පටන් ගන්න යන්න එපා. සද්දේ සද්දේ විතරම වුනා නම් ඉවර නේ කියලා කියන්න පුළුවන්. එහෙම වෙලා ද දැන් ප්‍රායෝගිකව. තමන් ඉන්න මට්ටම තේරුම් ගන්න. ඒකටයි අපි ප්‍රතිකර්මය කරන්න ඕන. වෙන දේවල් නවත්වන්න ගිහිල්ලා හරියන්නේ නෑ. ඒක කරන්න බැහැ. අපිට පුළුවන් ඒකට හේතු ටික පෙන්නන්න. මෙහෙම හේතු යෙදුන හින්ද නේ ඔය

රැවටුනේ කියලා. ඒක පෙන්නන්නත් හොඳට මේක නුවණින් තේරුම් ගත්තොත් විතරයි කරන්න පුළුවන්. මේ අහපු ධර්මය තේරුම් ගත්තොත්.

(ශබ්දයක් ...) මෙකක්ද අර? මෝටර් සයිකලයක් ද? ත්‍රී වීලරයක් ද? ත්‍රී වීලරයක්. මෝටර් සයිකලයක් නෙවෙයි. මෝටර් සයිකලයක් කිව්වොත් නෑ කියලා තර්ක කරන්න පුළුවන්. තියෙනවා, නෑ කියන දෙක ඔය. ඒක කාර් එකක් නම් නෙවෙයි කියලා තර්ක කරන්න පුළුවන්. අරක නෙවෙයි. තියෙනවයි නැහැයි. දැන් භෞතික ලෝකයට නේද අහුවුනේ? ඕකේ සතර මහා ධාතුවත් කථා කරයි. ඕක හැදිලා තියෙන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ වලින්, අර මම ජාති හතරක් කිව්වේ. **සම්මුතියෙන්** කතා කරයි, **සසම්භාරයෙන්** කතා කරයි, **ලක්ඛණයෙන්** කතා කරයි, **ආරම්මණයෙන්** කතා කරයි. මේවා කතා කරන්නේ මොකටද? මේවා හොයන්න ඕන. ඇයි හොයන්නේ? ඇත්ත අවබෝධ කර ගන්නයි. ඇත්ත නෙවෙයි ඔය. ඇත්ත අවබෝධ කරන්න උදව් කරන දේවල්. අපි ඒක අරගන්නවා ඊළඟට ඇත්ත කියලා. දෘෂ්ටිවලින් මිදෙන්නයි ඔය ටික තියෙන්නේ.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>:- විදර්ශනා අරමුණු ඔය එන්නේ. ඒ ගොල්ලන්ට බනින්න එපා. අපට අවස්ථාව ඔය එන්නෙ. ඔන්න අරමුණක් හදලා දුන්නා. ඒකට පින් දෙන්න. අපි කරන්නේ මොකක් ද? මොන කරදරයක් ද? මේක අහගන්න නෑ. සද්ද කරනවා. දහම දැක්ක කෙනාට හැම එකක්ම විදර්ශනා අරමුණක්. එදට ඔය කැලේට යන්න දුවන්නේ නෑ. ආරණ්‍යවලට දුවන්නේ නෑ. ඒ ප්‍රශ්නෙත් ඇහුවා නේද එක්කෙනෙක්. ගිහිව ඉඳගෙන මේක කරන්න පුළුවන් ද, ආරණ්‍යට යන්න ඕනෙද? ආරණ්‍යයට ගියත් වැඩක් නෑ ඕක දන්නේ නැතුව. ඒවා දැනගත්ත, විදර්ශනා කරන කෙනාට අරමුණු තියෙන තරමට හොඳයි. හැබැයි ඉතින් ඊට කලින් හිත සන්සුන් කිරීමත් කරන්න ඕන. සමාධිය උදව්වෙනවා මේ යථාභූත දර්ශනයට. **සමාධිං භික්ඛවෙ භාවෙථ, සමාහිතො භික්ඛු යථාභූතං ඤාණදස්සනං පජානාති.**[6] එතකොට හිත සන්සුන් කර ගැනීමත් අවශ්‍ය යි. එතකොට තමයි මේවායේ ඇත්ත ඇතිහැටි දකින්න පුළුවන් වෙන්නේ.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>:- ඒක හරි. රූප තමයි අපට මැවෙන්නේ. එළියේ රූපය කියන කොට මතක තියාගන්න අපට රූප සංඥාව අනිත් ආයතන වලිනුත් එන්න පුළුවන්. අපි ශබ්දය ඇහෙන හින්ද, ඇහෙන් දැකලා නැතිවුනත්, බාහිරයක් විශ්වාස කරන්න පුළුවන්. ලෝකයක් හදන්න පුළුවන්. ඒකේ සමහරවිට පාට නෑ. කලු සුදු ලෝකය හදන්නත් පුළුවන්. ඒ අත්දැකීම් අනුව. එතකොට ඒකේ තේරුම කාමාවචර මට්ටමේ ඒවාම තමයි

[6] සමාධිභාවනා සූත්‍රය (සංයුක්ත නිකාය, ඛන්ධ වර්ගය, ඛන්ධ සංයුක්තය )

අපට මැවෙන්නේ. මොකද අපි කාම භූමියේ. ඒ රූප දැකලා හින්දමයි අපට ඕවා මැවෙන්නේ. ඒ මැවෙන්නේ මොකක්ද කියලා හොඳට බැලුවොත් පෙනෙයි, අතීත අත්දැකීමක්මයි. ගලාගෙන එනවා අපේ පෙර ඇසුර. ඒක කෙලෙස් මට්ටම. දැන් අපේ කෙලෙස් පිහිටලා තියෙන විදියට රූපවලට තමයි වැඩිපුර ඇලෙන්නේ. දැන් මෙතැනින් හිතන්නකෝ දැන් රූපාවචර ලෝකයට යනකොට, කාමභූමියෙන් රූපාවචර මට්ටමට කෙලෙස් යටපත් කරන්න පුළුවන් නේ. එතකොට අර සතරමහාධාතු මට්ටම පිහිටනවා මිසක් අපි හිතන කාමාවචර රූප නෙවෙයි එතකොට. රූපාවචර මට්ටමේ. එතකොට ඇහැ, කන, නාසය, ඒවා පිනවන්න නෙවෙයි යන්නේ. රූප විතර නේ. දැන් ඒකෙනුත් මිදුන මට්ටමකට කෙලෙස් යටපත් වෙන කොට ඒ රූප පිහිටන්නෙත් නෑ. අරූපාවචර මට්ටමේ. ඒ වගේ ඒවා අපේ කෙලෙස් මට්ටම්ම යි. ඊගාවට අපේ බලවත් කෙලෙස්වලට අදළව තමයි අපට වැඩිපුර අරමුණු එන්නේ. තමන් ආශා කරන දේ ගැනමයි තමන්ට හිතන්න හිතෙන්නේ.

**ප්‍රශ්නයකට පිළිතුරක්** :- දැන් ඕකේ හිතන්න දැන් මේ මොනවාද හොයන්නේ. අපි භාරගත්තු රූප ගැන තව තව විස්තර හොයනවා නේද? දහම මතක් කර ගන්න. මූලික guideline එක තියාගන්න. බුදුහාමුදුරුවෝ කිව්වේ ලෝකය එළියෙන් හොයන්නද, තමන් තුළින් හොයන්නද කියලා. එළියේ රූප හඳුගත්තාට පස්සේ ඒවා ගැන ඕන තරම් ප්‍රශ්න එනවා. හොයන්න. ඕක විදර්ශනයක් ද මේ කරන්නේ? ඒ හින්ද තමයි පූර්ව ප්‍රතිපදව ගොඩාක් වඩන්න ඕන. රූපය තියෙනවා කියලා පිළිඅරන්. දෙතිස් කුණපය ගොඩාක් වඩන්න ඕන. ධාතු මනසිකාරය වඩන්න ඕන. මේ අභ්‍යන්තර රූපයේ පඨවියයි, බාහිර රූපයේ පඨවියයි, එකමයි. ඔතෙන්දි කියන්න එපා බාහිරයෙත් පඨවි නෑ, අභ්‍යන්තරයෙත් පඨවි නෑ. අර විදර්ශනයේ කියපු එක කියලා හරියන්නේ නෑ. රූපයට අහුවෙනවා නම්, ඒකෙන් පෙන්නන්නේ තවම පූර්ව ප්‍රතිපදව මදි. තව ප්‍රගුණ කරන්න ඕන. ඒ හින්ද තමයි මම හැම තිස්සෙම කියන්නේ මෛත්‍රිය වඩන්න, පිළිකුළ වඩන්න, අශුභය වඩන්න, මරණානුස්සතිය වඩන්න. ලෝකයට අයිතියි කියලා ඒවා අතහරින්න එපා. එහෙම අතහැරලා පනින්න බැහැ මේකට. ඒවත් වඩන්න. ආ ඕක ඔය මුළාවෙන් නේ හදලා තියෙන්නේ, ඒවා වඩලා වැඩක් නෑ කියලා එහෙම අතහරින්න බැහැ. මේ නුවණ ගත්තට අර මුල ටික අතහරින්න බැහැ. මොකද අපි ජීවත් වෙන්නේ රූපත් එක්කමයි. ඒ කෙලෙස් තවම කැඩිලා නෑ. ඒවා ගැන බලන්න ඕන හොඳට. ඇලීමක් එනකොට ඒ රූපය ගැන හොඳට අශුභය වඩන්න. එතැන රූපයක් නෑ කියන එක වඩන්න බැහැ එකපාරට.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>:- ඊවටුනහම තියෙන කෙලෙස් කැඩෙනවා කියන එක පෙනෙන්න ඕන. දැන් පෙනෙන එක එළියේ කියලා විශ්වාස කරන කොට සක්කාය දිට්ඨිය එනවා. ඒක පැහැදිලි වෙන්න ඕනේ. ඒ පෙනෙන කොට මේ එළියේ දෙයක්මයි දැනගත්තේ කියලා හිතුවොත් අනිවාර්‍යයෙන්ම සක්කාය දිට්ඨිය එතැන තියෙනවා. මොකද අපි රූපය භාර අරගෙන, රූපය උපාදන කරලා.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>:- වෙන්නේ නැත්තේ මොකද කියන එක වෙනම හොයාගන්න ඕන. ඒක තමයි මේ දහම තේරුම් අරන් ඒක හිතට පෙන්නන්න ඕන, මෙන්න මේ මුළාව හින්දයි රූපය භාරගත්තේ. මේ මුළාව හින්දයි රූපය භාරගත්තේ කියන එක ඒකත් පටිච්චසමුප්පන්නයි. ඒ භාරගන්න හේතු යෙදුන හින්ද භාරගත්තා. දැන් බල්ලා වතුරේ බල්ලෙක් ඉන්නවා කියලා භාර ගන්නේ නිකම් නෙවෙයි. ඒ හේතු යෙදෙන කොට භාරගත්තා. ඒක අපි පෙන්නන්න ඕන. එහෙම විශ්වාස කළේ මේ හේතු යෙදුන හින්ද යි. සමුදය පෙන්නන්න ඕන අපි. සමුදය පෙන්නන කොට තමයි පෙනෙන්නේ සමුදය නැතිවුනා නම් මොකද වෙන්නේ කියලා. ඒක එන අවබෝධයක්. අත්ථඞ්ගමය නැත්නම් නිරෝධය කියන එක බලෙන් දෙන්න බැහැ. අපි සමුදය පැත්ත පෙන්නන්න ඕන. ඒ පෙන්වීම තුලින් එන අවබෝධයක් අර. නුවණක් ගන්න පුළුවන් සමුදය මෙන්න මේ ටික යෙදුනේ නැත්නම් ඔහොම පිහිටන්නේ නැහැ නේද? ඒක තමයි සත්‍යය ඥානය කියන්නේ. තවම කෘත්‍යය කරලා නෑ. **භාවිතා බහුලීකතා** කරලා නෑ. ඒවා ටික කරලා තිබුණා නම් අහන කොටම මගඵල ලැබෙයි. ඔය ධර්මම අහලා රහත් වුණ අය හිටියා නේ මගඵල ලබපු අය. ලක්ෂ ගණන් අවබෝධය ලැබුවා. ඕවා වඩලා තියෙන්න ඕන අවබෝධය එන්න. අපි ඒක තේරුම් අරන්, ටික ටික හරි හිතට ඒවා පෙන්නන්න ඕන.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>:- ඒවා ලෝකයට අයිති දේවල්මයි. එළියේ දෙයකටම නේ ලෝභ කරන්නේ. එළියේ දෙයක් එක්කම නේ ගැටෙන්නේ. රූපයට අහුවෙලාමයි. අහුවුනේ මොකක් හින්ද ද? මෝහය හින්ද යි. ලෝභය තියෙනවා නම් මෝහය තියෙනවා. ද්වේශය තියෙනවා නම් මෝහය තියෙනවා. මුළාව. ඒක ඔය කරුණු එකතු කරන එක නෙවෙයි. ප්‍රායෝගිකව මොකක්ද කරන්න ඕන කියන එකයි තේරුම් ගන්න ඕන. ඒක මම අර ආනාපානසතිය කරද්දි පෙන්නුවා නේද? හුස්මට සිහිය පිහිටනකොට කරන්න ඕන දෙයක් තියෙනවා. හුස්මට සිහිය පිහිටන්නේ නැත්නම් ඉස්සෙල්ලා ඒක හදගන්න ඕන. හිත එහෙ මෙහෙ දුවනවා වැඩි නම් ආයෙ ආයෙ ගන්න ඕන. ඊළඟට හුස්මේම සිහිය පිහිටන කොට, ඔන්න දැන් මනස සන්සුන්. මනස සන්සුන් වෙනකොට විදර්ශනය කරන්න හිත ලෑස්තියි. අන්න ඒ වෙලාවට සද්දයක් ඇහිලා රූපයක් දැනගත්තහම

ඔන්න අපට මේ දැනගත්තු දේ පෙන්නන්න පුළුවන්. ඔය රූපය ඇහැට පෙනුනේ නැහැ නේ. ඇහැ වහගෙන නේ හිටියේ. එහෙනම් හිතෙන් හදපු එකක් තමයි දැනගත්තේ. ඒක එළියේ තියෙන සතරමහාධාතුව වෙන්න බැහැ. එහෙම කළේ අපේ තියෙන මෝඩකමට, මුළාවට. අර වතුරට එබෙන බල්ලා වගෙයි. ඒක හිතට පෙන්නන්න ඕන. පෙන්නන්න නම් තමන් දැනගෙන ඉන්න ඕන. දැනගන්න තමයි ඕවා අපි ආයෙ ආයෙ කතා කරන්නේ. ඒවා පැහැදිළි නැත්නම්, ආයෙ ආයෙ අහලා අහලා තේරුම් කරගන්න ඕන. පැහැදිළි වෙන්නෙත් නෑ ඕක ලේසියෙන්.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>:- තමන්ට හුස්මේ හිත තියාගන්න බැරිනම් හිත තියාගන්න පුළුවන් එකක් අල්ලාගන්න. හුස්මේම තියාගන්න ඕන කියලා නීතියක් නෑ. ඒක පොදු එකක් විතරයි. ඒක අමාරු නම් වෙන ක්‍රම තියෙනවා. සම සතළිස් කමටහන් කියලා හතළිහක් තියෙනවා. ඕන තරම් කරන්න පුළුවන්.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u>:- විදර්ශනය පුළුවන් නම් පුළුවන් තරම් විදර්ශනය කරන්න. විදර්ශනය කරගෙන යද්දී පෙනෙනවා දැන් ටිකක් කරන කොට හිත දුවලා ගොඩාක්. එහෙම වෙන්න අඩුව තමයි අපේ සමථය වැඩිලා නෑ. හිතේ කලබල වැඩියි. ඒ හින්ද තමන්ට පුරුදු මොකක් හරි භාවනාවක්, බුදුගුණයක් වෙන්න පුළුවන්. ඒක ආයෙ ආයේ කිය කියා ඉන්න. සුවපත්වේවා වෙන්න පුළුවන්. ඒක කිය කියා ඉන්න. එතකොට තමන්ට ලෙහෙසියෙන් හිත හිතා ඉන්න පුළුවන් මේක කියලා තමන්ට හැඟෙනවා. දැන් මට පුළුවන් කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇට මිදුළු. ඒ ටික නිකම් කියාගෙන යන්න පුළුවන්. තේරුමක් නැතිවුනත් ඔය ටික කියාගෙන යන්න. හිතෙන් හිතෙන් කියන කොට සිහිය පිහිටන්න එනවා. එතකොට ඒක කියනකොට මේ තියෙන තැන්වලටත් අවධානය යොමුවෙනවා. ඒ පූර්ව ප්‍රතිපදාවේ ඕනෑ එකක්, තමන්ට පුරුදු එක කරන්න පුළුවන්. කොච්චර හිත දිව්වත්, තරහා ගිහින් ඉන්න වෙලාවක වුනත් මේක පුළුවන් කියන මට්ටමකට ඒක පුරුදු කරන්න. කරන කොට තමයි එහෙම පුළුවන් වෙන්නේ. සුවපත් වේවා, සුවපත් වේවා වචනයේ තේරුම හිතුවේ නැති වුනාට කමක් නැහැ. තරහා යන වෙලාවට කටපාඩමෙන් හරි කමක් නෑ, සුවපත් වේවා, සුවපත් වේවා කිය කියා බනින්න. මොකද වෙන්නේ බලන්න ටිකක්. හිත අනිත් පැත්තට, මේ ඇත්ත පැත්තට හිත පෙන්නනවා.

<u>ප්‍රශ්නයකට පිළිතුරක්</u> :- නිතරම සමථ කමටහනක ඉන්න. ඒක තමයි ආරක්ෂක ස්ථානය වෙන්නේ. සමහරුන්ට හුස්ම ලෙහෙසියි. හුස්මම බල බලා ඉන්න කොට, යන කොටත් හුස්ම දිහා බල බලා යන්න පුළුවන්. ඒක

නිතරම පිහිටන දෙයක් වෙනවා. මුඛ නිමිත්තක් වෙන්න පුළුවන්. මොකක් හරි තමන්ට අවධානය යොමු කරගෙන. ඇවිදින කොට දැනෙන දේවල් වෙන්න පුළුවන්. ඒවා දිහා වුනත් බලාගෙන යන්න පුළුවන්. සතිපට්ඨානයේම තියෙනවා; පූර්ව ප්‍රතිපදාව විදියටත් තියෙනවා, ආයතී ප්‍රතිපදාව විදියටත් තියෙනවා. කොහොම හරි ඕවායේ යෙදෙන්නයි ඕනෑ වෙන්නේ.

මේ කාලය තුළ දැන් සතුටු වෙන්න පුළුවන් අපි සීල සමාධි ප්‍රඥා වැඩෙන භාවනාවල යෙදුනා. මහානිසංශ කුසල් සම්භාරයක් රැස්කරගත්තා කියලා සතුටුවෙන්න පුළුවන්. එහෙම වෙන්නේ මේවා නිවන් අවබෝධයටම හේතු වෙනවා. ඒ කියන්නෙ යම් කිසි දවසක නිවන් අවබෝධ කරන තුරුම උපකාරීවෙන කුසලකර්ම යි. ඒකයි මහානිසංශ කියන්නේ. මේ ජීවිතයේ ඵල දීලා හරි කීපයක් ඵල දීලා හරි ඉවරවෙන්නේ නෑ. යම්කිසි දවසක නිවන් අවබෝධ වෙනකම්ම ප්‍රයෝජනයක් තියෙන මහානිසංශ කුසල් සම්භාරයක් රැස්කරගත්තා කියලා සතුටුවෙන්න පුළුවන්.

# 2015.10.11 වැනි දින ස්වාමීන් වහන්සේනමක් සමග කළ ධර්ම සාකච්ඡාව

***රූපසිංහ මහතා*** :- ආපෝ, තේජෝ, වායෝ, පඨවි පිහිටන්නේ නැත්තේ, එළියේ මොකක් ද තියෙන්නේ කියලා, විඥ්ඥාණවාදයට අහු නොවී, විඥ්ඥාණවාදීන් කියන්නේ මොකුත්ම නෑ කියලා, එහෙම අහු නොවී ඇත්තටම එළියේ තියෙන්නේ මොකක් ද?

***ස්වාමීන් වහන්සේ*** :- ඇත්තටම එළියේ තියෙන්නේ මොකක් ද කියලා අහපුවහම ඕකේ උත්තරේ මහත්තෙයා, බෙදලා දක්වන්න ඕන උත්තරයක්. ඒකේ බෙදලා දක්වන කොට මූල පරියාය සූත්‍රයේ දී, ඒකේ අටුවාවෙදී අපට හම්බවෙනවා, සතර මහා ධාතු පිළිබඳ කතා ප්‍රවෘත්තිය. අපි දන්න සතර මහා ධාතු සහ ඇත්තටම පිහිටා තිබෙන සතර මහා ධාතු පිළිබඳව අර්ථය දෙකක්. අපි සාමාන්‍යයෙන් අපේ මට්ටමෙන් අපි ගන්න ක්‍රමයක් තියෙයි. හැබැයි සතර මහා ධාතු සතර ආකාරයකට බෙදෙනවාඃ සතර මහා ධාතු සතර ආකාරයයි. **i. ලක්ඛණ පඨවි, ii. සසම්භාර පඨවි, iii. ආරම්මණ පඨවි, iv. සම්මුති පඨවි** කියලා පඨවිය හතරකට බෙදෙනවා. ඒ විදියට ආපෝ, තේජෝ වායෝ කියන මේවාත් අර විදියට ප්‍රභේද හතරෙන් බෙදෙනවා.

එතකොට අපි දැන් **සම්මුති** පඨවිය කියලා කියන්නේ, සම්මත පඨවි ආපෝ තේජෝ වායෝ කියලා කියන්නේ ඃ අපි කියමු දැන් 'පඨවි' කිව්වාහම පස් කියලා කියන්නේ - පොළොව - මහ පොළොවට පඨවි කියලා කතා කරන්නේ ඒක සම්මතයක් කරගෙන යි. ඊළඟට 'ආපෝ' කියපු ගමන් වතුර. 'තේජෝ' කියපු ගමන් ගින්දර. එහෙම නැත්නම් ඉර එළිය හරි - ගිණි කියලා තමයි ගන්නේ හුඟාක් දුරට, ගින්දර කියන එක. ඊළඟට 'වායෝ' කියපු ගමන් සුලං කියනවා. ඕක අර ගොඩාක් දුරට ඉස්සර පැරැණි හාමුදුරුවරු කිව්වා 'පස් දිය ගිනි සුලං' හතර තියෙන තැනක් කියලා කතා කරනවා නේ. 'පස් දිය ගිනි සුලං' සතර තමයි සතර මහා ධාතු කියලා කතා කරන තැනකට එදා පනවලා තිබුනේ. ඉස්සර අපට පොඩිකාලේ මතකයි අපි අධ්‍යයනය කරන කාලෙදී පස්, දිය, ගිනි, සුලං හතරයි කියලා ලෝකයේ තියෙන්නේ ඔච්චරයි කියලා කතා කළේ. නමුත් ඒක සම්මුති, පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන හතරයි.

ඊළඟට **සසම්භාර** පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියල කියන කාරණාවක් අයිති වෙනවා. ඒක තමයි අපට පෙනෙන මට්ටමකට ඇවිල්ලා තියෙන්නේ. පෙනෙන මට්ටමේ දී වර්ණ සටහන තමයි පෙනෙන්නේ.

නමුත් වර්ණ සටහන පිහිටා සිටින්න ඕන නේ. නැත්නම් නිකම් අවකාශයේ තියෙන්නේ නෑ නේ වර්ණ සටහනක්. ඇහැ ආධ්‍යාත්මික වෙනකොට, ඇහැට බාහිර වෙච්ච ඒ වර්ණ සටහනක් නේ. එතකොට ඒ වර්ණ සටහන පිහිටා තියෙන්නේ, අපි දැන් ඕකට උදාහරණයකට මට මහත්තයලාට මතක් කළ හැකියි, ටෝච් එකක් ගැහුවොත්. කිසිම ගහක් කොළක් මොනවාවත්ම නැති පරිසරයක ටෝච් එකක් ගැහුවොත්, ටෝච් එකේ එළිය වදින්න තැනක් නැහැ නේ. ඒකේ එළිය කොච්චර දුර ගියාද කියන්නත් අපට තේරෙන්නේ නැහැ නේ. හැබැයි ඔය අතරේ ගහක් හරි, ගලක් හරි මොකක් හරි දෙයක් තිබුණොත් මේ එළිය වදිනවා නේද? අර එළිය පිහිටා හිටින්නට තැනක්, පරිසරයක් තියෙන්නට ඕනෑ නේ. ඒ පරිසරයට කියනවා **සසම්භාර** සතර මහා ධාතු කියලා. ඒ සතර මහා ධාතු අතරෙන් විශෙෂයෙන්ම පඨවි එක තමයි ඔතැන ප්‍රධාන වෙන්නේ. පඨවියට තමයි යමක් දර්ශණය කරගන්න පුළුවන්කම තියෙන්නේ. අපට පෙනෙනවා නම් පෙනිලා තියෙන්නේ වර්ණ සටහනක් බව ඇත්ත යි. නමුත් ඒ වර්ණ සටහන රැඳෙන්න පුළුවන් වෙලා තියෙන්නේ අපට මේ කණුව කියලා හරි, බිත්තිය කියලා හරි සසම්භාර මට්ටමේ තියෙන සතර මහා ධාතුවල තමයි, අපට ඒ වර්ණ සටහන පිහිටලා තියෙන්නේ. ඒකට කියනවා සසම්භාරයි කියලා.

ඊළඟට **ලක්ඛණ** කියලා කියනවා. ලක්‍ෂණයක් කියලා කියන්නේ අපි විමර්ශණය කර කරා ගන්නකොට, තද ගතියෙන් යුක්ත යම් දෙයක් තියෙනවා නම් ඒක පඨවි ධාතුවට දානවා. වැගිරෙන ගලන ස්වභාවයෙන් යුක්ත නම් දෙයක්, ඒක ආපෝ වලට දානවා. එතකොට ඌෂ්ණ සීතල කියන ප්‍රභේදය අනුව වෙන් කරනවා නම් ඒක තේජෝ වලට දානවා. ඒකේ ගතිය අනුව. ඊළඟට විසුරුවන සුළඟ වගේ විසුරුවන, හැකිලෙන ස්වභාවයකින් යුක්තයි නම් ඒක වායෝ කියන තැනකට දානවා. ඒක ලක්‍ෂණය අනුව තමයි නම් කරලා තියෙන්නේ. ඒකත් අපි ඔය දැන් කෙස් කියන එක, ලොම්, නිය, දත්, සම්, මස් කියලා අපි ශරීරයේ කොටස් විස්සක් වෙන් කරනවා නේ පඨවි ධාතුවට. හැබැයි ඕක පඨවි ධාතුවට කියලා වෙන් කරන්නේ ඒකේ ලක්‍ෂණය අනුවයි. හැබැයි ඕක මැරුණාට පස්සේ කුණුවෙන කොට ඔය තියෙන තද ගතිය අඩුවෙලා ඔය ඔක්කෝම ආපෝ බවට පත්වෙනවා නේ. ඕජා බවට පත්වෙනවා නේ. එතකොට එතැන ලක්‍ෂණය වෙලා තියෙන්නේ ආපෝ ධාතුව යි. ශරීරයේ උෂ්ණ බවක් දැනෙනවා නම්, අපි කියන්නේ රස්නය තියෙනවා ද නැද්ද කියලා අපි බලන්නේ ඇගේ රස්නය කොහොමද කියලා, එතැන තේජෝ උෂ්ණ සීතල බවක් අපි කතා කරනවා නම් ඒ ලක්‍ෂණයක් අනුවයි කතා කළේ.

***කොග්ගලගේ මහතා :-*** ඒකත් හාමුදුරුවනේ දැන් අපි බාහිර පවතින ස්වභාවයක් කියන මට්ටමෙන් නේද?

***ස්වාමීන් වහන්සේ:-*** ඔව්, ඒකත් බාහිරයම තමයි. බාහිර දෙයක මෙන්න මේ ගති කියන තැනකින් ඇවිල්ලා තියෙනවා.

ඊළඟට **ආරම්මණ** පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා කියනවා. ඕකේ අටුවාවේ විස්තරයක් තියෙනවා, ආරම්මණ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා කියන කොට, කසින භාවනාවල දී පඨවි කසිනය අරමුණු කරන බවක්. ඒ කියන්නේ පඨවි කසින මණ්ඩලයක් හදලා, ඒ කසින මණ්ඩලය මනසින් අරමුණු කරලා, ඒ මනසේ හදගන්නවා නේ පඨවිය පිළිබඳව සංකල්පනාවක්. සංඥවක්. ඔන්න ඕකට කියනවා ආරම්මණයේ පඨවිය කියලා. අටුවාවේ විස්තරයේ තියෙන්නේ එහෙම කථාවක්. හැබැයි ඊට එහාට ගිහිල්ලා කාරණයක් හිතෙනවා. ඒ කියන්නේ ඒක විතරක්ම නෙවෙයි. ඒකත් එකක් වෙන්න පුළුවන්. නමුත් ආරම්මණ පඨවියි කියන කතාවට වෙන්නේ දැන් අපට පෙනෙන වර්ණ සටහනක අරමුණක් අරගන්නවා නේ අපේ මනසෙන්. ඒ ගත්ත අරමුණ තුළ අපේ මනස පවත්වාගන්න කියන කාරණාවක් තුළ, ඒකෙම එළඹ ඉන්න බවක් තියෙනවා නේ. අපි දැන් සමහර හිත් ගැන, 'මහ කලුගලක් වගේ මහ තද හිතක්' කියලා හිතනවා නේ. සමහර හිත් ගැන, 'මහ වෙඩරු පිඩක් වගේ දියවෙන හිතක්, මගේ හිත නිකම් පිච්චිලා දැවිලා ගියා' කියන තැනකින්, අර හිතේ ගති පිළිබඳව එන කාරණා ටිකක් තියෙනවා නේ. හැබැයි, ඒ කාරණා ටිකටත් අපට අරමුණක් මුල් කරගෙන නම් තියෙන්නේ, ඒ කියන්නේ බැහැර අරමුණක් මුල්කරගෙන නම් මේ ගතිය අපේ හිතේ ඇතිකරගත්තේ අන්න ආරම්මණයේ තමයි මේ ගතිය ඇතිවෙලා තියෙන්නේ.

ඒක එකක්. අනිත් එක මට ඔය කාරණාවට වඩා හරි කාරණයක් එනවා: දැන් අපි හිතන්නකෝ මේ මේසය දැක්කහම අපේ හිතට එනවා, මේක හරි තද යි. මේ තද බව මෙහේ අපි අල්ලාගත්ත බවවත්, බලන බවවත් බැහැරින් නෙවෙයි තීරණය කළේ. ගත්ත අරමුණේ අපි තද බවක් හිතලා තියෙනවා. සමහරවිට උස්සලා ගන්නවා. මෙහෙම උස්සලාගත්තාට එච්චර බර නෑ සමහර වෙලාවට. සමහර වෙලාවට පෙනුමෙන් අපට සැහැල්ලුබවක් තියෙනවා. දැන් කියන්න කෝ උදාහරනයකට : මිරිඟුව කියන එක. අපට මිරිඟුව වතුර බවට ජේනවා නේ අපට. ඒ වතුර බවට පෙනෙන්නේ එතැන වතුර තියෙන හින්ද නෙවෙයි. අපේ මනසේ අරමුණ තුළ අපට තීරණයක් ඇවිල්ලා තියෙනවා මෙතැන තියෙනවා ආපෝ ගතිය. ඊළඟට, රස්නේ : දැන් අපි කියන්නකෝ ගින්දර පෙනෙනකොට

අපේ මේ අරමුණේ පිච්චෙයි කියන ගතියක්; අයිස් කැටයක් දකිනකොට මෙහේ අරමුණේ අපට තියෙනවා නේ අපට සීතල බවක් කියලා තැනක්. එතකොට මේ අරමුණේ තියෙනවා අර බැහැර කාරනයක් මුල් කරගෙන අරමුණ යෙදිලා තියෙනවා සතර මහා ධාතුවල ගතියක් එක්ක ඇති බවට කියන පැත්තෙන් එනවා. මොකද අටුවාවෙ අර විස්තරේ තිබුණාට, ඒකත් හරි වෙන්න පුළුවන්. මොකද ඇත්තටම අරමුණු කරනවා නේ එයා පඨවිය. පඨවි කසිනය අරමුණු කරලා එයා පඨවි කසිනයෙන්, පඨවි නිමිත්තක් හදාගෙන එයාට සමථය උපරිමයෙන් වඩන්න පුළුවන් මට්ටමක් තියෙනවා නේ.

***කොග්ගලගේ මහතා :-*** ඒ කියන්නේ අපි දැන් හිතෙන් මොනවා හරි අරමුණු කරන ගමන්, ඒ අරමුණට මේ ලක්ෂණ අදාලයි කියලා...

***ස්වාමීන් වහන්සේ:-***ඒ කියන්නේ අරමුණේ ලක්ෂණය කියලා කිව්වා ට මේ අරමුණේ ලක්ෂණය යොදලා තියෙන්නේ අර බැහැර එකට නේ. බැහැරින් බලලා. එතැනත් බැහැර අරමුණක්මයි අපි මේ ලක්ෂණයට යොදාගෙන තියෙන්නේ. නමුත් වෙන සිද්ධිය මානසිකයි. සිදුවීම ඇත්තටම මානසික යි. ඒ කියන්නේ මනායතනය තුළ වෙන සිදුවීමක් තියෙන්නේ. දැන් අපි මෙහෙම මේක පොත කියලා තීරණය කළෙත්, මේක නවන්න පුළුවන් කියලා තීරණය කළෙත්, මේක හරි තදයි කියලා තීරණය කළෙත් මනස තමයි. හැබැයි එහෙම තීරණය කළේ මේ පොත පිළිබඳව, පොතට අයිතියි කියන තැනකින් නේ.එහෙම කියලා මනසෙන් තමයි මේක හදන්නේ.

***කොග්ගලගේ මහතා :-*** අයිතියි කියලා මනසෙන් තමයි මේක හදන්නේ.

***ස්වාමීන් වහන්සේ:-*** ඔන්න ඔය විදියට සතර මහා ධාතු හතර ආකාරයකින් තියෙනවා. ඒකේ දැන් අපි කියන්නකෝ ඔය ආරම්මණය පිළිබඳ කතා කරන කාරනාවට තවත් උදාහරණයක් දෙන්නම් : අපි දැන් රෑට හීනයක් දකිනවා කියන්නකෝ. ඔය දකින හීනයේ තියෙනවා නේ භෞතික දේවල් ඕන තරම් අපට පෙනෙන මට්ටමට. ඒ කියන්නේ භෞතික යමක් තිබිලා නෙවෙයි නේ. භෞතික දේවල් ඕන තරම් අපට පෙනෙනවා නේ. හැබැයි ඒ හැම අරමුණක්, අරමුණක් ගානේම ඔය කියන ලක්ෂණ ටික අපේ මනසේ තියෙනවා. ඒක ආරම්මණ මට්ටමේ තියෙන්නේ. අද ඇස් දෙක ඇරගෙන ඉද්දිත්, අපට මේ පෙනෙන හැම කාරනයක් මුල් කරගෙන ම, මානසිකයේ තියෙනවා ඔය කියන ආරම්මණ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන මට්ටමකින් නිර්ණය කිරීමක් අපේ මනසේ. හැබැයි වෙනසකට තියෙන්නේ අර නින්දෙදී නිදාගෙන ඒ හීනෙන් දකින වෙලාවෙදී සසම්භාර පඨවි, ආපෝ, තේජෝ, වායෝ එතැන නෑ. අද

මෙහෙම ඇස් දෙක ඇරලා බලනකොට සසම්භාර පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා තියෙනවා අර වර්ණ රූපය රැඳෙන තැනක්. එහෙන් එහෙම රැඳෙන්න තැනක් තියෙන කොට මෙහෙන් ආරම්මණයක් තියෙන කොට මේ දෙපැත්තකින් මේක එකතු වෙලා තමයි අපේ මනසේ ඇත්තටම තියෙනවා කියලා යමක් අපට අහුවෙලා තියෙන්නේ බැහැරින්.

*රූපසිංහ මහතා* :- සසම්භාරිකයෙන් තමයි එවෙලේ...

***ස්වාමීන් වහන්සේ***:- සසම්භාරිකයෙන් තමයි එවෙලේට වර්තමාන සිද්ධියකින් සම්බන්ධ කරලා පෙන්නුවේ. ඔන්න ඔහොම විග්‍රහයක් තමයි ඉතින් දන්නේ නම්.

*රූපසිංහ මහතා* :- අපි මෙහෙම ඇහුවොත් : අපි ගෙදර ඉඳලා ඔබවහන්සේට කතා කරලා, ඔබවහන්සේව අපට හිතේ සිහිකර ගන්න පුළුවන්. මෙතැනට ආවහම දකින්නේ සසම්භාර දේ...

***ස්වාමීන් වහන්සේ***:- මෙතැනට ආවහම දකින්නේ සසම්භාර දේ දැක්කාට, එයද ආරම්මණයේමයි තියෙන්නේ. මෙතැන තියෙනවා ආරම්මණයත් එක්ක සසම්භාරයයි කියන දෙකම යෙදිලා. ගෙදර දී සිහිකරලා විතරක් කතා කරන වෙලාවෙදි තියෙන්නේ ආරම්මණය විතරයි. අර දෙන්නෙක් සාක්ෂි දුන්නොත් නඩුවක් දිනන්න පුළුවන් කියල කියන්නේ. සාක්ෂි දෙකක්වත් තියෙන්න ඕනැයි කියලා කියන්නේ. දැන් දෙපැත්තකින් සාක්ෂි දෙනවා නේ. ඒ හින්ද ඇත්තමයි කියලා අපට අද ඔප්පුවෙලා තියෙන්නේ. ඒ කියන්නේ මේ ඉන්න කෙනා ඇත්තමයි කියලා. මේ පෙනෙන රූපය ඇත්තමයි කියලා අපට ඔප්පුවෙලා තියෙන්නේ. මෙහෙත් හදගත්ත එක තියෙනවා. මෙහෙත් ඒකට අදාල කාරනේ තියෙනවා නම්, මේ දෙකම ගැටහනවා නම් අපේ මානසික මට්ටමෙන්, අපට ආයේ ගලවාගන්න ලෙහෙසි වෙන්නේ නෑ.

*කොග්ගලගේ මහතා* :- එතකොට ගැට ගහලාම නේද. ඕක ඇත්ත යථාභූත ස්වභාවය නො වෙයි.

***ස්වාමීන් වහන්සේ***:- නෑ නෑ, ගැට ගහලාමයි. යථාභූත ස්වභාවය නො වෙයි. හදගෙනමයි තියෙන්නේ. ඒ කියන්නේ හදගෙනමයි තියෙන්නේ කියලා කියන්නේ මේ ඇතුළේ හදගත්ත ආරම්මණය තුළ හදගන්න කාරනාව තුළ තියෙන්නේ, ඒ කියන්නේ ඇත්තටම අපි නිර්මාණය කරගත්ත එකමයි අපි මේ බලනවා කියලා කියන්නේ. ඇත්තටම දැන් අපි උදාහරණයක් කිව්වොත් එහෙම, කෙහෙල් අත්තක් හෙල්ලෙනවා කියන්නකෝ. ඇත්තම සිද්ධිය කෙහෙල් අත්තක් හෙල්ලෙන එකයි. හැබැයි අපි මෙහේ මනසින් හදගෙන

තියෙනවා නම් යකෙක් හරි, භූතයෙක්, මොකෙක් හරි, හොල්මනක් හරි, මොකක් හරි කියන තැනකින්, අපට කෙහෙල් අත්තක් පෙනෙන්නේ නැහැ. අපට පෙනෙන්නේ යකෙක් ඉන්නවාමයි කියලා එතැන. එතකොට දැන් මේ ඉන්න එක, තියෙන එක පෙනෙනවා ද අපට, අපි හදාගත්ත එක බලනවාද? හැම වෙලේමකරන්නේ, අපි හදාගත්ත එක බලන එකමයි. නමුත් අපට හිතෙනවා, මෙහෙ සජීවී කරගෙන තියෙන නිසා මෙහේ එක ඇත්තයි, ඒ ඇත්ත එක තමයි අපට මේ පෙනෙන්නේ කියලා.

*කොග්ගලගේ මහතා* :- දැන් අපි දැන් ඕක වෙන් කර ගත්තා කියමුකෝ; පෙනෙන ස්වභාවය එකක්, පවතින ස්වභාවය තව එකක් කියලා. මම හිතන්නේ මේ අහන්නේ දැන් පවතින ස්වභාවය මොකක් ද කියලා.

*ස්වාමීන් වහන්සේ*:- පවතින ස්වභාවය තමයි, සසම්භාර පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන තැනකින් ඒ ලක්ෂණ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ටිකකින් සහ සම්මුති පඨවි, ආපෝ, තේජෝ, වායෝ ටිකකින් පවතින ස්වභාවයක් තියෙන්නේ. දැන් වැඩේ තියෙන්නේ, රූපය ගැන කතාකරන්න, නාම ධර්ම නැතුව කතා කරන්නේ කොහොම ද? මොකද, රූපය කියන එක හඳුනාගැනීම සඳහා නාම ධර්මික අත්‍යාවශ්‍ය බවක් තියෙන්නේ. මොකද නාම ධර්මයක් නැතුව, රූපයකට රූපයක් හඳුනන්න බැහැ නේ. එතකොට මේ නාමයක් හා රූපයක් කියන තැනකින් අපි හඳුනන්නේ අපේ මට්ටමේ හදාගත්ත එකකින් දලානේද බලන්න.

*කොග්ගලගේ මහතා* :- අන්න ඒක තමයි, මේ නාමවලට අහුවෙන රූපයක්ම නේ අපි කතාකරන්නේ අර පැත්ත අහුවෙන්න විදියක් නෑ නේ.

*ස්වාමීන් වහන්සේ*:- එතකොට එතැන අහුවෙන්න විදියක් නැහැ කියලා කියන්නේ එතැන ඇත්තටම තියෙනවා නම් තියෙන්න පුළුවන්කම තියෙන්නේ ශක්ති ටිකක් විතරයි. ශක්ති ටිකක් කියලා කියන්නේ, ගති කියලා දැන් අපි පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියලා කියන්නේ පඨවි කියලා එකක්, තියෙන එකක් නෑ. අපට දැනුනාට පඨවි කියලා තියෙන එකක් මෙතැන නෑ. එහෙම තියෙනවා නම්, කෙස් ගහ පඨවි නම්, ඒ කියන්නේ, මේ මස් ටික පඨවි නම්, ඒක ආපෝ වෙන්න බැහැ.

*කොග්ගලගේ මහතා* :- එතකොට වෙන් කරලත් ඉවර නේ මේවා.

*ස්වාමීන් වහන්සේ* :- එහෙම වෙන් කරන්න බැහැ. හතර දෙනා ශක්ති හතරක්. අපි මෙහෙම කියමුකෝ: කරන්ට් එක කියන එක පෙනෙන්නේ නෑ නේ අද අපට. හැබැහැ ශක්තියක්ම නේ ඒක. එකෙන් ඕන තරම් අපි වැඩ ගනියි නේ. නොයෙකුත් දේවල්වලට වෙන් කරගෙන, වෙන් කරගෙන.

කෙනෙක් කිව්වොත් හෙම වයර් එකක් පෙන්නලා, මේක කරන්ට් එක තියෙනවයි කියලා කිව්වාට, ' කෝ නෑ නේ. පෙනෙන්න නෑ නේ ' කියලා කියයි. හැබැයි කරන්ට් එක නිසා වැඩකරන දේවල් ටික පෙන්නුවොත් අපට, අපි දන්නවා සුවිච් එක දැම්මහම පැන් එක කරකැවෙනවා. කරන්ට් එක තියෙනවා. සුවිච් එක දැම්මහම ලයිට් එක පත්තුවෙනවා. කරන්ට් එක තියෙනවා කියලා අපි ඒකේ ඵලය දකිනවා මිසක අපට සතර මහා ධාතු කවදාවත් දකින්න බැහැ. සතර මහා ධාතු නිසා උපාදාය රූපවලින්, වර්ණ රූපය විතරමයි නම් අපට පෙනෙන්නේ ඉතුරු රූප විසිහතක් අපට පෙනෙන්නේ නැහැ. උපාදාය රූප විසිහතරෙන්, විසිතුනක්ම පෙනෙන්නේ නැහැ. සතර මහා ධාතුවේ එතැන තියෙන හතරත් එක්ක ගත්තහම විසි හතක් අපට පෙනෙන්නේ නැහැ. පෙනෙන්නේ එකම එක රූපයයි - වර්ණ රූපය විතරයි. එතකොට ඒ පෙනෙන්නේත් සතර මහා ධාතූන්ගෙන් හදපු උපාදාය රූපයක්මයි. එතකොට ඒ උපාදාය රූපය හඳුගන්න පුළුවන්කම තියෙන්නේ සතර මහා ධාතු හින්ද නෙවෙයි. ඒ සතර මහා ධාතු තියෙන නිසා හින්ද, ඒක හින්ද වර්ණ රූපයක් හැදුනා කියන එක නෙවෙයි. මෙතැන ආයතනය උපද්දවාපු හින්දයි අරක දකින්න පුළුවන් වෙලා තියෙන්නේ. හැම වෙලේම මේ පැත්තෙන් හේතු පෙන්නන්නේ ඒකයි. මෙහේ හදපු හින්ද නේ තියෙන්නේ. මෙහේ හදපු නැති කෙනෙකුට අරහෙම එකක් පෙනෙන්න බැහැ.

***කොග්ගලගේ මහතා :-*** හදපු නැති කෙනෙකුට ඒක පෙනෙන්නේ නැහැ. හැබැයි ප්‍රශ්නය තියෙන්නේ මෙහේ හැදුවා කියලා, එහේ නො තිබුණොත් ඒත් පෙනෙන්නේ නැහැනේ.

***ස්වාමීන් වහන්සේ:-*** නෑ හරි. මෙහේ හැදුව නිසා තමයි, එහේ උපදවාගෙන හරි බලන්න පුළුවන්කම තියෙන්නේ. උපදවාගෙන බලනවා කියන තැනකින් කියන්නේ අරමුණු කරලා අපට හඳුගන්න පුළුවන් නේ. දැන් කෙහෙල් අත්තක් තියෙන තැනක මට පෙරේතයෙක් හරි, යකෙක් හරි මවාගන්න පුළුවන් කියලා කියන්නේ, එතැන තිබ්බිච්චි හින්ද නෙවෙයි. මෙතැන හදගෙන බලපු හින්ද නේ. එතකොට සතර මහා ධාතු කියන පොදියක්, එහෙම නැතිනම් සතර මහා ධාතු රූප කලාප ටිකක් තියෙන තැනක, මට මෙහේ මානසික මට්ටමේ හැටියට නම් ඒක හැදිලා පෙනෙන්නේ, දැන් සතර මහා ධාතුම නෙවේ ද දේවත්වයට අයිති කයේ තියෙන්නේ? දැන් දෙවිවරු කියන්නෙත් කාමාවචර ලෝකයේම නේ. මොකද, රූපය නැති අය නෙවෙයි, රූපය තියෙන අය නේ. නමුත්, ඒ තියෙන රූපය මට පෙනෙන්නේ නැත්නම්? පෙනෙන්නේ නෑ කියලා කියන්නේ මෙතැන ප්‍රසාද ඒ මට්ටම දකින්න තරම් හැදිලා නෑ. එතකොට මේ හැදිලා තියෙන

මට්ටමේ හැටියට තමයි මෙතැන පෙනිලා තියෙන්නේ. මෙහේ තියෙන මට්ටමට පෙනුනා කියන තැනකින් නේ අද අපි හිතන්නේ.

***කොග්ගලගේ මහතා*** :- දැන් අහන්න හැදුවේ ස්වාමීන් වහන්ස, අර කියපු එකේ දැන් මෙහෙන් අපි ආයතන හදගත්තොත්, ඒ නිසාම නේ පෙනෙන්නේ. අරෙහෙ උදව්වක් ඇති.

***ස්වාමීන් වහන්සේ***:- මේක විතරක් පෙනුනාට ඒක නො තිබුණොත් ඒ වෙන්නෙත් නෑ. ඒක විතරක් තිබුණාට මේක නො තිබුණොත් ඒ වෙන්නෙත් නෑ. එකයි අර **තින්නං සංඝති ඵස්සො** කියලා මේ සිද්ධි තුනක් එකතු කරගෙන ආවේ. **චක්ඛුං පටිච්ච රූපෙච උප්පජ්ඣති චක්ඛුවිඤ්ඤාණං. තින්නං සංගති ඵස්සො** කියලා කිව්වේ මේ තුන්දෙනාගෙම එකතුවයි මේ ස්පර්ශය ඇතිකරවන්නේ, මනො සම්ඵස්සයක් ඇතිකරවන්න හේතුව.

***කොග්ගලගේ මහතා*** :- දැන් අපි අර උපමාව, කෙහෙල් අත්තේ යකෙක් දකිනවා කියන එක ගනිමුකෝ. දැන් මෙහෙන් මෙහෙම දකින්න ආයතනයක් අපි හදගෙන, එහෙම බලන හින්දමයි අරක පෙනෙන්නේ. එහෙම හැදුනේ නැත්නම් ඕක පෙනෙන්නේ නැහැ. මෙහෙන් හදගෙන දකිනවා කියන එක හරි. දැන් ප්‍රශ්නය තියෙන්නේ අරෙහෙ මොනවා හරි තියෙන්නම ඕනද කියන එකේ නේ ඔය දැන් ගැටළුව එන්නේ. ඒ තියෙන දේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ ද, නැත්නම්...

***ස්වාමීන් වහන්සේ***:- ඕකට දහමෙන් චූට්ටක් එහාට ගිහිල්ලා විද්‍යාත්මක පැත්තෙන් පොඩ්ඩක් කතා කරමු ද? දැන් දහමේ කියන කාරනය ඔයිට වඩා ගැඹුරුයි. මොකද විද්‍යාත්මකව කතා කළා කියන තැනකින් දහමට හානියක් වෙන්නේ නැහැ. මොකද දහම කියන එක විද්‍යාත්මක පැත්තෙන් අපට තවත් ඔප්පු කරගන්න පුළුවන් නේ එතකොට. අද අපි මේ බලනවා පෙනෙනවා කියන මට්ටමක් කතාකරන කොට අද මේ දකිනවා කියන මට්ටමේ තියෙන සියලූම දැකපු දේවල් තියෙන්නේ ඇහැ ඇතුළට වැටිච්ච අර ප්‍රතිබිම්බයක් විතරමනේ. එතකොට ප්‍රතිබිම්බය තියෙන්නේ කොහේ ද?

***කොග්ගලගේ මහතා*** :- බාහිරේ නෙවෙයි නේ.

***ස්වාමීන් වහන්සේ*** :- බාහිරේ නෙවෙයි නේ. ඒක ඇතුළට වැටිච්ච එක නේ තියෙන්නේ. එතකොට අපට හැම වෙලේම අත්දැකීම තියෙන්නේ මේ ඇහැට වැටිච්ච ඡායාමාත්‍රයක අත්දැකීමක් මිස, ඇහෙන් එළියේ දශමයක් අපි දන්නේ නැහැ.

*කොග්ගලගේ මහතා* :- අත්දකින්න විදියක් නෑ.

***ස්වාමීන් වහන්සේ***:- එතකොට ඇහෙන් එළියේ තියෙන දෙයක් ගැන අපි කොච්චර කතා කළත්, අපට අත්දැකීම, දශමයක අත්දැකීමක් නෑ මේ බැහැර යන කාරනාවත් එක්ක. එතකොට තියෙන්නේ ඇහේ අර අපි කියන්නේ දෘෂ්ටි විතානයට වැටිච්ච ප්‍රතිබිම්බය හරහා, ඒ ප්‍රතිබිම්බයට මානසික මට්ටමෙන් හදගත්ත ටිකක් නේ මේකට එකතු කරගන්නේ. මොකද, ප්‍රතිබිම්බය කීයටවත් ඔය දෘෂ්ටි විතානයට කියන්නේ නෑ, මේ ඇහැට පෙනෙන්නේ මනුෂ්‍යයෙක්, ඇහැට පෙනුනේ ගහක්, ඇහැට පෙනුනේ ගෙයක් කියන තැනකින් මේ දෘෂ්ටි විතානයට හැකියාවක් නැහැ. ඒ අරබයා මානසික මට්ටමෙන් කරන කාරනා ටිකක් තමයි සම්පටිච්ඡන, සන්තීරණ වොත්පන කියන කාරනා වලින් එන සිද්ධියක් තමයි අපේ අත්දැකීම වෙලා තියෙන්නේ මනසේ හැම වෙලේම. එතකොට ඒ අත්දැකීම් අනුව අපි කතා කරනවා හැරෙන්න අපට දශමයක අත් දැකීමක් නෑ නේ ඇහෙන්, මේ ඇහෙන් බාහිර සිද්ධියක් කියන්න. එතකොට ඔය ප්‍රශ්නයට උත්තරේ තියෙනවා නේ.

*කොග්ගලගේ මහතා* :- එහෙමයි.

***ස්වාමීන් වහන්සේ***:- එතකොට මෙහේ තියෙන එකක් ගැන අපි කතා කරනවා වෙනුවට...

***කොග්ගලගේ මහතා*** :- ඇත්තටම මම පැහැදිලි කරන්නෙත් ඔතැනින්මයි. අර අපි අර බිත්තර කටුවක් ඇතුළේ ඉන්නවා වගෙයි කියන එකට. අර project කරන ටික විතරයි අපට පෙනෙන්නේ.

***ස්වාමීන් වහන්සේ***:- එතකොට ආපහු කෙනෙකුටත් ප්‍රශ්නයක් වෙන්නට පුළුවන්, එහෙම දෙයක් වැටෙන්නත් එකක් තියෙන්න ඕන නේ.

*කොග්ගලගේ මහතා* :- ඕක තමයි අහන්නේ!!

***ස්වාමීන් වහන්සේ***:- එහෙම එකක් තිබිල නිසා නේද වැටෙන්න ඕන කියන කාරනාවක් තියෙන්නේ. හැබැයි මේ මනස කියන එක පිළිබඳව ඔන්න ඔය කියන කාරනාවත් එක්ක එකඟ වෙන්න අපට පුළුවන්කමක් නෑ. මොකද දන්නවද? මේ මනස කියලා කියන්නේ, බුදුරජාණන් වහන්සේ පෙන්නනවා විඤ්ඤාණය කියලා කියන්නේ මායාකාරයෙක්. එතකොට මෙයාට ඕන දෙයක් මවලා පෙන්නන්න පුළුවන්. මේ මවපු දේ තුළ අපි හොයන්න යනවා නම් තැනක මොකක් හරි දෙයක්, ඔන්න ඔතන ඒ දේ හරියි කියලා හෝ, ඒ දේ වැරැදියි කියලා හෝ තැනකට යොදනවා නම්,

ඔතන තමයි විඤ්ඤාණවාදයට අයිති වෙන්නේ. මේකෙන් හරිය කියන තැනකට මෙයා කියන කියන දේවල්වලට එකඟයි කියන තැනකට යනවානම් කෙනෙක්, විඤ්ඤාණවාදයට අයිති වෙනවා.

*කොග්ගලගේ මහතා :-* ඒක මේ අළුත් අර්ථකථනයක්. ඒ කියන්නේ ඔබ වහන්සේ හරි, හැබැයි ඒකහරි ගැඹුරුයි එතැන. මොකද අපි විඤ්ඤාණවාදයයි කියලා නිකම් හිතෙන්නේ එළියේ මොකුත් නෑ, ඔක්කෝම අරකෙන් හැදුවයි කියන එක නේ.

*ස්වාමීන් වහන්සේ:-* නෑ, ඊට වැඩිය ගැඹුරකට යනවා මේ කාරනාව.

*කොග්ගලගේ මහතා :-* දැන් එළියේ මොනවා හරි තියෙනවා කිව්වත් විඤ්ඤාණවාදයට වැටෙන්න පුළුවන්?

*ස්වාමීන් වහන්සේ:-* විඤ්ඤාණවාදයට වැටෙන්න පුළුවන්. මේ මෙතන විඤ්ඤාණාකාරයි. හැබැයි මෙතැන මොනවක්වක් නෑ නෑ නෑ නෑ කිය කිය මෙයා කියනවා නේද , අරෙහෙම යි තියෙන්නේ මෙහේ මොකුත් නෑ කියන තැනකට එනවා නේද. මේකම භෞතිකවාදයට යනවා. එකම තැනේ දෙපැත්ත කාරනා දෙක දෙපැත්තට වෙනස් වීමෙන් විඤ්ඤාණවාදයට හා භෞතිකවාදයට යනවා.

*කොග්ගලගේ මහතා :-* ඒක හරියට හරි. මම බොහොම එකඟ වෙනවා ඒකට.

*ස්වාමීන් වහන්සේ:-* එතැන දකින්න තියෙන්නේ මේ කාරනා දෙකම දැකලා මේ දෙකටම වැටෙන්නේ නැතුව, මේ හේතු ඵල දහමේ තියෙන න්‍යාය දැක්කා නම්, ඒක තමයි මධ්‍යම ප්‍රතිපදාව. නෑ කියන්නත් බැහැ, තියෙනවා කියන්නත් බැහැ. හැබැයි තියෙනවා නම් තියෙන්නේ මෙන්න මේ කාරනාව නිසා යි, නැත්නම් නැත්තේ මෙන්න මේ කාරනාව නිසා කියන මෙන්න මේ පැතිකඩවල් දෙකම දැකලා එයා මැදට එනවා. අන්ත දෙකෙන් එක පැත්තකටවත් යන්නේ නෑ.

*කොග්ගලගේ මහතා :-* එතැන මම හිතන්නේ ඔක්කෝටම උත්තර තියෙනවා. අපි අර එළියේ දේ හොයන්න යන එක නිශ්ඵල ක්‍රියාවක් වගෙයි.

*ස්වාමීන් වහන්සේ:-* මේ කෙලෙසයකට හැදිච්ච එකක් කියලා කියන්නෙම ඒකයි මහත්මයා, මොකද දන්නවාද, ඒ කියන්නේ නිවන පැත්තකින් තැබ්බො - නිවන පැත්තකින් තබන්නකෝ- දැන් කාමාවචර මට්ටමේ කෙනෙකුට රූපාවචර මට්ටමේ උපදින්න පුළුවන්කම තියෙන්නේ කාමය දුරු කරලා නෙවෙයි නේ මෙයා. කාමය කියන කෙලෙසය යටපත් කිරීමක්

කරලා අරමුණකින් යන්න පුළුවන් කමක් නේ තියෙන්නේ. නිරෝධයටහිත තියලා නෙවෙයි නේ මේ යන්නේ. කාමය කියන මට්ටම දුරු කරගන්න පුළුවන් මට්ටමක් එන්නේ යටපත් කරලා මෙයාගේ මනසට තියන්න පුළුවන් පරිසරය මොකක්ද කියන එක අපට හිතාගන්න වෙනවා නේ. එහෙම තියන්න පුළුවන් පරිසරයක් තියෙන හින්ද නේ එයාට තියන්න වෙන්නේ. ඊළඟට රූප මට්ටමෙනුත් මිදිලා, අරූප මට්ටමට මානසික මට්ටම තියන්න පුළුවන් වෙලා තියෙන්නේ එහෙම පරිසරයක් තියෙන හින්ද නේ. නැත්නම් අපට හිතෙන්න පුළුවන් මෙහෙම එකක් තියෙන හින්ද මයි මේ අපට පෙන්නලා තියෙන්නේ කියන තැනකින් ගත්තොත්. කීයටවත් මේ තියෙන හින්ද පේනවා කියන තැනකින්, මේ තියෙන එක නැතිකරන්න වෙනවා අපට මේ පෙනෙන එක නැතිකරලා. බාහිරෙන්ම නැතිකරන්න වෙනවා මේ අපේ මානසික මට්ටම වෙනස් කරන්න. දැන් බාහිරේ නැති කරන්න යන්නේ නැතුව මානසික මට්ටම වෙනස් කරන්න පුළුවන් ක්‍රමයක් ලෝකයේ තියෙනවා. නිවන නෙවෙයි.

*කොග්ගලගේ මහතා :-* හැබැයි එතැන මෙහෙම පැත්තකුත් තියෙනවා නේද, ස්වාමීන් වහන්ස. දැන් මේ අපි බාහිරේ වෙනස් කළොත් විතරයි (බාහිරේ තියෙනවා නම්, තියෙනවා නම් කියලා හිතුවොත්) අපට බාහිරේ වෙනස් කළොත් විතරයි කාම භූමියෙන් රූප භූමියට යන්න කියන එක වෙන්නම ඕන නෑ. මොකද, මේ පැත්තේ අපි ආයතනය සකස් කළොත් විතර නේ පෙනෙන්නේ.

*ස්වාමීන් වහන්සේ:-* ඒකටත් මම උත්තරය දෙන්නම්. එතැනදී දැන් සෘෂිවරු හෙම ගොඩාක් දුරට කැලෑව ඇතුළට ගිහිල්ලා මේ ගොල්ල ධ්‍යාන වඩන්න ගියාම නතර කරන්නේ එහේ හේතුව යි. ඇහැට පෙනෙන රූප නතර කරන්නයි හදන්නේ. කනට ඇහෙන ශබ්ද නතර කරන්නයි හදන්නේ. රූපවලින් මිදෙන්න තමයි මේ ආවේ. ඒ කියන්නේ රූප පෙනෙන එක වළක්වලා තමයි මෙයා ගිහින් කටයුතු කරන්නේ. නාරිලතා මල් පිපෙන කාලෙට ඉන්නෙත් නැතිලු ඒ අහලකටවත් කියලා කියනවා. මොකද, ඒ නිසා හරි යම් කෙලේස මට්ටමක් ඇතිවුනොත් ධ්‍යානය පිරිහෙනවයි කියලත් කියනවා. එතකොට මෙයා මේ බැහැරක් නතරකරලා නේද මේ ඇතුළට ගිහින් හදන්නේ.

*කොග්ගලගේ මහතා :-* නෑ නෑ, මම කිව්වේ කරන්න හදන හැටි නෙවෙයි. කොහොම හරි ඒ තත්ත්වය ගත්තා නම් ඕකේ සඳහන් වෙන්නේ දැන් අපි...

***ස්වාමීන් වහන්සේ:-*** දැන් මම මේ කියන්න උත්සාහ කළේ මෙතැන දී බැහැර පිරිසිඳු කරලා කවදාවත්ම මේ කියන පැත්තෙන් නිවන කියන පැත්තට එන්න බැහැ කියලා. හැබැයි අර වගේම ක්‍රමයකුත් ලෝකයේ තියෙනවා. එහෙම තියෙන්න හේතුව මම කිව්වේ නිවන පැත්තකින් තැබ්වා, මේ විදියට කියලා මම කිව්වේ ඒකයි. ඒ කියන්නේ ලෝකයේ අපි කතා කරන දහම පැත්තෙන් නෙවෙයි මම මේ කිව්වේ. දහමට පරිබාහිර කාරනාවක්. හැබැයි එහෙම පුළුවන් වෙලා තිබුණොත් එහෙම මාර්ගයකුත් තියෙන හින්ද. ඒ කියන්නේ එහෙම රැවටිල්ලකුත් ලෝකයේ තියෙන හින්ද තමයි රූපයෙන් මිදෙන්න තමයි, කාමයෙන් මිදෙන මට්ටමට රූපයට හිත තියලා කාමයෙන් මිදෙනවා. මේ ඔක්කෝම රූපයි කියන තැනකින් කාම මට්ටමෙන් මිදෙනවා. රූපයෙන් මිදෙන්නෙ මේ අරූපයට හිත තියලා. එහෙම ක්‍රමයකින් ගියාට අරූපයෙන් මිදෙන්න ක්‍රමයක් නෑ එයාට. හිත තියන්න එකක් නැතුව යනවා. ඒකයි ඒ නෙවසඤ්ඤානාසඤ්ඤායතනය උපදවාගනියි, ඇත්තෙත් නෑ, නැත්තෙත් නෑ කියන තැනකට. එතකොට එතනින් එහා මොකක් ද මෙයා කරන්නේ? ඒ කියන්නේ ලෞකික මට්ටමේ යන්න තියෙන ඉහළම මට්ටම ඔතැනයි. නමුත් බුද්ධ දේශනාව කියලා කියන්නේ, නිරෝධයටම යි හිත තියන්නේ. නෑ කියලා තර්ක කරන්න යන්න එපා කොයි වෙලාවකවත්.

***කොග්ගලගේ මහතා :-*** මම කියන්නේ බලන්න කියලා, අපට පෙනෙනවා නම් හිතෙනවා නම්...

***ස්වාමීන් වහන්සේ:-*** පෙනෙනවා නම්, හිතෙනවා නම් හිතිලා තියෙන්නේ කෙලෙස් මට්ටමකට මිසක...

***කොග්ගලගේ මහතා :-*** අන්න ඒක පිහිටියේ කොහොමද කියලා මේ පැත්තෙන් බලන්න.

***ස්වාමීන් වහන්සේ:-*** අන්න ඒක පිහිටියේ කොහෙමද කියන එක මේ පැත්තෙන් බලාගත්තා නම්...

***කොග්ගලගේ මහතා :-*** එච්චර නේ බලන්න ඕන.

***ස්වාමීන් වහන්සේ:-*** ඒ කියන්නේ මේ ඇතුලාන්තය පිරිසිඳු කරන්න ඕන, මෙහේ සියල්ල විසඳෙනවා නම් ප්‍රශ්නයේ. එතකොට ප්‍රශ්නය තිබිලා තියෙන්නේ බැහැර නෙවෙයි නේ. **තිට්ඨානි චිත්‍රානි තථෙව ලොකෙ,** කියලා පෙන්නනවා, **සංකප්ප රාගො පුරිසස්ස කාමො.** කාමය රාගය ඇතිවෙන්න හේතුව මනුෂ්‍යයාගේ සංකල්පනාව නිසා, පෙනෙන රූපය නෙවෙයි කියලා පෙන්නන කොට, පෙනෙන රූපයක් ගැන කතා කරනවා

නේ. **තිට්ඨානි චිත්‍රානි තථෙව ලොකෙ,** ලෝකයේ තියෙනවා නම් තියෙන්නේ චිත්‍ර විතරයි කියලා එතැන තියෙන දෙයක් ගැන කතා කරනවා. හැබැයි ඒ තියෙන දේ ගැන හොයන්න කිව්වේ නෑ නේ. මොකද, ඒ දේ හොයලා ඒකේ ප්‍රශ්න විසඳෙව්වාට, අපි දැන් විදර්ශනා කරන කොට ගොඩාක් අය වරද්දගන්න තැනක් තමයි, අපි කියමුකො, අල්ලාගන්නවා මේ බැහැර තියෙන රූපයක්. ඔය රූපය අරගෙන ඕක කඩලා කඩලා කඩ කඩා කඩ කඩා බලනවා.

***කොග්ගලගේ මහතා*** **:-** අන්තිමට එනවා සතර මහා ධාතුවට. ඒකත් එළියේ තියෙන්නේ.

***ස්වාමීන් වහන්සේ:-*** ඒකේ සතර මහා ධාතු හතරක්, එහා පැත්තේ තියෙනවා. හතරක් තියෙනවා මෙයාට. හතර මහා ධාතු කියන එක ඇහැට පෙනිච්ච එකක් විදියටම එළියෙ තියෙනවා මෙයාට.

***කොග්ගලගේ මහතා*** **:-** ඔතන තමයි හිරවෙන්නේ.

***ස්වාමීන් වහන්සේ:-*** නමුත් ඕක පෙන්නනවා, මූලපරියාය සූත්‍රයෙත් පෙන්නනවා, හොඳ ලස්සනට මේ සතර මහා ධාතු කියලා ගත්තොත් ඒත් වැරදියි කියලා. පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කිරීමක් තියෙන්නේ. එහෙම හඟිනවා නම් ඒත් වැරදියි කියනවා. සාසනයෙන් බැහැරයි.

***කොග්ගලගේ මහතා*** **:-** ඔතන තමයි මට හිතෙන්නේ ගොඩාක් හිරවෙන තැනක්.

***ස්වාමීන් වහන්සේ:-*** හිරවෙන්නට හේතුවකුත් තියෙනවා මහත්තෙයා. මොකද දන්නවාද? අපේ ඉගැන්වීම් රටාව සහ අද වර්තමනයේ පොතපත ලියවිලා තියෙන්නේ ඔය කියන කාරනා ටිකත් එක්ක. ඔතනින් එහා පැත්තක් පිළිබඳව කතා වෙන්නේ නැහැ. ඒ කියන්නේ ඔය සතරාකාරයකින් තියෙනවා කියන එකත් මං හිතන්නේ කියවෙන්නෙත් නෑ වර්තමාණයේ පොත්වල. පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන එක, ආරම්මණ, ලක්ඛණ, සසම්භාර, සම්මුති කියන කාරනා හතරෙන් ප්‍රභේද ගත...

***කොග්ගලගේ මහතා*** **:-** මම දන්නේ නැහැ. මම මේ ඇහුවාම යි. කොහේද ඒක තියෙන්නේ?

***ස්වාමීන් වහන්සේ:-***මූල පරියාය අටුවාවේ තියෙන්නේ.

***කොග්ගලගේ මහතා*** **:-** දැන් ඔය හතරම ඇත්තටම ගත්තොත්, දැන් සසම්භාර මට්ටමේ දී වුනත්, අරෙහෙ මොකක් හරි තියෙන්න ඕන මේක වදින්න

කිව්වාට, ඒ සම්මතයේ කිව්වාට, දැන් ඒකත් අනික් පැත්තට මෙහෙම්ම හදපු එකක්ම නේද?

***ස්වාමීන් වහන්සේ:-*** මෙහෙම්ම හදපු එකක්. මෙහෙම්ම හදපු එකක් කියලා කියන්නේ, රූප කලාප කියලා කොටසක් අපි කතාකරනවා නේද? රූප කලාපවල, දැන් උදාහරණයකට ඕක මම මෙහෙම කියන්නම් මහත්මයාට තව කාරණයක් තේරෙන්න, අපි කියමුකෝ තොරණක් කියලා. තොරණක් නො වෙයි දැන් අර තියෙනවා නේ LED display එක තියෙනවානේ, එක එක කඩවල්වල හෙම ගහලා තියෙන්නේ අකුරු වැටෙන විදියට නොයෙකුත් විදියට හදලා තියෙනවා නේ. හැබැයි මේක වෙන්නේ, මේ බල්බ් ටික නිවෙන පත්තුවෙනවා කියන සිදුවීමක් මිසක, ඒකේ අපට නේ මේ අකුරු රටා චිත්‍ර රටා මැවෙන්නේ.

***කොග්ගලගේ මහතා :-*** මම ඕකට ගන්නේ computer screen එකයි TV screen එකයි. ඒකේත් තිත් ගොඩක් නේ තියෙන්නේ.

***ස්වාමීන් වහන්සේ:-*** ඒකේත් තිත් ගොඩක් නේ තියෙන්නේ. ඒකේ ඒ පත්තුවෙන නිවෙන කාරනාව අනුව ඒකේ වෙන වර්ණ විපර්යාස අනුව නේ අපට මේ පෙනෙන්නේ කාරනාවන්. ඒ වගේ තමයි මේ සසම්භාර කියන මට්ටමේ තියෙන්නේ ඔන්න ඔය කියන විපර්යාසයන්. ඒ කියන මට්ටම තුළ, අපි කියමු දැන් මේ කනුව කියන මට්ටමක් අපට ඇවිල්ලා තියෙන්නේ මෙතැන තියෙන සසම්භාර කියන, පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන, සසම්භාර කියන සතර මහාධාතු මුල්කරගෙන යි. සසම්භාර කියන්නේ සතර මහා ධාතු මුල්කරගෙන යි. ඒ සතර මහා ධාතු මුල්කරගෙන, වර්ණ රූපය කියන රූප උපදවාගෙන තියෙනවා. උපදවාගත්තා කියලා කියන කතාවට හේතුව තමයි ඒක බලන්න පුළුවන් ක්‍රමයට හදලා තියෙනවා කියන එකයි. මේ හදලා තිබ්බච හින්දයි ඒක පෙනෙන්න පටන්ගන්නේ. එහෙම නැත්නම්, ඒ කියන්නේ දැන් අපේ මට්ටමට ඒක පෙනෙන්නේ නැත්නම්, දෙවි කෙනෙක්ගේ රූපයක් අපට පෙනෙන්නේ නැත්තේ, ඒ මට්ටමට මෙතැන හදලා නෑ. හදපු නිසා අපට දෙවි කෙනෙක් පෙන්නේ නෑ. අපි කියන්නේ tune කරනවා කියලා කිව්වොත් හිතන්නකෝ ඇහේ දෘෂ්ටි විතානය මට්ටමේ අපේ තියෙන ප්‍රසාද රූපය, අපි දෙවි කෙනෙක් පෙනෙන මානසික මට්ටමට මෙතැන සියුම් වුනොත්, අන්න අරක පෙනෙනවා. එතකොට ඒක පෙනුනේ මෙහේ හදපු නිසා මිසක ඒක තියෙන හින්ද පෙනුනා නෙවෙයි. ඒක උපදවාගෙනයි බැලුවේ.

***කොග්ගලගේ මහතා :-*** ඒ වුනාට ඔතැන පොඩි ප්‍රශ්නයක් එනවා : දැන් අපි මෙහේ උපදවාපු හින්ද තමයි ඒක පෙනෙන්නේ. හැබැයි අපට හැම තැනම එහෙම පෙනෙන්නේ නැහැ නේ. දැන් මෙහේ ඉපැද්දුවාට හැම තැනම දෙවිවරු පෙන්නේ නැහැ නේ. එතැන මොනවා හරි...

***ස්වාමීන් වහන්සේ:-*** එතැන මොනවා හරි තියෙනවා කියන එකට තමයි කිව්වේ සසම්භාර ලක්ෂණයකින් යුක්තයි.

***කොග්ගලගේ මහතා :-*** එතකොට බාහිරය ගැන නේද කතා කරන්නේ? සසම්භාර ලක්ෂණය මෙහෙන් උපද්දපු හින්ද තමයි දකින්නේ. හැබැයි දැන් අනිත් පැත්තට කියන්නේ අර මොනවා හරි ස්වභාවයක් නොතිබුනා නම්, මෙහෙම පෙනෙන්නේ නැහැ.

***ස්වාමීන් වහන්සේ:-*** එතැනින් මහත්මයා, මෙහෙම කාරනයකට එන්න, ඔය කාරනය ඔහොම හොයන්න යන්න එපා කියන්නේ මෙහෙම කාරනයක් නිසා. මොකද දන්නවාද ඕක හොයන්න යන්න එපාය කියල කියන්නේ, අපට කවදවත් මේ බැහැර සිද්ධියක් අහු නොවෙන හින්දමයි හොයන්න එපා කියන්නේ. දෘෂ්ටි ගොඩක්මයි එන්නේ. ඒ මොකද, ඇත්තටම අපේ මානසික මට්ටමකින් අත්දැකීමක් ලබන්න බැහැ ඔය කියන තර්කවලින්. ඒ පරිසරයේ අත්දැකීමක් ලබනවා නම් ලබන්න පුළුවන්කම තියෙන්නේ මෙතන (ආයතන ඉක්මවා ගිය) නිවිච්ච කෙනාට මිසක, ඊට මෙහා කෙනෙක් අපේ මානසික මට්ටමේ අපි හිතලා හිතලා හදගන්න හිතපු ටිකක් මිස ප්‍රඥවට මතුවෙච්ච, ගෝචර වෙච්ච කාරනයක් නෙවෙයි. ලෝකයෙන් අයින් වෙච්ච කෙනාට යි ලෝකය කැරකෙනවා කියලා පෙනෙන්නේ. ලෝකයේ ඉන්න කෙනාට කවදවත් ලෝකය කැරකෙනවා කියලා දැනෙන්නේ නැහැ. ඒ වගේ වැඩක් මේක. ඒ කියන්නේ කාම මට්මෙන් මිදිලා, කාම මට්ටමෙන් මිදිච්ච කෙනාට යි කාමය පෙනෙන්න පටන්ගත්තේ. එතකං කාමය පෙනෙන්නේවත් නෑ එයාට. රූප මට්ටමෙන් මිදිච්ච කෙනාටයි රූපය පෙනෙන්න පටන්ගන්නේ. ඇත්ත. ඒ කාරනය ඒකයි. එතැනින් අයින්වුනහම තමයි ඒක පෙනෙන්න පටන්ගන්නේ. එතකං, ඒකේ ඉන්නකං, එයාට ජීවිතය වෙලා ඒක.

***කොග්ගලගේ මහතා :-*** බල්ලා වතුරට එබිලා රැවටිලා ඉන්නකං ඌට ඕක පෙනෙන්නේ නැහැ එතැනින් එහා. අපි කියනවත් එක්ක ඒ මානසිකත්වයට පෙනෙන්නේ නැහැ. ඒ වගේ අපි ඉන්න කොට...

***ස්වාමීන් වහන්සේ:-*** තමන් හිටගෙන ඉන්න තැන බලන්න නම්, තමන් ඒ හිටගෙන ඉන්න තැනින් අයින් වෙන්න ඕන. එතකොට යි හිටගෙන හිටපු

තැන පෙනෙන්නේ. එතකං වැහිලා තියෙන්නේ. ඒ වගේ තමයි අපි ඉන්න කෙලෙස් මට්ටම අපට අද පෙනෙන්නේ නෑ.

*කොග්ගලගේ මහතා :-* ඒ හින්ද තමයි අරවා ගැන කතාකරන්න එපා කියන්නේ. වැඩක් නෑ.

***ස්වාමීන් වහන්සේ:-*** එපා කියලා කියන්නේ වෙන මොකුත් නිසා නෙවෙයි, ඔය ඒ පැත්ත හොයන්න ගිය කෙනෙක් භෞතික වාදයට වැටෙනවා නිකම් ම.

*කොග්ගලගේ මහතා :-* ඔව් ඔතැන හරියටම ගැලැපෙනවා නේ බුදුරජාණන් වහන්සේ ඇයි මේ ලෝකය බඹයක් පමණ ශරීරය තුළින් පනවන්නේ.

***ස්වාමීන් වහන්සේ:-*** ඇයි මේ පැත්තට පනවන්නේ කියන එක, අපි හිතන්නකෝ, අපි දැන් කෙහෙල් ගහක් අරගෙන, මේ කෙහෙල් ගහ හැදුනේ කොහොම ද, ඒ කෙහෙල් ගහේ තියෙන්නේ මොනවා ද, කියලා ඕක කෑලි කෑලි කෑලි වලට පෙති ගහලා බලලා බලලා බලලා කළයි කියලා, අපට ලැබෙන විදර්ශනා ඥානය මොකක් ද.

*කොග්ගලගේ මහතා :-* ඥානයක් නෑ තව දෘෂ්ටියක් ඇතිකරගෙන...

***ස්වාමීන් වහන්සේ:-*** තව දෘෂ්ටියක් ඇතිකරගෙන එතන එහෙම එකක් නෑ කියලා, කෙහෙල් ගහක් නෑ, දැන් කෙහෙල් ගහ කියන කොට කෙහෙල් ගහ තිබිලා තියෙනවා. නෑ කියන කොට නෑ කියන කොට නෑ කියන දෘෂ්ටියක් හදාගෙන. වික්ෂෙප දෙකකටම ඇවිල්ලා තියෙනවා. අමරා වික්ෂේපය මම හිතන්නේ දෙකම එකතු වුනහම. ඇතයි නැතයි දෙකම ආවාට පස්සේ හදන දෘෂ්ටියක් ඒක. කෙහෙල් ගහ කියන කොට තිබිලා තියෙනවා. දැන් ඒක නෑ කියලා කියන කොට නෑ කියන අර්ථයටත් ඇවිල්ලා. වචනය නෙවෙයි මම කිව්වේ. ඒ අර්ථය ගැන යි. ඒ නිසා අත්ථි ප්‍රත්‍යයෙන් හා නත්ථි ප්‍රත්‍යයෙන් කියන ප්‍රත්‍ය දෙකම අත්ථි ප්‍රත්‍යය හඟවනවාය කියලා පෙන්නනවා නේ. නත්ථි ප්‍රත්‍යයෙනුත් පෙන්නන්නේ අත්ථි ප්‍රත්‍යයමයි කියලා. යමක් නෑ කියලා කතාකරනවා නම්, පුටුව මෙතන නෑ කියලා කියනවා නම් පුටුව කියන එකක් ගැන තියෙනවා කියලා කතා කරනවා නේ. ඇතට සාපේක්ෂව නේ නෑ කියලා කතා කරන්නේ.

*කොග්ගලගේ මහතා :-* අර ඔබවහන්සේ ඉස්සෙල්ලා කියාපු කතාව හරි පැහැදිලියි. විඤ්ඤාණ වාදය කියනකොට නැත විතරක් නෙවෙයි ඇත කිව්වත් මේ පැත්තෙන්ම නේ තියෙන්නේ.

***ස්වාමීන් වහන්සේ:-*** ඒ කියන්නේ මේ අපට ගොඩාක් දුරට හිතෙන්න පුළුවන් මේ නෑ කියන එක විතරයි කියලා.

***කොග්ගලගේ මහතා :-*** මම ඇත්තටම හිතාගෙන හිටියේ එහෙමයි. විඤ්ඤාණ වාදය කියන්නේ ඒකයි කියලා. අද බොහොම වටිනවා ඔබවහන්සේ මේක කියාපු එක.

***ස්වාමීන් වහන්සේ:-*** නමුත් ඕක ගොඩාක් අය දනවා භෞතික වාදයට. තියෙනවා කියන අර්ථයෙන්. හැබැයි තියෙනවා කියන අර්ථයෙන් භෞතිකවාදයට වැටෙන්නේ ඔය කියන රූප ගැන බලලා එහේ තියෙනවාය කියන තැනකින් ගත්තොත් තමයි භෞතිකයට අයිති වෙන්නේ. මෙහේ තියෙනවාය කියලා ගත්තොත් එහෙම මෙහේ තියෙන්නේම විඤ්ඤාණවාදය යි. ඒ කියන්නේ නාම වලටයි. නාම පැත්තෙන් තියෙනවා හෝ නෑ කියලා යම් කෙනෙක් කතා කරනවා නම් ඒ දෙකම අයිති වෙන්නේ විඤ්ඤාණවාදයට යි. බැහැරින් යමක් තියෙනවා හෝ නෑ කියලා කතා කරනවා නම් ඒක අයිතිවෙන්නේ භෞතිකවාදයට යි. භෞතික දෙයක් ගැනම තියෙනවා හෝ නෑ කියලා කතා කරනවා නම් : එහෙම අහුවුනේ නැද් ද? (නෑ) දැන් මම කියන්නේ මේ පොත තියෙනවා කියලා කතා කරනවා නම්. පොත කියලා එකක් තියෙනවාමයි කියන තැනකින් මෙහෙම කතා කෙරුවොත් මේක භෞතික වාදයට ද අයිති වෙන්නේ විඤ්ඤාණවාදයට ද? මේ පොත තියෙනවා. මෙහෙ තියෙන පොතක් ගැන කතා කළොත් මේක භෞතිකවාදයට අයිති වෙනවා. මෙතැන පොතක් නෑ. මෙතැන තියෙන්නේ සතර මහා ධාතු යි. මෙතැන පොතක් කියලා එකක් නෑ. ඒත් භෞතිකවාදයටයි අහුවෙන්නේ. ඒකයි මම කිව්වේ, තියෙනවා කියලා කිව්වත්, නෑ කියලා කිව්වත්, (බාහිරෙන්) කතා කළොත් භෞතිකවාදයට යි අයිති වෙන්නේ. මේ පොතක් කියලා මේ හිතට නේ හිතුනේ. හිතේ නේ මේ පොතක් කියන එකක් හැදිලා තියෙන්නේ කියලා එතැන විතරක් කතා කළොත්, ඒක අයිති වෙනවා විඤ්ඤාණවාදය ට. මේ හිතෙත් හදාගෙන තියෙන එකක්. මේ හිතේත් එහෙම එකක් නැහැ, මේ හිතේ තියෙන්නේ ස්කන්ධපඤ්චකයක් හටගත්තා මිසක, පොතක් කියන එකක් හිතේ නෑ. රූප වේදනා සංඥා සංඛාර විඤ්ඤාණයි ඇතිවෙලා තියෙන්නේ. ඒකත් අයිති වෙනවා විඤ්ඤාණවාදයට.

***කොග්ගලගේ මහතා :-*** හිතේ හදපු පොතක් තමයි එළියෙන් තියලා තියෙන්නේ කිව්වත් අයිති වෙනවා විඤ්ඤාණවාදයට.

*ස්වාමීන් වහන්සේ:-* හිතේ හදපු පොතක් තමයි එළියෙන් තියලා තියෙන්නේ කියන තැනකින් එතැන කතා කළත් ඒ තියෙන්නේ විඤ්ඤාණවාදය යි.

*රූපසිංහ මහතා :-* ඒක පඤ්චද්වාරයට කලින් නෑ?

*ස්වාමීන් වහන්සේ:-* නෑ. පඤ්චද්වාරයට කලින් අපේ මානසික මට්ටමේ, මනස ඉපදිලා නේ තියෙන්නේ. මනස ඉපදිච්ච මනසකින් නේ පඤ්චද්වාරය අරමුණු කරන්නේ. එතකොට හිතක් ඉපදුනා කියන ගනයට, අපේ මට්ටමට ප්‍රකටවෙන්නේ පඤ්චද්වාර මට්ටම යි. ඊට කලින් තත්ත්වය තුළත් ඔය කියන කාරනා තියෙනවා. අතීත භවාඞ්ගය කියාපුවහම අතීතභවාඞ්ගය කියන තැනම තියෙනවා නේ කෙලෙස් මට්ටමක්. මොකද භවාඞගය පිරිසිදු වෙලා නෑ නේ අපේ මානසික මට්ටම. මොකද, එහෙම පිරිසිදු වුනා නම්, ඊළඟ මොහොතේ නිවන් දකින්න පුළුවන් අපට. එහෙම බැරිවෙලා මේ දිගින් දිගට දිගින් දිගට චිත්ත රැල්ල යන්නේ, අනුසය වෙලා, ආස්‍රව වෙලා යන්නේ .

*රූපසිංහ මහතා :-* සංඛාරයක් වෙන්න කලින් කොහොම ද?

*ස්වාමීන් වහන්සේ:-* නෑ මහත්තෙයා, මෙහෙම කාරනයක් ඔතැන තියෙන්නේ. ඒ කියන්නේ කලින් මානසික මට්ටමේ ඒ විදියට හැදිච්ච එක මුල් කරගෙන, ඊළඟ හිත උපදින්නේ විපාක විදියට යි. ඊළඟ හිත උපද්දවන්න පුළුවන් බව දීලා තියෙන්නේ අරකේ විපාකයක් විදිය ට යි. එතකොට ඒ විපාකය හැදෙන්නේ ම, මේකේ මට්ටමේ කෙලෙස් මට්ටමේ හැටියටම යි. හැබැයි විපාකය පිරිසිදු යි. විපාකය පිරිසිදු යි, පිරිසිදු බව දන්නේ නෑ, අර ආස්‍රවයෙන් ආයෙ වහනවා මේක. ආස්‍රවයෙන් වැහුවා කියලා කියන්නේ අවිද්‍යාව යෙදුනා කියන එකයි. අවිද්‍යාව යෙදුනා කියලා කියන්නේම ආපහු කිලිටි කළාකියන එක යි. පිරිසිදු යිවිපාකය. විපාකය පිරිසිදු වුනාට, අපි පිරිසිදු බව දන්නේ නැති බවක් තියෙනවා නේ. ඇත්ත ඇති හැටියට නො දන්නා බවක්.

*කොග්ගලගේ මහතා :-* ඒක මේ මොහොතේ අවිද්‍යාව යි.

*ස්වාමීන් වහන්සේ:-* ඒ මේ මොහොතේ යෙදෙන එකයි. මේ වර්තමානයේ යෙදෙන හේතු ටිකක් තියෙනවා. ඒක ඒ නිසා ආපහු කර්මයක් වෙනවා තව සිතක් උපද්දවන්න.

*රූපසිංහ මහතා :-* අභිසංකරණ වෙලා.

*ස්වාමීන් වහන්සේ:-* අභිසංකරණ වෙලා. ආපහු උපද්දන එකත් ආයෙ උපදින එකත් පිරිසිදුයි. ඒ උපදින එක පිරිසිදු වුනාට මේකෙන් ගෙනාපු ආස්‍රවයෙන් අරකත් වහනවා.

*කොග්ගලගේ මහතා :-* මේ මොහොතේ අවිද්‍යාව යෙදුනේ නැත්නම් ආයෙත් සකස් වෙන්න විදියක් නෑ.

*රූපසිංහ මහතා :-* ඒක ලෞකික හිතක්ම නේද?

ස්වාමීන් වහන්සේ:- ලෞකික හිතක්ම තමයි. ලොකෝත්තර සිත්වල යෙදෙන්නේ නෑ මේ මට්ටමි.

*රූපසිංහ මහතා :-* ලොකෝත්තර සිත ගැන නේද මේ සොයන්න උත්සාහවත් වෙන්නේ ?

*ස්වාමීන් වහන්සේ:-* ලොකෝත්තර සිත ගැන සොයන්න උත්සාහවත් වෙනවා කියන එකත් වැරැදි නැහැ. නමුත් ඒ කියන ලෝකෝත්තර සිතක් පිළිබඳව අපට සොයන්න බැහැ.

*කොග්ගලගේ මහතා :-* සෙව්වාට වැඩක් නෑ.

*ස්වාමීන් වහන්සේ:-* සෙව්වාට වැඩක් නෑ කියන තැනකින් වෙන්නේ, එයද සොයලා තියෙන්නේ අපේ කෙලෙස් මට්ටමටමයි. එහෙම මහත්මයා මොනවා හරි දෙයක් දිහා බලලා හිතනවා නම්, ඒ හිතලා තියෙන්නේ මහත්මයා ලඟ තියෙන තොරතුරු ටිකට නේ. දැන් මෙහෙම හිතන්නකෝ උදාහරනයකට : මම ශිෂ්‍යත්ව පන්තියේ ඉන්නවා, මහත්මයා සාමාන්‍ය පෙළ පන්තියේ ඉන්නවා. මහත්මයා උසස් පෙල පන්තියේ ඉන්නවා. අපි හිතමුකෝ කැම්පස් එකේ ඉන්නවාය කියලා. මානසික මට්ටම් හතරක් නේ.අපි හතර දෙනාම ගිහිල්ලා ඉවරවෙලා යමක් දිහා බලන් ඉන්නවා කියන්නකෝ. දැන් මට පෙනෙන්නේ මම දන්නා තරමට අරගෙන නේ අර දිහා බලන්නේ. මහත්මයා, මහත්මයා ගැන හිතන්න. ඉංජිනේරු මහත්මයාත් ඒ තාක්ෂණයත් යොදලා ඒවා ඒ කාරනාත් එක්ක නේ බලන්නේ. ඒ කාරනා අපට දැනෙන්නේ නෑ නේ. පැහැදිලි ද? ඒ කෙනා කෙනා, කෙනා කෙනා බැලුව. හැබැයි එකම අරමුණක්, එකම කාරනයක් තමයි මෙයාලට ආවේ. එකම නිමිත්තක්, එකම නිමිත්තක අරමුණක් තියෙන්නේ.

*කොග්ගලගේ මහතා :-* එක්කෙනෙක් ඇහුව මේ doctor කෙනෙක්, surgeon කෙනෙක් අර stethoscope එකෙන් සද්දේ අහලා මෙයාට තියෙන ලෙඩේ

හිතේ මවාගත්තා. ඊළඟට බෙහෙත් කරලා ලෙඩෙත් සනීප කළා. බාහිරයක් නැත්නම් ඒක කොහොමද වෙන්නේ?

***ස්වාමීන් වහන්සේ:-*** ඒ මානසික මට්ටම්වලින් නම් කතාකරලා මේ දහම කතාකරන්න බැරිවෙයි. ඒ කියන්නේ එච්චරකට ඒ කියන තැනකින් කතා කළොත් නම්. කතා කරන්න බැරිව නෙවෙයි මම කියන්නේ. එහෙම ගැටළුවක් නැහැ. ඒ ගැන කතා කරන්න පුළුවන්. නමුත් ඒ කියන පරිසරයකින්දහම උළුප්පන්න බැහැ. නෑ ඕක ඔහොම තමයි. එන ගැටළුවක් තමයි දැන් රහතන්වහන්සේ රූපය පරිහරණය කරන්නේ නෑ කියන කතාවක් තියෙනවා නේ. රහතන්වහන්සේ පරිහරණය කරන්නේ ස්කන්ධ හතරයි කියල කියන එක පෙන්නනවා නේ. ධම්මසඞ්ගනියේ පෙන්නනවා. එතකොට කෙනෙකුට ප්‍රශ්නයක් එනවා, රහතන්වහන්සේ කෙනෙකුට රූපයක් නැද්ද? රහතන්වහන්සේට නැති රූපයක් ගැන මවාගන්නේ අපි නේ මේ සිතෙන්. අපි හිතාගෙන ඉන්න රූපය රහතන්වහන්සේට තියෙනවයි කියලා නේ අපි හිතන්නේ. රහතන්වහන්සේගේ මානසික මට්ටමට අහුවෙන එක අපිට හිතාගන්න බැහැ නේ. පිහිටන්නේ නැති ස්වභාවයක් ගැන අපට අද අත්දැකීමක්වත් නෑ. ඒ අත්දැකීමක් නැති එකක් පිළිබඳව දශමයක් අපට හිතාගන්නවත් බැහැ. ඒකයි මම කිව්වේ, ඒ මානසික මට්ටම පිළිබඳව අපි දැනගෙන හිටියාට කමක් නෑ. හැබැයි ඒ මානසික මට්ටම කොහොමද වෙන්නේ කියලා හිතන්න යන්න එපා. දේශනාවෙ අපට පෙන්නනවා නේ රහතන්වහන්සේගේ මානසික මට්ටම මේ මේ විදියට වෙන්නේ, මේ විදියට තමයි ඉන්ද්‍රිය ධර්මයන් ආදී කාරනා ටික වැඩ කරන්නේ කියලා පෙන්නනවා. ස්කන්ධ, ධාතු, ආයතන මෙන්න මේ විදියටයි තියෙන්නේ කියලා. ඒ තියෙන්නේ කොහොමද එහෙම වෙන්නේ කියලා ආයෙ ප්‍රශ්නයකින් අපි හොයන්න ගියාට අපේ මේ නීවරණ මානසික මට්ටමකින් තව අපි මේ නීවරණවත් දුරු කරපු නැති මනසකට රහතන්වහන්සේගේ මානසික මට්ටමෙන් දකිනවයි කියන කාරනාවක් කිසි කලෙක වෙන්නේ නෑ. එහෙම අහුවුණොත් තමයි පුදුමෙත්.

*කොග්ගලගේ මහතා :-* හැබැයි ඒක අපට අනුමානෙන් හොයාගන්න පුළුවන්.

***ස්වාමීන් වහන්සේ:-*** අනුමානෙන් හොයාගන්න පුළුවන්. හැබැයි එතැනට එන්න වෙන්නේ පෙල දහම හරියි කියන තැනකින්. අපි හිතන් ඉන්න එක හරියි කියන තැනකින් පෙල දහම ගලපන්න එපා අපි හිතාගෙන ඉන්න තැනකට. අපේ දැනුම අරගෙන යන්න පෙල දහම තියෙන තැනට එතැන හරියි කියන තැනකට. මොකද පරියත්ති සාසනයේ විශ්වාසය ඇතුව තමයි මේ ගමන යන්න වෙන්නේ.

***කොග්ගලගේ මහතා:-*** එතැනදී තමයි අර කේවඩ්ඪ සූත්‍රයේ එන පඨවි, ආපෝ, තේජෝ, වායෝ නගාධති කියන මට්ටම හිතාගන්න පුළුවන් නේද ස්වාමීන් වහන්ස.

***ස්වාමීන් වහන්සේ:-*** එතැනදී මෙන්න මෙහෙම පරිසරයක් නේ කියන්නේ කියන එක පිළිබඳව කතා කරන්න පුළුවන්. එතැන රහතන්වහන්සේගේ මානසික මට්ටමේ තියෙන විශේෂත්වය තමයි, ඇත්ත ඇති හැටියටත් දකිනවා. එතැන. ඒ නිසා එයාට ඒකෙන් මිදෙන්නත් පුළුවන්. ලෝකයා මෙන්න මෙහෙම රැවටිල්ලකයි ඉන්නේ කියලා ඒ රැවටිල්ලත් දකිනවා. ඒ නිසා ඒ රැවටිල්ල තුළ කතා කරන්නත් පුළුවන්. එතැනයි මෙතැන තියෙන විශේෂත්වය. ඉතින් ඒ නිසා අපට හිතෙන්න පුළුවන්, රහතන්වහන්සේත් මේ පිණ්ඩපාතේ යන්නේ, රහතන්වහන්සේත් මේ පුද්ගලයෙකුට කතා කරන්නේ. සැරියුත් හාමුදුරුවෝ මේ බුදුහාමුදුරුවෝ හම්බවෙන්න යන්නේ, ඉතින් පුද්ගලයෙක් නැත්නම් එහෙම කොහොමද වෙන්නේ?

***කොග්ගලගේ මහතා :-*** ඕව තමයි අහන්නේ. කවුද සැරියුත් හාමුදුරුවෝ කියල අඳුනාගත්තේ කියලා.

***ස්වාමීන් වහන්සේ*** :- ලෝකයාට හරිම ප්‍රශ්නයක්. සැරියුත් හාමුදුරුවන්ට එහෙම ප්‍රශ්නයක් නැහැ.

***කොග්ගලගේ මහතා :-*** ඕව අහනව. බුදුහාමුදුරුවන්ටත් මේ හිසේ කැක්කුම හැදුනා නේද...

***ස්වාමීන් වහන්සේ:-*** අපි ගන්නේම බුදුහාමුදුරුවෝ කියන්නේ පුද්ගලයෙක් විදියට. සැරියුත් මහ රහතන්වහන්සේ කියන්නේ පුද්ගලයෙක් විදියට. අපේ මට්ටමේන් අපි අද සත්ත්ව පුද්ගල සංඥවෙන් බලන පුද්ගලයා කියන ආකල්පයෙන් මයි බුදුහාමුදුරුවන්ගේ මානසික මට්ටමෙනුත් ලෝකය බලලා තියෙන්නෙත් අපි (සිනා). ඕවගේ කාරනා වලට ඉතින් හිනාවෙනවා ඇරෙන්න වෙන කරන්න දේකුත් නෑ. අපිත් ඔය මෝඩකම්වල ඉන්නවා තාමත්. නමුත් තේරෙනවා මේ කරන්නේ මහ මෝඩ වැඩක් කියන එක. සමහරු තර්ක දනවා. මහ පුදුම විදියේ තර්ක දන්නේ. ඉතින් ඇත්තටම වැඩ කරන්නේ, අපට තේරෙනවා මේකෙ මේ කතා කරන්නේ සම්පූර්ණම දහම නෙවෙයි කියලා. මොකද ධර්මයේ දර්ශනය තුළ දර්ශන ක්‍රමවේදය හරියට තේරුම්ගත්ත කෙනෙකුට, ඒ කියන්නේ දර්ශනය අවබෝධ වුනා නෙවෙයි. දර්ශන ක්‍රමවේදය කියන්නේ මෙන්න මෙහෙම එකක් කියලා තේරුම් ගත්තා නම්, ඒ කෙනාව කොතනකවත්

රැඳිලා හිරවෙන්නේ නෑ. හැම තැනම ලිහෙනවා. ඒ කියන්නේ හැම ගැටළුවකටම කාරනය ලිහෙනවා.

***කොග්ගලගේ මහතා*** :- ඔතැන නේ ස්වාමීන් වහන්ස, මම මේ දකින්නේ අර පටලවාගෙන කියලා. දැන් එක තැනක තියෙන එක, 'ආ ඒක ඒ පරියායට එතැනට නේ මේක තියලා තියෙන්නේ. මෙතැනට ඕක ගැලපෙන්නේ නෑ' කියලා ඔන්න ඔහොම බේරිලා යාමකුත් තියෙනවා නේ සමහර වේලාවට. මේ සූත්‍රයේ මෙහෙම කියලා තියෙන්නේ. ඒ මේකට.

***ස්වාමීන් වහන්සේ***:- එතැනදී මෙහෙම බලන්න ඕන මහත්මයා. එතැනදී සම්පූර්ණ අර්ථයකින් අපි කතා කරන්න හොඳ නෑ එතැන දී. එතැනදී තියෙනවා මහත්මයා එක සූත්‍ර දේශනාවක් තව සූත්‍ර දේශනාවකට වෙනස් වෙන්නෙ කොහොමද කියලා. පරියායයන් දෙකක් වෙන්නේ කොහොමද කියන එක. ඒ කියන්නේ දැන් අපි කියමුකෝ මෙහෙමඃ දැන් මහත්මයයි, මායි කතා කරනවා කියන්නකෝ. දැන් අපි දෙන්නා කතා කරන කාරනාව තුළ අපි දෙන්නාගේ මානසික මට්ටමකට අදල කාරනාවක් කතා කරයි. ඒ කාරනාවම අපි තව එක්කෙනෙක් එක්ක කොහොමද කතා කරන්නේ? එතකොට වෙනස් වෙන්න පුළුවන්. හැබැයි කතා කරන දර්ශණය එකයි. කතා කරන කාරනා ටික දෙකක්.

***කොග්ගලගේ මහතා*** :- දර්ශණය වෙනස් වෙන්න බැහැ නේ.

***ස්වාමීන් වහන්සේ***:- දර්ශණය වෙනස් වෙන්න බැහැ. මොකද බුද්ධ දර්ශණය තුළ තියෙන්නේ හේතු ඵල දහම නම් ඒක පටිච්චසමුප්පාදයෙන් කතා කළත් හේතු ඵල දහමම විය යුතුයි. ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙන් කතා කළත් හේතු ඵල දහමම විය යුතුයි. ඊළඟට චතුරාර්ය සත්‍යයෙන් කතා කළහමත්, ඒත් එහෙමම විය යුතුයි. ඔය කියන මාතෘකා ආදිය...

***කොග්ගලගේ මහතා***:- නොගැලපෙන්න බැහැ නේ එක තැනකට වත්.

***ස්වාමීන් වහන්සේ***:- නො ගැලපෙන්න බැහැ. නො ගැලපෙන්න බැහැ අපට ඒක ගලපාගන්න බැරිවෙන එක අපේ දුර්වලකමක්. අපේ දුර්වලකමක් මිස ගලපාගන්න බැරිකම ධර්මයේ අඩුවක් වෙන්න බැහැ. හැබැයි මෙහෙම කරන්න හැකියි. ඒ කියන්නේ දැන් සමහර සූත්‍ර දේශනාවල තියෙනවා මහත්මයා, ඒ සූත්‍ර දේශනාවේ කතා කරලා තියෙන්නේ මාර්ගය ගැන විතරම යි. වෙන කිසිම දෙයක් කතා කරලා නෑ. එතකොට අපට හිතෙන්න පුළුවන් මේක බුදුහාමුදුරුවෝ එක පරියායක් මාර්ගය ගැන විතරයි කියලා තියෙන්නේ කියලා. නෑ මාර්ගය ගැන කිව්වේ දුක සහ දුකට හේතුව සහ දුකේ නිරෝධය කියන කාරනා තුනම වටහාගන්න

පුළුවන් නුවණ තියෙන කෙනාට මාර්ගය විතරයි අඩුවෙලා තිබුණේ. ඒ කෙනාට මාර්ගය ගැන පැහැදිලි කරන්න විතරයි අවශ්‍ය වෙන්නේ. ඒ මානසික මට්ටමට මාර්ගය කිව්වහම එයා ඒ මාර්ගයෙන් නිවන් දකිනවා.

*කොග්ගලගේ මහතා:-* අනිත් ඒවා විස්තර කරන්න අවශ්‍ය නෑ.

***ස්වාමීන් වහන්සේ:-*** මාර්ගය ගැන විස්තර කරනකොට දුක සහ දුකට හේතුව සහ දුකේ නිරෝධය කියන තුනම ඕක ඇතුළේ තියෙනවා.

*කොග්ගලගේ මහතා :-* එතැන ගැටළුවක් නෑ. අපි හිතමු, මාර්ගය ගැන එක තැනක තියෙන එකයි, මාර්ගය ගැන තව තැනක තියෙන එකයි, දෙකක් කියලා...

***ස්වාමීන් වහන්සේ:-*** ඒකට ප්‍රභේද තියෙන්න පුළුවන්.

*කොග්ගලගේ මහතා:-* ප්‍රභේද තිබුණට අර දර්ශණය එකම වෙන්නට ඕන නේ. අතෙන්දි එක මාර්ගයක් කිව්වා, මෙතෙන්දි වෙන මාර්ගයක් කිව්වා...

***ස්වාමීන් වහන්සේ:-*** නෑ. නෑ. මාර්ග දෙකක් නෑ මේ සාසනයේ. මාර්ග දෙකක් නැහැ. නමුත් මාර්ගය දකින ආකාර තියෙන්න පුළුවන් විවිධාකාර.

*කොග්ගලගේ මහතා:-* කොහොම ආවත් අවබෝධය එකම වෙන්න ඕන නේ.

***ස්වාමීන් වහන්සේ:-*** අවබෝධය එකම වෙන්න ඕන. හැබැයි මෙහෙම තියෙනවා මහත්මයා. ඒ අවබෝධය එකම අවබෝධය කියලා අපි කතා කළාට දැන් රහතන්වහන්සේලාගේ ප්‍රභේද දෙකක් අපට පෙන්නනවා. සිව්පිළිසිඹියාපත් රහතන්වහන්සේ සහ සිව්පිළිසිඹියාපත් නැති රහතන්වහන්සේ කියලා. මොකද මේ වගේ ප්‍රභේද දෙකක් පෙන්නන්නේ මේ අයගේ මොකක් සම්බන්ධයෙන් ද කියන එක අපට පොඩි හිතන්න තැනක් තියෙනවා. රහතන්වහන්සේ නමක් එනවා තමන් යම් කමටහනක් කරගෙන, ඒ කමටහනට අනුව මාර්ගය වඩලා, රහත්බව උපදවා ගැනීම කියන තැන දක්වා එනවා. එයා ද නිවන් දැකපු කෙනෙක් තමයි. හැබැයි මේ රහතන්වහන්සේ සමහර වේලාවට අනිත් පරියායයන් එකක්වත් දන්නේ නැහැ. ඒ තමන් ආපු පරියායට අනුව විතරයි දන්නේ. ඒ රහතන්වහන්සේ රහතන්වහන්සේ නමක් කියනවා. හැබැයි තවත් රහතන්වහන්සේ නමක් ඒ විදියටම තවත් පරියායකින් එනවා. හැබැයි ඒ රහතන්වහන්සේට සියලු පරියායයන් වැටහෙනවා. මේ අවබෝධයම තමයි. අවබෝධ දෙකක් නෙවෙයි. ප්‍රහීණ කළ යුතු සියළු කෙලෙස් ප්‍රහීණවෙලා තමයි. හැබැයි මෙතැන තියෙන ප්‍රඥාව සහ මෙතැන තියෙන ප්‍රඥාව අනුව

ප්‍රභේද දෙකක් තියෙනවා, මෙතැනට සියළු පරියායයන් වැටහෙන්නත්, මෙතැනට ආව පරියාය ගැන විතරක් දැනුවත් වෙන්නත් කියන කාරනා දෙකකින් ප්‍රභේද කරලා තියෙනවා. ඒකෙන් ගන්න එපා නිවන කියලා දෙකක් තියෙනවා කියලා. රහත් බව කියලා දෙකක් තියෙනවා කියලා ගන්න එපා. ඒ හින්ද මාර්ග දෙකක් තියෙනවා කියලා ගන්න එපා.

***රූපසිංහ මහතා :-*** එකම උපාධිය.

***ස්වාමීන් වහන්සේ:-*** නෑ ඕකට මම දෙන්නේ උදහරණය මොකක්ද කියලා දන්නවද, දැන් අපි කියමුකෝ උසස් පෙල ලියලා මට ' A' තුනක් තියෙනවා.තව කෙනෙක් උසස් පෙල ලියලා,' A 'දෙකයි, ' B ' එකයි තියෙනවා. දෙන්නාගේම rank එකට campusඑකට යන්න පුළුවන් නම් දෙන්නම පාස්. දෙන්නම එකම campus එකේ out වෙනවා එකම batch එකේ ලියලා. අන්න එයත් doctorකෙනෙක්, මෙයත් doctor කෙනෙක් කියන්නකෝ. අරයාත් doctor, මේ ' A ' තුනක් ගත්ත doctor කෙනෙක් අරයා කියලා කියනවාද? කීයටවත් නෑ. අර යන doctor මේ, ' A ' දෙකයි, ' B ' එකයි තියෙන්නේ මේ ඩොක්ටර් ට වඩා ඒ ඩොක්ටර් ට එකක් අඩුවෙලා තියෙන්නේ කියලා කියනවාද? එතැන කතා කරන්නේ එකම degreeඑකගැන නේ කතා කරන්නේ. ඒ වගේ රහත්වුනා කියන තැනක ආයෙ මේ ප්‍රභේද කතන්දරයක් නැහැ. නමුත් මෙයාට වඩා මෙයා දක්ෂ වෙන්න පුළුවන්.

***කොග්ගලගේ මහතා:-*** ඒක සමහර විටෙක තව කෙනෙකුට කියා දෙන්න ගියහම ඒ වෙනස පෙනෙන්න ඉඩ තියෙනවා.

***ස්වාමීන් වහන්සේ:-*** ඒ වෙනස පෙනෙන්න ඉඩ තියෙනවා. නමුත් අවබෝධය කියන කාරනාවේ වෙනසක් නැහැ. නැත්නම් ඕකත් වරද්ද ගන්නවා ඇයි එහෙම දෙකක් තියෙන්නේ කියලා. ඒ මේ මාර්ග දෙකකින් ඇවිල්ලා වෙන්න ඇති. නෑ එහෙම නෑ. පරියායයන් ගණනාවක් තියෙන්න පුළුවන්. හැබැයි ඒ හැම පරියායයක්ම එක තැනකට වැටිලා, එක තැනකින්ම තමයි ඔක්කෝමයන්නේ. දැන් අපි කියන්නකෝ මෙහෙම : ආනාපානසති භාවනාව කරන කෙනා කොහොමද නිවන් යන්නේ කියලා. ඒ කෙනා සමහරවිට ආනාපානසතියෙන් සෝවාන් කෙනෙක් වෙන්න ඇති. අශුභ භාවනාව වඩන කෙනා සෝවාන් වෙනවා. මේ කෙනා නම් ආනාපානසති භාවනාවෙන් සෝවාන් වෙච්චි කෙනෙක්, මේ කෙනා අශුභ භාවනාවෙන් සෝවාන් වෙච්චි කෙනෙක්, මෙයා මරණානුස්සතියෙන් සෝවාන් වෙච්චි කෙනෙක්, මෙයා මේ පිළිකුල් භාවනාව, සක්මන් භාවනාව, කරලා කියලා

එහෙම ප්‍රභේද නැහැ නේ. එහෙම ප්‍රභේද නැතිවෙන්න හේතුව තමයි, සෑම කමටහණකම විදර්ශනාව එකයි. **අජ්ඣතංවා බහිද්ධාවා අජ්ඣත්ත බහිද්ධාවා** කියන කොටස හැම කමටහනටම එකයි. **සමුදය ධම්මානුපස්සීවා වයධම්මානුපස්සීවා සමුදයවයධම්මානුපස්සීවා** එතැනදිත් ඔය ප්‍රභේද අපි වෙන්කරගෙන වෙන්කරගෙන වෙන්කරගෙන කොච්චර කතා කළත්, එකම තැනකටයි ඇවිල්ලා තියෙන්නේ. ආනාපානසති භාවනාව වෙන්න පුළුවන්, අශුභය, සීවතිකය කියලා මොන තරම් කමටහන් තිබුණත්, **අජ්ඣත්තං වා බහිද්ධං වා** කිව්වා නම් එකම තැන යි. අපි ඕක **අජ්ඣත්තං වා බහිද්ධං වා** කියලා ඒ ඒ කමටහණට වෙන් කරගන්නවා. එහෙම නෑ. එකම තැනක් මේ කතා කරන්නේ. **සමුදය ධම්මානුපස්සී වා වයධම්මානුපස්සී වා** කිව්වා නම් එකම තැන යි. **අත්ථි කායොතිවා පනස්ස සති පච්චුපට්ඨිතා හොති.** සත්ත්වයෙක් පුද්ගලයෙක් නො වෙයි කය පමණක් ඇත්තේය කියන නුවණේ පිහිටා හිටින තැන දක්වා එන්න කියනවා. එහෙනම් මේ හැම කෙනෙක්ම එන්න ඕන එකම තැනකට යි. කායානුපස්සනාවෙන්. සත්ත්වයෙක් පුද්ගලයෙක් නෙවෙයි මෙතැන කය පමණක් ඇත්තේ ය කියන නුවණේ පිහිටා ඉන්න තරම් දක්ෂයි. ඒ කියන්නේ සක්කාය දිට්ඨිය දුරුවෙලා. ඊට පස්සේ පෙන්නනවා, **අභිජ්ඣා දෙමනස්සා** දෙක දුරුවෙනකම් මේ කමටහණ වඩනවා. එතකොට ආයෙ ඔයාට ඇවිල්ලා අහන්න ඕන නෑ හාමුදුරුවනේ, මම දැන් මේක කළා. දැන් හාමුදුරුවනේ මම ඊළඟට මොකක් ද කරන්න ඕනේ කියලා අහන්න දෙයක් නෑ. ඇයි තමන්ම දන්නවානේ තමන්ගේ මේක දුරුවෙලා ද නැද්ද කියලා. තමන්ගේම මේ සිහිය පිහිටලා ද නැද්ද කියලා තමන්ම දැනගන්නවා. එතෙන්ට එනකම් කළා නම් අහන්න දෙයක් නෑ ප්‍රතිඵලම තමයි එයාට තියෙන්නේ.

*කොග්ගලගේ මහතා* :- ඒ කියන්නේ අර **නචකිඤ්චි ලොකෙ උපාදියති**, කියනකොට...

*ස්වාමීන් වහන්සේ*:- මේ ලෝකයේ කිසි දෙයක් උපාදය කරගන්නේ නෑ කියන කාරනාව නේ. ඒ කියන්නේ ලෝකයේ කිසිම දෙයක් මෙයා අල්ලං නෑ කියන්නේ, ලෝකෝත්තර වෙලා. කයෙනුත් මිදෙනවා. එතැන ඒ කය පමණක් ඇත්තේ ය කියන තැනදි ගන්න එපා තියෙන කයක් කියන එක. ඔතැනත් වරද්ද ගන්නවා. මේ තියෙන කය ගැනයි මේ කතා කරන්නේ තියෙන එක නෙවෙයි ඔය. හේතුඵලයත් එක්ක හම්බවෙන සිද්ධියක් නේ මේ දකින්නේ මෙයා. **සමුදය ධම්මානුපස්සී වා වය ධම්මානුපස්සීවා** කියලා කියන්නේ ඇත්තටම මෙයා දකින්නේ හේතු ඵල දහමයි. එතකොට ඒ හේතුඵල දහමට මෙයාට වැටහෙනවා, හේතු නිසා කය පවතිනවා,

හේතු නිරෝධයෙන් කය නිරෝධ වෙනවා කියලා මෙන්න මේ හේතුව නිසා ඇතිවෙලා හේතුවේ නිරෝධයටයන...

***කොග්ගලගේ මහතා*** :- හේතු යෙදෙන්නේ නැත්නම් කයක් ගැන කතා කරන්න දෙයක් නැහැ.

***ස්වාමීන් වහන්සේ***:- කතා කරන්න දෙයක් නැහැ. නමුත් දැන් කතා කරන්න පුළුවන් වෙලා තියෙන්නේ හේතුඵල යෙදිලා තියෙන කයකින් ජීවත් වෙන නිසා යි. එහෙනම් මේ හේතුඵල දහමක ජීවත්වෙනවා මිසක සත්ත්වයෙක් පුද්ගලයෙක් ජීවත් වෙනවා නෙවෙයි කියලා නුවණට එන්න ඕන. ඒකයි කය පමණක් ඇත්තේය කියලා කියන තැනක සත්ත්ව පුද්ගලභාවයක් නෙවෙයි මෙහෙම කයක් තියෙනවා. ඒ තියෙන කය කොහොමද, ඇතිවෙලා නැතිවෙලා යන කයක් තියෙන්නේ. කයේ නිරෝධය දකිමින් කයක් දකිනවා. ඒකයි අර රූපයේ අනිත්‍යය දකිනවා නෙවෙයි, අනිත්‍ය වූ රූපය දැක්කා නම් හරි නේ. රූපයේ අපි දකින්නේ තියෙන කයේ අනිත්‍යයයි. හැබැයි අනිත්‍ය වෙච්ච රූපයක් දැක්කා නම් රූපයම අනිත්‍ය වෙලා අපට. එතකොට ආයෙ තියෙන කතාවක්වත්, නෑ කතාවක්වත් නෑ එතැන. එයා තියෙනවා කියන්න යන්නෙත් නෑ, නෑ කියන්න යන්නෙත් නෑ. ඇයි එයා දකින්නේම අනිත්‍ය වෙච්චි රූපයක්. එතකොට මේ කයත් සමුදයෙන් වයෙන් දෙකෙන් දකින කාරනාවක දී මෙයාට කොතැනක වත් කොටු කරන්න ලඝු කරන්න තැනක් අහුවෙන්නේ නෑ, තියෙන එකක් වත් නැති එකක් වත්. මෙයාට තියෙන්නේ ඇතිවෙලා පැවතිලා නැතිවෙලා යන ධර්මතාවයකට අදාල ලක්ෂණ ටිකක් මිස, එතකොට ඒ ලක්ෂණයට යටත් වෙච්චි කයක් තියෙයි. ඒ තියෙන කය අර ධර්මතාවයකට යටත්වෙලා තියෙනවා. ඒකයි **අත්ථි කායොති වා පනස්ස සති පච්චුපට්ඨිතා හොති.** සිහි නුවණින් යුක්තව දකිනවා, ඇත්තේ මෙහෙම එකක් විතරයි කියලා. එහෙම නැතුව මේ කය කියලා ආයෙත් ගෙඩි පිටින් සත්ත්ව පුද්ගල කයක් අල්ලගන්නවා කියන තැනකට නෙවෙයි. ඔය වචනවල අර්ථය කොච්චර වරදවා ගන්නවාද.

***කොග්ගලගේ මහතා***:- සත්ත්වයෙක් නැති කයක් තියෙනවා කියලා වරදවා ගන්නවා!

***ස්වාමීන් වහන්සේ***:- නෑ කියලා කියන්නත් බැහැ නේ. ඇයි, හේතු හැදෙනකොට මේ තියෙනවා කියන තැනකට ඇවිල්ලා. හේතු නැතිවෙනකොට නැතිවෙනවා කියන නිසා, තියෙන තැනකත් නෑ. ඒ නිසා ඊට කලින් පෙන්නනවා සමුදය වය දකින්න කියලා. උදය වැය බලන්න කියලා කියන්නේ.

*කොග්ගලගේ මහතා :-* ඕක අර හරියටම ගැලපෙනවා අනිච්ච සංඥව එක්කත් අර සමුදයයි අත්ථගමයයි...

***ස්වාමීන් වහන්සේ:-*** ඒ කියන්නේ හේතු නිසා ඇතිවෙන හින්ද නෑ කියන්න බැහැ මේවාට. නෑ කියන අන්තයට යන්නත් බැහැ. හේතු නිරෝධයෙන් ඵල නිරෝධයට යන නිසා තියෙනවා කියන අන්තයට යන්නත් බැහැ. එතකොට තියෙනවා කියලා පනවන්නත්, නෑ කියලා පනවන්නත් බැහැ කියලා කියන්නේ මෙයාට ස්ථිරව මොකට ද පනවන්න පුළුවන්? නිත්‍ය වශයෙන් කෝකට ද ගන්න පුළුවන් මෙයාට? නිත්‍ය වශයෙන් කිසිම දෙයක් ගන්න බැහැ කියන විදියට තමයි අනිත්‍ය දැක්කේ. එහෙම නැතුව මේ තියෙන එක වෙනස් වීමට අනිත්‍යය කියන එක නෙවෙයි, ඒක විපරිනාමය. ඒ කියන්නේ මේ තියෙන කයේ වෙනස්වීම ගැන කතා කරලා ඒ තියෙන කය ගැන කතන්දරයක් හදමින් කතා කළොත් එහෙම වෙනස්වෙනවා කියලා ඒක විපරිනාමයට අයිති දෙයක්. ඔන්න ඔය දෙකේ වෙනස බුද්ධ දේශනාවේ තියෙනවා. දේශනාවේ විපරිනාමය වෙනම පෙන්නලා දෙනවා විපරිනාම දුකත් එක්කම. දුක ගැන කතා කරනකොට විපරිනාම දුකත් පෙන්නනවා නේ. අනිත්‍ය දුකකුත් කතා කරනවා. විපරිනාම දුකකුත් කතා කරනවා. ඉතින් ඔය දෙක පටලවාගෙන මේ ගමන යන්න බැහැ.

*කොග්ගලගේ මහතා :-*බොහොම පැහැදිලියි. සාදු ! සාදු !! සාදු !!!

# මජ්ඣිම නිකායේ මූලපරියාය සූත්‍රය ඇසුරෙන් 15-11-2015 දින අන්තර්ජාලය ඔස්සේ පැවැත්වුනු සවනට සිසිලස ධර්ම සාකච්ඡාව

හැම දෙනාටම තෙරුවන් සරණයි. අද 2015 නොවැම්බර් මස 15වැනි ඉරිදා සවනට සිසිලස ඔස්සේ යුරෝපා කල්‍යාණ මිත්‍රයිනුත්, ඒ වාගේ ම, ලෝකවාසී අනික් කල්‍යාණ මිත්‍රයිනුත් එකතු කරගෙන ස්කයිප් මාධ්‍යය හරහා කෙරෙන සාකච්ඡාවක ආරම්භය යි මේ.

අද අපට සම්බන්ධවෙන්නේ ශ්‍රී ලංකාවේ සිට ආචාර්‍ය රවි කොග්ගලගේ මහත්මයා යි. එතුමා අපට දන්වලා එවලා තියෙනවා අද සම්බන්ධ වෙන්නේ මඳ වේලාවකට පසුව කියලා. එතුමා ඔන් ලයින් ආපුවහම අපි එකතුකරගන්නා අදහසින් අපි සාකච්ඡාව ආරම්භ කරමු.

අද අපට මාතෘකාව හැටියට අපි ගන්න හිතාගෙන ඉන්නේ මජ්ඣිම නිකායේ පළමුවෙනි පොතේ, ඒ කියන්නේ මූල පණ්ණාසකයේ පළමුවෙනි සූත්‍රය වන මූල පරියාය සූත්‍රය යි.

මූල පරියාය සූත්‍රය ගැන කෙටි හැඳින්වීමක් කළොත් මම හිතනවා ඒක අපි මීට කලිනුත් අහලා තියෙන හැටියට ඒ දවස්වල විශාල මාන්නයක් සහිත අය ගිහිල්ලා බුද්ධ සාසනයේ පැවිදිවුනා. ඒ යම් කිසි කුලයක් නිසා හරි, ගෝත්‍රයක් නිසා හරි, සාමාන්‍යයෙන් ඒ කාලයේ තිබ්බච සමාජ ක්‍රමය අනුව මානාධික කොටසක් ගිහින් පැවිදි වෙච්චි බව අපට අහන්නට ලැබිලා තියෙනවා. ඒ අයගේ මානය දුරු කිරීම සඳහාත්, විශේෂවූ ධර්‍ම කොටස් මතුකර දීම සඳහාත්, මේ සූත්‍රය දේශනා කළා කියලා අපි අහලා තියෙනවා.

ඉතින් ඒක මේ ආකාරයට යි පටන්ගන්නේ. මේකත් ආනන්ද ස්වාමීන්වහන්සේගෙන් තමයි අපට ලැබුණේ. : **එවං මෙ සුතං එකං සමයං භගවා උක්කත්තායං විහරති සුභගවනෙ සාල රාජ මූලෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවො ති. භදන්තෙ ති තෙ භික්ඛූ භගවා පච්චස්සොසුං.** ඒ කියන්නේ සාමාන්‍යයෙන් පටන් ගන්නා විදියටමයි මේ සූත්‍රයත් පටන්ගන්නේ. මා විසින් මෙසේ අසන ලදී කියලා. භාග්‍යවතුන් වහන්සේ උක්කත්තා නුවර සමීපයේ තිබ්බ සුභග කියන වනයෙහි වැඩ වසන කාලයේ තමයි මේ දේශනාව සිද්ධකරලා තියෙන්නේ. ඒකෙදී බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා, **සබ්බ ධම්ම මූලපරියායං වො භික්ඛවෙ දෙසිස්සාමි.** මහණෙනි, තොපට සියලු සක්කාය ධර්මයනට මූල

කාරනය දේශනා කරන්නෙමි කියලා තමයි මජ්ඣිම නිකාය පරිවර්තනයේ සඳහන් වෙන්නේ. ඒ කියන්නේ සියලු දේ වල මුල් පිළිවෙල දේශනා කරනවා කියලා තමයි ඒකෙදී සඳහන් කරලා තියෙන්නේ. **තං සුනාථ** - අහන්න. **සාධුකං මනසිකරොථ** - හොඳින් මෙනෙහි කරන්න කියලා කියනවා. **භාසිස්සාමි - එවං භන්තෙ ති සො වෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං.** භික්ෂූන් වහන්සේලා කිව්වා, හොඳයි ඒ විදියට කරන්නම් කියලා.

ඊළඟට දේශනාව කරලා කියනවා, **ඉධ භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරිය ධම්මස්ස අකොවිදෙ අරිය ධම්මෙ අවිනීතො සප්පුරිසානං අදස්සාවී සප්පුරිස ධම්මස්ස අකොවිදෙ සප්පුරිස ධම්මේ අවිනීතො පඨවිං පඨවිතො සංජානාති. පඨවිං පඨවිතො සඤ්ඤජත්වා පඨවියං මඤ්ඤති. පඨවියා මඤ්ඤති. පඨවිතො මඤ්ඤති. පඨවිං මෙ තෙ මඤ්ඤති. පඨවිං අභිනන්දති. තං කිස්ස හෙතු. අපරිඤ්ඤතං සක්කාති වදාමීති.** ඒ කියන්නේ මෙතැන දී විශේෂයෙන් කියනවා මේ අශ්‍රැතවත් පෘථග්ජනයා, අපි මේ දේවල් සාකච්ඡා කරලා තියෙනවා මීට පෙර, කවුද අශ්‍රැතවත් පෘථග්ජනයා කියලා කියන්නේ කියලා. ආර්‍යයන් වහන්සේලා නො දකින, ඒ කියන්නේ ගුණ වශයෙන් හඳුනා නො ගන්න, ආර්‍ය ධර්මයේ අදක්ෂ, අකෝවිද, **අරිය ධම්මෙ අවිනීතො** ආර්‍ය ධර්‍මයේ විනීත බවක් නැති, ඒ වගේම සත්පුරුෂයන් කවුද කියලා හඳුනන්නේ නැති ගුණ වශයෙන්, සත්පුරුෂ ධර්‍මයේ අදක්ෂ, සත්පුරුෂ ධර්‍මයේ අවිනීත, වෙන කෙනෙක් - එයාට කියනවා අශ්‍රැතවත් වූ පෘථග්ජනයා කියලා. මෙයා මේ ධර්‍මය අහලා නැති පෘතග්ජනයෙක්. මෙන්න මේ විදියට හිතනවා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, කොහොමද? **පඨවිං පඨවිතො සඤ්ජානාති.** එතැනදී දීලා තියෙන විදිය තමයි, පරිවර්තනයේ කියලා තියෙනවා, මහණෙනි, මේ ලෝකයේ ආර්‍යයන් නො දක්නා සුලු, ආර්‍ය ධර්‍මයෙහි අදක්ෂ වූ, ආර්‍ය ධර්‍මයෙහි නො හික්මුනා වූ, බුද්ධාදී සත්පුරුෂයන් නො දක්නා සුලු, සත්පුරුෂ ධර්‍මයෙහි අදක්ෂ වූ, සත්පුරුෂ ධර්‍මයෙහි නො හික්මුණා වූ, අශ්‍රැතවත්, පෘතග්ජන තෙමේ පෘථිවිය පෘථිවිය වශයෙන්, තණ්හා මාන දිට්ඨි මඤ්ඤණාවෙන් සංඥා විපර්‍යාස වශයෙන් හඳුනයි. ඒක තමයි කිව්වේ **පඨවිං පඨවිතො සඤ්ජානාති** කියලා.

ඊළඟට කියනවා, පඨවිය පඨවිය වශයෙන් හැඳින පඨවිය තණ්හා මඤ්ඤණා දී වශයෙන් හඟී. හඟිනවා කියලා කියන්නේ ඒ විදියට හිතාගන්නවා කියන එක යි. ඊළඟට මම පෘථිවියෙහි පිහිටියෙමි යි කියලා හඟියි කියනවා. මම පඨවියෙහි පිහිටලා ඉන්නවයි කියලා හැඟීමක් එනවා. එහෙමත් නැත්නම් එහෙම හිතාගන්නවා. ඊට පස්සේ මම පඨවියෙන්

බැහැර වෙසෙනවයි කියලාත් හිතාගන්න පුළුවන්. ඒ විදියෙන් එක් විදියකට හිතාගන්න පුළුවන්. ඊට පස්සේ පඨවිය මගේ කියලාත් හිතාගන්න පුළුවන්. ඊට පස්සේ පඨවිය අභිනන්‍දනය කෙරේ. අපි දන්නවා අභිනන්දනය කියන්නේ මොකක් ද කියලා. අභිනන්‍දනය කරනවා කියන්නේ ඒ ගැන වැඩිපුර ඇල්මෙන් ගුණ වශයෙන් හෝ ඒ විදියට පිළිගැනීම යි. අභිනන්‍දනය කරනවා. වඳිනවා කියන එකටත් අපි අභිනන්‍දනය කරනවා කියනවා නේ. ඒ කවර හෙයින් ද යත්, ඔහුගේ පඨවිය පිළිබඳ පිරිසිඳ නො දැනීම නිසා යි. ඒ කියන්නේ පඨවිය කියන එක හරියට තේරුම් අරන් නැති හින්දයි කියලා කියනවා. ඔන්න ඔය විදියට පඨවිය ගැන මුලින්ම සඳහන් කරනවා බුදුරජාණන්වහන්සේ.

ඊළඟ ඡේදයෙන් මේ ආපෝ ගැන, දැන් අපි පඨවිය ගැන කථා කළා. ඊළඟ ඡේදයේ ආපෝ ගැනත් ඔන්න ඔය ආකාරයෙන්ම හිතනවා. කොහොමද? ආපෝ කියන එක ආපෝ වශයෙන්ම හඳුනාගන්නවා. ආපෝ වශයෙන් ඇඳිනගෙන, ආපෝ වශයෙන් මඤ්ඤණා කරනවා. මඤ්ඤණා කරනවා කියන්නේ නැවත වරක් ආපෝ කියන එක ආපෝ කියලා හිතාගන්නවා.

මේ ගැන ඉස්සරහට සාකච්ඡා කරමු කොග්ගලගේ මහත්මයාත් සම්බන්‍ධ වුනායින් පස්සේ.

ඊට පස්සේ මේ ආපෝ මෙහි පිහිටියා කියලා හිතාගන්නවා. ආපෝවලින් බැහැර වුනා කියලත් හිතාගන්නවා. ආපෝ මගේ කියලා හිතාගන්නවා. ආපෝ කියන එක අභිනන්දනය කෙරෙනවා.

ඔය විදියට තේජෝ වායෝ කියන දේවල් ගැනත් ඔය ආකාරයෙන්ම සඳහන් කරනවා.

ඊට පස්සේ මේක මේ භූතයන් ගැන, ඒ කියන්නේ චාතුර්මහාරාජිකයේ ඉන්න ඒ දෙවියන් ගැනත් ඒ විදියටම මඤ්ඤණා කරන විදියක් පෙන්නනවා. සූත්‍රයේ ඔබට බලාගන්න පුළුවන්. ඊට පස්සේ දෙවියන් වශයෙන් ඊට පස්සේ ප්‍රජාපතී කියලා ඒක මේ මෙතැනදිත් සඳහන් කරලා තියෙනවා වරහන් ඇතුලේ මාරයා කියලාත්. එයා ගැනත් මාරයා ඒ කියන්නේ ප්‍රජාපතී ප්‍රජාපතීහු වශයෙන් හඳුනයි. ප්‍රජාපතීහු වශයෙන් හැඳින ප්‍රජාපතීහු කියලා හඟිනවා නැත්නම් මඤ්ඤණා කරනවා කියලා.

ඔය ආකාරයෙන් බ්‍රහ්මයා බ්‍රහ්මයා විදියටත්, එතකොට කියනවා ආභස්සර දෙවියෝ ආභස්සර දෙවියෝ හැටියට ඔය විදියටම මඤ්ඤණා කරනවා කියලා. සුභකින්නක බ්‍රහ්මලෝකයේ ඉන්න සුභකින්නක බ්‍රහ්මයන්වත් ඒ විදියටම මඤ්ඤණා කරනවා කියලා. ඊළඟට වෙහප්පල, වෙහප්පල

බ්‍රහ්මයන්වත් ඒ විදියටම මඤ්ඤණා කරනවා කියලා. ඊළඟට අභිභූ. අභිභූ කියලා කියන්නේ අපි අර සාමාන්‍යයෙන් දන්නවානේ අසඤ්ඤ තලය කියලා එකක් තියෙනවා නේ. රූපී බ්‍රහ්ම ලෝකයේ තියෙනවා මේ අසඤ්ඤ තලය කියලා. ඒකේ සංඥාවක් දැනෙන්නේ නැති තලයක් හැටියට. ඒකේ ඉන්න අයත් **අභිභූං අභිභූතො සඤ්ජානාති**. එහෙම හඳුනාගන්නවා. එහෙම හඳුනාගෙන ඒ විදියට අභිභූ කියලා මඤ්ඤණා කරනවා කියලා. ඊළඟට ඒ වගේම, ආකාසානඤ්චායතනයේ ඉන්න ඒ බ්‍රහ්මයිනුත් ඒ විදියටම හඟිනවා, මඤ්ඤණා කරනවා කියලා ඒ විදියට දිගින් දිගට විඤ්ඤණඤ්චායතනය, ආකිඤ්චඤ්ඤයතනය, නෙවසඤ්ඤනාසඤ්ඤයතනය, කියන ඒ බ්‍රහ්ම තලයත් ඔන්න ඒ විදියටම හිතාගෙන ඉන්නවා කියලා කියනවා.

ඉතින් මේක බැලූ බැල්මටම කාටවත් වරදක් විදියට පෙනෙන දෙයක් නෙවෙයි මේ කියන්නේ. නමුත් මේකේ තියෙනවා ගැඹුරු අර්ථයක්. අපි ඒක තමයි හොයාගන්න අද මහන්සි ගන්නේ.

විශේෂයෙන් මේ අර මුලින් කියාපු ධාතූන් හතරෙන්, මේ ධාතූන් හතර ගැන විශෙෂයෙන්ම අවබෝධ කරගන්න අපි මහන්සි වෙනවා. අපි සාකචඡාවක් හැටියට කොග්ගලගේ මහත්මයා සම්බන්ධ වෙනකම් අපට පුළුවන් කෙටි සාකච්ඡාවක යෙදෙන්න මේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධාතූන් අපි කොයි ආකාරයෙන්ද හඳුනාගෙන ඉන්නේ කියන එක පොඩ්ඩක් කතා කරමු.

ඊට පස්සේ, අපි කොග්ගලගේ මහත්මයාත් සම්බන්ධවුනාට පස්සේ, තව දුරටත් මේ ගැන සාකච්ඡා කරමු.

මහත්මයා, මොනවාද මේ ධාතු හතර කියලා නාමිකව සඳහන් කරලා, දැනුත් අපි සඳහන් කළා. ඊට පස්සේ අපට පඨවි ධාතුව ගැන ඔබ දන්නා දේවල් මොනවාද කියලා. කොයි විදියටද දැනට ධර්මයේ හඳුනාගෙන තියෙන්නේ පඨවි ධාතුව කියන එක ගැන, පොඩි විස්තරයක් කරන්න පුළුවන් නම් කල්‍යාණ මිත්‍රයන් වෙනුවෙන් අපට පුළුවන් සාකච්ඡාව ආරම්භ කරන්න.

ගරුතර මහා සංඝරත්නය ඇතුළු සියළුම කල්‍යාණ මිතුරු මිතුරියන්ගෙන් අවසරයි. අපි දැන් මහාභූත හැටියට කථා කරනවා නැත්නම් තේරුම් අරගෙන තියෙනවා, ආපෝ, තේජෝ, වායෝ පඨවි කියන ටික. මෙතැන දී පඨවිය කියන එක මම තේරුම් අරගෙන තියෙන්නේ එක්තරා විදියක තද බව කියන එකයි. මෙය ශක්තියක් හැටියට යි මට වැටහෙන්නේ. දැන් හුඟාක් වෙලාවට, දැන් මුල් අවධියේ දී මට තේරුම් ගියේ මේ පෘථිවියයි

පඨවිය හැටියට තේරුනේ. පසුව මම මේක තේරුම් ගත්තා ශක්ති විශේෂයක් විදියට. අපට මේක තද බව කියන එක කියනවා මිසක්, අනිත් ඒවා නෑ කියන්න බැහැ. දැන් අපි මේසයක් ඇල්ලුවාහමත් ඒකේ පඨවි ප්‍රමාණයක් තියෙනවා. හැබැයි මේ කොයි විදියකටවත් කියන්න බැහැ මේකේ අනිත් ඒවා නැතියි කියලා. ආපෝ, තේජෝ, වායෝත් මේකේ එක්තරා ප්‍රමාණයකට තියෙනවා. නමුත් මේකේ වැඩි ප්‍රමාණයක් තියෙන්නෙ පඨවි. ඒ නිසා තමයි අපට ඒකට විශාල ශක්තියක් තියෙනවා, ඒකේ විශාල තද ගතියක් තියෙනවා කියලා දැනෙන්නෙ. අපට යමක් ඇඟේ හැපෙන ගතියක් හොඳට තේරෙනවා ඒකේ පඨවි ගතිය තියෙන නිසා කියන එකයි මගේ අවබෝධය. හොඳයි තෙරුවන් සරණ යි.

තෙරුවන් සරණයි. බොහොම පිං, මම හිතන්නේ ඒ මහත්මයා සඳහන් කළේ, ඒ කියන්නේ අපි දැන් මේ වෙන වෙනම මේවා ගැන කථා කළාට, ඒ හතරම එකට යි තියෙන්නේ කියන අදහසින් කථා කළේ. ඊට පස්සේ පඨවිය ගැන අපට යම් කිසි විස්තරයක් කළා.

ආපෝ ධාතුව ගැන කොයි ආකාරයෙන් ද ඔබතුමිය තේරුම් අරන් ඉන්නේ කියන එක පැහැදිළි කරලා දෙන්න, තෙරුවන් සරණයි.

තෙරුවන් සරණයි, ගෞරවණීය ස්වාමීන් වහන්සේලා ඇතුළු කල්‍යාණ මිතුරු සියලු දෙනාගෙන්ම අවසරයි. ඇත්තටම ඒ මහත්මයා සඳහන් කළ ආකාරයට මේ මහාභූත සතරදෙනාම ශක්තීන් විදියට තමයි මටත් තේරුම්ගන්න පුළුවන් වෙන්නේ. එතකොට පඨවි යම් තැනක පිහිටා තියෙනවා ද, පඨවි ගතිය, තද ගතිය වැඩියෙන් තියන යම් වස්තුවක පඨවි ධාතුව කියලා කිව්වාට, පඨවි ධාතුව තුළ ම, පඨවි ධාතුව තියෙන සෑම තැනක ම, මට තේරුම්ගන්න පුළුවන් වෙන විදියට, මේ ආපෝ ධාතුවත්, තේජෝ ධාතුවත්, වායෝ ධාතුවත්, මේකට එකතුවෙලා තියෙනවා කියලා කියන්න පුලුවන්. මේ ආපෝ ධාතුව කියන මේ ධාතුව සාමාන්‍යයෙන් එකට එකතු කරලා වගේ තියෙන ශක්තියක්. ඒ කියන්නේ, පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන මේ තුනම බැඳිලා තියෙන වා වගේ එනවා ඒකට අර අපි කෙටියෙන් කියනවා නම්, අපි උදහරණයක් විදියට ගම් (glue) වලින් ඇලවිලා තියෙනව වගේ. එතකොට කියන්න පුළුවන් වෙන්නේ එකක් අනෙකෙන් වෙන්කරන්නත් බැහැ, පඨවි, ආපෝ, තේජෝ, කියන ඒවා වායෝ ධාතුවෙන් වෙන් කරන්න බැහැ. ඒ මහාභූත හතරම එකට එකතුවෙලා යමක් වැඩි ප්‍රමාණයක් තියෙනවා නම්, පඨවි ධාතුව වැඩියෙන් තියෙනවනම් දැන් මහ පොලොව වගේ, ඒකෙ පඨවි ධාතුව වැඩි නිසා පඨවි කියනවා. මේ ධර්ම මාර්ගයේ ගමන් කිරීමේදී මේවා දේවල් විදියට හඳුන්වන්න බැහැ අපට. මේවා ශක්තීන් වශයෙන් තමයි පෙන්නලා

දීලා තියෙන්නේ. ඒ කියන්නේ මම ඉගෙනගත්තු විදියට මේ ධර්මයේ ගමන් කරන විට මේක පැහැදිලි වෙලා තියෙන්නේ මේ ආපෝ ධාතුවෙන් තමයි මේක ඇලිලා බැඳිලා තියෙන්නේ කියලා. අන්න ඒ විදියට තමයි මට මේක තේරුම්ගන්න පුළුවන් වෙන්නේ. තෙරුවන් සරණයි.

තෙරුවන් සරණයි. බොහොම පින්. මම හිතන්නේ තවත් පඨවි ගැනත් තවත් අදහස් අපට තියෙනවා. මම හිතන්නේ කල්‍යාන මිත්‍රයින්ට එකතු කරන්න අදහස් තියෙනවා. මම මහත්මියට යොමුවෙන්න කලින් පොඩි දෙයක් මතක් කරන්නම්. අපි පසුගිය වතාවේ සාකච්ඡා කරන කොටත්, අපි කිව්වා මේ ධාතුන්ගේ ලක්ෂණ ගැන මතක් කළා. ඒ කියන්නේ සම්මුති වශයෙන්. ඒ වාගේම අපි කිව්වා සසම්භාර හැටියට, ලක්ඛණ හැටියට, ආරම්මණ හැටියට ආදී වශයෙන් අපි කථා කළා. කාට හරි මතකයි නම් පසුවත් ඒ ටික එකතු කරන්න කවුරුහරි.

මම නැවත වරක් පඨවි ධාතුව ගැන සාකච්ඡාව තව දුරටත් ගෙනියන්න මහත්මියට යොමුවෙනවා.

මේකයි මම කියන්න හැදුවේ. දැන් සුනාමිය කාලෙදී අපි දැක්කා කොච්චර ලොකු බිල්ඩිංස් හෙම කඩා වැටුනාද කියලා. ඉතින් මූදේ ආපො ධාතුව වැඩිය තියෙන්නේ. නමුත් ඒ අවස්ථාවෙදී ඒක පඨවි ධාතුව ඉස්මතුවෙලා මොන හානියක් කළාද කියලා තේරෙනවා. ඒ කියන්නේ ශක්තියක්මයි මේ පඨවි ධාතුව. ඉතින් ඒක යම් යම් අවස්ථාවලදී ධාතුන්ගේ එකතුවීම වෙන්වීම අනුව ඒකේ ගති ලක්ෂණ වෙනස්වෙනවා කියලායි මට කියන්න තියෙන්නේ. තෙරුවන් සරණයි.

තෙරුවන් සරණයි. බොහොම පින්. තවත් අදහස් තියෙනවාද පඨවි ධාතුව ගැන? එතෙන්දී සඳහන් වුනේ ඇත්තටම දැන් අපි ජලය කියන එක ගත්තහම ආපෝ ධාතුව ප්‍රකට වූ දෙයක් හැටියට නේ සඳහන් කරන්නේ. නමුත් දැන් අර කිව්ව විදියට දැන් ජල පහරක් වදින වෙලාවක ඒකේ තියෙන අර පඨවි ගතිය නිසා තමයි ඒ තද බල බලයක් යෙදෙන්නේ කියන එක ගැන තමයි සඳහන් වුනේ.

තවත් අදහස් තියෙනවාද පඨවි ආපෝ කියන දෙක පිළිබඳව අපි ඉදිරියට යන්න කලින්. ඔබතුමියට යොමුවෙන්න ද? තෙරුවන් සරණයි මට මෙතන එකතු කරන්න පුළුවන්කම තියෙනවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන හතර කඩලා බලන්න බැහැ. නමුත් ඒ භූත ස්වභාවය, බුදුරජාණන්වහන්සේ අහනවා භූත භූත කියන්නේ මොනවාටද කියලා. ඊළඟට බුදුරජාණන්වහන්සේම උත්තර දෙනවා භූත කියන්නේ පඤ්චස්කන්ධයට යි. ස්කන්ධවලටත් කියනවා භූත කියලා. මොකද අපිට

යම්කිසි දෙයක් අපේ ඇසට, කනට, නාසයට, දිවට, කයට මුනගැසෙනවා නම් ඒ හැම දෙයක්ම මුන ගැසෙන දේවල් භූත. භූත රූප. භූතයන්ගෙන් හැදුන දේවල්. ඒක නිසා පඤ්චස්කන්ධය භූත. පඤ්චස්කන්ධයට අපි ඇලුනොත් එතකොට තමයි පඤ්චඋපාදනස්කන්ධය වෙන්නේ. නැත්නම් ස්කන්ධය පඨවි, ආපෝ, තේජෝ, වායෝ ලෙස පිරිසිදු උනොතින් එක එක විදියට, එක එක දර්ශන හැටියට එක එක ආකාරයට පෙනී හිටියාට, ඒ පෙනී ඉන්නේ අපේ මේ පංචස්කන්ධය තුළින්. ඒකට ඇලීම සහ ගැටීම පංචඋපාදනස්කන්ධය වෙනවා. තෙරුවන් සරණයි.

තෙරුවන් සරණයි. ඇත්තටම බොහොම පින් ඒ අදහස්වලට. පඨවි ආපෝ කියන එක දැන් ඇත්තටම අපි කතා කළා ඒක බලන්න බැහැයි කියන එක. ඒ කියන්නේ වෙන්කරලා දැකීමේ හැකියාවක් නැති එක කථා කළා. එතකොට පඨවි කියලා කිව්වා, ඉස්සෙල්ල මහත්මයාත් මතක් කළා මේකේ තියෙන රලු එහෙම පඨවි කියලා කිව්වේ ඒකේ තියෙන තද ගතිය කියන එක යි. එතකොට දැන් ඇයි අපි මේ මේකේ දේශනාව තුළ දී මේ පරිවර්ථනයේ පඨවියට පෘථිවිය කියලා තමයි හඳුන්වලා තියෙන්නේ. ඒ පිළිබඳව කාට හරි අදහසක් තියෙනවාද, ඇයි අපි මේ පඨවියට පෘථිවිය කියන්නේ කියලා වගේ අදහසක් තියෙනවා ද?

හොඳයි මම තව උදව්වක් කරන්නම් ඒකට, අපි ඔය පරණ ස්වාමීන් වහන්සේලාගේ දේශන අහන කොට හුඟක් වෙලාවට ධාතු හතර හඳුන්වලා තියෙනවා පස්, දිය, ගිනි, සුලං කියලා. එතකොට පස් කියන තැන පඨවි ධාතුව තමයි හඳුන්වලා තියෙන්නේ. දිය කියන තැන වතුර ඃ ආපෝ ධාතුව හඳුන්වාපු තැනක්. ගිනි කියන තැන තේජෝ ධාතුව හඳුන්වාපු තැනක්. සුලං කියන තැන වායෝ ධාතුව හඳුන්වාපු තැනක්. ඒ කියන්නේ, කාට හරි කියන්න පුළුවන් ද, අපිට ඇයි එහෙම, එහෙම හඳුන්වන ධාතුන්වලට කියන විශේෂ නමක් තියෙනවා ද? මොන විදියට හැඳින්වීමක් ද ඒ කරලා තියෙන්නේ කියලා සාකච්ඡා කරන්න පුළුවන් ද?

සමහර විට මේක මම දන්නේ නෑ ඔබ තුමා කියන්න හදන්නේ උදාහරණයක් වශයෙන් අපි දැන් බත් ටිකක් කනවා කියන්නකෝ. දැන් බත් එන්නෙත් වී වලින් නේ. එතකොට වී ඇටේ පැලවෙලා තියෙන්නේ පොළවේ. අන්තිමට පොළවේ තියෙන දෙයක් උරාගෙන තමයි වී ඇටේ බවට පත්වෙන්නේ. එතකොට ඒක තමයි මේ ශරීරය හේදිලා තියෙන්නෙ ඒක කාලා. ඊට පස්සේ මේ ශරීරය ඉතින් අපට මේ දැනෙන නියපොතුවලින් තද ගතිය, කෙස්වල තියෙන තද ගතිය, ඒ ආදී වශයෙන් මේවා ඔක්කෝම ඊට පස්සේ අන්තිමට මැරුණාට පස්සේ ඇවිල්ලා පස් වලටම තමයි අයිති වෙන්නේ. ඉතින් එහෙම බැලුවහම ඒකම වෙන්න

ඇති මේ පෘථිවිය කියන්නෙ. ඒකම වෙන්න ඇති පඨවි කියන එක ඒ පෘථිවිය එක්ක සම්බන්ධ කරලා තියෙන්නෙ කියලා හිතෙනවා. තෙරුවන් සරණයි.

තෙරුවන් සරණයි. තවත් අදහස් තියෙනවා ද?

තෙරුවන් සරණයි. මට මෙහෙම දෙයක් හිතුනා. ඇත්තටම බුදුරජාණන්වහන්සේ මේ රූපය ගැන කතාකරන කොට මේ අපි දකින රූපය නෙවෙයි බුදුරජාණන්වහන්සේ අපට පෙන්නුවේ. ඒකයි බුදුරජාණන්වහන්සේ විශේෂයෙන්ම මතුකළ දර්ශණය තමයි ත්‍රිලක්ෂණය. අනිත්‍ය, දුක්ඛ අනාත්ම. අනිත්‍ය දුක්ඛ අනාත්ම නම් මේ සියලුම ලෝකයේ තියෙන මම ඇතුළු අභ්‍යන්තර සහ බාහිර වස්තුන්ගෙන් මූලික අවස්ථාවට බුදුරජාණන්වහන්සේ අපිව අරන් ගියා. ඒකෙදි බුදුරජාණන්වහන්සේ දිය හැකි හොඳම උදාහරණ වශයෙන් ගත්තේ පඨවි කියන තැනට ලෝකය යි, එතකොට ආපෝ කියන තැනට ජලය යි, වායෝ කියන තැනට සුළඟයි. අවසාන වශයෙන් ගින්දරයි කියන එතකොට විශේෂයෙන්ම මම හිතන්නේ විශේෂයෙන්ම මේකෙදී බුදුරජාණන්වහන්සේ ගත්තේ ලෝකෙටම පොදු දර්ශණයක්. ලෝකෙන් පොදුවුන උදාහරනයක් හැටියට තමයි මට හිතෙන්නේ. ලෝකය එතකොට පෘථිවිය කියාපුවහම මම හිතන්නේ ඉන්දියාවේ ඉන්න කෙනාටත්, එතකොට යුරෝපයේ ඉන්න කෙනාටත් අද දවසේ ඕන කෙනෙකුට මේක ගන්න පුළුවන් උදාහරණයක් හින්ද තමයි. පෘථිවිය කියන එක හැම තැනම තදයි. කියන ඒ දර්ශණය නිසා තමයි මම හිතන්නේ මේ පඨවි කියන එකට පොළොව උපමා කළේ. හොඳයි.

බොහොම පින්. මම හිතනවා අපට හොඳ අදහස් තියෙනවා. මම හිතන්නේ හැමෝගෙම අදහස් හරි වැදගත් වෙනවා අපට මේක මූලික ස්වභාවය ගැන හිතාගන්න කොට. අපි පොඩ්ඩක් මතක් කළොත් පසුගිය සාකච්ඡාවට ගියොත් අපි තව මේ ධාතු කොටස් දෙකක් තියෙනවා කතා කරන්න. ඊට කලින්, මතකද සඳහන්වුනා සම්මුති පඨවි, සම්මුති ආපෝ, සම්මුති තේජෝ, සම්මුති වායෝ කියලා කොටස් සම්මුති වශයෙන් හඳුන්වලා තියෙනවා. ඊළඟට ලක්ෂණ. ලක්ඛණ පඨවි, ලක්ඛණ ආපෝ, ලක්ඛණ තේජෝ, ලක්ඛණ වායෝ කියලා කොටසක්. සමාවන්න. ඒ ලක්ඛණවලට කලින් කිව්වා සසම්භාර. සසම්භාර පඨවි, සසම්භාර ආපෝ, සසම්භාර තේජෝ, සසම්භාර වායෝ කියලා. එතකොට මුලින්ම කිව්වා සම්මුති, ඊළඟට සසම්භාර, ඊළඟට ලක්ඛණ, ඊළඟට කිව්වා ආරම්මණ පඨවි, ආරම්මණ ආපෝ, ආරම්මණ තේජෝ, ආරම්මණ වායෝ කියලා. එතකොට ඔය ධාතු ගැන කථා කරනවා, ඔන්න ඔය කොටස් හතර විදියකින්. මේ කතා කරන කොට, මුලින්ම කිව්වා නේ අපි සම්මුති කියලා.

ඔය සම්මුති කියන තැනට දීපු උදාහරණ තමයි ඔය අපි ගත්තොත් පෘථිවිය. එහෙමත් නැත්නම් පස් දිය ගිනි සුලං කිව්ව අවස්ථාවට අපි බැලුවොත්, එතැන තියෙන්නේ සම්මුතියෙන් යමක් හඳුනාගන්න දීපු මූලිකම ස්වභාවය පිළිබඳ දීපු එකක් කියලා කියන්න පුළුවන්. ඒ වගේම දැන් සසම්භාර කියන තැන තමයි අර මහත්මයා කිව්වා වාගේ දැන් යමක් දක්කහම ඝණතත්වයක් පෙනෙනවා නම් අපි ඒක ගන්නවා සසම්භාර පඨවි කියලා. දැන් එතකොට දැන් මේසයක්, පුටුවක්, කොම්පියුටරයක් - ඔය වගේ දෙයක් ගත්තොත් එහෙම එතකොට ඒකේ එයා සසම්භාරික, ඒ කියන්නේ සම්භාරයක් සහිත නැත්නම් බරක් සහිත කියලත් කියන්න පුළුවන් සමහර අවස්ථාවල. අන්න ඒ වගේ අපි, ඒ කියන්නේ ප්‍රකටවෙන, ධාතු ප්‍රකටවෙන තැන අපි කියනවා ඒකට නම් දීලා මේක පඨවි කියලා. දැන් උදාහරණයක් හැටියට අපි අර අශුභ භාවනාව වඩනකොට මුල් කොටස් අපි ඒකේ තියෙනවා නේ කොටස් තිස් දෙකක්. ඒකේ මුල් කොටස් විස්ස ගත්තොත් **කෙසා-ලොමා-නඛා-දන්තා** කියන තැන, එතකොට අපට පෙනෙන්නේ ඒක සසම්භාර පඨවි හැටියට තමයි නම් කරලා තියෙන්නේ. නමුත් අපි ඒක තව දුරටත් ඉස්සරහට ගියහම අපි බලමු කොහොමද ආරම්මණ විදියටත් පේන්නේ කියලා. එතකොට යම් දෙයක් මූලික වශයෙන් හඳුන්වන කොට අපි කිව්වා, සම්මුති. ඊළඟට කිව්වා ඒවා වෙන වෙනම ගත්තහම ඒකේ ස්වරූපය වශයෙන් ගත්තහම ඒකට අපි කිව්වා සසම්භාර කියලා. ඊට පස්සේ ලක්ඛණ කියනකොට තමයි අර මහත්මයා කිව්වා වගේ දැන් තද ගතිය, එහෙමත් නැත්නම් ආපෝ ගැන කතාකරන කොට වැගිරෙන ගතිය වගේ දේවල් කතාකරන කොට අපි එතන අන්න ඒ ලක්ෂණය අඳුනාගන්න තැනත්, ලක්ඛණ පඨවි, ලක්ඛණ ආපෝ, ලක්ඛණ තේජෝ. තේජෝවල තියෙන ලක්ඛණය තමයි සිසිල් උණුසුම් ගතිය. එතකොට ඒකට කිව්වා ලක්ඛණ කියලා. ඊට පස්සේ ආරම්මණ කියන කොට විශේෂයෙන්ම අපි භාවනාවලදී ගන්න අවස්ථාවලදී ගන්නේ ආරම්මණ පඨවි - දැන් අපි කෙස් ගැන ඇස් දෙක පියාගෙන මෙනෙහි කරන අවස්ථාවේ ගන්න කොට, ඒක අරමුණක් හැටියට, භාවනාවකට ගන්නවා. ඒ වාගේම අපට මතක්වෙන කොට කාව හරි මතක්වෙන කොට අපට දැනෙනවා නේ. දැන් කන්දක් ගැන මතක් කළොත් ගලක් ගැන මතක් කළොත්, තද ගතියක් දැනෙනවා. වතුරක් ගැන මතක් කරොත් සිසිල් ගතියක්, ඒ වාගේම ගලන ගතියක් - ඒ වාගේ අන්න ඒ ආකාරයෙන් ගතියක් තියෙනවා.

හොඳයි ඒ පිළිබඳව තවත් මොනවා හරි කාටවත් අදහසක් තියෙනවා ද ?

ආපෝ ධාතුව ගැන අපි කථා කරා. පඨවි, ආපෝ. වායෝ ධාතුව ගැන කාට හරි පුළුවන් ද විස්තරයක් කරන්න?

තෙරුවන් සරණයි. වායෝ ධාතුව මම දැනගෙන තියෙන්නේ ඒක සෙලවෙන ගතිය. දැන් අර ඉස්සෙල්ලා කිව්වා පඨවි තද ගතියක් වගේ, වායෝ කියන එක සෙලවෙන ගතිය, සුළඟට සෙලවෙන ගතිය. තෙරුවන් සරණයි.

ඒකට අවකාශය කියලාත් කියනවද?

වායෝ ධාතුවට අවකාශය කියලා කියන්න පුළුවන් ද? කාට හරි පුළුවන් ද ඒකට උත්තරයක් දෙන්න?

මම නම් හිතන්නේ නෑ එහෙම වායෝ ධාතුවට ආකාශය කියලා කියන්න පුළුවන් කියලා. අපට ආකාශ ධාතු වෙනම එකක් තියෙන නිසා, අවකාශයට ආකාශ ධාතු කියලා නම තියෙන නිසා, වායෝ ධාතුව ඒක සෙලවීම කියන අර්ථය යි තියෙන්නේ. අවකාශයේ එහෙම සෙලවීමක් නැහැ හිස් බවක් විතරයි. ඒක නැතිකමක් තියෙන්නේ. ඒ හින්ද මට එතන වායෝ ධාතුවට අවකාශය කියන එක හරි නැහැයි කියන එකයි මගේ තේරුම. තෙරුවන් සරණයි.

ඔව් තෙරුවන් සරණයි. මම හිතන්නේ අපේ රූප විසිඅට ගත්තත්, ඒකේ තියෙනවා ආකාශ රූපය කියලා වෙනම කොටසක්. එතකොට වායෝවලට සම්බන්ධය අපට ඒ විදියට අපට බලාගත්ත හැකි යි.

ආරම්මණ ධාතු කියන කොට, ඒ කියන්නේ ශබ්දයක් ඇහෙන කොට අහවල් දේ කියලා කියන එක ගැන ද ඔබතුමා ඇහුවේ? පොඩ්ඩක් පැහැදිලි කරන්න.

පඨවි ධාතුව කියන එක, දැන් අපි භාවනාවේදී ආරම්මණයක් වශයෙන් ගන්නවා නේ. එතකොට පඨවි ධාතුව අපට අතින් අල්ලලා නෙවෙයි ඒ තද ගතිය දැනෙන්නේ. එතකොට පඨවි ධාතුවේත් රූපය එක්තරා අරූපී ගතියක් ගන්නවා නේ. එතකොට ඒ සම්බන්ධයෙන්, ඒකට ආරම්මණ ධාතුව කියන එකද? ඒකද පඨවි ධාතුව ආරම්මණය වශයෙන් ගන්නවාය කියලා කිව්වේ?

මෙහෙම යි, එතැන දී ඇත්තටම මේ, ඊට සමාන්තර අදහසක් තමයි තියෙන්නේ. ඒ කියන්නේ අපි දැන් යම් කිසි විදියකින් අපි දැන්, විශේෂයෙන් අපි හිතමුකෝ දැන් භාවනා අවස්ථාවලදිත් ඔය ආරම්මණය කියන ස්වභාවය එනවා. එහෙම නැත්නම්, අපි හිතන කල්පනා කරන වෙලාවටත්, ඔය ස්වභාවය එනවා. අපි හුඟක් වෙලාවට ගත්තොත් එහෙම දැන් පඨවි ධාතුව ප්‍රකට කරලා තියෙන දෙතිස් කුණපයේ පළමුවෙනි විස්ස

ගැන හිතන කොට කෙස් කියන එක ගැන අපි බලනකොට අපේ හිතේ කෙස් කියන එක මවාගන්නවා. හිතේ අර හිතෙන් අපි ඒක ගැන හිතනවා. එතකොට අපට අර සංඥා මට්ටමෙන් ඒ කෙස් කියන එක අපි දකිනවා. සංඥා මට්ටමෙන්. අන්න ඒක තමයි ඇත්තටම ආරම්මණය කියලා කියන්නේ. එතකොට ඇත්තටම අරමුණක් විතරයි. ඒ කියන්නේ නාමිකව පහළවෙන දෙයක්. ඒක අර සත්‍ය වශයෙන්ම සතරමහාධාතුවෙන් හැදිච්චි දෙයක් නෙවෙයි. නමුත් ඒ අපි කලින් දැකලා තියෙන සංඥා අනුව අපේ මනසේ ඒ ආකාරයෙන් මේ පඨවි ධාතුව පිළිබඳව සංඥාවක් ඇතිවෙනවා. ඒ ආකාරයෙන් තමයි තේරුම් අරන් තියෙන්නේ ඒ ආරම්මණය කියන එක. ආරම්මණ පඨවි ධාතුව.

මහත්මයා ඔබතුමාට පැහැදිලි කරන්න පුළුවන් ද මේ මඤ්ඤණා කියලා වචනයක් තියෙන්නේ ඒ වචනේ ඒක මේ පඨවි ධාතු ව ගැන රැවටෙනවයි කියලා මේ මඤ්ඤණා කියන වචනය ගැන මඤ්ඤණා කියන්නෙ මොකක්ද කියලා පැහැදිළි කරන්න.

එච්චරම ගැඹුරට කතා කරන්න දන්නේ නෑ. සමාවෙන්න. ඒ ගැන පොඩි අදහසක් විතරයි තියෙන්නේ. වෙන කාට හරි පුළුවන්ද ඒ සම්බන්ධව පැහැදිලි කරලා දෙන්න? මඤ්ඤණා කියන වචනය.

ඔව් දැන් අපි අශ්‍රැතවත් පෘථග්ජනයා කියල කථා කළානෙ මහත්මයා දැන් එතකොට අශ්‍රැතවත් පෘථග්ජනයා පඨවි පඨවි වශයෙන් දකිනවා කියලා තියෙනවා. දැන් අපි සරලව ගත්තොත් අපි දැන් මේ ඉන්න ඉඩමත් ඒවා වෙන් කරගෙන අක්කර වශයෙන් මගේ ඉඩම් කරගෙන වෙන්කරගෙන ඉන්නවා. ඉතින් මේකම මඤ්ඤණා කිරීමක් වගේ ගන්න පුළුවන් පඨවිය ගැන. තෙරුවන් සරණයි.

මඤ්ඤණා කිරීම කියලා මම තේරුම් ගත්ත විදියට සත්‍යය තත්වය ගැන අනවබෝධය. මේක පටන් ගත්තෙත් අශ්‍රැතවත් පෘථග්ජනයා කියලනෙ. එතකොට අශ්‍රැතවත් පෘථග්ජනයා සහ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා අතර ඇති වෙනස තමයි මෙතනින් මතුවෙන්නේ. මම හිතන්නේ අපි මේ ධර්ම සාකච්ඡාවේදී ශ්‍රැතවත්භාවය කියන්නෙ අසා දැනගත් දැනුම නේ. ඇත්තටම මම හිතන්නේ මේක අපිට ලොකුම භාග්‍යයක් මේ විදියට මේ ධර්ම සාකච්ඡාව කරන්න ලැබීම, ශ්‍රැතවත්භාවය සඳහා ප්‍රයෝජනවත් වෙනවා.

කොග්ගලගේ මහත්මයා, තෙරුවන් සරණයි. ඔබතුමාව ඉතාමත්ම ගෞරවයෙන් පිළිගන්නවා. අපි කතා කරගත්තු විදියට සාකච්ඡා කළේ මූල පරියාය සූත්‍රයේ මූලික ධාතු පිළිබඳ කොටස යි. ඉතුරු කොටස සාකච්ඡා

කිරීමට මම ඔබතුමාට යොමු වෙන්නම්. කොග්ගලගේ මහත්මයා. තෙරුවන් සරණයි.

තෙරුවන් සරණයි. අපි මඤ්ඤණා කරනවා කියන එක ගැනයි මම හිතන්නේ පිරිස කතාවුනේ. ඉතින් මම හිතනවා ඒ මූලපරියාය සූත්‍රයේ කතා කරන්න ඇති පුද්ගලයෝ හතර කොටසක් ගැන. පෘතග්ජන පුද්ගලයා, සේඛ පුද්ගලයා, රහතන්වහන්සේ, තථාගතයන් වහන්සේ.

මූලපරියාය සූත්‍රයේ පුද්ගලයෝ හතර කොටසක් ගැන කථා කරනවා. පෘතග්ජන පුද්ගලයා, සේඛ පුද්ගලයා, රහතන්වහන්සේ සහ තථාගතයන් වහන්සේ. මූලපරියාය සූත්‍රයේ තියෙනවා, **පඨවිං පඨවිතො මඤ්ඤති** කියලා. එහෙම කියන්නේ අශ්‍රැතවත් පෘථග්ජනයා. එහෙම නැත්නම්, ආර්‍ය ශ්‍රාවකයන් මුණ නො ගැසුනු, සද්ධර්මය අහපු නැති, සාමාන්‍ය පෘතග්ජන කෙනා මේ ලෝකය දකින හැටි. ඊළඟට තව කොටසක් තියෙනවා, සේඛ පුද්ගලයා. සේඛ පුද්ගලයා කියන්නේ තවම රහත්වෙලා නැහැ, හැබැයි ආර්ය මාර්ගයේ ඉන්නවා. ඒ කියන්නේ මගඵල ලාභීන් විදියට ඉන්න අය. සෝවාන්, සකෘදගාමී, අනාගාමී මගඵල, එහෙම් නැත්නම් ආර්ය දර්ශනයේ ඉන්නවා. තවම සම්පූර්ණ කරලා නැහැ. ඒ දෙවෙනි පුද්ගලයා. තුන්වෙනි පුද්ගලයා තමයි රහතන්වහන්සේ. හතරවෙනි පුද්ගලයා තමයි බුදුරජාණන් වහන්සේ. ඒ විදියට වර්ග කරලා ඒ එක එක අය මේ ලෝකය දකින හැටි ගැන තමයි මූලපරියාය සූත්‍රයේ මුලදී සඳහන් වෙන්නේ.

එතැන දී පෘතග්ජන පුද්ගලයාට කියනවා, **පඨවිං පඨවිතො මඤ්ඤති.** එතන පඨවිය පඨවිය විදියටම දකිනවා. නැත්නම් භාර ගන්නවා. මඤ්ඤණා කරනවා. ඊළඟට සේඛ පුද්ගලයා පෙන්නනවා, **පඨවිං පඨවිතො මා මඤ්ඤති** කියලා වචනයකින්.

ඒ මූලපරියාය සූත්‍රය අනුව පුද්ගලයන් හතර දෙනෙකුට බෙදලා තිබුණාට, ඇත්තටම තුන් ආකාරයයි - ඒ කියන්නේ තථාගතයන් වහන්සේයි, රහතන්වහන්සේයි එක මට්ටමකින්. ඒ කියන්නේ අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරුකළහම තියෙන මට්ටම කියලා අපට හිතන්න පුළුවන්. එතකොට පෘථග්ජනයා පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කරනවා. **පඨවිං පඨවිතො මඤ්ඤති.** ඊළඟට සේඛ පුද්ගලයාට යෙදෙන්නේ **මා මඤ්ඤති** කියන වචනය. රහතන්වහන්සේයි, තථාගතයන්වහන්සේටයි යෙදෙන්නේ **න මඤ්ඤති. න මඤ්ඤති** කියන කොට මඤ්ඤණා කරන්නේ නැති ස්වභාවය. එතකොට පෘථග්ජනයා මේ විදියට මඤ්ඤණා කරනවා. රහතන්වහන්සේ මඤ්ඤණා කරන්නේ නැහැ. එතකොට අපට හොයාගන්න වෙනවා, මේ **මා මඤ්ඤති** කියන වචනයේ තේරුම සේඛ

පුද්ගලයා සම්බන්ධයෙන්. ඒ කියන්නේ ආර්ය දර්ශනය තියෙනවා නමුත් තවම සම්පූර්ණ කරලා නැති අයට කියන්නේ **මා මඤ්ඤති** කියලා.

එතකොට මඤ්ඤණා කරනවා කියන එක ගැන අදහසක් ගන්න අපි මේ විදියට ගනිමු. දැන් වතුරට එබෙන බල්ලාගේ උපමාව ගත්තොත්, බල්ලා තව බල්ලෙක් ඉන්නවා කියලා මඤ්ඤණා කරනවා කියලා ගන්න පුළුවන්. එහෙම නැත්නම් ඒ බල්ලා හැදිලා තියෙන්නේ සතරමහාධාතුවෙන් කියලා විශ්වාස කරනවා නේ. ඒකත් එතකොට ඒ සතරමහාධාතුව ගැන මඤ්ඤණා කරනවා. එතකොට පඨවිය පඨවිය කියලා මඤ්ඤණා කිරීමක් තියෙනවා. සූත්‍රයේ ඉස්සෙල්ලා තියෙනවා, **පඨවිං පඨවිතො සඤ්ජානාති** - ඒ කියන්නේ හඳුනාගන්නවා. ඒකම ඊළඟට **පඨවිං පඨවිතො මඤ්ඤති.**

එතකොට **පඨවිං පඨවිතො මඤ්ඤති** - පෘතග්ජන කෙනා. සේඛ පුද්ගලයාගේ තියෙන්නේ **පඨවිං පඨවිතො මා මඤ්ඤති.** ඊළඟට රහතන්වහන්සේයි, තථාගතයන් වහන්සේයි **පඨවිං පඨවිතො න මඤ්ඤති.** එතකොට අර මඤ්ඤණා කරන එක ඇත්ත ඇත්තහැටි නෙවෙයි. ඒ කියන්නේ අපි දෘෂ්ටියකින් හදගත්ත එකක්. ඒක එහෙමමයි කියලා භාරගන්න ගතිය තමයි පෘතග්ජන ස්වභාවයේ තියෙන්නේ ලෝකයට අයිති දෘෂ්ටියකින්. එතකොට ඒක හිතන්න පුළුවන් **පඨවිං පඨවිතො මඤ්ඤති.**

එතකොට රහතන්වහන්සේ, ඒ කියන්නේ අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරුකළාට පස්සේ එහෙම මඤ්ඤණා කරන්නේ නැහැ. ඒ කියන්නේ පඨවිය කියලාවත් නො පිහිටන ස්වභාවයක්. දැන් වතුරට එබෙන බල්ලාට බල්ලෙක් නො පිහිටන ස්වභාවය නේ දැන් අපට තියෙන්නේ. අපි වතුරේ බල්ලෙක් ඉන්නවා කියන්නේ නැහැ. ඒ කියන්නේ, ඒ උපමාවේ දී අපට අවිද්‍යාවක් යෙදෙන්නේ නැහැ, බල්ලාට අවිද්‍යාව යෙදුනාට. මේක උපමාවක්.

එතකොට ඒ උපමාව අපට සංසන්දනය කළොත්, අපෙයි රහතන්වහන්සේගෙයි ස්වභාවය, දැන් අපි යම්කිසි දෙයක් තියෙනවා කියලා භාරගත්තාට, ලෝකයක් භාරගත්තාට, ලෝකයක් මඤ්ඤණාකළාට, රහතන්වහන්සේට එහෙම මඤ්ඤණාකිරීමක් යෙදෙන්නේ නැහැ.

ඊළඟට මම ඒ මැද කොටස දකින්නේ සේඛ පුද්ගලයා, **මා මඤ්ඤති** කියන වචනය අපි තේරුම්ගන්න උත්සාහ කළොත්, එයා තාම රැවටෙන ගතිය තියෙනවා. ඒ කියන්නේ ලෝකයට අයිති මට්ටමෙන් දකින ගතිය තියෙනවා. හැබැයි ඒ වුණාට නුවණක් තියෙනවා, රහතන්වහන්සේ මේ

විදියට මේක භාරගන්නේ නැහැ. මේ විදියට මඤ්ඤණා කරන්නේ නැහැ. මේ පෘථග්ජනයා තමයි මෙහෙම මඤ්ඤණා කරන්නේ. එහෙම නම් අපි ඒ මඤ්ඤණා කරන එකෙන් මිදෙන්න උත්සාහයක් ගන්න ඕනේ. මොකද දැන් රහතන්වහන්සේගේ තත්ත්වයේ නම් සම්මාදිට්ඨියෙන් අවබෝධයක් තියෙනවා. තවමත් ඒක සම්පූර්ණ නො වුණාට, පෘතග්ජන ස්වභාවයට මෙහෙම භාරගත්තාට, රහතන්වහන්සේගේ ස්වභාවයේ දී මෙහෙම භාරගැනීමක් නැහැ. එහෙම නම් අපේ ප්‍රඥාව වැඩෙන්න ඕනේ අන්න ඒ මට්ටම දක්වා කියලා අවබෝධයක් තියෙනවා සේඛ පුද්ගලයාට. එතකොට එයා මඤ්ඤණා කරන එකෙන් වළකින්න උත්සාහයක් දරනවා. ඒක තමයි මම **මා මඤ්ඤති** කියන එකෙන් දකින්නේ. ඒ කියන්නේ තවම ඒකට අහුවෙන ස්වභාවය තිබුණාට, මේකේ ඇත්ත ස්වභාවය මෙහෙමයි කියලා අවබෝධයක් තියෙනවා. දැන් අපට කෙලෙස් මට්ටමට මෙහෙම පෙනුනාට, කෙලෙසුන් දුරු වුණහම මේ විදියට අපි මඤ්ඤණා නො කරන ස්වභාවයක් තියෙනවා.

ඒ කියන්නේ අපි හිතමු දැන් බල්ලාට තව බල්ලෙක් ඉන්නවා කියලා හිතෙනවා. හැබැයි එයා අපි කියන දෙය විශ්වාස කළොත්, ඔතන ඔහොම පෙනුනාට ඔතන බල්ලෙක් නැහැ, ඕක හිතෙන් හදගත්තු දෙයක් තමයි ඔය එළියේ තියෙන්නේ කියලා භාර අරගෙනතියෙන්නේ. එතකොට එයාට ඒක ප්‍රත්‍යක්‍ෂව නො පෙනුනාට අපි ගැනත් ශ්‍රද්ධාවක් තියෙනවා නම්, මේ කියන එක ඇත්ත වෙන්න ඇති, මේක මගේ තියෙන කෙලෙස්වලටමයි, මගේ තියෙන ඇත්ත නො දන්නාකමටමයි මට මෙහෙම හිතෙන්නේ, ඇත්ත අවබෝධ කළොත් මේක නො පිහිටන ස්වභාවයක් ඇති කියලා නුවණකින්, ඒ කියන්නේ අපේ පැත්තෙන් බැලුවොත්, සම්මා දිට්ඨියකින්, දළ අවබෝධයක් තියෙයි නම්, එතකොට ඒ සඳහා උත්සාහ කරනවා. උත්සාහ කරනවා කියන්නේ ආර්ය මාර්ගය වඩනවා ප්‍රඥාව වැඩීම සඳහා. අන්න ඒ වගේ අදහසක් තමයි මම **මා මඤ්ඤති** කියන එකෙන් දකින්නේ. අපි මේක පැහැදිළි වුණාද කියලා බලන්න අදහස් විමසලා බලමු.

**ප්‍රශ්නයක්:** මේ සූත්‍රයේ සිංහල පරිවර්ථනයේ තියෙනවා, සේඛ පුද්ගලයා ගැන කියන තැන, මහණෙනි, සේඛ වූ නොපැමිණි අර්හත්වය ඇති, - ඒ කියන්නේ රහත් නො වූ - යම් මහණෙක් නිරුත්තර වූ යෝග ක්‍ෂෙම සඞ්ඛ්‍යාත රහත් බවට පතමින් වෙසේ ද, - ඒ කියන්නේ ඒ ආර්ය මාර්ගය වඩන කෙනෙක්, දැනටත් ආර්ය පුද්ගලයෙක් තමයි, නමුත් රහත් වෙලා නැහැ. හෙතෙමේ පෘථිවිය, පෘථිවිය වශයෙන් වෙසෙසින් දනී. පඨවිය, පඨවිය වශයෙන් මැනැවින් දැන, මඤ්ඤණා නැත්තේ නමුදු, (තෘෂ්ණා, මාන වශයෙන් මඤ්ඤණා නැත්තේත් නොවේ කියලා.) එතකොට අපට හිතෙනවා, දැන් අපි මඤ්ඤණා කරනවා කියන කොට, අපි කියනවා

තණ්හා, දිට්ඨි, මාන කියන තුන. එතකොට මෙතැන ඇත්ත වශයෙන්ම සඳහන් වෙන්නේ තණ්හා, මාන කියන දෙක විතරයි. ඒ කියන්නේ එතැන අර දිට්ඨිය කියන එක නැති නිසා, මේ තණ්හා මාන වශයෙන් මේ විදියට මඤ්ඤණා කරන්නේ නැහැයි කියන එක. ඉතින් තණ්හා, මාන වශයෙන් විතරයි, නමුත් දෘෂ්ඨි කියන කොටස කැඩිලා තියෙන විදියට වගේ තේරුම් ගත්තොත් නිවැරැදිද කියලා කරුණාකරලා පැහැදිළි කරන්න.

**උත්තරය:** සිංහල තේරුමේ ඒ විදියට තමයි තියෙන්නේ. හැබැයි අපි නිතරම පාලි එකත් එක්ක යන්න ඕන. දැන් පාලි එකේ තියෙන්නේ මඤ්ඤණා කරන වචනය විතරයි. **මඤ්ඤති, මා මඤ්ඤති, න මඤ්ඤති** කියන එක. එතකොට ඕක සිංහලෙන් විස්තර කරන්න ගිහිල්ලා තමයි අර තණ්හා-දිට්ඨි-මාන දාලා, ඊළඟට දිට්ඨි කෑල්ල අඩුකරලා තියෙනවා, මොකද දැන් සෝවාන් පුද්ගලයාගේ දිට්ඨිය නැහැ කියන එක. ඒ කියන්නේ, සක්කාය දිට්ඨිය නැහැ කියන අදහසින් තමයි, මට හිතෙන විදියට එතන ඔය දිට්ඨි කොටස අයින්කරලා තියෙන්නේ. එහෙම නැත්නම් සම්මා දිට්ඨිය පැහැදිළිව තියෙන හින්ද, අර දිට්ඨි කියලා - වැරැදි දෘෂ්ඨිය කියන එක යෙදෙන්නේ නැහැ කියන අදහසින් තමයි එතන දිට්ඨිය නැහැ, තණ්හා මාන දෙක විතරයි කියන එක.

ඉතින් අපි මඤ්ඤණා කිරීමේ දී, කලින් (කලින් ප්‍රපඤ්චගැනත් කතා කරනවා මට ඇහුණා). එතැනදීත් ඔය අදහසම ගන්නවා, මේ තණ්හා-දිට්ඨි-මාන විදියට ගැනීමයි ප්‍රපඤ්චය කියලා. දැන් මෙහෙම සිද්ධියක් තියෙනවා - මඤ්ඤණා කරනවා කියන්නේ, නැත්නම් ප්‍රපඤ්චයක් හදනවා කියන්නේ, ඇත්ත ඇතිහැටි නෙවෙයි කියන එක අපි තේරුම් ගන්න ඕනේ. මම මුලින් උදහරණයේදී කිව්වේ වතුරේ බල්ලෙක් ඉන්නවා කියලා මඤ්ඤණා කරනවා. නැත්නම් ප්‍රපඤ්චකරනවා. විතක්ක විචාර තමයි ප්‍රපඤ්චබවට හැරෙන්නේ. ඒ කියන්නේ අපේ මනසෙන් හිතන දෙයක්. ඒක බාහිරේ තියෙන්නම අවශ්‍ය නැහැ. අපට ප්‍රශ්නය තියෙන්නේ අපි බාහිරයේ තියෙනවා කියලා විශ්වාස කරන ගතියක් තියෙනවා. ඒ තමයි **මඤ්ඤති** කියන එක. එතකොට **න මඤ්ඤති** ස්වභාවයේ දී ඒක යෙදෙන්නේ නැහැ. දැන් **මා මඤ්ඤති** කියන එකේ දී අපි මෙහෙම දකින ගතිය තියෙනවා. ඒ කියන්නේ මඤ්ඤණා කරන ගතිය තියෙනවා. ඒ වුණාට දන්නවා මෙතන මොකක්දෝ වැරැද්දක් තියෙනවා කියලා. ඒ කියන්නේ අපේ කෙලෙස් මතමයි මෙහෙම අපට හිතෙන්නේ, නැත්නම් පෙනෙන්නේ. තියෙනවා කියලා හිතෙන්නේ. එතකොට කෙලෙස් දුරුකළොත් ඔහොම පිහිටන්නේ නැහැ කියන අවබෝධයක් එන ගතිය.

දැන් පරිවර්තනයේ මෙන්න මෙහෙම අදහසක් තියෙනවා. දැන් ඒක අපි මඤ්ඤණා කළාට පස්සේ, ඒ කියන්නේ තියෙනවා කියලා හිතුවාට පස්සේ ඔතැන යෙදෙනවා තණ්හා-දිට්ඨි-මාන කියන ඒවා. තියෙන දෙයට අපට තණ්හා කරන්න පුළුවන්. ඇලෙන්න ගැටෙන්න පුළුවන්. දැන් උදහරණයක් හැටියට අතන බල්ලෙක් ඉන්නවා කියලා බල්ලා පිළිගත්තාට පස්සේ, එක්කෝ ඌට තරහා අරන් බුරන්න පුළුවන්. එහෙම නැත්නම් ලෝභ පැත්තෙන්, ආසා පැත්තෙන් ගිහිල්ලා වලිගය වනන්න පුළුවන්. එතකොට එතන දී පෙනෙනවා ඒ තණ්හාව යෙදෙන්න පුළුවන් අරක භාරගත්තාට පස්සේ. ඔන්න ඔතන පොඩි වෙනසක් තියෙනව. ඒ කියන්නේ තණ්හා-දිට්ඨි-මාන කියන ටික යෙදෙන්නේ අතන ඒ දෙයට අහුවුනාට පස්සේ යි. ඒක මත යෙදෙන දෙයක්. ඒ කියන්නේ ප්‍රපඤ්ච නිසා තණ්හා-දිට්ඨි-මාන ඇතිවෙනවා මිසක්, ඒ දෙකම එකක් කියලා බොහෝ වේලාවට අහන්න ලැබුණාට, ඔය දෙකේ පොඩි වෙනසක් මම දකිනවා.  එතකොට ඒ සිංහල පරිවර්තනයේ දී ඒ තණ්හා-දිට්ඨි-මාන දැම්මත්, අපි තේරුම්ගන්න ඕන මෙතැන වැරදි දෘෂ්ටියකට අහුවීම, ඒ කියන්නේ නැති දෙයක් තියෙනවා කියලා භාරගන්න ගතියමයි මේ මඤ්ඤණා කරනවාය කියන එක. එතකොට රහතන්වහන්සේට එහෙම මඤ්ඤණා කිරීමක් යෙදෙන්නේ නැහැ. මේක පැහැදිළිවෙනවා කියලා මම හිතනවා.

එතකොට සේඛ පුද්ගලයාගේ තියෙන්නේ තවම මඤ්ඤණා කරන ගතිය තියෙනවා. මොකද තවම කෙලෙස් සම්පූර්ණයෙන් දුරුකරලා නැහැ. රහත් වෙනකම් අපේ අවිද්‍යාව දුරුවෙන්නේ නැහැ. එතකොට මඤ්ඤණා කරන ගතිය තිබුණාට එයාගේ සම්මාදිට්ඨිය හින්ද, ඒ කියන්නේ සද්ධර්මය අහලා ඒක නුවණින් දැකපු හින්ද, තේරුම් ගත්ත හින්ද, එයා දන්නවා මගේ කෙලෙස් මට්ටමට මෙහෙම පෙනුනාට, මේ අවිද්‍යාව දුරුවුණ දවසක මේ ස්වභාවය නෙවෙයි පවතින්නේ. ඒ කියන්නේ රහතන්වහන්සේගේ මට්ටම **න මඤ්ඤති** ස්වභාවයයි. එතකොට ඔතැන අපි ගන්න ඕන - දැන් රූපයක් කියන එක අපි භාරගන්න ගතියක් තියෙනවා. උපාදන කරන ගතියක් තියෙනවා. එතකොට රහතන්වහන්සේට - දැන් සාමාන්‍ය පැහැදිලි කිරීමක් තමයි රූපය තිබුණාට ඕක උපාදනය කරන්නේ නැහැ කියන එක. දැන් මම දකින පැත්තඃ උපාදන කරන්න රූපයක් පිහිටන්නේ නැහැ. ඒ කියන්නේ අර වතුරට එබෙන බල්ලා දැන් මෙතැන ඡායා මාත්‍රයක් විතරයි කියන අවබෝධයට ආවොත්, ඒ කියන්නේ අපි ඉන්න මට්ටමට ආවොත් එයාට බල්ලෙක්ව පිහිටන්නේ නැහැ. ඒ කියන්නේ උපාදන කරන්න රූපයක් පිහිටන්නේ නැහැ. මේ සතරමහාධාතුවෙන් හැදිච්ච බල්ලෙක් නේද කියලා හිතන්න,

බල්ලෙක්ව පිහිටන්නේ නැහැ. එතකොට බල්ලෙක්ව පිහිටන්නේ නැති දවසට, සතරමහාධාතුවක් කියලා භාරගන්නත්, ඒකත් නො පිහිටන ගතියක් තියෙනවා. උපදින්නේ නැති ගතියක්. අපට අපේ කෙලෙස් මට්ටමට උපදිනවා. දැන් බල්ලාගේ නම්, බල්ලාගේ කෙලෙස් මට්ටමට එහෙම දෙයක් ඉපදිලා තියෙන්නේ.

ඒ උපමාවේ දී අපට ඔය කෙලෙස් යෙදෙන්නේ නැති හින්ද, අපට ඒක උපදින්නේ නැහැ. ඒ කියන්නේ පිහිටන්නේ නැහැ. එතකොට ඒ මඤ්ඤණා කරන්නේ නැති ගතිය. හැබැයි අපි ඒ වතුරේ දී මඤ්ඤණා නො කළාට, අනිත් රූපවලට අපි මඤ්ඤණා කරනවා, ඇහෙන් දකින ඒවා තියෙනවාමයි කියලා. නැත්නම් තියෙන හින්දමයි පෙනෙන්නේ කියන අන්න ඒ වැරැදි මතයක ඉන්නවා. ඒ ඉන්න ගතියම තමයි මඤ්ඤණා කිරීම. ඒ කියන්නේ බාහිරයේ තියෙන දෙයමයි මේ පෙනෙන්නේ. නැත්නම් පෙනෙන දෙයමයි තියෙන්නේ. ඒ මට්ටම. ඒක පෘතග්ජන මට්ටම කියලා අපට හිතන්න පුළුවන්. ඒක තමයි මම දකින්නේ මඤ්ඤණා කරන මට්ටම. ඒවා හැදිලා තියෙන්නේ පඨවි-ආපෝ-තේජෝ-වායෝවලින් කියලා අපි ඊළඟට තේරුම්ගන්නවා.

ඒ කියන්නේ ඔන්න බාහිර ශරීරයක් තිබුණොත්, මුලින්ම අපේ භාවනාවලදී අපි ඕක කඩනවා, මේක කෙස්-ලොම්-නිය-දත්වගේ දෙතිස්කුණපය කියලා. එතකොට අපි ශරීර සංඥවෙන් මිදෙන්න දෙතිස්කුණපය අල්ලාගන්නවා. ඊළඟට දෙතිස් කුණපයෙන් මිදෙන්න, දැන් කෙස්-ලොම්-නිය-දත් කියන ජාති තියෙනවා නේ. ඒවායින් මිදෙන්න, ඒවා හැදිලා තියෙන්නේ සතරමහාධාතු, එහෙම නැත්නම් රූප කලාප ගොඩකින් තමයි මේවා හැදිලා තියෙන්නේ කියලා රූපකලාපයට හිත තියනවා අර කෙස්-ලොම්-නිය-දත් කියන සංඥවෙන් මිදෙන්න. හැබැයි දැන් රූපකලාප තියෙනවා. ඒ රූප කලාපයත් ඊළඟට කියනවා, ඕකේ තියෙන්නේ සතරමහාධාතුව, හැබැයි ඒවා වෙන්කරන්න බැහැ. ඊළඟට ඒ රූපකලාපවල අනිත්‍යයත් දකිනවා. මේවා හටගන්නවා, විනාශවෙනවා, මේ පවතින කාලයක් තියෙනවා, චිත්තක්ෂණ දහතක්. ඔහොම ඒ වෙනස්වන ගතිය. හැබැයි ඒ වෙනස්වීම දකින්නෙත් එළියේ තියෙන රූපවල. එතකොට එතැන රූප කලාප මට්ටමේ, නැත්නම් ධාතු මට්ටමේ මඤ්ඤණා කිරීමක් තවම තියෙනවා. මොකද ඒ ධාතුන් ගැන, එළියේ තියෙන දෙය හැදිලා තියෙන ධාතුන්, නැත්නම් රූප කලාප, තියෙනවා කියලා දැනගන්නේ කවුද? මෙහේ ඉන්න මම කියන ගතිය තියෙනවා. මොකද ඒ දැනුවත්වීම ආවේ කාටද කියන ස්වභාවය.

දැන් ඕකේ අනිත් පැත්ත තමයි **න මඤ්ඤති** ස්වභාවයේ, පිහිටන්නේ නැති ස්වභාවයේ, දැන් අර වතුරට එබෙන බල්ලාගේ මට්ටමේ දී අපට කවදාවත් වතුරේ බල්ලෙක් පිහිටන්නේ නැහැ. එතකොට පිහිටන්නේ නැත්නම් ඒ බල්ලා හැදිච්ච සතරමහාධාතුවත් පිහිටන්නේ නැහැ. හැබැයි බල්ලාගේ දෘෂ්ටියේ හිටියොත්, බල්ලෙක් ඉන්නවා කියලා හිතුවොත් එයා ඒ බල්ලාගේ සංඥාවෙන් මිදෙන්න ඊළඟට අපි භාවනා කළොත් - නැහැ ඔය බල්ලෙක් නෙවෙයි, දෙතිස් කුණපය - කෙස්-ලොම්-නිය-දත්-සම්-මස්-නහර කියලා හිතන්න පුළුවන්. එහෙමත් නැත්නම් ඒවාත් නෙවෙයි තියෙන්නේ, ඔය සතරමහාධාතුව, එහෙම නැත්නම් රූප කලාප ගොඩක් කියලා හිතන්නත් පුළුවන්. දැන් එහෙම හිතුවත් අපි දන්නවා එතන දී ඒක ඇලීම් ගැටීම් නැතිකරන්න උදව්වුනාට මුළාව නැති කරන්න ඒකෙන් උදව්වක් නැහැ. මොකද තවම බාහිර දෙයක් තියෙනවා, ඒක හැදිලා තියෙන්නේ මෙන්න මේවායින් කියලා ඒක කඩලා බිඳලා බැලීමක් තමයි ඒ කරන්නේ. ඒක පිහිටියේ කොහොමද කියලා, සමුදයයි, ඊළඟට ඒ සමුදය නැතිවුණොත් මේක නො පිහිටන්න ගතියයි ගැන අවබෝධයක් එතැන යෙදෙන්නේ නැහැ, බාහිර රූපය භාර අරන් ඒ දෙය කළොත්. එතකොට බාහිර රූපය පිහිටියේ මෙන්න මේ හේතු නිසයි කියලා බැලුවොත් ඊට වඩා දැක්මකට යන්න පුළුවන්. ඒක නො පිහිටන මට්ටමකට. ඒ කියන්නේ **න මඤ්ඤති** මට්ටමකට යන්න පුළුවන් කියන එකයි.

ඉතින් සිංහල පරිවර්තනයට වඩා ටිකක් පාලි එකෙන්ම ගත්තොත් යම්කිසි අදහසක් ගන්න පුළුවන්. මේ ලෝකෝත්තර දර්ශනය ගැන කියන මට්ටමේ ඉඳන් තමයි මම සාකච්ඡා කරන්නේ. ඒ ගැන අපි තව අදහස් විමසලා බලමු.

**ප්‍රශ්නයඃ** දැන් අපි හිතමු මේසයක් දකිනවා නම් එතන යම් දෙයක් තියෙනවා. එතකොට මම ඒක මේ පඨවි ධාතුවක් හැටියට හිතන එකද, නැත්නම් මේසයක් කියලා මම දැනගත්තා වුණාට මේසයක් නෙවෙයි එතැන පඨවි ධාතුවක් තියෙනවා කියලා හිතන එකද හරිකියලයි මම අහන්නේ. මොකක් හරි එතන තියෙනවා කියලා දන්නවා හින්ද.

**උත්තරයඃ** ඒ තැනට තමයි මම එන්න හැදුවේ. අපි දැන් එළියේ මේසයක් තියෙනවා කියලා දැක්කහම, අපි අහලා තියෙනවා, නැත්නම් පුරුදුකරලා තියෙන්න පුළුවන් ඔතැන මේසයක් නෙවෙයි තියෙන්නේ, රූපකලාප ටිකක්. එහෙම නැත්නම් සතරමහාධාතුව. එතකොට සතරමහාධාතුව තියෙන තැනක අපේ ඇහැ නිසා තමයි ඔය මේසයක් තියෙනවා කියලා අපි දැනගත්තේ. එතකොට ඒ මේ ගැන හිතන්න පුළුවන් එක්තරා මට්ටමක්. හැබැයි තවම ඇත්තම ඇත්ත නෙවෙයි. ඒ කියන්නේ යථාභූත

ස්වභාවය නෙවෙයි. මොකද අපි දැන් මේසය නැති වුණාට එළියේ සතරමහාධාතුව තියෙනවා කියන මතයකට ගිහිල්ලා තියෙනවා. එතකොට දැන් එළියේ සතරමහාධාතුව තියෙනවා කියලා දැනගන්නේ කවුද? එතකොට පෙනෙයි මේ පැත්තේ මම තමයි ඕක දැනගත්තේ කියන එක. එහෙම නම් අපේ සක්කාය දිට්ඨිය දුරුවෙයිද මේ විදියට බලලා? ඒක තව පැත්තකින් හිතන්න; දැන් මේ ලෝකය අපි දකින්න හදන්නේ මේ බඹයක් පමණ ශරීරය තුළින්ද බුදුරජාණන්වහන්සේ දේශනා කරපු විදියට, එහෙම නැත්නම් එළියේ තියෙන මේසයක් තුළින්ද? දැන් මේසය කියන තැන නේ අපි සතරමහාධාතුව කියලා නැවතිලා තියෙන්නේ. ඒ කියන්නේ මේ සතරමහාධාතුව. තවම අපි බාහිරෙන් නේද මේ ලෝකය හොයන්න හදන්නේ? ඔන්න ඔතන පොඩි අඩුවක් තියෙනවා කියන එක තමයි මම මේ කියන්න හදන්නේ, සූත්‍රයෙන් පැහැදිළි කරන්න ගත්තේ. මොකද මේ ගැඹුරු සූත්‍ර සමහරවිට කතාකරනවා අඩුයි.

මම ඊළඟට තව ටිකක් ඉදිරියට යන්නම්. එතකොට මේක තව ටිකක් පැහැදිලි වෙයි කියලා මට හිතෙනවා. දැන් මේ පිළිබඳව මූලපරියාය සූත්‍රයට අදාල අට්ඨකථාවෙහි තියෙනවා; දැන් පෘථග්ජනයා මෙහෙම මඤ්ඤණා කරනවා නේ. පඨවිය පඨවිය කියලා, ආපෝ ධාතුවේ ආපෝ කියලා, ඊළඟට තේජෝ ධාතුවේ තේජෝ කියලා මඤ්ඤණා කරනවා. වායෝ ධාතුවේ වායෝ කියලා මඤ්ඤණා කරනවා. රහතන්වහන්සේ එහෙම මඤ්ඤණා කරන්නේ නැහැ. එතකොට අපි ඔය සතරමහාධාතු භාරගන්න කෙනාට, එහෙම නැත්නම් මඤ්ඤණා කරන කෙනාට, සතරමහාධාතුව ගැන, එක එක ආකාරයට හිතෙන්න පුළුවන්. සතරමහාධාතුව කියන්නේ මොකක්ද කියන එක, අන්න ඒක හිතෙන්න පුළුවන් ආකාර හතරක් සඳහන් වෙනවා. ඒ ආකාර හතර තමයි; සම්මුති පඨවි. මම දැන් පඨවිය අරන් කිව්වොත් - ඒක ආපෝ, තේජෝ, වායෝවලටත් ඒකම යෙදෙනවා. දැන් පඨවිය අරන් කිව්වොත් පළමුවෙනි එක තමයි සම්මුති පඨවි. ඊළඟට තව ගන්න ආකාරයක් තමයි, ලක්ඛණ පඨවි. ඊළඟට තවත් ආකාරයක් තමයි ආරම්මණ පඨවි කියන එක. හතරවෙනි ආකාරය තමයි සසම්භාර පඨවි.

එතකොට **සම්මුති, ලක්ඛණ, ආරම්මණ, සසම්භාර**. ඔන්න ඔය විදියේ හතර ආකාරයකට මේ සතරමහාධාතුව භාරගන්න පුළුවන්. මතක තියාගන්න ඕන එතකොට මේ සතරමහාධාතුව මඤ්ඤණා කරන කෙනාටයි මේ ආකාරයට සතරමහාධාතුව ගැන අදහස් එන්නේ. මම ඒ වචන හතර විස්තර කළොත්; දැන් සම්මුති විදියට ගන්න එකේදී අපි පඨවිය කියන්නේ පොළොව. නැත්නම් පස් කියලා ගන්න එක. ඊළඟට ආපෝ කියන්නේ වතුර වගේ - ජලය කියලා ගන්න එක. තේජෝ

කියන්නේ ගින්දර. වායෝ කියන්නේ සුළං විදියට ගන්න එක. ඒ විදියේ පැහැදිලි කිරීමක් මම හිතන්නේ හැමෝම අහලා ඇති. පස්, දිය, ගිනි, සුලං කියලා සතරමහාධාතුව පැහැදිලි කරන විදියක් තියෙනවා. ඒකට කියනවා **සම්මුති** ආකාරය කියලා. සම්මුතියට අනුව.

ඊළඟට **ලක්ඛණ** විදියට සතර මහාධාතුව විස්තර කරන්න පුළුවන්. ලක්ඛණ කියන්නේ දැන් අපට දැනෙන ගති අනුව. දැන් පඨවි කියන්නේ තද ගතිය. ස්පර්ශ කළහම තද ගතියක් දැනෙනවා නේ කාය ස්පර්ශයට. අන්න ඒ තද ගතිය. පොළොව ඇල්ලුවොත් තද ගතියක් දැනෙනවා. මේසයක් ඇල්ලුවොත් තද ගතියක් දැනෙනවා. අන්න ඒ ගතිය තමයි මේ පඨවි කියන්නේ. පඨවි කියන ස්වභාවය. තද ගතිය. එතකොට ආපෝ කියන්නේ මේ දියර ස්වභාවය. නැත්නම් ඇලිලා තියෙන ආලම්බණ ස්වභාවය. තේජෝ කියන්නේ උණුසුම් සිසිල් ගතිය. ඒකත් දැනෙන ගතියක්. එතකොට එළියේ තියෙන ගතියක් නෙවෙයි. මේක මේ ආයතන හරහා දැනෙන ගතියක්. ඊළඟට වායෝ - වායෝ කියන්නේ මේ විසිරෙන ගතිය කියලා. ඒ වගේ ගති විදියට කියන කොට ඒක ලක්ඛණ, ඒ කියන්නේ ලක්ෂණයෙන් සතරමහාධාතුව විස්තර කරන්න පුළුවන්.

ඊළඟට තුන්වෙනි ආකාරය **ආරම්මණ** කියලා කියනවා. ආරම්මණ ධාතුව විදියට ගන්නකොට, දැන් ආරම්මණ පඨවි කියන එක, එක විදියකට හිතන්න පුළුවන් දැන් අහලා ඇති පඨවි කසිනය වඩන කොට, එළියේ පඨවියක් දිහා බලාගෙන පටන්ගත්තාට, ඒ කසින මණ්ඩලයක් හදලා ඒක ටිකක් වෙලා යනකොට ඊළඟට ඇස් පියාගෙනත් පඨවි පඨවි කියන කොට ඒක අරමුණු කරන්න පුළුවන් මට්ටමකට එනවා. අන්න එතකොට පෙනෙනවා මේක ආරම්මණ පඨවියක් කියලා. බාහිරයේ තියෙන දෙයක් නෙවෙයි. මේ හිතෙන්ම පෙන්නන ආරම්මණයක් කියන එක. මේක තව විදි වලට ගන්න පුළුවන්. දැන් අපට ඈත ගින්දර තියෙනවා පෙනෙන කොට අපට හිතෙනවා හරි රස්නෙයි කියලා. ඒක දැන් ඇඟට දැනිලා නෙවෙයි. ඇඟේ රස්නයක් ගැටිලා නෙවෙයි. මෙයා අරමුණු කරනවා. මෙතන හරි රස්නෙයි කියලා. නැත්නම් හිම කන්දක් වගේ එකක් දකින කොට හරි සීතල ඇති කියලා. ඒක ආරම්මණ ගතියකින් ගන්න එකක්. ඒ වගේ හතර ජාතියම ගන්න පුළුවන්. ඒක එතකොට ආරම්මණ පඨවි.

ඊළඟට හතරවෙනි එක තමයි **සසම්භාර** පඨවි කියන එක. දැන් මුලින් අහපු ප්‍රශ්නයේ දී අර මේසය තියෙන තැන, මේසය නෙවෙයි තියෙන්නේ, සතරමහාධාතුයි. එතකොට අපි එතන මේසය භාරගන්න සතරමහාධාතුවක් ගැන කතාකරනවා. දැන් අපි එළියේ මොකක් හරි ගහක් දැක්කොත් අර ගහ තියෙන්නේ, අන්න අතන තමයි අර පාටවල් ටික

තියෙන්නේ ගහට අදල. දැන් ඇහැට පෙනෙන්නේ පාටනේ. එතකොට ඒ පාට රඳාපවතින සතරමහාධාතුවක් තියෙනවා කියන අදහස. ඒ කියන්නේ මේක භාරගන්නවා. සසම්භාර කියන්නේ ඒකයි.

ඕක තව ටිකක් තව විදියකට විස්තර කළොත් දැන් අපි ටෝච් එකක් එල්ල කළොත් ආකාසයට, මොකුත් පෙනෙන්නේ නැහැ. හැබැයි ඔය අතරට මොකක්හරි යෙදුනොත් අපට පෙනෙනවා අන්න අතන කියලා. ඒ අන්න අතන කියලා කියන්නේ එතන භාරගන්න ගතියේ ධාතු ස්වභාවයක් තියෙන බව තමයි අපට හිතෙන්නේ. අන්න ඒ ගතියට කියනවා සසම්භාර කියලා.

ඔය විදියට පඨවි-ආපෝ-තේජෝ-වායෝ කියන හතරම හිතෙන්න පුළුවන්. එතකොට ධාතුවේ ධාතුව කියලා මඤ්ඤණා කරන කෙනාට මෙතන හිතෙන්න පුළුවන් ආකාර හතරක් තියෙනවා. මෙතෙන්දී ඒකෙන් තේරුම්ගන්න ඕනේ මේ හතරෙන් කොතන හිටියත් අපි තවම මේක මඤ්ඤණා කරන ස්වභාවයකින් ඉන්නේ කියල. රහතන්වහන්සේ **න මඤ්ඤති**. එතකොට සම්මාදිට්ඨිය තියෙන කෙනා දකිනවා මේක අපේ කෙලෙස් මට්ටමකට මෙහෙම මඤ්ඤණා කරන්නේ, තව ප්‍රඥාව වැඩුනොත් කෙලෙස් දුරුවෙන මට්ටමට, ඔය විදියට මඤ්ඤණා වෙන්නේ නැහැ කියලාදැක්මක්, අවබෝධයක් ඇතිකරගන්න පුළුවන්. මම හිතනවා තව ටිකක් පැහැදිලි වෙන්න ඇති කියලා.

**ප්‍රශ්නයඃ** විපාක විදියට චක්ඛු විඤ්ඤණය පහලවෙන කොට, එතකොට රූපයක් උපදින කොට, යම්කිසි විදියකට අපි අහලා තියෙන විදියට විද්‍යමාන වෙනවා කියලා. එතකොට මේ පිහිටන්නේ නැතිබව අපි අවබෝධ කරගන්නේ හේතු නිසා මේවා විද්‍යමාන වෙන බව ප්‍රඥාවෙන් ගෝචර වෙන නිසා ද? පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**උත්තරයඃ** දැන් බුදුරජාණන් වහන්සේ පෙන්නනවා මේ රූපයේ ඇත්ත දකින්න කියලා. අපි රූපයේ මුළාවෙලා ඉන්නවා කියන එක අපි පිළිගන්න ඕනේ. ඒ කියන්නේ ලෝකයට අයිති දැක්මේ ඉන්නවා කියන එක. එතකොට රූපයේ යථාභූත ස්වභාවය දකින්න නම්, ස්කන්ධ වශයෙන්, ධාතු වශයෙන්, ආයතන වශයෙන් බලන්න කියලා. එතකොට ආයතන වශයෙන් බලනකොට මේ ඇහෙන් දැකීම ගැන අපට කතා කරන්න පුළුවන්. ඇහෙන් දැකලා නම් මොනවා හරි දැනගෙන තියෙන්නේ, එතකොට එතන මොන ආයතන විදියටද මේ තත්වයට ආවේ, අපි මේ දෙය තියෙනවා කියලා පිළිගන්නා මට්ටමකට ආවේ.

මෙතැනදීත් මතක්කරගන්න අර බල්ලාගේ උපමාව - වතුරට එබෙන බල්ලා බල්ලෙක් ඉන්නවා කියලා තේරුම්ගත්තේ ඇහෙන් දැකීම මුල්කරගෙනයි. එතකොට චක්ඛායතනය තමයි මුලින්ම වැඩකරලා තියෙන්නේ. ඒ කියන්නේ චක්ඛු විඤ්ඤාණයෙන් යම්කිසි ස්වභාවයක් පෙන්නනවා. අපි දන්නවා ඇහැට ගෝචර වෙන්නේ වර්ණ රූපය කියන එක. ඒ කියන්නේ ඇහැට වර්ණ සටහනක් තමයි අරන් දෙන්න පුළුවන්. ඇහැට බැහැ ශබ්ද සටහන් අරන් දෙන්න. ඇහැට බැහැ ඝානාරම්මණ අරන් දෙන්න. ඇහැට බැහැ රසාරම්මණ අරන් දෙන්න. අනිත් ආයතනවලින් ගන්න ඒවා ඇහැට ගන්න බැහැ. එතකොට ඇහැට ගෝචර රූපයක් තියෙනවා. ඒ ගොචර රූපය අනික් ආයතනවලට ගෝචරත් නැහැ.

තව විදියකට කිව්වොත්; දැන් කනට ශබ්ද ගෝචර වෙනවා මිසක් කනට රූප ගෝචර නැහැ. වර්ණ ගෝචර නැහැ. රස ගෝචර නැහැ. එතකොට ඒ ආයතනවලට තියෙනවා ගෝචර නානත්වයක්. ඒකට ගෝචර වෙන දෙය විතරයි ඒකට ගෝචර වෙන්නේ. වෙන ආයතනයකට ගෝචර වෙන දෙයක් මේකට ගෝචර වෙන්නේ නැහැ කියන ධර්මතාවයක් තියෙනවා. එතකොට දැන් ඇහැට අරන් දෙන්න පුළුවන් වර්ණ සටහනක් විතරයි. අපි විද්‍යාව පැත්තෙන් බැලුවත් ඇහේ ලෙන්ස් එකක් තියෙනවා. ඕකෙන් පුළුවන් වර්ණ සටහනක් මේ දෘෂ්ටි විතානය මත ඇතිකරන්න විතරයි. එතකොට ඒ වර්ණ සටහන තමයි හිත දැනගත්තා නම් දැනගන්නේ. වර්ණ සටහනේ තියෙනවාද සතරමහාධාතු? ඒ කියන්නේ ඇහැ ඇතුළේ හැදෙන වර්ණ සටහනේ අපි දන්නවා ඒකේ රස්නය ගතියක් තියෙන්න බැහැ, සීතල ගතියක් තියෙන්න බැහැ, නැත්නම් පඨවි - තද ගතියක් තියෙන්න බැහැ. ඒ සතරමහාධාතු ගතියක් එතැන නැහැ. එතන දැකීමක් ඇතිකරන වර්ණ ස්වභාවයක් විතරයි තියෙන්නේ. දැන් මෙතැන දී මම තව ටිකක් එහාට යන්නම්.

එතකොට ඇහැට ගෝචරවෙන්නේ වර්ණය විතරයි. එතකොට අපි අහලා තියෙන රූප - දැන් අභිධර්මය දන්නා අය දන්නවා රූප විසිඅටක් ගැන කතා කරනවා. උපාදය රූප විසිහතරක් තියෙනවා. සතරමහාධාතුත් එක්ක විසිඅටයි. එච්චර නො දන්නවා නම් අපි ශුද්ධ අෂ්ඨකය ගැන දන්නවා. පඨවි-ආපෝ-තේජෝ-වායෝ ඊළඟට වර්ණ-ගන්ධ-රස-ඕජා කියන උපාදය රූප. එතකොට ඒ අතින් බැලුවොත්වර්ණය කියන්නේ එකක් විතරයි. නැත්නම් අර විසිඅටෙන් බැලුවොත් වර්ණය කියන්නේ එකක් විතරයි.ඒක විතරයි ඇහැට ගෝචරවෙලා තියෙන්නේ. එතකොට අපි මේ වර්ණයක් පමණයි ගෝචර කරගෙන තියෙන්නෙ. ඒ වුණාට අපි විශ්වාස කරනවා විසිඅට ජාතියක් ඔතන තියෙනවා කියලා. එහෙම නැත්නම් වර්ණයක්

දැකලා අපි හිතනවා එතැන තියෙනවා පඨවි-ආපෝ-තේජෝ-වායෝ ටිකක්. දැන් ඒ ටික ඇහෙන්ද දැනගත්තේ? ඇහෙන් වෙන්න බැහැ. මොකද, ඇහැට ගෝචර වර්ණ රූපය විතරයි. එහෙම නම් ඔය ටික වෙන ආයතනයකින් තමයි දැනගෙන තියෙන්නේ.

අපි ටිකක් හිතුවොත් පෙනෙයි මොන ආයතනයද එතෙන්ට මුල් වෙන්නේ - මනායතනය. හිතෙන් හිතලාමයි ඉතුරු ටික ගැන දැනගෙන තියෙන්නේ. එතකොට විසිඅට රූපයක් ගැන කතා කරන කෙනෙක් ඉතුරු විසිහතරම ඇහෙන් දැකලා නෙවෙයි දැනගෙන තියෙන්නේ. අපි ටිකක් හිතුවොත් පෙනෙයි එහෙනම් මනසින් - හිතෙන් හිතපු දෙයක් තමයි ඔය ඉතුරු විසිහතරම. ඒ කියන්නේ අපි දැනගත්ත දෙයක් උදව්කරගෙන හිතලා. නැතුව ඇහැට කවදාවත් බැහැ පඨවිය දකින්න. ඇහැට ගෝචර වෙන්නේ නැහැ. ඇහැට බැහැ ආපෝ, තේජෝ, වායෝ දකින්න. ඒවා ගෝචර වෙන්නේ නැහැ.ගෝචර වෙන්නේ නැත්නම් අපි දැනගෙන තියෙන්නේ හිතෙන්. එහෙම නැත්නම් මනායතනයෙන්.

එතකොට හිතෙන් දැනගන්න දෙය එළියේ තියෙන්න පුළුවන් ද? ඔන්න ඊළඟ ප්‍රශ්නය. දැන් ඇහැ පිරිසිඳ දකිනවා කියන්නේ ඊළඟට මනායතනයත් පිරිසිඳ දකින්න වෙනවා. එතකොට මනසට අරමුණු වෙන්නේ මොනවාද? ධම්ම. මන, ධම්ම, මනෝ විඤ්ඤාණය. දැන් ඇහැ, රූප, චක්ඛු විඤ්ඤාණය වගේ මන, ධම්ම, මනෝ විඤ්ඤාණය. ධම්ම කියන්නේ මොනවාද? ධම්ම කියන්නේ මනසින්ම සකස් කරන දෙයක් විතරයි. අපි කලිනුත් දවසක කතා කළා මනෝමය කියලා. **මනොපුබ්බඞ්ගමා ධම්මා, මනොසෙට්ඨා මනොමයා** - **මනොමයා** කියන්නේ මනසින්ම සකස් කරන දෙයක්මනසින්ම දැනගෙන. මේ ධම්ම කියන මට්ටම මනසින්ම සකස් කරපු දෙයක්. ඒක දැනගන්නේ කවුද? මනෝ විඤ්ඤාණය. එතකොට ඒ ටිකකින් නේද මේ හිතෙන්ම හදපු දෙයක් හිතෙන්ම දැනගෙන නේද අපි ඉතුරු ගත්ත විසිහතක් ගැන කතා කරන්නේ. දැන් ඇහැට ගෝචර වෙන්නේ එක රූපයක් විතරයි. එතකොට මේ හිතෙන්ම හදලා දැනගත්ත එක ඊළඟට අපි තුන්වෙනි අවස්ථාවේ දී ඕක එළියේ තියෙනවා කියලාත් විශ්වාස කරනවා. ඒ කියන්නේ හිතෙන් හදපු රූපය දැන් එළියෙනුත් තියනවා.

මේක අර බල්ලාගේ උපමාවත් එක්ක ගළපලා බලන්න. දැන් බල්ලා ඇහෙන් වර්ණ සටහනක් දකිනවා විතරයි චක්ඛු විඤ්ඤාණ මට්ටමෙන්. ඊළඟට ඕක ගැන හිතනවා. හිතන කොට තමයි මේ සටහනේ මේ විදිහට පෙනෙන්නේ බල්ලෙක් කියලා ඔන්න හිතෙන්ම පෙන්නනවා. එහෙම පෙන්නන්න තව ඒවා උදව් වෙනවා. දැන් ගත්ත වර්ණ සංඥාව විතරක්

නෙවෙයි, පෙර අත්දැකීම් ටිකත් එතෙන්ට එකතු කරනවා. මේ සටහනට අදාළ බල්ලෙක් කියන එක දැනගන්න කොට. දැන් ඔය ටික හිතෙන් හදන දෙයක්. ඒ කියන්නේ මන, ධම්ම, මනෝ විඤ්ඤාණය. ඊළඟට එතන මනායතනයට පියවි සිහිය පිහිටන්නේ නැති හින්ද - ඇත්ත ඇතිහැටියේ නො දන්නා හින්ද එතන සිහිය, නුවණ පිහිටන්නේ නැහැ. එතකොට එයා විශ්වාස කරනවා මේ දැනගත්ත දෙය තියෙන්නේ එළියේ කියලා. ඒ එළියෙන් තියන කොට මතක තියාගන්න ශුද්ධාෂ්ඨකය හදලා, එහෙම නැත්නම් ජීවිතින්ද්‍රියත් දාලා පනත් දීලා, අපි අර විසිඅට රූපයම දාලා තමයි එළියේ තියෙනවා කියලා භාරගන්නේ. එතකොට මෙන්න මෙතැන දී, මේ කියපු අවස්ථා තුනම යෙදිලා තමයි බාහිර රූපයක් භාරගන්නේ.

එතකොට එළියෙන් තියෙන කොට ඔන්න මඤ්ඤණා කරන මට්ටමට ගිහිල්ලා. එතකොට මෙතෙන දී මනායතනයේ සිහිය නුවණ පිහිටියා නම් අපි දන්නවා මනසින් හදපු දෙය මනසින්ම දැනගත්තා, ඕක කවදාවත් බාහිරයේ තියෙන්න පුළුවන් ස්වභාවයක් නෙවෙයි. හිතෙන්ම හදලා හිතෙන්ම දැනගත්ත දෙයක් කියන එක. ඇහෙන් දකින්නේ වර්ණයක් කියන එක ඔය විදිහට අපිට තව ටිකක් ගැඹුරට විස්තර කරන්න පුළුවන්.

**ප්‍රශ්නයඃ මා මඤ්ඤති** කිව්වා නම් තවම සක්කාය දිට්ඨිය තියෙනවා, එතන මමෙක් ඉන්නවා, ඒකට මම රැවටෙනවා. **න මඤ්ඤති** කිව්වා නම් එළියේ යමක් තියෙනවා නමුත් මේ පෙනෙන දෙය මනස පිළිගන්නේ නැහැ. මනස හරි දියුණුයි. මේ අදහස් දෙක හරිද කියලා මම දැනගන්න කැමතියි.

**උත්තරයඃ** ඒ අදහස තමයි අපිට හුඟක් අහන්න ලැබෙන්නේ, පොත්පත් වල තියෙන්නේ. නමුත් මම හිතනවා නුවණින් විමසන කොට තව ටිකක් දහමට ගළපලාම හිතුවොත් මේ වගේ අදහසක් එනවා. පෘථග්ජනයා තමයි මඤ්ඤණා කරන්නේ. එතකොට මඤ්ඤණා කරන කෙනාට තමයි මම අට්ඨකථාවෙන් පෙන්නුවේ සතරමහාධාතුව මඤ්ඤණා කරන විධි හතරක්. සම්මුති විදිහට, ආරම්මණ විදිහට, ලක්ඛණ විදිහට, සසම්භාර විදිහට. දැන් සසම්භාර කියන කොට එළියේ තියෙන ධාතුවක්, මේ තියෙන දෙය භාරගන්න සතරමහාධාතුවක්. එහෙම නැත්නම් ඒ සතරමහාධාතුව තියෙන තැනකයි මෙහෙම පෙන්නුම් කරන්නේ කියන මට්ටමකට යනවා. හැබැයි එතනත් තේරුම් ගන්න ඒකත් මඤ්ඤණා කිරීමක්. එතකොට සතරමහාධාතුවේ පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කරනවා. භාරගන්නවා. **පඨවිං පඨවිතො මඤ්ඤති.**

රහතන්වහන්සේගේ **නමඤ්ඤති. න මඤ්ඤති** කියන්නේ කිසිම මඤ්ඤණා කිරීමක් නැහැ. පඨවිය කියලා මඤ්ඤණා කිරීමක් එතන

යෙදෙන්නේ නැහැ. එතකොට සේඛ පුද්ගලයාගේ **මාමඤ්ඤති** කියන්නේ තවම රහතන්වහන්සේගේ මට්ටමට හිත දියුණුවෙලා නැහැ. එහෙම නැත්නම් අවිද්‍යාව දුරුවෙලා නැහැ. අවිද්‍යාව දුරුවෙලා නැහැ කියන්නේ මුළාවෙන මට්ටම තියෙනවා. ඒ මුළාවෙන මට්ටම තියෙනවා කියන්නේ තවම මඤ්ඤණා කරන ගතිය තියෙනවා. සතරමහාධාතුව භාරගන්න ගතිය තියෙනවා. හැබැයි එයාට පැහැදිලි දර්ශණයක් තියෙනවා රහතන්වහන්සේ මෙහෙම මඤ්ඤණා කරන්නේ නැහැ කියලා. එහෙනම් අපේ ප්‍රඥුව වැඩෙන්න ඕනේ මේ මඤ්ඤණා නො කරන මට්ටමට කියන එක. එතකොට **මාමඤ්ඤති** කියන්නේ මඤ්ඤණා කළාට මේකෙන් වළකින්න උත්සාහයක් දරන්න එයාට නුවණක් තියෙනවා. සම්මාදිට්ඨියක් තියෙනවා. දැන් මාර්ගය වඩනවා කියන්නේ ඒ උත්සාහය දරනවා කියන එක.

දැන් මෙතන දී මම මාර්ගය කියලා අදහස් කරන්නේ ලෞකික මාර්ගය නෙවෙයි, ලෝකෝත්තර මාර්ගය. ඒ කියන්නේ ලෝකය ඉක්මවා දකින මාර්ගය. මේකම මම තව ටිකක් දහමට ගලපන්නම්. අපි දන්නවා මේ ඇත්ත දකින්න නම් බුදුරජාණන් වහන්සේ පැනෙව්වේ සතර සතිපට්ඨානය. එතකොට රූපයේ ඇත්ත දකින්න කියලා තියෙන්නේ කායානුපස්සනාවෙන්. කායානුපස්සනාව තියෙන්නේ රූපය පිරිසිඳ දැකීම සඳහා. ඇයි? අපි රූපයේ මුළාවෙලා ඉන්නවා. මුළාවෙලා ඉන්න අයට රූපයේ ඇත්ත ඇතිහැටියේ අවබෝධ කරගන්න තමයි කායානුපස්සනාව තියෙන්නේ. එතකොට ඒ කායානුපස්සනාවේ දී කියනවා අජ්ඣත්ත රූපය ගැනත් මේ විදියට සිහිය පිහිටන්න, බාහිර රූපය ගැනත් සිහිය පිහිටන්න කියලා. **ඉති අජ්ඣත්තං වා කයෙ කායානුපස්සි විහරති, බහිද්ධා වා කයෙ කායානුපස්සි විහරති**, ඊළඟට ඒ දෙක ගැනම සිහිය නුවණ පිහිටන්න කියනවා. **අජ්ඣත්තබහිද්ධා වා කයෙ කායානුපස්සි විහරති.**

එහෙම ගිහිල්ලා ගිහිල්ලා බලාගෙන යනකොට කායානුපස්සනාවේ ඉතුරු ටිකේ දී අන්තිමට එනවා කොටසක් **න ච කිඤ්චි ලොකෙ උපාදියති.** කායානුපස්සනාවේ ලෝකය කියන්නේ මේ රූප කියන එක. කය කියලා අදහස් කරන්නේ රූප. එතකොට රූප ලෝකයේ - **න ච කිඤ්චි ලොකෙ උපාදියති** - කිසියම්ම දෙයක් උපාදනය කිරීමක් වෙන්නේ නැහැ. ඒ කියන්නේ භාරගැනීමක්, අල්ලාගැනීමක් සිදුවෙන්න විදිහක් නැහැ - කාටද? කායානුපස්සනාව සම්පූර්ණ වුණ කෙනාට. මොකද කායානුපස්සනාවේ ප්‍රතිඵලය වෙන්නේ රූපයෙන් මිදීම, නැත්නම් රූපය පිරිසිඳ දැකීම. එතකොට පිරිසිඳ දකින කොට ආයේ අල්ලගන්න රූපයක් ඉතුරුවෙන්නේ නැහැ.

දැන් මෙන්න මෙතන දී අදහසක් ගන්න ඕනේ - රූප තියෙනවා, ඒවා අල්ලගන්නේ නැත්ද, නැත්නම් අල්ලගන්න රූප පිහිටන්නේ නැත්ද. එතන දී ආයතන පිරිසිඳ දැක්කා නම්, ඇහැ පිරිසිඳ දැක්කා නම්, අර වතුරට එබෙන බල්ලා වගේ අපි ඇහැට රැවටිලා බාහිර රූපයක් භාරගන්නේ නැහැ. ඒ කියන්නේ ඇහෙන් වර්ණ සටහනක් හදලා දුන්නා, ඒක තමයි චක්ඛු විඤ්ඤාණයෙන් දැනගත්තේ. එතකොට චක්ඛු විඤ්ඤාණයට ගෝචර වෙන්නේ වර්ණ ගතිය විතරයි. එතනින් එහාට කිසිම ධාතු - ඒ කියන්නේ මුලින් කියපු අටවිසි රූප වලින් විසිහතක් චක්ඛු විඤ්ඤාණයට අදාළ නැහැ. නමුත් විඤ්ඤාණයේ තියෙනවා මායාකාරී ස්වභාවයක්, ඒ මායාකාරී ස්වභාවයෙන් තමයි මේක රූපයක් කරලා - රූපයක් කරනවා කියන කොට මම අදහස් කරනවා අර විසිඅට රූපයක් හදලා, ඔන්න ඕක තමයි මේ දැනගත්තේ කියන මට්ටමකට අපට ගෙනෙන ස්වභාවයක් තියෙනවා. මුළාකරන ස්වභාවයක්. හැබැයි ආයතන පිරිසිඳ දකින කොට, අර ගෝචර නානත්වය හඳුනගන්න කොට, ඇහැට පුළුවන්කම තියෙන්නේ වර්ණයක් දකින්න විතරයි කියන අදහස එනකොට ඉතුරු විසිහතම මේ මායාකාරයා හදලා අපිම මුළාකරපු ස්වභාවයක් කියන එක දකින්න පුළුවන් වෙයි.

මෙතන පැහැදිලිව මම කියන්න හදන්නේ එළියේ ධාතුව තියෙනවා, ඒ වුණාට අපි අල්ලාගන්නේ නැහැ කියන ස්වභාවයක් නෙවෙයි, අල්ලාගන්න ධාතුවක් පිහිටන බව වත් මඤ්ඤණා කිරීමක් නැහැයි කියන මට්ටමක් රහතන්වහන්සේ **න මඤ්ඤති** කියන එකෙන් අදහස් කරනවා කියලා මම කියන්න උත්සාහ කරන්නේ.

**ප්‍රශ්නයක්:** අර විසිඅට රූප ගැන කථා කරන කොට එතන දී විසිහතරක් අරගෙන, අනිත් හතර විෂය රූප හතරද ඔය ගත්තේ? ඒ වෙන් කරලා ගත්තේ? එතකොට විඤ්ඤාණය නිසාද අර විසිඅටම අපිට ගෙඩියක් වශයෙන් පෙනෙන්නේ, රූපයක් වශයෙන්? අර හතර වෙන්කෙරුවේ, විෂය රූප හතරද ඒ වෙන්කෙරුවේ?

**උත්තරය:** එතන මම වෙන් කළේ සතරමහාධාතුවයි, උපාදය රූපයි කියලා කොටස් දෙකක් තියෙනවා. උපාදය රූප විස්තර කරන්නේ සතරමහාධාතුව ඇති තැනක පෙන්නුම් කරන ගති ලක්ෂණ ටිකක් - උපාදය. උපාදින්නයි කියලත් කියනවා. එතකොට උපාදය රූප කියන එක බාහිරෙන් විස්තර කරන්න ගියොත් අපිට කියන්න වෙනවා වර්ණයකට නිකම් පවතින්න බැහැ. සතරමහාධාතුව තියෙන තැනකමයි වර්ණය පවතින්නේ කියලා අපිට සතරමහාධාතුව ගැනත් කතා කරන්නම වෙනවා. හැබැයි එහෙම වෙන්නේ - ඒක තමයි ලෝකයට අයිති දැක්ම. හැබැයි බුදුරජාණන්වහන්සේ පනවනවා නේ ආයතන පිරිසිඳ දකින්න කියලා.

ඇහැ පිරිසිඳ දකින්න, ඇහෙන් දැනගන්න රූපයපිරිසිඳ දකින්න. **ඡානං ඵස්සං යථාභූතං** - ඇත්ත ඇතිහැටි දන්න දකින කෙනාට තමයි සම්මාදිට්ඨිය තියෙන්නේ කියලා.

එතකොට ඇහැ ගැන අවබෝධය ගන්න කොට දැන් ඇහෙන් දැකලා නම් යම්කිසි දෙයක් දැනගන්නේ, ඇහැට දැනගන්න පුළුවන් වර්ණ ගතිය විතරයි කියන නුවණක් එනවා. ඇහැට වෙන කිසිම දෙයක් ගෝචර නැහැ. එහෙනම් ඇහෙන් අරන් දීපු මේ වර්ණ ගතිය මුල්කරගෙන අපේ මේ හිත නේද ඉතුරු ධර්ම ගැන හිතලා තියෙන්නේ. අන්න ඒ පැත්තෙන් මේක ටිකක් මෙනෙහි කරලා බලන්න.

තව පැත්තකින් අපි කලිනුත් පැහැදිලි කළා දැන් අපි දකින වර්ණය ඇත්තටම එළියේද තියෙන්නේ? මම කිව්වේ පොඩි පරීක්ෂණයක් - පාට පාට කණ්ණාඩි දලා බැලුවොත්, නැත්නම් පාට පොලිතීන් කොල වලින් බැලුවොත්, අපට ඒ පාට රූප පෙනෙනවා මිසක් එතකොට බාහිර තියෙන පාටද මේ පෙනෙන්නේ දැන්? එතකොට අපි උපදින කොටම ඇහේ යම්කිසි පාටක් ගෑවිලා තිබුණා නම් එහෙම අපි මෙච්චර කල් දකින ලෝකය ඒ පාට වෙයි. වර්ණ අන්ධ කෙනෙක් ගැන එහෙම ටිකක් හිතලා බලන්න පුළුවන්, කළු සුදු විතරක් පෙනෙන අය, සත්වයෝ ඉන්නනවා. ඒ අය ගැන හිතලා බලන්න පුළුවන්. එතකොට ඒ අයත් විශ්වාස කරන්නේ ඒ පාට මේ එළියේ තියෙන ඒවායේ තියෙනවා කියලා නේද? කළු සුදු විතරක් පෙනෙන අය, සත්වයෝ ඉන්නවා ඒ මට්ටමක ඇහැක් තියෙන්නේ. එතකොට ඒ අයට කවදාවත් අනිත් වර්ණයන් ගැන හිතා ගන්නවත් බැහැ. එතකොට එහෙම අයට දැන් අපි දකින ගහක කොළයක තියෙන කොළ පාට, කොළයේ කොළ පාටක් තියෙනවා කියන එක ද හරි, නැත්නම් අපේ ඇහේ හැකියාව අනුව සකස් කරලා දීපු දෙයක් මේ හිත දැනගෙන ඒක මුල්කරගෙන නේද අපි නිගමනයකට ඇවිල්ලා තියෙන්නේ ඔය කොළ පාට තියෙන්නේ එළියේ කියලා.

මේ මට්ටම දකින්න අර ආයතන ගැන වෙන වෙනම හොඳට මෙනෙහි කරන්න වෙනවා. ඒ ගැන අදහසක් එන්න ඇති කියලා මම හිතනවා. සතරමහාධාතුවෙන් කියන එක දීලා තියෙන්නේ අපේ මූලික මට්ටමේ තියෙන කෙලෙස් ටිකක් කඩාගන්න කියන එකයි මම දකින්නේ. ඔය ටික අයිති පූර්ව ප්‍රතිපදාවට. පූර්ව ප්‍රතිපදාව තියෙන්නේ විශේෂයෙන් තදබල නීවරණ ටික යටපත් කරගන්න. තදබල ඇලීමක් තියෙනවා නම්, එහෙම නැත්නම් ගැටෙන ගතියක්, කාමච්ඡන්ද, ව්‍යාපාද වගේ ඒවා තුනී කරගන්න තමයි ඔය පූර්ව ප්‍රතිපදාවේ භාවනා තියෙන්නේ. එතන දී අපි ලෝකයට අයිති මට්ටමකින් තමයි ඒ භාවනා ටික කරන්නේ. එතකොට

ලෝකයට අයිති මට්ටමේ භාවනා ටිකකිනුත් කෙලෙස් යටපත් කරගන්න පුළුවන්. හැබැයි කෙලෙස් සම්පූර්ණයෙන්ම කඩලා දන්න බැහැ. සමුච්ඡේද වශයෙන් නැතිකරන්න බැහැ. ඒ සඳහා මේ ආර්ය දර්ශනයටම එන්න වෙනවා.

අපි අනිච්ච සඤ්ඤ සූත්‍රයේදීත් ඕක පැහැදිලි කළා. එළියේ තියෙන රූපයේ අනිත්‍යය බැලුවහම එළියේ තියෙන රූපය වෙනස් වෙනවා කියලා බලලා අපට කඩාගන්න පුළුවන්, නැත්නම් යටපත් කරගන්න පුළුවන් කෙලෙස් ප්‍රමාණයක් තියෙනවා. හැබැයි ඒකෙන් ඇත්ත ඇතිහැටියටම දකින්න පුළුවන්කමක් නැහැ. ඒ ඇයි කියලා බලන්න - දැන් වතුරට එබෙන බල්ලා බල්ලෙක් ඉන්නවා කියන දෘෂ්ටියෙ ඉඳගෙන අර රූපය වෙනස් වෙනවා, නැත්නම් අර රූපය හැදිලා තියෙන්නෙ රූප කලාප වලින්, ඒවාත් සීඝ්‍රයෙන් වෙනස් වෙනවා කියලා ඒ වගේ කොච්චර දක්මකට ගියත් එයාගේ ඇලීම් ගැටීම් අඩුවෙයි මිසක් මුළාව දුරුවෙන්නේ නැහැ. එතකොට මුළාව දුරුවෙන්න නම් ඔතන තේරුම් ගන්නම වෙනවා ඔය රූපයේ සමුදය. රූපය විතරක් නෙවෙයි, රූපය හටගත්තේ කොහොමද? මේ පැත්තේ අවිද්‍යාව, මුළාව යෙදුණු හින්දයි අරපැත්තේ රූපයක් භාර අරගෙන තියෙන්නේ. ඒ සමුදය යෙදුණේ නැත්නම් එහෙම රූපයක් පිහිටන්නේ නැහැ. **න ගාධති** - එහෙම නැත්නම් මඤ්ඤණා කරන්නේ නැහැ කියන මට්ටම ඒ සමුදය යෙදුණේ නැත්නම් එහේ රූපයක් පිහිටන්නේ නැහැ කියන මට්ටමෙන් මම දකින්නේ.

එතකොට අර විසිඅට රූපයේ විසිහතරක්ම උපාදය රූප විදියටයි ගන්නේ. එතකොට ඒ උපාදය රූප - දැන් බාහිර ලෝකය පැත්තෙන් භාරගන්න කෙනාට ඒ උපාදය රූපය රඳපවතින්න සතරමහාධාතුව අවශ්‍යයි. සතරමහාධාතුව නැති තැනක ඉතුරු ඒවා ගැන කතා කරන්න බැහැ. හැබැයි ඕක තවම ලෝකයට අයිති දර්ශනය. එතනින් එහාට යන්න, ලෝකෝත්තර දර්ශනයේ දී තමයි මේ සතරමහාධාතුවත් මඤ්ඤණා කරපු දෙයක් නේද, එහෙනම් ඒකෙනුත් මිදෙන්න මාර්ගයක් තියෙනවා. එක පැත්තකින් බුදුරජාණන් වහන්සේ පෙන්නනවා අනිච්ච සඤ්ඤාව වඩන්න. තව පැත්තකින්පෙන්නනවා කායානුපස්සනාව වඩන්න. ඒ දෙකෙන්ම මම පෙන්නුවේ ඒවායේ ප්‍රතිඵලය තමයි ආයේ උපාදන කරන්න කිසිම, කිසියම්ම රූපයක් ඉතුරුවෙන්නේ නැහැ. **න ච කිඤ්චි ලොකෙ උපාදියති** කියන මට්ටමක් පිහිටනවා. ඒ කියන්නේ රූපයක් නො පිහිටන මට්ටමක්.

දැන් අපිට තියෙන්නේ රූප උපද්දවලා ඒවා භාරගන්න මට්ටමක්. රහතන්වහන්සේ කියන්නේ නැවත ඉපදීමක් නැති - නැවත ඉපදීමක් නැති කියන එකෙන් මම අදහස් කරන්නේ පිරිනිවන්පෑවාට පස්සේ

උපදින්නේ නැහැ කියන එක විතරක් නෙවෙයි, රහත් වුණු මොහොතේ පටන්ම ආයේ ඉපදීමක් නැහැ. මොනවාගේද ඉපදීමක් නැත්තේ? **ඛන්ධානං පාතුභාවො ආයතනානං පටිලාභො** - කියන දේවල්වලත් ඉපදීමක් නැහැ ජාති කියන කොට. එතකොට රූපයත් එතෙන්ට අයිතියි. එතකොට අපි මුළාවෙන් රූපයක් ඉපැද්දුවා නම් ඒ රූපය උපදින්නේ නැහැ, මොකද අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරු කරපු හින්ද. **අසෙස විරාග නිරොධා** කියන මට්ටම.

**ප්‍රශ්නය:** ඒ කියන්නේ මේ විඤ්ඤාණයේ තුළ මායාකාරී ස්වභාවය නිසාමයි මේ රූප විසිහත රූපයක් වශයෙන්, ගුලියක් වශයෙන් පෙනෙන්නේ නේද? නැත්නම් තියෙන්නේ හතරක් - අර භූත රූප හතරයි අනෙක් ඔක්කෝම උපාදය රූප විසිහතරක් තියෙනවා කියන්නේ. එහෙමද? කරුණාකර පැහැදිලි කරලා දෙන්න.

**උත්තරය:** මේක විඤ්ඤාණයෙන් කරන මායාවමයි. එතැන දී මූලික වශයෙන් අපි උපාදය රූප විඤ්ඤාණයෙන් කරන මායාවක් කියන එක තේරුම්ගන්න ඕනේ. දෙවෙනි එක දැන් චක්ඛු විඤ්ඤාණයට ගෝචර වුණේ වර්ණය විතර නේ. එතකොට සතරමහාධාතුව නෙවෙයි. ඉතුරු විසිහතරෙන් එකක්. උපාදය රූප වලින් එකක් තමයි වර්ණ රූපය කියන එක. එතකොට විඤ්ඤාණයට උපාදය රූපයක් ගෝචර වෙලා එයා අපට කියනවා සතරමහාධාතුවක් ගැන. ඒක චක්ඛු විඤ්ඤාණයට ගෝචර දෙයක් ද? නැහැ නේද? ඒ කතාව කිව්වේ මනෝ විඤ්ඤාණයකින්ම නේද? එතකොට ඒ පැත්තෙන් මනෝ විඤ්ඤාණයත් අරගන්න වෙනවා. දැන් වර්ණ රූපය අනුව හිතන කොට හිතේ තමයි ඉස්සෙල්ලා ඒකට අදළ නාමික රූප, එහෙම නැත්නම් චිත්ත රූප ටිකක් හැදෙන්නේ. ඒක නාමික මට්ටම, නැත්නම් මනසට පෙනෙන ධම්ම මට්ටමක් විතරයි. එතකොට ධම්ම කියන ඒවා මනසින්ම උපද්දන දෙයක් මිසක්, බාහිර සතරමහාධාතුවට අයිති දෙයක් නෙවෙයි. ඕක බාහිරයට අයිති කරන්නේම ආපහු මනෝ විඤ්ඤාණයෙන් කරන මුළාවට අපි අහුවෙන හින්ද. මනෝ විඤ්ඤාණයේ හැකියාව මනසින්ම හදපු ධම්ම මනසටම පෙන්නන එක. ඒ කියන්නේ මනෝ විඤ්ඤාණයට පෙන්නන එක. එතකොට ඒ විඤ්ඤාණයේ කෘත්‍ය, විඤ්ඤාණයේ හැකියාව අපි හඳුනගත්තේ නැත්නම්, එතෙන්ට සිහිය නුවණ

පිහිටියේ නැත්නම්, අපි මේ දැනගත්තේ එළියේ තියෙන යම්කිසි දෙයක් කියලා භාරගන්නවා. ඒ භාරගැනීම මයි මඤ්ඤණා කිරීම.

උපමාවේ දී බල්ලාගේ වර්ණ සටහන ඇහෙන් හදලා දුන්නා. ඌ ඒක දැකලා ඒක ගැන හිතනවා. ඒ හිතන එකෙත් නෙවෙයි වැරැද්ද. ඒ හිතන දෙය එළියේ තියෙනවායි කියන තැනදී තමයි ඔන්න ලෝකයට අහුවෙන්නේ. එහෙම නැත්නම් මඤ්ඤණා කරන්නේ කියන ස්වභාවය. එතකොට ඉස්සෙල්ලා මේක උපාදය රූප වලටත් දකින්න ඕනේ, ඊළඟට සතරමහාධාතුවටත් ඔය මට්ටම මයි කියන එක තමයි මම මේ සූත්‍රයෙන් විශේෂයෙන් පැහැදිලි කරන්න උත්සාහ කරන්නේ. මොකද පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කරන ස්වභාවයක් තියෙනවා පෘථග්ජනයාගේ. රහතන්වහන්සේගේ එහෙම මඤ්ඤණා කිරීමක් නැහැ කියන එක පැහැදිලිව මේ සූත්‍රයේ තියෙනවා. ඒ කියන්නේ **න මඤ්ඤති. පඨවිං පඨවිතො න මඤ්ඤති.** එතකොට අන්න ඒක ටිකක් ගැඹුරෙන් බලන්න නම් සතරමහාධාතුවටත් මේක අදාළයි කියන අදහසක් තමයි මම මේ මතුකරන්න උත්සාහ කරන්නේ. ඉතින් මේවා අනුමාන ඥාන විතරයි. අපි පෙලදහම නුවණින් විමසන්න උත්සාහ කරන්න කියන එක කියන්න තමයි මම විශේෂයෙන් මේ සූත්‍රය සාකච්ඡාවට ගත්තේ.

ඒ එක්කම මම මතු කරනවා මීට කලින් අපි සාකච්ඡා කරලා ඇති කෙවට්ට සූත්‍රයේ[7] දී පඨවි, ආපෝ, තේජෝ, වායෝ නො පිහිටන මට්ටම - **න ගාධති. එත්ථ ආපො ච පඨවී, තෙජො වායො න ගාධති** කියන ස්වභාවයක් ගැනත් එතන සඳහන් වෙනවා. ඒකත් පොඩ්ඩක් බලාගන්න එක හොඳයි.

**ප්‍රශ්නයඃ** දැන් අභිධර්මය ඉගෙන ගන්න කොට රූප විසිඅට පරමාර්ථ වශයෙන් ඉගෙන ගන්නවා නේ. එතකොට ඔබතුමා කිව්වා පඨවි, ආපෝ, තේජෝ, වායෝ මඤ්ඤණා කරගන්න දෙයක් කියලා. එතකොට පරමාර්ථ කිව්වහම සත්‍යය වශයෙන්ම තියෙන දේවල් විදියට අභිධර්මයේ කියලා දෙන්නේ. ඒකත් ඇත්තම නො වෙන්න පුළුවන්. ඒකත් අපි මඤ්ඤණය කරගෙන කරන දෙයක්ද එතකොට?

---

[7] දීඝ නිකාය, සීලස්කන්ධ වර්ගය, කේවට්ට සූත්‍රය

**උත්තරය:** ඔව්, ඇත්තටම ඒක තමයි මම කියන්න උත්සාහ කරන්නේ. දැන් අපි අභිධර්මයෙන් ඉගෙන ගන්න දෙයත්, අභිධර්මය බොරුයි, වැරදියි කියන එක නෙවෙයි මේ කියන්නේ. එහෙම දකින එකෙන් යම්කිසි කෙලෙස් ප්‍රමාණයක් කඩන්න පුළුවන්. හැබැයි ඒක කෙළවර නෙවෙයි. එතනින් එහාට යන්න ඕනේ. මේ ලෝකෝත්තර දර්ශනය කියන්නේ ලෝකය ඉක්මවා යෑමක්, එහෙම නැත්නම් රූපය ඉක්මවා යෑමක්. එතකොට ඒ ගැන අදහසක් තමයි මේ සූත්‍ර වලදී අපට දකින්න පුළුවන්. දැන් මේ සූත්‍රයේ දී පඨවි, ආපෝ, තේජෝ, වායෝ මඤ්ඤණා කරන ස්වභාවයක් තියෙනවා කියනවා සාමාන්‍ය කෙනාගේ. සෙඛ පුද්ගලයා **මා මඤ්ඤති**. ඒකෙන් මිදෙන්න උත්සාහයක් තියෙනවා. රහතන්වහන්සේ එහෙම මඤ්ඤණා කරන්නේ නැහැ. **න මඤ්ඤති**. ඊළඟට අපි කේවට්ට සූත්‍රය ගත්තොත් එතන දී අහන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ නිරුද්ධ වෙන්නේ කොහේද කියලා.

එතකොට බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා ඔය ප්‍රශ්නය වැරදියි. පඨවි, ආපෝ, තේජෝ, වායෝ නිරුද්ධ වෙන්නේ කොහේද කියලා අහන්න එපා. ඒවා නොපිහිටන්නේ කොහේද? **න ගාධති** කියන වචනය. **නිරුජ්ඣති** නෙවෙයි, **න ගාධති**. එතකොට ඒවායේ නොපිහිටන ස්වභාවයක් තියෙනවා. නොපිහිටන්නේ කාටද? රහතන්වහන්සේට. නාමරූප හොඳටම පිරිසිඳ දැකපු, ඒවා වෙන්වෙලා ගිය, ඒ මට්ටමේ දී, ඒ කියන්නේ අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරු වුණු මට්ටමක දී සතරමහාධාතුව නොපිහිටන ගතියක් තියෙනවා. **න ගාධති** කියන එක. එතකොට ඒවා පිහිටන කෙනාට ඒවා ගැන කතා කරන්න පුළුවන්. ඒ කතා කිරීමේ වැදගත්කමක් තියෙනවා මොකද ඒ මට්ටමෙන් කැඩෙන කෙලෙස් ප්‍රමාණයක් තියෙනවා.

උදාහරණයක් වශයෙන් ගන්න; අපි ස්ත්‍රී පුරුෂ කියලා ශරීරයකට ඇලුනහම ඒකෙන් මිදෙන්න අපි මෙනෙහි කරනවා කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර කියලා දෙතිස් කුණපයක් වශයෙන්. දැන් ඒ දෙතිස් කුණප මට්ටමෙන් මෙනෙහි කිරීමේ දීත් රැවටීමක් තියෙනවා. රැවටීමක් නැතුව නෙවෙයි. හැබැයි එතන තේරුම් ගන්න ඕනේ ඒ මට්ටමෙන් මෙනෙහි කිරීම තුළ කැඩෙන කෙලෙස් ප්‍රමාණයකුත් තියෙනවා. තව ඉතුරුවෙන කෙලෙස් කොටසකුත්

තියෙනවා. එතකොට මේ කතා කරන්නේ අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරු කිරීමක් ගැන. ඒ කියන්නේ රහත් වීමට අවශ්‍ය දෙයක් ගැන. ඊට මෙහා මට්ටමේ කෙලෙස් දුරු කරන්න ඔය ධාතු මට්ටමින් බැලීම පැහැදිලිවම උපකාර වෙනවා. ඒ හින්ද ඒවා බලන්න එපා කියන එක නෙවෙයි මේ කියන්නේ. මේ කියන්නේ එතනින් එහාටත් තව යම්කිසි දෙයක් තියෙනවා. ඒ ගැනත් දර්ශනයක් ඇති කරගත්තොත් ඒක ප්‍රයෝජනයක් වෙන්න පුළුවන් කියන එක.

**ප්‍රශ්නය:** උපාදය කියන කොට හැමවෙලාවේම මම තේරුම් අරගෙන තිබුණේ මහාභූත ඇති තැනක තමයි උපාදය රූපයක් හැදෙන්නේ කියන එකයි. එතකොට අපි දැන් මෙතන කතා කරනවා නම් මහාභූතත් නැතැයි කියලා, එතකොට එහෙම නම් උපාදය රූපත් නැහැ කියන අදහසද ගන්නේ කියන එකයි මගේ ප්‍රශ්නය.

**උත්තරය:** මෙතන අපි පරෙස්සම් වෙන්න ඕනේ නැහැයි කියන කතාවක්ද මේ කියන්නේ? මොකද තියෙන දෙයක් නැහැ කිව්වොත් ඒකත් දෘෂ්ටියකට පත්වීමක් වෙනවා. අපි අමතක කරන්න හොඳ නැහැ කච්චායනගොත්ත සූත්‍රයේ දී මේවා හටගන්නවා දකින කොට ඇත කියන මතයකට යනවා, නිරුද්ධවෙනවා දකින කොට නැත කියන මතයකට යනවා. තථාගතයෝ ඔය දෘෂ්ටි දෙකටම නොවැටී පටිච්චසමුප්පාදයක් දේශනා කරනවා.

මෙතන පටිච්චසමුප්පාද ධර්මතාවයට එන්නයි මේක කතා කරන්නේ. එතකොට එතන දකින්න ඕනේ දැන් සතරමහාධාතුවෙත් අපට ඇත කියලා දෘෂ්ටියක් එන්නත් පුළුවන්, නැත කියලා දෘෂ්ටියක් එන්නත් පුළුවන්. ඒ දෙකම මත දෙකක් මිසක් පටිච්චසමුප්පන්න ස්වභාවය නෙවෙයි කියන එක තේරුම් ගන්න ඕනේ. එතකොට පටිච්චසමුප්පන්න ස්වභාවයේ දී **ඉමස්මිං සති ඉදං හොති** - මේ හේතු තියෙනවා නම් මේ ඵලය තියෙනවා. **ඉමස්මිං අසති ඉදං න හොති**- මේ හේතු යෙදුනේ නැත්නම් ඒවා පිහිටන්නේ නැහැ. එතකොට මේ කතා කරන්නේ හේතු නො යෙදුනොත් නොපිහිටන ස්වභාවය. දැන් ඒවා තියෙනවා කියලා විශ්වාස කරන්න හේතු යෙදෙනකම් ඒවා පිහිටනවා. ඒකත් පටිච්චසමුප්පන්නයි. හැබැයි ඒ හේතු අපි හඳුනගන්න ඕනේ. දැන් ආයතන වලට අහුවෙලා, නැත්නම් ආයතන වලට මුළාවෙලා දකින කොට ඒ මුළාවේත්

අවිජ්ජා මට්ටමක් තියෙනවා. මොකද ඒ රූප තියෙනවා කියලා භාරගත්තොත් ඒ රූපය ගැන කතා කරන්න පුළුවන්. හැබැයි ඒ කතා කරන්නේ මේ ආයතනයෙන් කියන දෙයක් කියලා භාරගැනීම මත. ආයතන ඉක්මවා ගිය කෙනෙකුට ඒ කොටස යෙදෙන්නේ නැහැ.

උදහරණයේ දී වතුරට එබෙන බල්ලා බල්ලෙක් ඉන්නවා කියලා කතා කරන කොට, එයාගේ මානසික මට්ටම යෙදෙන කොට ඒ තත්වය තියෙනවා. ඒක නැහැ කිව්වොත් වැරදියි. මොකද ඒ කෙලෙස් මත එයාට එහෙම මයි ඒක පෙනෙන්නේ, හිතෙන්නේ. ඊළඟට ඔතන ඇත්ත අවබෝධ කරපු කෙනාට අර දේවල් යෙදෙන්නේ නැහැ, මොකද ඒවා පිහිටන්නේ නැහැ. දැන් ඕකම සිහිමුළාවෙන අවස්ථාවකට ඕනේ නම් ගළපලා බලන්න. දැන් කෙනෙක් කොහේ හරි හොල්මනක් ඉන්නවා කියලා දැඩිව විශ්වාස කරනවා. එතකොට එයාට ඒක පිහිටනවා. අනිත් අය කොච්චර කිව්වත් වැඩක් නැහැ ඔතන එහෙම දෙයක් නැහැ කියලා, එයා නම් කවදාවත් තනියෙන් ඔතනින් යන්නේ නැහැ. එයාගේ කෙලෙස් මට්ටම මත ඒක යෙදෙනවා. ඒ මට්ටමේ දී එහෙම කතා කරන්න වෙනවා. එහෙම කතා කරන කොට අපි තේරුම්ගන්න ඕනේ ඒක ඇත්ත ඇතිහැටි වෙන්නම අවශ්‍යය නැහැ. යථාභූත ස්වභාවය වෙන්නම අවශ්‍යය නැහැ. සත්වයා ඉන්නේ ආයතන වල සිහිමුලා වෙලා කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා.

එතකොට යථාභූත ස්වභාවය දකින්න, අවබෝධ කරන්න බුදුරජාණන්වහන්සේ මාර්ගයක් පෙන්නලා තියෙනවා. ඒ මාර්ගය එක පැත්තකින් සතර සතිපට්ඨානය කියලා කියනවා - ඒකායන මර්ගය. ඒ කායානුපස්සනා පැත්තෙන්. තව තැනක තියෙනවා මේ පඤ්ච උපාදන ස්කන්ධයේ අනිච්ච සඤ්ඤාව වඩන්න කියන පැත්තෙන්. එතකොට අනිච්ච සඤ්ඤාව වැඩීම තුළින් කොහොමද මේක පෙනෙන්නේ? එතකොට අනිච්ච සඤ්ඤාවේදීත් තේරුම් ගන්න බාහිරයේ තියෙන දෙයක් අනිත්‍යයි කියලා බලන මට්ටමේ අනිත්‍යයකුත් තියෙනවා, ඊළඟට **ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො** කියලා බලන මට්ටමේ අනිත්‍යයකුත් තියෙනවා. ඒක තමයි ආර්ය දර්ශනය. දැන් සමුදයයි - සමුදය නිසායි මෙය පිහිටන්නේ, ඒ සමුදය යෙදුණේ නැත්තම් නොපිහිටන

ස්වභාවයකුත් තියෙනවා. දැන් මේ කතා කරන්නේ නොපිහිටන ස්වභාවය. එතකොට සතරමහාධාතුව පිහිටන මට්ටමකුත් තියෙනවා. ඒකෙන් කියන්නේ නැහැ ඒක යථාභූත ස්වභාවය කියලා. ඒ හින්දමයි මේ සූත්‍රයෙන් මම දකින්නේ පැහැදිලිවම, වෙන් වෙන්වම පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කරනවා, ආපෝවල ආපෝ කියලා මඤ්ඤණා කරනවා, ඔහොම ඔය හතරට වෙන වෙනම පෙන්නලා තියෙනවා. කවුද **මඤ්ඤණා** කරන්නේ, කවුද ඒක මා **මඤ්ඤති** කරන්නේ, කවුද ඒක **න මඤ්ඤති** ස්වභාවයකින් ඉන්නේ.

එතකොට අපි උත්සාහ කරන්නේ **න මඤ්ඤති** ස්වභාවය තේරුම්ගන්න නම් අපි අර මූලික කෙලෙස් කඩන්න තියෙන මට්ටම - ඒක මම සඳහන් කරන්නේ පූර්ව ප්‍රතිපදව කියලා. එතකොට පූර්ව ප්‍රතිපදවෙන් ආර්ය දර්ශනයට යන්න වෙනවා. ඒ කියන්නේ ලෝකෝත්තර දර්ශනයට, ලෝකය ඉක්මවා යන දර්ශනයට යන්න වෙනවා. සතරමහාධාතුව තියෙනවා කියන්නේ ලෝකය තියෙනවා. එතකොට මේකේම ලෝකයේ තියෙන දෘෂ්ටි තේරුම් ගන්න කොට අපිට ටිකක් හිතාගන්න පුළුවන් අපි ඉන්නේ මොන මට්ටමේද කියලා.

දැන් අපි අහලා තියෙනවා විඤ්ඤණ වාදය කියලා එකකුයි, භෞතික වාදය කියලා එකකුයි ගැන. භෞතික වාදය කියන්නේ බාහිර යම්කිසි දෙයක් තියෙනවා හෝ බාහිර යම්කිසි දෙයක් නැහැ කියන එක. එතකොට බාහිරෙන්මයි කතා කරන්නේ. බාහිරය හැදිලා තියෙන ධාතු වලින්. එතකොට ඒක තියෙනවා කියලා එක පැත්තකින් කියන්න පුළුවන් කෙනෙකුට, නැහැ එහෙම දෙයක් නැහැ කියලා කියන්නත් පුළුවන් කෙනෙකුට. ඒ කියන්නේ බාහිරය සකස්වෙලා තියෙන යම්කිසි ස්වභාවයක්. මේකට කියනවා භෞතික වාදය කියලා.

ඊළඟට අනිත් පැත්තෙන් කියනවා - නැහැ, ඔය ඔක්කෝම විඤ්ඤණයෙන්, මේ මනසෙන් හදලා නේ එළියෙන් තියලා තියෙන්නේ කියලා. එතකොට ඒක විඤ්ඤණ වාදයට අහුවෙනවා. එතකොට මේ මනසෙන් හදන මට්ටමේ දීත් වාද දෙකකින් රැවටෙන්න පුළුවන්. මේ මනසෙන් හදන දෙය තියෙනවා මයි කියලා එක පැත්තකට යනවා, එහෙම දෙයක් නැහැ කියලා තව

පැත්තකට යනවා. එතකොට ඒ දෙකත් දෘෂ්ටි දෙකක් කියලා තේරුම් ගන්න ඕනේ.

එතකොට ඔය එකකටවත් අහු නොවෙන ධර්මතාවයක් තමයි මේ පටිච්චසමුප්පන්න ස්වභාවය. මේ හේතු තියෙනවා නම් මෙහෙමයි, ඒ හේතු නැත්නම් ඒ දෙය ගැන කථා කරන්නවත් බැහැ. ඒකයි නොපිහිටන ගතිය, නැත්නම් **න ගාධති** කියන ගතිය. අන්න ඒ වගේ ධර්මතාවයක් තමයි මම මේ මතු කරන්න උත්සාහ කරන්නේ.

**ප්‍රශ්නය:** වර්ණ ඡායාව උපදවන පටිච්චසමුප්පාදයයි, මනසින් හදගන්න ඒ මොහොතේ ඇතිවෙන පටිච්චසමුප්පාදය සම්බන්ධව යම්කිසි විස්තරයක් කරන්න.

**උත්තරය:** දැන් වර්ණ සටහනක් ගැන අපි දැනුවත් වෙන්නේ කොහොමද? වර්ණ සටහනක් දැනගන්න නම් වර්ණය ගෝචර වෙන්නේ ඇහැට විතර නේ. එතකොට ඇහැක් තියෙනකම් විතරයි වර්ණයක් ගැන කතා කරන්න පුළුවන්. ඇහැක් ඉපදුනොත් විතරමයි වර්ණයක් ගැන දැනගන්නේ. වෙන දැනගන්න විදියක් නැහැ. එතකොට අපි මේ ඇහැ හදගෙන තියෙන්නේ ඇයි? රූප දකින්න. වර්ණ රූප දකින්න අපේ තණ්හාවක් තියෙන හින්ද. ඇයි අපට එහෙම තණ්හාවක් ඇති වුණේ? ඒ පිළිබඳව පෙර තිබුණු අවිද්‍යාවයි, එහෙම බාහිරයේ දෙයක් තියෙනවාමයි, මේක දැකීමෙන් අපට ආස්වාදයක් තියෙනවා - ඔන්න දැන් තණ්හාව, ඊළඟට අවිද්‍යාව, ඒ සඳහා අවශ්‍ය ඇසක් අපි හදගෙන තියෙනවා. දැන් මෙතන දී මතක් කරගන්න ඔය ඇහැ කියන එකයි, ඇහෙන් දැනගන්න රූපය කියන එකෙයි ධර්මයේ පෙන්නන කරුණු. මේවා සංඛතයි, පටිච්චසමුප්පන්නයි. ඒ වගේම මේවා පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධවෙන ස්වභාවයක් තියෙනවා. එතකොට පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධවෙන ඇහැකින්, පෙර නොතිබීම හටගෙන ඉතුරු නැතුවම නිරුද්ධවෙන වර්ණ සටහනක් තමයි මේ දැකලා තියෙන්නේ. ඒකයි මේ පටිච්චසමුප්පන්න ධර්මතාවය දකින්න කියන්නේ. එතකොට අපි වර්ණයක් දැනගත්තේ ඒ මට්ටමේ ඇහැක් අපිම සකස් කරගත්ත හින්ද. ඇයි මේ ඇහැක් සකස් කළේ? අපේ ඒ මට්ටමේ කෙලෙස් යෙදිලා හින්ද. ඇහැට හේතු විදිහට කියන්නේ - පෙර තණ්හා, කර්ම,

ආහාර, අවිද්‍යා වගේ හේතු සඳහන් වෙන්නේ ඇහැක් උපද්දන්න. එතකොට අන්න ඒ කරුණු ටික මෙනෙහි කළොත් මේ ධර්මතාවය ටිකක් පැහැදිලි වෙයි කියලා හිතනවා. එතකොට ඇහැත්, ඇහෙන් දැනගන්න රූපයත්, වර්ණ සටහනක් දැනගැනීමත් පටිච්චසමුප්පන්න ධර්මතාවයක් කිව්වේ ඒ නිසායි.

**ප්‍රශ්නය:** සළායතනය ගත්තහම ඇස, කන, නාසය, දිව, කය, මන ආදි වශයෙන් දැන් එතකොට මඤ්ඤණා කියන විට අදහස් කරන්නේ මනසට එන ධම්මාරම්මණ තුළින් ඇතිවෙන ඒවා පමණක්ද?

**උත්තරය:** ඒකට අපි යන්න ඕනේ අවබෝධයක් තුලින්. අපි කලින් අවස්ථාවක දී කතා කළ සූත්‍රයක් - උණ්ණාභබ්‍රාහ්මණ සූත්‍රය[8]. ඒකේ දී උණ්ණාභබ්‍රාහ්මණයා බුදුරජාණන්වහන්සේගෙන් අහනවා මේ ඇස, කන, නාසය, දිව, ශරීරය කියන ආයතන වල ගෝචර නානත්වයක් තියෙනවා, **නානාවිසයානි නානාගොචරානි** - ඒක පැහැදිලි ඇති; ඇහැට ගෝචර වෙන දෙය කනට ගෝචර වෙන්නේ නැහැ ආදි වශයෙන්. ඒ එක්කම තියෙනවා මේ ආයතන වලට මේ අරමුණ විඳීමේ හැකියාවකුත් නැහැ. දැන් ඇහෙන් රූප හදලා දුන්නාට ඇහැට ඒ රූපය විඳීමේ හැකියාවක් නැහැ. තව විදියකට කිව්වොත් ඇහැ දන්නේ නැහැ දැන් දකින්නේ මොන රූපයද කියලා. කන දන්නේ නැහැ දැන් අහන්නේ මොන ශබ්දයද කියලා. එතකොට ඒ අරමුණු විඳින්නේ කවුද? නැත්නම් මේ ආයතන පහට පිළිසරණ වෙන්නේ කවුද කියලා තමයි මේ බ්‍රාහ්මණයා අහන්නේ. එතකොට ඒ ආයතන පහට පිළිසරණ වෙන්නේ මනස කියලා බුදුරජාණන්වහන්සේ පෙන්නනවා. එතකොට තේරුම්ගන්න මේ ආයතන පහෙන් මිදෙන මට්ටමක් තියෙනවා. එතකොට තමයි ආයතන වල ඇත්ත තත්වය තේරෙන්නේ. එතකොට ඇහෙන් දැක්කා කිව්වාට ඇත්තටම දැකලා තියෙන්නේ මනසෙන් කියන මට්ටමක් තියෙනවා. ඒ මට්ටමේ අවබෝධය එන කොට මේ ඇසට, කනට, නාසයට, දිවට, ශරීරයට කරන්න දෙයක් නැහැ. ඒවා නිකම් උපකරණ පහක් විතරයි.

උදාහරණයක් විදිහට ගත්තොත් ටෙලස්කෝප් එකක් හෝ මයික්‍රස්කෝප් එක උපකරණයක්. ඒ උපකරණ වල හැකියාව ඒකේ

---

[8] සංයුක්ත නිකාය, මහා වර්ගය, ඉන්ද්‍රිය සංයුක්තය

හැකියාව අනුව වර්ණ සටහනක් හදලා දෙන එක විතරයි. උපකරණය දන්නේ නැහැ මේ හදලා දෙන්නේ මොකක්ද කියලා. ඒක බලන්න කෙනෙක් ඉන්න ඕනේ. ඒ බලන කෙනා තමයි ඔය මනස. එතකොට මනස ඕක බැලුවේ නැත්නම් අරක වැඩ කළාද නැත්ද කියන එකටවත් අර්ථයක් නැති වෙනවා. එතකොට මූලික වෙන්නේ මනස. මනසම තමයි අරමුණ විඳලා තියෙන්නේ. අපි මේ ආයතන වලට මුල්තැන දෙන්නේ ඒ අපේ කෙලෙස් මට්ටම අනුව.

ඒ ගැන තව ටිකක් හිතන්න පුළුවන්; භූමි තුනක් තියෙනවා නේ, කාම භූමි, රූප භූමි, අරූප භූමි. ඒ භූමි පිහිටන්නේ අපේ මනසේ තියෙන කෙලෙස් මට්ටම් වල වෙනසක් අනුව. එතකොට ඒ ආයතන උපද්දන්නේ කෙලෙස් මට්ටමකට. රූප භූමියේ දී අපේ කායාතනය නැහැ. ජිව්හායතනය නැහැ. ඝානායතනය නැහැ. ඉතුරු ටික තියෙනවා. ඊළඟට අරූප භූමියට යද්දී චක්ඛායතනයත් නැහැ, සෝතායතනයත් නැහැ. මනායතනය විතරයි තියෙන්නේ. එතකොට ඒවා පිහිටන්නේ කෙලෙස් මට්ටම් අනුව. ඒකෙන්ම තේරුම් ගන්න මේ කෙලෙස් මට්ටමටම හදපු ආයතන ටිකක් මේවා. මේක මනසේම වැඩක් අන්තිමට බලන කොට.

ඇත්තටම අපි බුදුරජාණන්වහන්සේ පෙන්නපු ආකාරයට මේ ලෝකය දකින්න මේ බඹයක් පමණ ශරීරය තුළින්, නැත්නම් මේ ආයතන තුළින් කියන මට්ටමම තමයි මම කතා කරන්න, මතු කරන්න උත්සාහ කරන්නේ. මොකද අපි නොදැනුවත්වම බාහිරෙන් ලෝකය හොයන්න පුරුදුවෙන ගතියක් තියෙනවා. ඒ විදිහට තමයි අපිව පුරුදු කරලා තියෙන්නේ ඉගැන්වීම් තුළින්, විද්‍යාවෙන් ආදි වශයෙන්. එළියේ තියෙන්නේ මේවායි කියන්නමයි හොයන්න හදන්නේ. ඉතින් අපි මූලිකව දහමට අනුව තේරුම් ගන්න ඕනේ මේක බාහිරයෙන් හොයලා නම් කවදාවත් ධර්මය අවබෝධ කරන්න බැහැ කියලා. බුදු දහම අනුව මේක අභ්‍යන්තරයෙන්, නැත්නම් ආයතන තුළින්ම ලෝකය අවබෝධ කරගන්න අවශ්‍යයි. ඒ පැත්ත දකින කොට ඔය බාහිරය තියෙනවාද නැත්ද කියන ප්‍රශ්න යෙදෙන්නේ නැති ස්වභාවයක් තියෙනවා. ඕවා යෙදෙන්නේම අපි ඒවා මඤ්ඤණා කිරීම තුළමයි කියන එක තමයි මම මේ මූලපරියාය සූත්‍රයෙන් මතුකරන්න උත්සාහ කළේ. තෙරුවන් සරණයි.

# මජ්ඣිම නිකායේ මූලපරියාය සූත්‍රය ඇසුරෙන් 20-12-2015 දින අන්තර්ජාලය ඔස්සේ පැවැත්වුනු සවනට සිසිලස ධර්ම සාකච්ඡාව

මේ සූත්‍රය ටිකක් ගැඹුරු එකක් හින්ද ඒක තවදුරටත් සාකච්ඡා කළොත් හොඳයි කියලා මම හිතුවා. **පඨවිං පඨවිතො මඤ්ඤති** කියන එක තමයි අපි දිගට කථා කළේ. ඒකේ දී පුද්ගලයෝ කොටස් හතරකට බෙදලා පඨවියේ පඨවිය ගැන මඤ්ඤණා කරන හැටි පෙන්නනවා. **අස්සුතවා පුථුජ්ජනො අරියානං අදස්සාවී අරියධම්මස්ස අකොවිදෙ අරියධම්මෙ අවිනීතො, සප්පුරිසානං අදස්සාවී සප්පුරිසධම්මස්ස අකොවිදෙ සප්පුරිසධම්මෙ අවිනීතො** - ඔය විදියට තමයි අශ්‍රැතවත් පෘථග්ජනයාගැන සඳහන් වෙන්නේ. **අරියානං අදස්සාවී** - ආර්යයන් වහන්සේලා දැකලා නැති, දකින්නේ නැති. ඊළඟට **අරියධම්මස්ස අකොවිදෙ** - ආර්ය ධර්මයෙහි අදක්ෂ වූ, **අරියධම්මෙ අවිනීතො** කියන්නේ ආර්ය ධර්මයෙහි හික්මිලා නැහැ. **සප්පුරිසානං අදස්සාවී** - සත්පුරුෂයන් නො දක්නා සුළු, **සප්පුරිසධම්මස්ස අකොවිදෙ** - සත්පුරුෂ ධර්මය දකින්නේ නැති, දක්ෂ නැති, හික්මිලා නැති **සප්පුරිසධම්මෙ අවිනීතො** - ඒගොල්ලන් කොහොමද මේ පඨවිය කියන එක දකින්නේ කියන එක.

එහෙම කෙනා **පඨවිං පඨවිතො සඤ්ජානාති** කියනවා මුලින්ම. ඒ කියන්නේ පඨවිය පඨවිය කියලා හඳුනගන්නවා. පඨවිය පඨවිය කියලා සංඥවක් ගන්නවා. ඊළඟට **පඨවිං පඨවිතො සඤ්ඤත්වා පඨවිං මඤ්ඤති.** පඨවිය පඨවිය කියලා පඨවි සංඥවෙන් ගත්තහම ඊළඟට **පඨවිං මඤ්ඤති** - පඨවිය කියලා මඤ්ඤණා කරනවා. පඨවිය පඨවිය කියලා හඳුනාගත්තාට පස්සේ පඨවිය පඨවියයි කියලා මඤ්ඤණා කරනවා. ඊළඟට **පඨවියා මඤ්ඤති, පඨවිතො මඤ්ඤති, පඨවිං මෙති මඤ්ඤති, පඨවිං අභිනන්දති** කියලා ඒක එක එක විදිහට මඤ්ඤණාව ගන්න හැටි පෙන්නනවා. ඒ පාලි වචන එක එක විභක්තියේ වරනැගෙන විදිහක් ඒ තියෙන්නේ. අපි මේකේ සිංහල තේරුම බැලුවොත් සත්පුරුෂ ධර්මයෙහි නො හික්මුණා වූ අශ්‍රැතවත් පෘථග්ජන තෙමේ පෘථිවිය පෘථිවිය වශයෙන් (තණ්හා මාන දිට්ඨි මඤ්ඤනාවෙන් සංඥ විපර්යාස වශයෙන්). එතකොට වරහන් ඇතුළේ දාම්මා කියන එකෙන්ම තේරුම් ගන්න ඒක පාලියේ සඳහන් වෙන්නේ නැහැ, ඒක අර්ථයක් වශයෙන් එකතු කරපු එකක්. එතකොට අපි පාලි එකේ තේරුම ගත්තොත් පෘථග්ජන තෙමේ පෘථිවිය පෘථිවිය වශයෙන් හඳුනයි. **පඨවිං පඨවිතො සඤ්ජානාති.** පෘථිවිය පෘථිවිය වශයෙන් හැඳින පෘථිවිය හඟියි. පෘථිවිය කියන්නේ මෙතන පඨවි කියන

එක. පඨවිය පඨවිය විදිහට හඟිනවා. පඨවිය පඨවිය විදිහට හඳුනගෙන, පඨවිය පඨවිය විදිහට හඟිනවා. ඒ මඤ්ඤති කියන එක. **පඨවිං පඨවිතො සඤ්ඤත්වා පඨවිං මඤ්ඤති.**

ඊළඟට **පඨවියා මඤ්ඤති** කියන්නේ මම පෘථිවියෙහි පිහිටියෙමි වගේ අදහසක්. ඒ කියන්නේ මේ පඨවියේ තමයි මම ඉන්නේ වගේ. ඊළඟට **පඨවිතො මඤ්ඤති** කියන්නේ මම පෘථිවියෙන් බාහිරව ඉන්නවා වගේ. පෘථිවිය එක පැත්තක තියෙනවා, පෘථිවියෙන් බැහැරව මම ඉන්නවා. ඊළඟට **පඨවිං මෙති මඤ්ඤති** - පෘථිවිය මගේ කියලා ගන්නවා. දැන් පෘථිවිය කියන එකම ටිකක් තේරුම් යන විදිහකට පඨවි ධාතු ගතිය වැඩි වස්තුවක් ගැන හිතන්න. තමන් ඉස්සරහ තියෙන කොම්පියුටරය වෙන්න පුළුවන්, මේසය, පුටුවක් වෙන්න පුළුවන්, ඒ විදිහට හිතුවහම ඊළඟට ඒක මගේ කියලා හිතෙන ගතියක් තියෙනවා. ඒක තමයි **පඨවිං මෙති මඤ්ඤති.** ඊළඟට **පඨවිං අභිනන්දති** - අභිනන්දනය කරනවා කියන්නේ ඒකේ සතුටුවෙන ගතියක් තියෙනවා.

දැන් කවුද මෙහෙම මඤ්ඤණා කරන්නේ? අශ්‍රැතවත් පෘථග්ජනයා. එතකොට එහෙම වෙන්න හේතුව මොකක්ද? **තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සා'ති වදාමි. අපරිඤ්ඤාතං** කියන්නේ පිරිසිඳ දකින එකේ අනිත් පැත්ත. **පරිඤ්ඤෙය්‍යං** කියන එක නේ **අපරිඤ්ඤෙය්‍යං** වෙන්නේ. එතකොට පිරිසිඳ නො දැනීම හේතුවෙන් තමයි මෙහෙම මඤ්ඤණා වෙන්නේ කියලාත් කියනවා. එතකොට අපි තේරුම් ගන්න ඕනේ අශ්‍රැතවත් පෘථග්ජනයා තමයි පඨවිය ගැන මේ විදිහට මඤ්ඤණා කරන්නේ. ඒකට හේතුව තමයි මේක පිරිසිඳ නො දන්නකම. ඒ කියන්නේ පඨවිය පිරිසිඳ නො දන්නකම හින්දමයි, තව විදිහකට කිව්වොත් ඇත්ත ඇතිහැටියේ නො දන්න හින්දමයි පඨවිය ගැන මේ විදිහට හිතන්නේ, කල්පනා කරන්නේ, මඤ්ඤණා කරන්නේ. නැත්නම් මේ විදිහට භාරගන්නේ.

ඉතින් ඕකම අපිට ඊළඟ ඡේද වලින් පෙනෙනවා අපෝ ධාතු ගතියත් ඔය විදිහටම තියෙනවා. තේජෝ ගැනත් ඔය විදිහටම හිතනවා. වායෝ ගැනත් ඔය විදිහටම හිතනවා. එහෙම මඤ්ඤණා කරනවා. ඒ මඤ්ඤණා කරන්නේ මොකද? ඒවා **අපරිඤ්ඤාතං** - ඒක පිරිසිඳ දැකලා නැති හින්ද. ඕකම ඊළඟට එක එක ලෝක වලටත් යනවා. දේවලෝක, බ්‍රහ්මලෝක ඒ වගේ. ඉතින් එතනින් තේරුම් ගන්න ඕනේ දේවලෝක වල කාම භූමිය තියෙනවා. ඊළඟට බ්‍රහ්මලෝක වලට යනකොට රූප භූමියයි, අරූප භූමියයි කියන ටිකත් අයිති වෙනවා. තව විදිහකට කිව්වොත් තුන් ලෝකයම මෙතන සඳහන් වෙනවා. ඒ කියන්නේ භූමි තුනම - කාම භූමිය, රූප භූමිය, අරූප භූමිය. ඒ තුනේම කියන්නේ මෙන්න මේ විදිහට

මඤ්ඤණා කරනවා. එහෙම මඤ්ඤණා කරන්න හේතුව මොකක් ද? **තං කිස්ස හෙතු? - අපරිඤ්ඤාතං තස්සා'ති වදාමි.** පිරිසිඳ නො දන්නාකමම යි.

ඊළඟට **දිට්ඨං දිට්ඨතො සඤ්ජානාති** - ඒකම මඤ්ඤති වෙනවා. **සුතං සුතතො සඤ්ජානාති** - ඒකත් මඤ්ඤති වෙනවා. ඒ කියන්නේ දකින එක දැක්කා කියලා මඤ්ඤණා කරනවා. ඇහුවොත් ඇහුවා කියලා මඤ්ඤණා කරනවා. **මුතං මුතතො සඤ්ජානාති** - දැනුනොත් දැනුනා කියලා මඤ්ඤණා කරනවා. **මුතං මුතතො සඤ්ඤත්වා මුතං මඤ්ඤති** - දැනුනා කියලා මඤ්ඤණා කරනවා. **විඤ්ඤාතං විඤ්ඤාතතො සඤ්ජානාති, විඤ්ඤාතං විඤ්ඤාතතො සඤ්ඤත්වා විඤ්ඤාතං මඤ්ඤති** - එතකොට විඤ්ඤාණයත් මඤ්ඤණා කරනවා. මොකක්ද මේකට හේතුව - **තං කිස්ස හෙතු? අපරිඤ්ඤාතං තස්සා'ති වදාමි.** පිරිසිඳ නො දන්නාකමම යි.

ඊළඟට තව තව ඒවා ගොඩක් මේකේ එකතු වෙනවා. **එකත්තං, නානත්තං,** අන්තිමට එනවා **සබ්බං සබ්බතො** - ඒ කියන්නේ සියල්ල. සියල්ල කියලා හඳුන ගන්නවා, සියල්ල සියල්ල කියලා මඤ්ඤණා කරනවා.

ඊළඟට **නිබ්බානං නිබ්බානතො සඤ්ජානාති** - මේකත් අපට ටිකක් වැදගත් වෙයි. නිවන නිවන කියලාත් හඳුන ගන්නවා. **නිබ්බානං නිබ්බානතො සඤ්ඤත්වා නිබ්බානං මඤ්ඤති** - නිවන එහෙම හඳුනගෙන නිවන කියලා මඤ්ඤණා කරනවා. එතනත් ඒ මඤ්ඤණාව අපි තේරුම් ගන්න ඕනේ. ඒකටත් හේතුව **අපරිඤ්ඤාතං** - මේ පෘථග්ජනයාගේ ස්වභාවය. එතනත් තේරුම් ගන්න පුළුවන් නිවන කියලා දෙයක් තියෙනවා කියලා, ඒකත් දෙයක් කරලා මඤ්ඤණා කරන ගතියක් තියෙනවා.

ඊළඟට දෙවෙනි කොට්ටාශය, පුද්ගල වර්ගය තමයි සේඛ - සේඛ කියන්නේ තවම රහත්වෙලා නැහැ, නමුත් මාර්ගයේ ඉන්නවා. ආර්ය මාර්ගයේ. තව විදිහකට කිව්වොත් අපි දන්නවා ආර්ය සම්මාදිට්ඨිය කියන එක තියෙනවා. දහමක් අහලා, තේරුම් අරගෙන සම්මාදිට්ඨිය ඇති කරගෙන. ලෝකෝත්තර දැක්ම. දැන් එයාගේ වෙන්නේ **යොපි සො භික්ඛවෙ, භික්ඛු සෙක්ඛො අප්පත්තමානසො අනුත්තරං යොගක්ඛෙමං පත්ථයමානො විහරති, සොපි පඨවිං පඨවිතො අභිජානාති** - ඉස්සෙල්ලා කිව්වේ **සඤ්ජානාති** කියලා. දැන් **පඨවිං පඨවිතො අභිජානාති; පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං මා මඤ්ඤි.** අභිඤ්ඤා කියන කොට දැන් සඤ්ජානාති කියන එකට වඩා පොඩ්ඩක් වෙනස්. සඤ්ජානාති කියන්නේ නිකම්ම හඳුනාගත්තා විතරයි. අභිජානාති නැත්නම් අභිඤ්ඤා විදිහට මේ

පඨවිය දැනගන්නවා. මේක සිංහලෙන් එනවා වෙසෙසින් දනියි කියලා. මැනවින් දැනගන්නවා. අර සාමාන්‍ය හඳුනාගැනීමට වඩා ටිකක් ගැඹුරකට පඨවිය දැනගන්නවා. ඒක තේරුම් ගන්න අර හඳුනාගැනීමේ මට්ටමින් ටිකක් එහාට ගිහින්, විශේෂ ඥානයකින් මේක දකිනවා - **අභිඤ්ඤාය. පඨවිං පඨවිතො අභිඤ්ඤාය** - එතකොට මොකද වෙන්නේ? **පඨවිං මා මඤ්ඤි.**

මෙතන සිංහල තේරුම නම් දෙන්නේ 'පෘථිවිය පෘථිවි වශයෙන් මැනැවින් දැන මඤ්ඤනා නැත්තේ නමුදු මඤ්ඤනා නැත්තේත් නො වෙයි' කියලා. ඒක ටිකක් පැටලෙන ගතියක් තියෙනවා. ඊට වඩා මම මේක දකින්නේ **පඨවිං මා මඤ්ඤි** කියන කොට මේක පඨවිය කියලා හිතෙන ගතිය තියෙනවා. ඒ වුණාට **අභිඤ්ඤාය** කියන කොට අර සාමාන්‍ය පුද්ගලයා දකිනවාට වඩා විශේෂ දැක්මක් තියෙනවා. මොකද, ධර්මයක් අහලා සම්මාදිට්ඨිය ඇතිවෙලා තියෙන හින්ද. ඒකේ දී තේරුම් ගන්න අපට ලෝකයට අයිති මට්ටමට මෙහෙම පෙනුනාට ආර්ය දර්ශනයේ දී මේ විදිහ නෙවෙයි. එතකොට අර මඤ්ඤණා කරන ගතියෙන් මිදීමක් තියෙනවා. එහෙම නැත්නම් රහතන්වහන්සේගේ **න මඤ්ඤී** කියන මට්ටමක් ගැන දැක්මක් මෙයාට තියෙනවා. තවම මඤ්ඤණා වෙන ගතිය තිබුණාට, මේකේ ඇත්ත ස්වභාවය, මේ කෙලෙස් යෙදුනේ නැත්නම්, අවිද්‍යාව යෙදුනේ නැත්නම්, **න මඤ්ඤී** ගතියක්. ඒ කියන්නේ මඤ්ඤණා කරන්නේ නැති ස්වභාවයක් තියෙනවා කියන ඒ දැක්ම තියෙනවා. ඒක ආර්ය සම්මාදිට්ඨියේ දී එන එකක්. එතකොට මෙයා උත්සාහ කරනවා ඒ මට්ටමට පත්වෙන්න. ඒක තමයි මම මෙතන දකින්නේ **මා මඤ්ඤී** කියන එකෙන්. වෙනස් අදහස් තියෙනවා නම් අපි ඒවා සාකච්ඡා කරමු.

ඊළඟට **අරහං ඛීණාසවො වුසිතවා** - රහතන්වහන්සේගේ මොකක්ද වෙන්නේ? **පඨවිං පඨවිතො අභිජානාති.** අන්න එතනින් තේරුම් ගන්න, දැන් සේඛ පුද්ගලයාත් **පඨවිං පඨවිතො අභිජානාති.** එතකොට **පඨවිං පඨවිතො අභිඤ්ඤාය, පඨවිං මා මඤ්ඤි** කියලා සේඛ පුද්ගලයාගේ යෙදුනේ. රහතන්වහන්සේගේ **යොපි සො, භික්ඛවෙ, භික්ඛු අරහං ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසංයොජනො සම්මදඤ්ඤා විමුත්තො, සොපි පඨවිං පඨවිතො අභිජානාති;** දැන් රහතන්වහන්සේ මේ කෙලෙස් දුරු කරලාත් **පඨවිං පඨවිතො අභිජානාති.** එතකොට විශේෂයෙන් දැනගන්නවා පඨවිය ගැන. සාමාන්‍ය හඳුනන මට්ටම නෙවෙයි. සඤ්ජානනය කරන මට්ටමට එහා ගිහින්. එතකොට **පඨවිං පඨවිතො අභිඤ්ඤාය පඨවිං න මඤ්ඤති.** රහතන්වහන්සේ එහෙම මඤ්ඤණා කරන්නේ නැහැ. මොකද පඨවියේ

නියම ස්වභාවය දැනගෙන ඉන්නේ. දැන් සේඛ පුද්ගලයා **පඨවිං පඨවිතො අභිඤ්ඤාය** වුණාට, නියම ස්වභාවය දැනගත්තාට මෙයාට තවම මඤ්ඤනා වෙන ගතියක් තියෙනවා, මොකද අවිද්‍යාව යෙදෙනවා. හැබැයි අවබෝධය තියෙනවා අවිද්‍යාව යෙදුනේ නැත්නම් මෙහෙම වෙන්නේ නැහැ කියලා. එතකොට එතෙන්ට යන්න උත්සාහ කිරීමක් තියෙනවා කියන එක තමයි **මා මඤ්ඤි** කියන්නේ. 'මා' කියන එක සාමාන්‍යයෙන් විරුද්ධ අර්ථය වගේ නේද එන්නේ? ඒකෙන් මිදෙන්න යෑමක් වගේ. එතකොට **මා මඤ්ඤි** කියන එකේ තේරුම මම දකින්නේ එහෙමයි. එතකොට රහතන්වහන්සේගේ **න මඤ්ඤති** කියන එක.

අපි මේ කියපු දේවල් ගැන පිරිසගෙන් අදහස් ටිකක් විමසලා බලමු.

**ප්‍රශ්නයක්:** මට තේරුන විදිහට සේඛ පුද්ගලයා කල්‍යාණමිත්‍ර ඇසුරෙන් සද්ධර්මය අහලා ආර්ය මාර්ගයේ ඉන්නවා. නමුත් තවම එයාගේ මුලාව තියෙනවා. නමුත් නුවණකුත් තියෙනවා රහතන්වහන්සේ මේ විදිහටයි වටහාගෙන තියෙන්නේ කියලා. නමුත් තවම එයා රැවටෙනවා. මගේ වැටහීම හරිද?

**උත්තරය:** ඒ අදහසම තමයි මමත් කියන්න උත්සාහ කළේ. පෘථග්ජනයාගෙන් සේඛ පුද්ගලයා වෙනස් වෙන්නේ සද්ධර්මය අහලා තේරුම් අරගෙන තියෙන නිසායි. තව විදිහකට කියන්න පුළුවන් චතුරාර්ය සත්‍යයේ සත්‍ය ඥනය ඇතිකරගෙන තියෙනවා. සත්‍ය ඥනය තියෙන කෙනාට නේ මාර්ගයක් තියෙන්නේ. කෘත්‍යය තියෙන්නේ. එතකොට දහමක් අහලා තේරුම් අරගෙන තියෙනවා මේකයි ආර්ය මාර්ගය කියන එක. එතකොට නිවන කරා යන මාර්ගය ගැන පැහැදිලි අවබෝධයක් තියෙනවා. එහෙම කෙනා තමයි සේඛ පුද්ගලයා වෙන්නේ. ඒ මට්ටමට එනකම් එයා පෘථග්ජන කෙනෙක් නේ. පෘථග්ජන භාවයෙන් සේඛ භාවයට පත්වෙන්නේ, ඒ කියන්නේ ආර්ය මාර්ගයට වැටුනා වෙන්නේ ආර්ය මාර්ගය ගැන පැහැදිලි දැක්මක් - ඒකම තමයි මම කිව්වේ ආර්ය සම්මාදිට්ඨිය, එහෙම නැත්නම් චතුසච්ච සම්මාදිට්ඨිය කියලා අදහස් වෙනවා.

එතකොට දැන් මෙයාට රහතන්වහන්සේ ගැන අනුමාන ඥනයක් තියෙනවා. අනුමාන කියන්නේ අපිට දළ වශයෙන් හිතාගන්න පුළුවන් රහතන්වහන්සේ මේ වගේ වෙන්න ඇති. එතකොට අපි ඒ තත්වයේ නැත්තේ අපේ අවිද්‍යාව තියෙන නිසායි කියලා. දැන් සේඛ පුද්ගලයාගේ අවිද්‍යාව තියෙනවා. අවිද්‍යාව දුරු වෙන්නේ - රහත්වෙන මොහොතේ නේ අවිද්‍යා සංයෝජනය කැඩෙන්නේ. එතකොට සේඛ පුද්ගලයාගේ

අනිවාර්යයෙන් අවිද්‍යාව තියෙනවා. අවිද්‍යාව දුරුවෙන්නේ රහත් වෙනකොට. හැබැයි මෙයාට නුවණක් තියෙනවා අවිද්‍යාව නිසා මෙහෙම පෙනෙනවා, නැත්නම් මෙහෙම අපි කල්පනා කරනවා, මඤ්ඤණා කරනවා. අවිද්‍යාව දුරුවුණු කෙනාට මෙහෙම මඤ්ඤණා වෙන්නේ නැහැ කියන ගතිය. ඒකයි රහතන්වහන්සේ **න මඤ්ඤති** කියන එක ගැන දළ අවබෝධයක් තියෙනවා.

ඒක දැන් අපට උපමා වලින් විතරයි හිතන්න පුළුවන් වෙන්නේ රහතන්වහන්සේගේ මට්ටම ගැන. ඒකයි අපි රැවටුන මොහොතකුයි, රැවටුන නැති මොහොතකුයි ගන්න උපමාව මම සාමාන්‍යයෙන් ගන්නේ - අර වතුරට එබෙන බල්ලාගේ උපමාව. මොකද අපි දන්නවා වතුරට එබෙන බල්ලා අවිද්‍යාව නිසාම, ඇත්ත ඇතිහැටි නො දන්නාකම නිසාම වතුරේ බල්ලෙක් ඉන්නවා කියලා හිතන ගතියක් තියෙනවා. දැන් ඒ වතුරේ බල්ලෙක් ඉන්නවා කියලා හිතන එක මම දකිනවා අර පෘථග්ජනයාගේ මඤ්ඤණා කිරීම වගේ. ඇත්ත ඇතිහැටි නො දන්න, අවිද්‍යාවෙන් යුක්ත සාමාන්‍ය පෘථග්ජනයා විසින් ඇහෙන් දෙයක් දැකලා ඒක තියෙනවාමයි කියන මට්ටමෙන් භාරගන්නවා. දකින දෙය තියෙනවාමයි, නැත්නම් එළියේ තියෙන හින්දමයි මෙහෙම පෙනෙන්නේ. එතකොට වතුරට එබෙන බල්ලාටත් වෙන්නේ දකින දෙය තියෙනවාමයි, වතුරේ තියෙනවාමයි - මෙහෙම පෙනෙන්නේ එහෙම බල්ලෙක් ඉන්න හින්දමයි වතුරේ. ඒ කියන්නේ පෙනෙන නිසා ඉන්නවා කියලා හිතනවා. ඒකේ අනිත් පැත්ත තමයි බල්ලෙක් ඉන්න නිසාමයි මට මෙහෙම පෙනුනේ, මගේ ඇහෙන් මෙහෙම පෙනෙන්නේ. මේ ඇහැට මෙහෙම පෙනෙන්නේ අර වතුරේ බල්ලෙක් ඉන්න හින්දමයි.

ඒ කියන්නේ ඉන්න නිසා නැත්නම් බාහිරයේ පවතින නිසාමයි මෙහෙම පෙනෙන්නේ කියලා හිතනවා. එතකොට දැන් පෘථග්ජනයා ඇහැ පාවිච්චි කරන කොට අපි හිතමු ගහක් දිහා බැලුවා කියලා. අඹ ගහක් තියෙනවා කියලා දැනගත්තා නම්, මේ මට මෙහෙම අඹ ගහක් පෙනෙන නිසා අතන අඹ ගහක් තියෙනවාමයි. එහෙම නැත්නම් අතන අඹ ගහක් තියෙන නිසාමයි මේ විදිහට මේ ඇහෙන් පෙන්නුම් කරන්නේ. දැන් ඔය දෙපැත්තකට එන්න පුළුවන් අපේ වැරදි දෘෂ්ටි දෙකක්. ඔය දෙක තියෙනවා. මොකද දැන් පෘථග්ජනයා තවම ඇහැ පිරිසිඳ දැකලා නැහැ.

දැන් ආර්ය මාර්ගයේ දී බුදුරජාණන්වහන්සේ කියනවා නේ ආයතන පිරිසිඳ දකින්න කියලා. එතකොට ආයතන වලින් පෙන්නුම් කරන රූපය පිරිසිඳ දකින්න විදිහක් නේ ආර්ය මාර්ගයේ තව විදිහකට කිව්වොත් තියෙන්නේ. එතකොට ආර්ය මාර්ගය වඩන කෙනාට ඒ ගැන දැක්මක් තියෙන්න ඕනේ

ඉස්සෙල්ලා. ඒක තමයි මේ ආර්ය දැක්ම කියලා මම අදහස් කරන්නේ. ඒ දැක්ම එන්න නම් අනිවාර්යයෙන් බුදුකෙනෙක්ගේ ධර්මය අහන්න වෙනවා. ඒ කියන්නේ සද්ධර්මශ්‍රවණය. ඊළඟට සද්ධර්මශ්‍රවණය කරලා ඒක ගැන නුවණින් විමසලා, ඒක තමන්ගේ දැක්මක් කරගන්නත් වෙනවා. ඒක තමයි **ජානං පස්සං යථාභූතං** කියලා කියන්නේ. අහන්නත් ඕනේ, ඒක දකින්නත් ඕනේ. **ජානං පස්සං යථාභූතං** මොකක් ගැන ද? මේ ඇත්ත ඇතිහැටි ගැන දැනගන්න පුළුවන් වෙන්නේ සද්ධර්මශ්‍රවණයෙන්. එතකොට ඒ **ජානං පස්සං යථාභූතං** කෙනාට තමයි සම්මාදිට්ඨිය තියෙනවා කියන්නේ. **සාස්ස හොති සම්මාදිට්ඨි.**[9]

එතකොට සේඛ පුද්ගලයා කියන කොට අනිවාර්යයෙන් සම්මාදිට්ඨිය තියෙනවා. චතුරාර්ය සත්‍යය පිළිබඳව සත්‍යය ඥානය තියෙන කෙනාටමයි සේඛ පුද්ගලයා කියන්නේ. එතකොට චතුරාර්ය සත්‍යය පිළිබඳව සත්‍යය ඥානය තියෙන කොට මේ අවිද්‍යාව තියෙන හින්ද මෙහෙම පෙනුනාට, අවිද්‍යාව දුරු වුණොත් රහතන්වහන්සේගේ තියෙන්නේ මෙන්න මේ වගේ තත්වයක් කියලා අනුමාන ඥානයක් ගන්න පුළුවන්. උපමාවේ දී බල්ලා වතුරට එබිලා තව බල්ලෙක් ඉන්නවා කියලා හිතුවාට, අර තියෙන දෙය පෙනෙනවා, නැත්නම් පෙනෙන දෙය තියෙනවාමයි කියන ඔය දෘෂ්ටි දෙකටම නො වැටුණොත් තත්වය මොකක්ද? ඒ කියන්නේ අපි ඇහැ පිරිසිඳ දැක්කොත්, අපේ මට්ටමට අපි නිකමටවත් හිතන්නේ නැහැ නේ වතුරේ බල්ලෙක් ඉන්නවා කියලා. දැන් බල්ලා තව බල්ලෙක් ඉන්නවා කියලා මඤ්ඤණා කරනවා. අපි **න මඤ්ඤති**. අපට බල්ලෙක් ගැන අදහසක්වත් - ඒ කියන්නේ වතුරේ ඉන්න බල්ලෙක් ගැන අදහසක් එන්නේ නැහැ. **න මඤ්ඤති** කියන මට්ටම.

එතකොට රූපයක් තියෙනවා කියන එකයි, එහෙම මඤ්ඤණා කරන්නේ නැහැ කියන එකේ මට්ටමයි, ඔය ධාතු හතර වෙන් කරලා පෙන්වීම තුළිනුත් ඒ වගේ අදහසක් තියෙනවා කියලා තමයි මට හිතෙන්නේ. දැනට ඒ සේඛ පුද්ගලයා කියන එක පැහැදිලි ඇති කියලා මම හිතනවා.

**ප්‍රශ්ණය:** මඤ්ඤණා කියන වචනයේ තේරුම වැරදියට දැන ගැනීම නේ. පෘථග්ජනයා මඤ්ඤණා කරන විදියයි, සේඛ පුද්ගලයා මඤ්ඤණා කරන ආකාරයෙයි වෙනස පැහැදිලි කරලා දෙන්න.

**උත්තරය:** ඒ ස්වභාවය තමයි අපි මේ සූත්‍රයෙන් මතුකරගන්න උත්සාහ දරන්නේ. දැන් මේකේ පැහැදිලිව පෘථග්ජනයා මඤ්ඤණා කරනවා කියලා

---

[9] මජ්ඣිම නිකාය, උපරි පන්නාසයක, සළායතන වර්ගය, මහාසළායතනික සූත්‍රය

තියෙනවා. **පඨවිං පඨවිතො මඤ්ඤති.** සේඛ පුද්ගලයාට සඳහන් වෙන්නේ **පඨවිං පඨවිතො මා මඤ්ඤති.** ඒ කියන්නේ මඤ්ඤණා කරනවා කියලා නෙවෙයි සඳහන් වෙන්නේ. ඊළඟට රහතන්වහන්සේ හරි තථාගතයන්වහන්සේ හරි **පඨවිං පඨවිතො න මඤ්ඤති.** ඔය වචන තුන යෙදෙන්නේ ඔය පුද්ගලයන් තුන්දෙනාට. මම නැවතත් කිව්වොත් - පෘථග්ජනයා **මඤ්ඤති.** සේඛ පුද්ගලයා **මා මඤ්ඤති.** රහතන්වහන්සේ හරි තථාගතයන්වහන්සේ හරි **න මඤ්ඤති.**

එතකොට අපි පැහැදිලි කරන්න හැදුවේ දැන් පෘථග්ජනයා කියන්නේ ධර්මය අහලාම නැති කෙනෙක්නේ. අශ්‍රැතවත් පෘථග්ජනයා. සේඛ පුද්ගලයා කියන කොට ඊට වඩා වෙනසක් තියෙනවා ධර්මය අහලා දැක්මක් ඇති කරගෙන. තව විදිහකට කිව්වොත් සම්මාදිට්ඨිය ඇති කරගෙන. අපි දන්නවා සම්මාදිට්ඨිය මුල් කරගෙන තමයි ආර්යඅෂ්ඨාංගික මාර්ගය වැඩෙන්නේ. එතකොට මාර්ගයේ ඉන්න කෙනා කියන්නේ අනිවාර්යයෙන් සම්මාදිට්ඨිය තියෙන්න ඕනේ. චතුසච්ච සම්මාදිට්ඨිය - චතුරාර්ය සත්‍යය පිළිබඳ අවබෝධයක්. තව විදිහකට කිව්වොත් සත්‍යය ඥානය කියලා කියන්නත් පුළුවන්. මොකද සත්‍යය ඥානය තියෙන කෙනාට තමයි කෘත්‍යය කරන්න පුළුවන් වෙන්නේ. මාර්ගය වඩන්න පුළුවන් වෙන්නේ. එතකොට මාර්ගය වඩන කෙනා තමයි සේඛ පුද්ගලයා. එතකොට සේඛ පුද්ගලයාට ආර්ය දැක්ම ගැන හොඳ පැහැදිලි දර්ශනයක් තියෙනවා. මේ ආර්ය ධර්මය ගැන, සද්ධර්මය ගැන. ඒ පැහැදිලි දර්ශනය කියන එක තමයි සම්මාදිට්ඨිය. සම්මාදිට්ඨිය ඇති වෙන්නේම බුදුරජාණන්වහන්සේ නමකගේ ධර්මය අහලා දැක්මක් තුළින්. සද්ධර්මශ්‍රවණයයි, යෝනිසෝමනසිකාරයයි එකතුවෙලා.

එතකොට එතනින් තමයි අදහසක් ගන්න බැලුවේ, දැන් එයාට නුවණක් තියෙනවා රහතන්වහන්සේ කියන කොට අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරුවුණු මට්ටමක් කියලා. ඒ මට්ටමේ දී මෙහෙම මඤ්ඤණා වෙන්නේ නැහැ. දැන් එයාට දැක්මක් තියෙනවා පෘථග්ජනයාට මඤ්ඤණා වෙනවා, රහතන්වහන්සේ **න මඤ්ඤති.** හැබැයි තවම එයාට **න මඤ්ඤති** මට්ටමට මනස දියුණුවෙලා නැහැ, දැක්ම තිබුණාට. එතකොට එයා උත්සාහයක යෙදෙනවා අර මඤ්ඤණා කරන එකේ ඉඳන් **න මඤ්ඤති** මට්ටමට පත්වෙන්න. තව විදිහකට කිව්වොත් පෘථග්ජන මට්ටමේ ඉඳන් රහතන්වහන්සේගේ මට්ටමට පත්වෙන්න උත්සාහයක් නේ ආර්ය මාර්ගය තුළ තියෙන්නේ. ඒ කියන්නේ **මඤ්ඤති** ස්වභාවයේ ඉඳලා **න මඤ්ඤති** ස්වභාවයට පත්වෙන්න. අන්න ඒ උත්සාහය තමයි - ඒ කියන්නේ මඤ්ඤණා කිරීම තුළින් මිදෙන්න උත්සාහය දරණ බව පෙන්වන්න තමයි

මේ **මා මඤ්ඤති** - මඤ්ඤණා කරන එකෙන් වළකින්න උත්සාහයක් දරණවා කියන අදහස තමයි මෙතන මට ඇතිවෙන්නේ. ඒ ගැන තව අදහස්, ප්‍රශ්න තියෙනවා නම් යොමු කරන්න.

**ප්‍රශ්නයඃ** මට තේරුණ විදිහට පෘථග්ජනයා කියන්නේ කෙලෙස් තියෙන පුද්ගලයෙක්. එයාට ද්වේෂයක් ඇති වුණොත් එයා ඒ ද්වේෂයෙන් එකවරම ක්‍රියා කරනවා කිසිම පාලනයක් නැතුව. සේඛ පුද්ගලයාටත් ද්වේෂයක් එනවා. නමුත් ඒක නරක ධර්මයක් කියලා දැනගෙන ඒක පාලනය කරගන්න උත්සාහවත් වෙනවා. ඒක තමයි මේ දෙදෙනාගේ වෙනස කියලයි මට තේරුනේ. රහතන්වහන්සේට ද්වේෂයක් එන්නේම නැති නිසා මඤ්ඤණා කියන එක ඇත්තේම නැහැ. නමුත් සේඛ පුද්ගලයා මේ දෙක අතරේ. ද්වේෂයක් ආවාට ඒක නැති කරගන්න එයා ගන්න උත්සාහය නිසා එයා **මා මඤ්ඤති** තත්වයේ ඉන්නේ කියලායි මට තේරුනේ. මේක **සඤ්ජානාති, අභිජානාති** කියන වචනත් එක්ක ගළපලා පහදා දෙන්න.

**උත්තරයඃ** ඒ උපමාව බොහෝම හොඳයි. අපි ද්වේෂයක්, තරහවක් ඇතිවුණු වෙලාව ගත්තොත්, ඔය පුද්ගලයෝ තුන්දෙනා මේ ගැන බලන විදිය විමසුවොත් - දැන් පෘථග්ජනයාට තරහා ගියා කියලා හිතන්න. එතකොට එයාට තරහා ගියා කියලා හඳුනගන්න පුළුවන් වෙයි - **සඤ්ජානාති**. හැබැයි එතනින් එහාට එයාට තරහා ගැන කිසිම අවබෝධයක් නැහැ. සේඛ පුද්ගලයාගේ වෙනස තියෙන්නේ තරහා ගියා කියලා දැනගත්තහම එයාට ආර්ය දැක්ම තියෙන නිසා, සම්මාදිට්ඨිය තියෙන නිසා එයාට දකින්න පුළුවන් මේ තරහා යාමේ ස්වභාවය පෘථග්ජනයාට තියෙනවා. හැබැයි රහතන්වහන්සේට එහෙම දෙයක් යෙදෙන්නේ නැහැ. මොකද අවිද්‍යාව තියෙනකම් විතරයි තරහා තියෙන්නේ. අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරු වුණොත් තරහා එන්න විදිහක් නැහැ. හැබැයි සේඛ පුද්ගලයා තවම අවිද්‍යාව දුරුකරලා නැහැ. එයාට තරහා යාමේ හැකියාව තියෙනවා. සාමාන්‍ය මට්ටමේ කෙලෙස් ඇතිවෙන්න පුළුවන්. එතකොට සේඛ පුද්ගලයාගේ වෙනස තමයි දැන් තරහා යන ගතිය තිබුණාට - අපි හිතමු තරහා ගියා, හැබැයි එයාට සිහිය පිහිටන කොට දකින්න පුළුවන් මේ මගේ කෙලෙස් හින්දයි තරහා ගියේ. අවිද්‍යාව තියෙන නිසාමයි මේ තරහා ආවේ. රහතන්වහන්සේගේ මෙහෙම අවිද්‍යාව යෙදෙන්නේ නැහැ. රහතන්වහන්සේට මෙහෙම තරහා කියලා ධර්මතාවයක් යෙදෙන්නේ නැහැ. මොකද තරහව ඇතිවෙන්න හේතු නැති හින්ද. එතකොට ඒ **න මඤ්ඤති** ස්වභාවය ගැන අනුමාන ඥානයක් තියෙනවා සේඛ පුද්ගලයාට.

එහෙම නම් මමත් මේ තරහා නූපදින මට්ටමට හිත දියුණු කරගන්න ඕනේ නේද කියලා දැක්මක් තියෙනවා. මඤ්ඤණා වීමෙන් මිදීමක් (නිරෝධයක්) තියෙනවා කියලා දැක්මක් තියෙන හින්ද මිදෙන්න උත්සාහයක් දරණවා. ඒ දරණ උත්සාහය තමයි මා මඤ්ඤති වෙන්නේ. දැන් පෘථග්ජනයාගේ එහෙම උත්සාහයක් යොදන්න එයාට දැක්මක් නැහැ. මේක මතු නො වෙන ස්වභාවයක් තියෙනවා කියලා නුවණක් එයාට නැහැ.

ඉතින් මෙතනම මම තව පොඩි අදහසක් මතු කරනවා. ඉස්සෙල්ලා ප්‍රශ්ණය කියද්දී සමහර විට තව පැත්තකට අදහසක් යන්න පුළුවන් - අපි තරහව ගැන විතරක් කතා කළොත්, සේඛ පුද්ගලයා කියන කොට තේරුම් ගන්න ඔය කෙලෙස් තුනී වුණ මට්ටමක් ගැන නෙවෙයි මේ කතා කරන්නේ. දැන් කෙලෙස් තුනී වුණ මට්ටමක් කිව්වහම අපි හිතමු ධ්‍යාන වඩන කෙනෙක් ගත්තොත්, එයාගේ කෙලෙස් බොහෝම තුනී යි. බොහෝ විට තරහා යන්නේ නැතිවෙන්න පුළුවන්. හැබැයි මේ ධ්‍යාන වඩන අය අන්‍ය සාසනවලත් හිටියා. බුදුරජාණන්වහන්සේගේ කාලයේ හිටිය ආලාරකාලාම, උද්දකාරාමපුත්ත වගේ අය හිත දියුණු කරපු අය. එතකොට ඒ අයගේ සමහර විට තරහා නො යන මට්ටමකට යටපත්වෙලා තියෙනවා වෙන්න පුළුවන්. හැබැයි මෙතන අපි තේරුම්ගන්න ඕනේ ඒ අයට මේ සේඛ පුද්ගලයා කියන වචනය යෙදෙන්නේ නැහැ. කෙලෙස් තුනී වුණු මට්ටමට සේඛ පුද්ගලයා කියන්නේ නැහැ. සේඛ පුද්ගලයා කියන්නේ පැහැදිලිවම ධර්මයක් අහලා, දැකපු - ඒ කියන්නේ චතුරාර්ය සත්‍යය පිළිබඳව සත්‍යය ඥානය ඇති කරගත්ත, එහෙම නැත්නම් සම්මාදිට්ඨිය ඇති වුණු කෙනාටමයි සේඛ පුද්ගලයා කියන්නේ. එයාට විතරයි ආර්යයන් වහන්සේ ගැන දළ අදහසක් තියෙන්නේ, රහතන්වහන්සේ මෙහෙම වෙන්න ඇති කියලා. එහෙම නැතුව සමහර පිරිස් සිතේ සමාධිය තුළින් කෙලෙස් යටපත් කරගෙන ඉන්න පුළුවන්. ඒ අයව සඳහන් වෙන්නේ නැහැ සේඛ පුද්ගලයා කියලා. මම ඒ කරුණත් ටිකක් මතුකරන්න හිතුවා.

**ප්‍රශ්නයඃ** මෙතන පුද්ගලයන් තුන්දෙනෙක් ගැන කතා කරනවා. අශ්‍රැතවත් පෘථග්ජනයා, සේඛ පුද්ගලයා සහ රහතන්වහන්සේ. අශ්‍රැතවත් පෘථග්ජනයා කියන එකට විග්‍රහ කෙරුවා ආර්ය ධර්මය නො ඇසූ, ආර්ය ධර්මයෙහි නො හැසිරෙන, ආර්යයන් වහන්සේලා නො හඳුනන වගේ අය. එතකොට මේ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා කියන කෙනා සේඛ පුද්ගලයාට මෙහා පැත්තෙත් ඉන්නවා නේ. ඒ කියන්නේ සෝවාන් මාර්ගයට අවතීරණය නො වුණු කොටසක් ඉන්නවා, ඒ අය අශ්‍රැතවත්

පෘථග්ජන නෙවෙයි. ඒ කොටස ගැන මෙතන විග්‍රහයක් වෙන්නේ නැහැ. එතන කොහොමද අපි ගන්න ඕනේ?

**උත්තරයඃ** ඒක මට එච්චර පැහැදිලි නැහැ. මම දකින්නේ පෘථග්ජනයා කියන්නේ ධර්මයක් අහලා තේරුම් නො ගත්ත කෙනා. ඔබතුමා සඳහන් කරන්නේ සේඛ පුද්ගලයායි පෘථග්ජනයායි අතර කොටසක් ඉන්නවා කියලා.

**ප්‍රශ්නයඃ** මම කිව්වේ අශ්‍රැතවත් පෘථග්ජනයා සහ ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා අතර වෙනස. දැන් උදාහරණයක් ගත්තොත් මේ ධර්ම සාකච්චාවට සහභාගි වෙන කොටස අශ්‍රැතවත් පෘථග්ජනයෝ නෙවෙයි. ඒ අය පෘථග්ජන මට්ටමේ වුණාට අශ්‍රැතවත් මට්ටමේ නෙවෙයි. ඒ වුණාට ඒ අය සේඛ පුද්ගලයෝත් නෙවෙයි. එහෙම මට්ටමකින් තමයි මම කතා කළේ.

**උත්තරයඃ** එතන මගේ අදහස තියෙන්නේ දැන් සේඛ පුද්ගලයා කියන කොට අපට එකවරම හිතෙනවා මාර්ගඵල ලබලාමයි කියලා. මට ඊට වඩා ටිකක් වෙනස් අදහසක් තියෙන්නේ. සෝවාන්ඵලය ලබපු, එතනින් එහා අයට සේඛ පුද්ගලයා කියනවා. නමුත් සෝවාන් මාර්ගයේ ඉන්න අයත් වැටෙන්නේ සේඛ පුද්ගල ගණයට කියන එකයි මම දකින්නේ. මොකද සෝවාන් මාර්ගයට වැටුනා කියන්නේ අනිවාර්යයෙන්ම ධර්මයක් අහලා තේරුම්ගත්ත කෙනා. එයා තවම ඵලය ලබලා නැතිවෙන්න පුළුවන්. ඒ වුණාට පැහැදිලි දැක්මක්, සම්මාදිට්ඨිය ඇතිවෙලා තියෙනවා. දැන් සම්මාදිට්ඨිය ඇතිවුණා කිව්වාට ආර්යාෂ්ඨාංගික මාර්ගය සම්පූර්ණ වුණා කියන්නේ නැහැ. දහම අහලා තේරුම් ගැනීම තුළ එනවා නේ දැක්මක්. එයා ඒ එක්ක අනිත් මාර්ග අංගත් වැඩීම තුළින් තමයි සෝවාන් මට්ටමට එන්න තියෙන්නේ. එතකොට ඒ සෝවාන්ඵලය ලබනතාක් ඒ කෙනාට කියන්න වෙන්නේ, දැන් ධර්මයක් අහලා දැක්මක් ඇති කරගත්ත නම් ආර්ය මාර්ගයට වැටුනා කියන මට්ටමින් තමයි මම ගන්නේ. ඒ කියන්නේ එයාත් සේඛ පුද්ගලයෙක් ගණයට යන්නේ කියන එකයි මගේ අදහස. එතකොට මට ඔය ගැටළුව එන්නේ නැහැ. මොකද එතකොට එක්කෝ පෘථග්ජන එහෙම නැත්නම් සේඛ. ඔය දෙක අතර කොටසක් මට ඉතුරුවෙන්නේ නැහැ මට හිතෙන හැටියට නම්. ශ්‍රැතවත් පෘථග්ජන කිව්වත්, තවම පෘථග්ජනමයි.

**ප්‍රශ්නයඃ** මෙතන කතා කරන විදිහට සුතමය, චින්තාමය, භාවනාමය ප්‍රඥාවත් අපට එකතු කරගන්න පුළුවන්ද? මොකද රහතන්වහන්සේ කෙනෙක් භාවනාමය ප්‍රඥාවෙන් මේ දේවල් දැක්කහම එතැනින් එහාට **න මඤ්ඤති.** ඒ තත්වය ඇතිවෙන තුරු යම්කිසි කෙනෙක් චින්තාමය

වශයෙන් තේරුම් ගත්ත තාක් කල් මා **මඤ්ඤති** තත්වය එන්න පුළුවන් කියන එකත්, එවැනි කිසිම අදහසක් නැති අශ්‍රැතවත් පෘථග්ජනයා - මොනම විදිහකටවත් ධර්මය නො අසපු කෙනෙක් **මඤ්ඤති** කියන තත්වයේ ඉන්නවා කියන එක වගේ තමයි තේරෙන්නේ. ඒ ගැන කරුණාකර කරුණු පැහැදිලි කරන්න.

**උත්තරයඃ** සුතමය ඥානය, චින්තාමය ඥානය, භාවනාමය ඥානය ගත්තොත් සුතමය කියන්නේ අපි යමක් අහලා දැනගැනීම. අහලා කියන කොට දැන් අද කාලයේ කියවලා වෙන්නත් පුළුවන්. නැත්නම් වෙනත් විදිහකට ඒක මම දකින්නේ ත්‍රිපිටක ධර්මය ගැන කොහෙන් හරි දැනගන්නවා. අහලා වෙන්න පුළුවන්, කියවලා වෙන්න පුළුවන්, වෙන මොකක් හරි ආකාරයකට ත්‍රිපිටක ධර්මය ගැන අහන්න ලැබීම සුතමය ඥානය. හැබැයි ධර්මය ඇහුනාටම - දැන් අපිත් සමහර වෙලාවට බණ අහනවා. බණ අහන ගොඩක් අය හිටියාට බණ ගැන හිතන්නේ නැහැ මේ මොනවාද කිව්වේ කියලා. එතකොට ඇහුනා විතරයි. එක කනකින් අහලා අනිත් කනෙන් පිටකරනවා කියලා කියන්නේ. ඒක ගැන ඊට වඩා හිතන්නේ නැහැ. එතකොට චින්තාමය ඥානය පැත්තට යන්න විදිහක් නැහැ.

දැන් අහපු දෙය ගැන සමහරු ඊට වඩා නුවණින් විමසනවා. හිතනවා. ප්‍රශ්න කරනවා. මේ ධර්ම සාකච්චා කිරීමත් මම දකින්නේ චින්තාමය ඥානය වැඩීමක් ලෙස. අපි දැන් අහපු දෙයින් එහාට යනවා. මේ සූත්‍රය කවුරු හරි කියෙව්වා නම් සුතමය ඥානය තියෙනවා. මම කියන ටික අහගෙන හිටියත් - ආ, මේ සූත්‍රයේ මෙහෙම කියලා තියෙනවා නේද කියන අදහස ආවා. ඒක සුතමය ඥානය. ඒක බාහිරයෙන් දැනගත්තා. ඊළඟට අපි ඕක නුවණින් විමසනවා. මොකක්ද මේකෙන් අදහස් කරන්න ඇත්තේ, මොනවගේ දෙයක්ද? දැන් මේ යන්නේ චින්තාමය ඥානය පැත්තට. මම දකින්නේ මෙතන ඉන්න හැමෝම මේක ගැන හිතනවා නේ. හිතනවා, නුවණින් විමසනවා, එක එක අදහස් කියනවා. දැන් සුතමය ඥානය චින්තාමය ඥානය පැත්තට ගන්නවා. දැන් චින්තාමය ඥානයෙන් පැහැදිලි වුණහම තමයි ඊළඟට ප්‍රායෝගිකව මේක කරන්නේ කොහොමද කියලා නුවණක් එන්නේ. චින්තාමය ඥානයෙන් තමන්ට දැක්ම ඇති කරනවා.

මේ දෙයමයි **ජානං එස්සං යථාභූතං** කියලා කියන්නේ. යථාභූතය ගැන **ජානං** - දැනගත්තා. දැන් දැනගත්ත දෙය දැක්මක් කරගන්න ඕනේ. තමන්ගේ දැක්මක් වෙන්න ඕනේ. අහගත්තාටම, අරයා කියන හින්දා මෙහෙම වෙන්න ඇති කියන මට්ටම මදි. මේ ගැන මෙහෙම කියනවා, මේක මෙහෙම තමයිනේ කියලා එක පැත්තකින් තමන්ගේ තර්කය පැත්තෙන්

දගන්නවා. අපිට ගැලපෙනවා, මේක මෙහෙම වෙන්න පුළුවන් කියලා තමන්ගේ දැක්මක් කරගන්නවා. එතකොට ඒ තමන්ගේ දැක්ම ඇත්තද කියලා බලන විදිහ තමයි ඊළඟට කෘත්‍යය වෙන්නේ. නැත්නම් භාවනාව වෙන්නේ. එතකොට ප්‍රායෝගිකව ඒක කරද්දී ඒක ප්‍රත්‍යක්ෂ කරගන්න පුළුවන් මට්ටමකට එනවා. එතකොට ඒ භාවනාමය ඥානය තුළින් තමයි මාර්ගය වැඩීම කියන එක වෙන්නේ. දැන් මාර්ගයට වැටෙනවා කියන්නේ මාර්ගය මේකයි කියලා හඳුනාගන්නවා. ඒ හඳුනගත්ත මාර්ගය ඊළඟට වැඩීම තමයි භාවනා කරනවා කියන්නේ.

එතකොට භාවනාමය ඥානයට ගන්න පුළුවන්. භාවනාමය ඥානය රහත් වීමම වෙන්න ඕනේ නැහැ. ඊට ඉස්සෙල්ලා තියෙන ඵලත් භාවනාමය ඥානයෙන් එන්නේ. සෝවාන්ඵලය, සකෘදගාමීඵලය, ඒ කෘත්‍යය වැඩීම තුළ ඇතිවෙන එක එක අවස්ථා වල ප්‍රතිඵල කියලා හිතන්න පුළුවන්. එතකොට මේක ඒ පැත්තෙන් කිව්වත් සුතමය ඥානය, චින්තාමය ඥානය, භාවනාමය ඥානය කියන එකට යන්න තමයි මේ ඉන්නේ. එතකොට මට හිතෙනවා අපි දැන් මේ කරන්නේ චින්තාමය ඥානය වඩාගැනීමක්. මේක වඩාගත්ත කෙනාට ඊළඟට ටිකක් පැහැදිලියි සුතමය ඥානයට වඩා පැහැදිලි අවබෝධයක් එනවා, දැන් එහෙනම් මේ අවබෝධය ලබාගන්න මොනවාද කරන්න ඕනේ කියලා. මාර්ගය ගැන, නැත්නම් කෘත්‍යය ගැන පෙරට වඩා පැහැදිලි අවබෝධයක් එනවා.

**ප්‍රශ්නය:** සේඛ පුද්ගලයා යමක් තණ්හා, මාන, දිට්ඨි වශයෙන් ගන්නේම නැත්ද, නැත්නම් ගන්නවා නමුත් වැටහීමක් තියෙනවා අවිද්‍යාව නිසායි මේ දෙය වුණේ කියලා. මෙහෙම කිව්වොත් හරිද?

**උත්තරය:** සේඛ පුද්ගලයා කියන්නේ දහමක් අහලා තේරුම් ගත්තා විතරයි. තවම මාර්ගය වැඩිලා නැහැ. එතකොට එයාගේ කෙලෙස් තවම තියෙනවා. ඒ කෙලෙස් ටිකෙන් ටික දුරු කිරීම තමයි අපි ඔය මාර්ගඵල විදිහට ගන්නේ. සංයෝජන පැත්තෙන් ගත්තොත් දස-සංයෝජන නේ කඩ කඩා යන්නේ. එතකොට සෝවාන් අවස්ථාවේ දී සංයෝජන තුනක් කැඩෙනවා - සක්කායදිට්ඨි, විචිකිච්ඡා, සීලබ්බතපරාමාස. ඊටපස්සේ සකෘදගාමී වෙනකොට කාමරාග, පටිඝ තුනීවීමක් වෙනවා. අනාගාමී වෙනකොට කාමරාග, පටිඝ සම්පූර්ණයෙන් දුරුවෙනවා. රහත් වෙනකොට තමයි රූප රාග, අරූප රාග, මාන, උද්ධච්ච, අවිජ්ජා සම්පූර්ණයෙන් දුරුවෙන්නේ. එතකොට ඒ හැම අවස්ථාවේදීම යම්කිසි මට්ටමක කෙලෙස් තියෙනවා. ඒ එක එක මට්ටමේ කෙලෙස් අනුව, ඒ කෙලෙස් වලට අදාළව මඤ්ඤණාවීමක් තියෙනවා. එතකොට මඤ්ඤණාවීම නැත්තේ රහතන්වහන්සේට විතරයි. අවිද්‍යාව

සම්පූර්ණයෙන් දුරුවුණු මට්ටමක දී විතරයි මඤ්ඤණා කිරීමක් යෙදෙන්නේ නැහැ කියන්න පුළුවන්. එතැනින් මෙහා - එක එක මට්ටමේ වෙන්න පුළුවන් - මඤ්ඤණා කිරීම සිද්ධවෙනවා. එතකොට ඒ මඤ්ඤණා කිරීමේ දී යෙදෙන කෙලෙස් මනස කොච්චර දියුණු වෙලාද, මොන කෙලෙස්ද කැඩිලා තියෙන්නේ, කොයි කෙලෙස්ද යෙදෙන්නේ කියන ඒවා මත වෙනස් වෙනවා.

කලින් සඳහන් කළ විදිහට මගේ අදහස ඔය පෘථග්ජන මට්ටම - අශ්‍රැතවත් පෘථග්ජන කියන එකෙන් ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා කියන මට්ටමට පැණීම තමයි සේඛ පුද්ගලයා බවට පත්වීම කියන්නේ. ඒ කියන්නේ ධර්මය අහලා නුවණින් මෙනෙහි කරලා මේක ගැන අවබෝධයක් ඇතිවීම තමයි සේඛ පුද්ගල මට්ටම කියන්නේ. එතකොට දැන් අපි උත්සාහ කරන්න ඕනේ පෘථග්ජන මට්ටමේ ඉඳන් සේඛ පුද්ගලභාවයට වත් පත්වෙන්න. එහෙම වුණොත් තමයි දහමෙන් ප්‍රයෝජනයක් ගත්තා වෙන්නේ. එතකොට ඒ සඳහා තමයි අපි මේ සාකච්ඡා වුණත් උදව් කරගන්න ඕනේ. එතකොට පෘථග්ජන පුද්ගලයාගෙයි සේඛ පුද්ගලයාගෙයි ප්‍රධාන වෙනස්කමක් විදිහට මම දකින්නේ පෘථග්ජනයාට හැකියාවක් නැහැ අඩුගණනේ මේ කෙලේසයක්, වරැද්දක් කියලා වත් දකින්න. මේකෙන් මිදුණු මට්ටමක් තියෙනවා කියන අවබෝධයක් ඇත්තේම නැහැ. සේඛ පුද්ගලයාට අවබෝධය තියෙනවා මේ මට්ටමේ කෙලෙස් මගේ යෙදුනාට, මේ කෙලෙසුන් දුරු කරපු රහතන්වහන්සේගේ මෙහෙම මේවා යෙදෙන්නේ නැහැ. එහෙම නම් එතෙන්ට යන්න මාර්ගයක් මේ බුදුරජාණන්වහන්සේ දේශනා කරලා තියෙනවා කියලා දැක්මක් එනවා. දැන් මේ කෙලෙස් යෙදීම අපව දුකට පත්කරලා තියෙනවා. එතකොට දුකත් පෙනෙනවා, දුක්ඛ සමුදයත් පෙනෙනවා. දුක්ඛ නිරෝධයත් පෙනෙනවා රහතන්වහන්සේ ගැන අනුමාන ඥානයෙන්. දැන් නිරෝධය දැකලා නෙවෙයි, ඒ වුණාට නුවණක් තියෙනවා මේක යෙදෙන්නේ නැති මට්ටමක් තියෙනවා කියලා. මේ සමුදය යෙදෙන හින්ද මෙහෙම තිබුණාට, සමුදය දුරුකරපු කෙනාගේ මෙහෙම යෙදෙන්නේ නැහැ. එහෙනම් අන්න ඒ සඳහා මාර්ගයක් තියෙනවා. ඒ මාර්ගය වඩන්න උත්සාහයක් කරන්න ඔන්න දැන් සුදුසුකම් ලබනවා. මොකද ඒ ගැන අවබෝධයක්, සත්‍යය ඥානයක් ආවා කියන එක.

මේ මඤ්ඤණා කිරීමේ ගැඹුරුම තැනකට අපි ගියේ - පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කරන ගතිය. මීට කලින් අපි ඕවාට වඩා දේවල් මඤ්ඤණා කරනවා. අපි පුද්ගලයෙක් ඉන්නවා කියලා හිතනවා, ශරීරයක් තියෙනවා කියලා හිතනවා. දැන් ඒවායින් මිදෙන්න අපි එක එක භාවනා කරනවා. උදහරණයක් විදිහට ශරීරය කියන එකටත් එහා ගිය එකක් තමයි

ස්ත්‍රියක්, පුරුෂයෙක් - අපට ඇලෙන්න හරි ගැටෙන්න හරි කෙනෙක් ඉන්නවා කියන මට්ටම. එතකොට ඒ මට්ටමින් මිදෙන්න පුළුවන් ඕවා ඔක්කෝම ශරීර කියලා දැක්කහම. ඒ ශරීර මනුෂ්‍ය ශරීර. එතකොට අපි සාමාන්‍යයෙන් කරන මූලික භාවනා වලිනුත් අපේ මඤ්ඤණා කරන ගතියේ එක එක මට්ටමේ කෙලෙස් කැඩීමක් තියෙනවා. ස්ත්‍රියක්, පුරුෂයෙක් කියන මඤ්ඤණාව කඩන්න මනුෂ්‍යයෙක් කියලා බලලා පුළුවන්. මනුෂ්‍යයෙක් කියන මට්ටමට එන්න පුළුවන්. ඊළඟට මනුෂ්‍යයෙක් කියන එක මනුෂ්‍ය ශරීරය කියන විදිහට එතකොට මඤ්ඤණා වෙනවා. ඊළඟට මනුෂ්‍ය ශරීරයක් කියන මඤ්ඤණාවෙන් ටිකක් මිදෙන්න විදිහක් තමයි අපි ඕක දෙතිස් කුණප වලින් හැදිලා තියෙන්නේ කියලා බලන එක. ඒ කියන්නේ කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර වගේ කොටස් ගොඩක් නේ ඔතන තියෙන්නේ, ඔතන මනුෂ්‍යයෙක් ඉන්නේ කොහොමද? කියලා ඔය විදිහට වෙන් කරලා බලලා මනුෂ්‍ය සංඥව ටිකක් කඩාගෙන ඊළඟට කොටස් ටිකකට යනවා. ඊළඟට කෙස්, ලොම්, නිය, දත් වගේ කොටස් ටිකත් නැවත අපට වෙන් කරන්න පුළුවන් මේවායේ පඨවිය වැඩි ඒවා තියෙනවා, ආපෝ, තේජෝ, වායෝ වැඩි ඒවා - ඒ හතරෙන්. ඊළඟට එනවා ඒ කෙස්, ලොම්, නිය, දත් කිව්වාට ඕවාත් හැදිලා තියෙන්නේ ධාතු සංකලනයකින් නේ. එතකොට ඒ ධාතු පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන හතරම යෙදුන රූප කලාප ගොඩකින් නේ හැදිලා තියෙන්නේ. එතකොට පඨවිය වැඩි රූප කලාප වලින් හැදුන ඒවාට අපි තද ගතිය වැඩි ඒවා කියනවා. කෙස්, ලොම්, නිය, දත් වගේ ඒවා. ඊළඟට දියර ජාති වලට අපි කියනවා ඒවා ආපෝ ස්වභාවය වැඩි රූප කලාප වලින් හැදිලා කියලා.

දැන් එහෙම ඒ මට්ටමකින් බලාගෙන යන්නත් පුළුවන්. එහෙම ගිහිනුත් ඊළඟට අපට ඉතුරු වෙනවා සතර මහා ධාතුව තියෙනවා කියලා මඤ්ඤණා කරන මට්ටමක්. එතකොට ඒ සතර මහා ධාතුවත් වෙන් වෙන් වශයෙන් මඤ්ඤණා කිරීමක් තියෙනවා. ඒක තමයි මේ පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කිරීම, ආපෝ වල ආපෝ කියලා මඤ්ඤණා කිරීම, තේජෝ වල තේජෝ විදිහට මඤ්ඤණා කිරීම, වායෝ වල වායෝ විදිහට මඤ්ඤණා කිරීම.

අපි මෙතන දී සාකච්ඡා කරගෙන එන්නේ පෘතග්ජන මට්ටමේ ඉඳලා කොහොමද එතකොට මේ ආර්ය මාර්ගයට වැටෙන්නේ. ඒ වැටෙන්න මොන වගේ දැක්මක් ඇති කරගන්න ඕනේද කියන අදහසක් ගන්න තමයි අපි මේ මූල පරියාය සූත්‍රයේ අශ්‍රැතවත් පෘථග්ජනයා ලෝකය දකින හැටි කොහොමද, ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා ලෝකය දකින හැටි කොහොමද, රහතන්වහන්සේ ලෝකය දකින හැටි කොහොමද කියලා අදහසක් ගන්න

තමයි මෙතන මේ එක එක කොටස් දකින හැටි බෙදලා අවස්ථා තුනකට වෙන් කරලා ගන්නේ.

එතන දී පෘථග්ජනයා **මඤ්ඤති**. සේඛ පුද්ගලයා **මා මඤ්ඤති**, රහතන්වහන්සේ **න මඤ්ඤති** කියනවා. මෙතන දී අපි **මා මඤ්ඤති** කියන එකේ තේරුම මොකක්ද කියලා තමයි කතා කරගෙන ආවේ. එතන මම මතු කරපු අදහස තමයි පෘථග්ජනයා මඤ්ඤණා කරනවා. ඒ කියන්නේ අවිද්‍යාවෙන්ම ගන්නවා ඇත්ත ඇතිහැටි ගැන කිසිම අදහසක් නැහැ. ඒ **සඤ්ජානාති** කියන මට්ටම. ඒ කියන්නේ සංඥාව එහෙමම විශ්වාස කරනවා.

මම තව පැත්තකින් බුදුරජාණන්වහන්සේ ගත්ත උපමාවකුත් මතක් කරන්නම්. සංඥාව මිරිඟුවට උපමා කළා නේ. එතකොට මිරිඟුව මිරිඟුව විදිහට දකින්න මට්ටමක් නැහැ. මිරිඟුව පෙනෙන කොටම ජලය කියලා භාරගන්නවා. එතකොට නිකම් පඨවිය කියලා සංඥාවක් එන කොටම, 'ආ පඨවිය තමයි' කියලා භාරගන්නවා. ඒ කියන්නේ මේක එළියේ තියෙනවා කියලා භාරගන්න මට්ටමක් තියෙනවා. මේ අදහසම තව විදිහකට ගත්තොත් අර වතුරට එබෙන බල්ලා 'අන්න බල්ලෙක් වතුරේ ඉන්නවා'මයි කියලා භාරගන්නවා. ඒ අවස්ථා තුනම මම දකින්නේ ඔය පෘතග්ජන ස්වභාවය විස්තර කරන්න දීපු ඒවා හැටියටයි.

එතකොට රහතන්වහන්සේ කියන්නේ සංඥාව මිරිඟුවක් කියලා දන්නවා. ආයේ වතුරක් කොහෙත්ම පිහිටුවන්නේ නැහැ. ඒකට දෙයක් පිහිටුවන්නේ නැහැ. හැබැයි සේඛ පුද්ගලයා වතුර වගේ කියලා හිතන මට්ටමක ඉන්නවා, හැබැයි එයා දන්නවා මේ මගේ කෙලෙස් තියෙන හින්ද අවිද්‍යාවටමයි මෙහෙම පෙනෙන්නේ, රහතන්වහන්සේගේ මේ කෙලෙස් නො යෙදෙන හින්ද මෙහෙම දෙයක් පිහිටන්නේ නැහැ කියන එක. ඔන්න ඔය කරුණු තුන අපි මේ කියන එක එකට දමන්න වෙනවා. පඨවියට දමන්න වෙනවා, ආපෝ, තේජෝ, වායෝ වලට දමන්න වෙනවා.

ඊළඟට ඕක පොදුවේ ගත්තහම මේ තුන් භූමියටම ඕක යොදන්න වෙනවා. පෘථග්ජනයාට මෙහෙම පෙනෙනවා, රහතන්වහන්සේට මෙහෙම පිහිටන්නේ නැහැ කියලා. එතකොට ඔන්න ඔය දෙපැත්ත දැක්කොත් පෘතග්ජන මට්ටමේ ඉඳන් රහතන්වහන්සේගේ මට්ටමට යන්න මාර්ගයක් උපදවා ගන්න පුළුවන් කියන එක.

**ප්‍රශ්නය:** මෙහෙම කිව්වොත් හරිද? සේඛ පුද්ගලයා මිනිස් ලොවට අටවෙනි වාරයකට වැඩිය පැමිණෙන්නේ නැහැ කිව්වොත් නිවැරදිද කියලා පැහැදිලි කරන්න.

**උත්තරය:** සේඛ පුද්ගලයා අටවෙනි උපතක් ලබන්නේ නැහැ කියන එකෙන් අදහස් කරන්නේ සෝවාන් පුද්ගලයා ද කියන එක නේ තව විදිහකට. සෝවාන් පුද්ගලයා තමයි **න තෙ භවං අට්ඨමමාදියන්ති**. අටවෙනි උපතක් නැහැ කියන මට්ටම. දැන් එහෙම මතයක් තියෙනවා. හැබැයි මට ඊට වඩා ටිකක් වෙනස් මතයක් තියෙන්නේ පෘතග්ජනභාවයෙන් මිදීමම සේඛ පුද්ගලභාවය කියන අර්ථයෙන් තමයි මම ගන්නේ. එතන මම සෝවාන් මාර්ගය කියන කොටසකුත් ගන්නවා ඵලයට අමතරව, ඒක තව ටිකක් විස්තර කළොත්. මොකද සමහරු ඔය මාර්ගය චිත්තක්ෂණයක් විතරයි, ඊටපස්සේ ඵලය කියන මට්ටමකින් ගන්නවා. ඒ අර්ථයෙන් නෙවෙයි මම තේරුම් අරන් තියෙන්නේ. මාර්ගයේ ඉන්න කොටසකුත් ඉන්නවා කියන මට්ටමෙන් තමයි මම මේ පැහැදිලි කිරීම කරන්නේ. එතකොට ඒ මාර්ගයට වැටීම තමයි ධර්මයක් අහලා නුවණින් විමසීම තුළින් ලැබෙන්නේ.

ඉස්සෙල්ලා අපි ඕක තව පැත්තකින් කතා කළා සුතමය ඥනය, චින්තාමය ඥනය කියන එක. අන්න ඒ දෙක ලබපු කෙනා අර පෘතග්ජනභාවයෙන් මිදෙනවා. එතකොට අශ්‍රැතවත් පෘතග්ජන ස්වභාවයේ ඉඳලා ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවක මට්ටමට වැටෙනවා. ඒ වැටීම කෙලින්ම සෝවාන් වුණා කියනවාට වඩා මම කියන්න කැමතියි ආර්ය මාර්ගයට වැටුනා කියලා. නැත්නම් සේඛ පුද්ගලයෙක් බවට පත්වුණා. එතකොට එයා තවදුරටත් මාර්ගය වඩාගෙන යෑම තුළ, ඒක සමහරෙකුට ක්ෂණිකව වෙන්න පුළුවන්, සමහරෙකුට ටික කාලයක් ගතවෙනවා වෙන්නත් පුළුවන් සෝවාන් ඵලය දක්වා.

ඒ කොහොම වෙතත්, මම අදහස් කරන්නේ පෘතග්ජනභාවයෙන් මිදුනා කියන මට්ටමයි, ආර්ය මාර්ගයට වැටුනා කියන මට්ටමයි, ඒ දෙක එකක් කියන එක. එතකොට ආර්ය මාර්ගයට වැටුනා කියන මට්ටම හඳුන්වන්න තියෙන නමක් විදිහටයි මම දකින්නේ සේඛ පුද්ගලයා කියන එක. හැබැයි තවම රහත්වෙලා නැහැ. රහත්වෙන්න කලින් ආර්ය මාර්ගයේ ඉන්න කෙනා. එතකොට අර මගඵල කියන කොටස් අටට වැටෙනවා. එතකොට අටවෙනි උපතක් ලබනවාද නැත්ද කියන එක අපිට හිතාගන්න තමයි වෙන්නේ. මොකද ඔතන තව මතයක් තියෙනවා සෝවාන් මාර්ගයට

වැටුන කෙනා සෝවාන් නොවී මැරෙන්නේ නැහැ කියලා[10]. ඉතින් ඒ පැත්තෙන් ගත්තොත් නම් අටවෙනි උපතක් ලබන්නේ නැහැ කියන්නත් පුළුවන්.

**ප්‍රශ්නයඃ** අපට දැන් ධර්ම දැනුම තියෙනවා. ප්‍රායෝගිකව ඒක අපේ ජීවිතයට ළඟා කරගන්නේ කොහොමද? කොතැනින්ද අපි මේ පාර හරවා ගන්න ඕනේ?

**උත්තරයඃ** එතෙන්ට යන්න තමයි අපි හැමෝම උත්සාහ කරන්නේ. මාර්ගය මොකක්ද කියලා පැහැදිලිව තේරුම් අරගෙන මාර්ගය වඩන්න ඕනේ. මම ඊට කලින් පොඩි නිවැරදි කිරීමක් කරන්නම්. ඔබතුමා සඳහන් කළා මම සියයට සියයක් හරියට කියනවා වගේ අදහසක්. එහෙමම ගන්න එපා. මම යමක් කියන්නේ මගේ කෙලෙස් මට්ටමට වැටහෙන දෙයක්. එතකොට අපි අමතක කරන්න හොඳ නැහැ රහත් වෙනකම්ම අපේ කෙලෙස් බලපානවා. එතකොට අපි බුදුරජාණන්වහන්සේ දේශනා කරපු කාලාමසූත්‍රයම ආදර්ශයට අරගෙන, දැන් මෙහෙම අදහසක් තියෙනවා. මේක තව දුරටත් හරිද වැරදිද කියලා හොයලා බලලා ඒක පිළිගන්න එක තම තමන්ගේ වැඩක්. කිසි වෙලාවක මම කියපු නිසා හරි කියලා ගන්න එපා. දැන් කාට හරි මෙතන සඳහන් වෙන දෙයක් ත්‍රිපිටකයේ යම්කිසි තැනක මෙන්න මෙතන මෙහෙම තියෙනවා කියලා පෙන්නන්න පුළුවන් නම්, ඉදිරියට හරි ඒක පෙන්නන්න. එතකොට අපේ වරදක්, අඩුවක් තියෙනවා නම් අපටත් අවස්ථාවක් වෙනවා ඒක නිවැරදි කරගන්න. විශේෂයෙන් ඉස්සෙල්ලා අර සේඛ පුද්ගලයා ගැන සඳහන් වුණ තැන දී, ත්‍රිපිටකයේ යම්කිසි තැනක මෙහෙම තියෙනවා කියලා හම්බවුණොත් ඒක අපට දැනුම් දෙන්න. එතකොට අපට ඒ දැනුමත් එකතු කරලා තව ඉදිරියට සාකච්ඡා කරන්න පුළුවන්.

අපි දැන් උත්සාහ කරමු මෙතැනින් තව ටිකක් ඉදිරියට යන්න. ධාතුව ගැන මඤ්ඤණා කරන විධි - අපි පඨවි, ආපෝ, තේජෝ, වායෝ සතර මහා ධාතුව ගැන මුලින්ම දැනගන්න ඕනේ පෘථග්ජනයා තමයි **මඤ්ඤති**. රහතන්වහන්සේ **න මඤ්ඤති**. එතකොට සේඛ පුද්ගලයා දන්නවා පෘථග්ජනයාට මඤ්ඤණා වුණාට රහතන්වහන්සේට එහෙම මඤ්ඤණා වෙන්නේ නැහැ. රහතන්වහන්සේට පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා වීමක් නැහැ. පෘථග්ජනයාට තියෙනවා.

---

[10] චක්ඛු සූත්‍රය (සංයුත්ත නිකාය>ඛන්ධ වර්ගය>ඔක්කන්ති සංයුක්තය)

ඊළඟට අපි තේරුම් ගන්න ඕනේ ඒ මඤ්ඤණා වුණා කියලා දැනගන්නේ කොහොමද? එතකොට අපි ඉන්න මට්ටම අපට හඳුනාගන්න පුළුවන්. අපි පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කළා ද? කළා නම් ඒ මඤ්ඤණා කරන විධි හතරක් ධර්මයේ සඳහන් වෙනවා. ඇත්තටම මේකේම අට්ඨකථාවේ තමයි මේක සඳහන් වෙන්නේ. මඤ්ඤණා කරන ක්‍රම හතරක්. ඒ ක්‍රම හතර තමයි මුලින් කිව්ව ආකාරයට **සම්මුති** විදිහට ගන්න පුළුවන්. දැන් මම පඨවිය උදහරණයක් විදිහට ගත්තොත් - පඨවියේ සම්මුති පඨවිය කියලා හිතන විදිහක් තියෙනවා. මඤ්ඤණා කරන විදිහක් තියෙනවා. ඊළඟට **ලක්ඛණ** පඨවිය කියලා මඤ්ඤණා කරන විදිහක් තියෙනවා. ඊළඟට **ආරම්මණ** පඨවිය කියලා මඤ්ඤණා කිරීමක් තියෙනවා. හතරවෙනි ආකාරය තමයි **සසම්භාර** කියලා මඤ්ඤණා කිරීමක් තියෙනවා.

ඔය හතරත් හඳුනගත්තහම අපට බලාගන්න පුළුවන් දැන් අපි මඤ්ඤණා කරලා ද? එතකොට රහතන්වහන්සේ මඤ්ඤණා කරන්නේ නැහැ. එහෙම නම් ඒ මට්ටමට එන්න අපට දර්ශනයක්, මාර්ගයක් උපද්දවා ගන්න පුළුවන් වෙනවා. ඒ හින්ද මේ හතර නැවතත් මතක් කරගනිමු. **සම්මුති** පඨවි කියන්නේ මේ සම්මුතියට අනුව - ඒ තමයි මේ පොළොව පඨවි කියලා හිතනවා. පෘථිවිය කියලාත් ඔය සඳහන් වෙන්නේ. නැත්නම් පස් කියලා කියනවා. පස්, දිය, ගිනි, සුළං කියලා සතර ආකාරයකට මේ සතර ධාතුව විස්තර කරන ක්‍රමයක් තියෙනවා. ඒ විදිහට හිතුවා නම් එතකොට තේරුම් ගන්න ඒ එක ආකාරයක මඤ්ඤණා කිරීමක්. පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කරනවා.

ඊළඟට දෙවෙනි ආකාරය තමයි **ලක්ඛණ** පඨවිය කියලා මඤ්ඤණා කරනවා. මම හිතන්නේ අපි හුඟ දෙනෙක් ඉන්නේ මේ **ලක්ඛණ** මට්ටමේ. සම්මුතියේ ඉඳලා දැන් ලක්ඛණ පැත්තට ඇවිල්ලා. ඒක හිතේ දියුණුවක් - ඒ කියන්නේ ධර්මාවබෝධයක්. මොකද මුලින් අපි විශ්වාස කළේ ඔය පඨවිය තියෙන්නේ බාහිර වස්තුවේ කියලා නේ. දැන් අදහසක් එනවා මේසයේ පඨවිය තියෙනවා, පඨවිය කියලා දෙයක් ඒකේ වැඩිපුර තියෙනවා, තද ස්වභාවයක්, හැබැයි දැන් අදහසක් එනවා ඒක මේසයට අයිති දෙයක් නෙවෙයි, අපි මේසය ඇල්ලුවහම අපට දැනෙන ගතියක් කියලා. තද ගතිය අපි කියනවා මිසක් මේසය දන්නේ නැහැ මේසය තදයි කියලා. එතකොට මේ විඤ්ඤණයට අහුවෙන ගතියක්. අපේ ආයතන භාවිතා කරලා දැනගන්න ස්වභාවයක් මේක. විශේෂයෙන් අපේ කායායතනයට දැනෙන ගතියක් කියලා. එතකොට ඒ පඨවි ගතිය. දැන් පඨවිය දෙයක් විදිහට නෙවෙයි, පඨවිය ගතියක් බවට පත්වෙනවා. ඒ කියන්නේ ලක්ෂණයක්. ඒකයි ලක්ඛණ කියන්නේ. එතකොට පඨවි,

ආපෝ, තේජෝ, වායෝ කියන ඒවා ගති ස්වභාවයක්, එහෙම නැත්නම් හඳුනගන්න පුළුවන් ලක්ෂණ ටිකක්. එතකොට දැන් පෙනෙන්නේ සම්මුති පඨවි පැත්ත නෙවෙයි ලක්ඛණ පඨවිය. සම්මුති පඨවි කියන කොට අර හතර එකතුවෙලා මේවා හැදිලා තියෙනවා, දවසක ඕවා වෙන්වෙලා යනවා කියනවා. අපට කාලයක් අහන්න ලැබුණා මේ කෙස් පොළොවට පස්වෙලා යනවා, දියර ජාති ටික වතුරට එකතුවෙලා යනවා, රස්නය උෂ්ණයට එකතුවෙලා යනවා ඔය වගේ අදහස් ටිකක්. එහෙම විස්තර කිරීමකුත් අහන්න ලැබුණ කාලයක් තිබුණා. හැබැයි දැන් මම හිතනවා ඊට වඩා කට්ටිය තේරුම් අරන් තියෙනවා එහෙම ස්වභාවයකින් මේක හොයන්න බැහැ, මේ වටේ තියෙන ඒවා එකතුවෙලා හැදිලා ආපහු ඕවා විසිරිලා යනවා කියන කතාවක් නෙවෙයි මෙතන තියෙන්නේ. එහෙම මතයක් තියෙනවා හින්දු ආගමේ. ඊට වඩා වෙනස් මතයක් බුදුරජාණන්වහන්සේ ඉදිරිපත් කරන්නේ මේකේ යථාභූත ස්වභාවය කියන කොට.

එතකොට මේවා ලක්ඛණ මට්ටමෙන්, පඨවි, ආපෝ, තේජෝ, වායෝ කිව්වාට ඕවා වෙන වෙනම පවතින ඒවා නෙවෙයි, ඕවා වෙන් කරන්නත් බැහැ, හතරම එකට තියෙන ස්වභාවයක්, එකක් ගැන කතා කළොත් අනිත් තුන ගැනත් කතා කරන්න වෙනවා. ඒවායින් තොරව මේ ගැන කතා කරන්න බැහැ. එතකොට ඒකේ අනිත් පැත්තට තමයි මේවා ලක්ෂණ ටිකක් විතරයි. ස්වභාව ටිකක් විතරයි කියන මට්ටම තමයි ඔය ලක්ඛණ පඨවි කියන එක. දැන් මම ජාති දෙකක් විස්තර කළා - **සම්මුති පඨවි, ලක්ඛණ පඨවි** කියලා.

ඊළඟට **ආරම්මණ** පඨවි කියන කොට අපේ හිතේ අරමුණු කරන ගතියක් කියවෙනවා. එක පැත්තකින් කසින භාවනා කරන අය පඨවි කසිනයක් එළියේ හදගෙන ඒක දිහා බලලා බලලා අන්තිමට ඇස් පියාගෙනත් මේක පෙනෙනවා. ඊළඟට පඨවි පඨවි කියලා අරමුණු වෙන්නේ මේ ආරම්මණයක්. එතකොට එළියේ තියෙන දෙයක් නෙවෙයි, හිතෙන්ම පෙන්නන, අරමුණු කරන ගතියක්. ඕක මම තව විදිහකට විස්තර කළා, දැන් ඇත ගින්දර වගේ පෙනෙන කොට අපට හිතෙනවා එතන හරි රස්නේ ඇති කියලා. ඒ වුණාට රස්නයක් දැන් ඇහැට දැනුනේ නැහැ නේ. එතකොට එතනත් පෙනෙනවා තේජෝ ගතිය අරමුණු කරලායි මේ කියලා තියෙන්නේ, දැනිලා නෙවෙයි. ඒකෙන් තේරුම් ගන්න ආරම්මණ පඨවි, ආරම්මණ තේජෝ කියන එක. ඒ තුන්වෙනි ආකාරය ආරම්මණ කරන ගතිය.

හතරවෙනි ආකාරය තමයි **සසම්භාර** කියන එක. **සසම්භාර** කියන්නේ අපි දකින දෙය භාරගන්න බාහිරයේ තියෙනවා පඨවි, ආපෝ, තේජෝ, වායෝ. උදාහරණයක් විදිහට අපි ගහක් දකින කොට ගහ තියෙන තැන සතර මහා ධාතුව තියෙනවා. ඒ සතර මහා ධාතුවෙන් තමයි මෙහෙම වර්ණයක් පෙන්නන්නේ. ඕක අපි තව විදිහකට පැහැදිලි කළා දූන් ටෝච් එකක් හිස් ආකාශයට ගැහුවොත් මොකුත් පෙනෙන්නේ නැහැ. හැබැයි මොනවා හරි ඒ අතරට යෙදුනොත් තමයි එළිය තියෙනවා කියලාවත් දැනගන්න පුළුවන්. එතකොට ඒක භාරගන්න සතර මහා ධාතු ස්වභාවයක් තියෙනවා. මෙතන දී පැහැදිලිවම බාහිරයේ තියෙන සතර මහා ධාතු ස්වභාවයක් ගැන කතා කරනවා. අන්න එහෙම හිතෙන ගතියක් තියෙන කොට ඒක **සසම්භාර** මට්ටමේ, සසම්භාර පඨවි, සසම්භාර ආපෝ, සසම්භාර තේජෝ, සසම්භාර වායෝ කියන මට්ටමක්.

එතකොට මේක ගැඹුරින් තේරුම් ගන්න ඕනේ ඔය හතරෙන් කොයි එක ගත්තත් පඨවියේ පඨවිය කියලා මඤ්ඤණා කරලා නේද, රහතන්වහන්සේ අවිද්‍යාව දුරු කළ නිසා එහෙම මඤ්ඤණා වෙන්නේ නැහැ නේද කියන එක. එහෙම නම් අපි මේ මඤ්ඤණා කරන ගතිය අපේ අවිද්‍යාව නිසාමයි, මේ අවිද්‍යාවෙන් මිදෙන්න මොකක්ද කරන්න ඕනේ කියලා ඔන්න ඔය හතර ගැන අවබෝධයක් ලබාගැනීම වැදගත් වෙනවා කියලා මම හිතනවා. ඒ ගැන අදහස්, ගැටළු තියෙනවා නම් ඉදිරිපත් කරන්න තව සාකච්ඡා කරන්න.

**ප්‍රශ්නයඃ** සසම්භාර පඨවිය කියන එක උදාහරණයක් අරගෙන තව ටිකක් පැහැදිලි කරන්න.

**උත්තරයඃ** සසම්භාර කියන්නේ අපි දකින දෙය භාරගන්න තැනක් තියෙනවා. ඇහෙන් පෙනෙන කොට අපි බිත්තිය දිහා බැලුවහම බිත්තියේ මොකක් හරි පාටක් තියෙනවා කියලා හිතමු. සුදු හෝ කහ පාට බිත්තියක් තියෙනවා කියලා හිතමු. දූන් කහ පාට රඳවා ගන්න එතන සතර මහා ධාතුව තියෙන්න ඕනේ. ඒ කියන්නේ බිත්තිය තියෙන තැන තමයි මේ පාට තියෙන්නේ කියලා අදහසක් එනවා නේ. පාටට නිකම් තියෙන්න බැහැ නේ. අපි අභිධර්මය පැත්තෙනුත් අහලා තියෙනවා වර්ණය කියන්නේ උපාදය රූපයක් විතරයි, උපාදය රූපයට තියෙන්න බැහැ සතර මහා ධාතුවෙන් තොරව කියලා. එතකොට පඨවි, ආපෝ, තේජෝ, වායෝ තියෙන්නම ඕනේ කියලා. ඒවා තියෙන්නේ කොහේද කියලා තැනක් අපට සිහියට එනවා. මේ අවකාශයේ යම්කිසි දුරක පිහිටි තැනක් තියෙනවා, අන්න එතන තියෙන සතර මහා ධාතු ටිකක් තමයි මේක භාරගන්නෙ -

දැන් පාට භාරගන්න මෙන්න මේ සතර මහා ධාතුව මෙතන තියෙනවා කියලා හිතෙනවා.

තව විදියකට කිව්වොත් එළියේ සතර මහා ධාතුව තියෙනවා. සතර මහා ධාතුව තියෙන තැනක තමයි අපේ ඇහෙන් අපට මෙහෙම පෙන්නන්නේ කියලා එහෙම පැහැදිලි කිරීමකුත් තියෙනවා නේ. මම හිතන්නේ ඒ මට්ටමෙත් හුඟක් අය ඉන්නවා. එතකොට ඔය හැම දැක්මකම මතක තියාගන්න යම්කිසි කෙලෙස් දුරුවීමක් තියෙනවා. ඒ නිසා ඒ දැක්ම වැරදියිම කියනවා නෙවෙයි. උදාහරණයක් විදිහට අපි ශරීරය කියන එක ශරීරය නෙවෙයි, ඔතන තියෙන්නේ කෙස්, ලොම්, නිය, දත් වගේ කොටස් ගොඩක් කියලා දකිනවා නේ. ඒ දැකීමෙන් කැඩෙන කෙලෙස් ප්‍රමාණයක් තියෙනවා. මෙතන හැබැයි අපි අවබෝධ කරගන්න ඕනේ යම්කිසි කෙලෙස් ප්‍රමාණයක් කැඩුනාට තවම ඇත්තම ඇත්ත දැකලාත් නැහැ. ඒ කියන්නේ යථාභූත ඥානය නෙවෙයි. එතකොට ලෝකෝත්තර දැක්මට එනකොට අපි එකින් එකට පතින දෘෂ්ටි ඔක්කෝම කැඩෙන පැත්තක් තියෙනවා.

ඔබතුමා ඉස්සෙල්ලා ඇහුවේ රෝස මලක කථාවක්. එළියේ රෝස මලක් තියෙනවා කියලා අපි දැනගන්න කොට ඔය රෝස පාට තියෙන්නේ කොහේද? ඔන්න එතන දී හිතෙනවා ඒ මල හැදිලා තියෙන පඨවි, ආපෝ, තේජෝ, වායෝ වල නේද ඔය රෝස පාට තියෙන්නේ කියලා. දැන් මේ තමයි අපට හිතෙන මූලික මට්ටම. ඒ මට්ටමෙනුත් කැඩෙන කෙලෙස් ප්‍රමාණයක් තියෙනවා. ඒ හින්ද ඒක වැරදියිම කියනවා නෙවෙයි. හැබැයි ඔතැනින් එහාට ගිය තව ඇත්තකුත් තියෙනවා කියන එකත් අමතක කරන්න එපා. මොකද තවම අපි ලෝකයට අහුවෙලායි ඕක දකින්නේ.

ඒක තව විදිහකට පෙන්නුවොත් අපි අර එළියේ තියෙන රෝස මල දැන් කඩලා බිඳලා බලන්නේ. 'ආ, එතන සතර මහා ධාතු තියෙනවා. එතකොට ඒ නිසා තමයි මේ රතු පාටක් පෙනිලා තියෙන්නේ. එතන තියෙන සතර මහා ධාතුවයි මෙහේ තියෙන ඇහැයි, ඔය ඔක්කෝම එකතු වෙලා අපට රෝස පාටක් පෙන්නලා තියෙන්නේ කියන මට්ටමක්. අපි දැන් රෝස මල කඩාගෙන කඩාගෙන යනවා - කොහේ තියෙන රෝස මල කියලා හිතාගෙන ද මේ විමර්ශණය කරගෙන යන්නේ? බාහිරයේ තියෙන එකක්. එතකොට මේ ලෝකය හොයන්න හදන්නේ බාහිරයෙන් නේද? නමුත් බුදුරජාණන්වහන්සේ පෙන්නුවේ ලෝකය බාහිරයෙන් හොයන්න ද, තමන් තුළින් දකින්න ද? අපි රෝහිතස්ස සූත්‍රයේ දී පැහැදිලිව අහලා තියෙනවා බාහිරයෙන් දැකලා නම් මේ ලෝකය අවබෝධ කරන්න බැහැ, ලෝකය අවබෝධ කරන්න නම් බඹයක් පමණ ශරීරය තුළින්ම බලන්න ඕනේ

කියලා. අන්න ඒ වගේ අදහස් වලින් අපි තේරුම් ගන්න ඕනේ ඔතනින් එහාට ගිය ඇත්තකුත් තියෙනවා කියලා.

ඒ පැත්තම තව ටිකක් පෙන්නන්න තමයි මම මේ මූලපරියාය සූත්‍රයෙන් පෙන්නුවේ රහතන්වහන්සේ **න මඤ්ඤති**. දැන් අපිට අතන තියෙන පඨවියක් මඤ්ඤණා වුණාට රහතන්වහන්සේට එහෙම මඤ්ඤණා වීමක් නැහැ කියන අදහසක් මෙතනින් මතු කරගන්න වෙනවා මොකද එතකොට තමයි ඒ සඳහා යන්න ඕනේ මාර්ගය මොකක්ද කියලා තමන්ට තේරුම් ගන්න පුළුවන් වෙන්නේ. මේ පිළිබඳව තව ප්‍රශ්න තියෙනවා නම් අහන්න.

**ප්‍රශ්නය:** මට තේරුන විදිහට නම් සෝවාන් පුද්ගලයා රහත් වෙන තුරු සේඛභාවය දිගටම තියෙනවා කියලා. මොකද සෝවාන් වුණාට පස්සේ නැවත ආපස්සට ඒමක් නැති නිසා. නමුත් සෝවාන් මාර්ගය තියෙන කෙනා සේඛ පුද්ගලයා වුණාට එයා සමහර අවස්ථාවල දී පෘතග්ජන මට්ටමටත් පත්වෙන්න පුළුවන් කියලා මට තේරුනේ. මොකද සමහර අවස්ථා වලදී එයා ධර්මය දැනගෙන තිබුණත් ඒවා අමතක වීම නිසා. ආපස්සට යන ගමන පෘතග්ජන ගමනක් හැටියටයි මට තේරෙන්නේ. සෝවාන් වෙන්නට ඉස්සෙල්ලා සේඛ පුද්ගලයා කියන එක ස්ථිර අවස්ථාවක් නෙවෙයි, ඒ කියන්නේ එයාට සේඛභාවය දිගටම තියාගන්න බැරිවෙන්න පුළුවන්. සමහර ආත්ම වලදී නැවතත් පෘතග්ජන පැත්තට වැටෙන්න පුළුවන්. එහෙමයි මම තේරුම් ගත්තේ.

තව ප්‍රශ්නයක් තමයි බෝධිසත්වයෝ සමහර බෝධිසත්ව ආත්ම වලදී රහතන්වහන්සේලා දැකලත් නැහැ, ත්‍රිපිටකය දන්නෙත් නැහැ. නමුත් බෝධිසත්වයෝ සේඛ පුද්ගලයෙක් හැටියට හඳුන්වන්න පුළුවන් නේද?

**උත්තරය:** සමහර සූත්‍ර වල (චක්ඛු සූත්‍රය - සංයුක්ත නිකාය, ඛන්ධ වර්ගය, ඔක්කන්ති සංයුක්තය), තියෙනවා චුල්ල සෝතාපන්න කියලා සෝතාපන්න වෙන්න කලින් ධම්මානුසාරී, සද්ධානුසාරී මට්ටමට පත්වීම. චුල්ල සෝතාපන්න කියලා එතකොට අදහස් වෙන්නේ තවම සෝවාන් වෙලා නැහැ හැබැයි සෝවාන් වෙන මාර්ගයට වැටුනා. ඒ අය නැවත අපාගත වෙන්නේ නැහැ කියන සඳහනක් තියෙනවා. ඒක ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකභාවයට පත්වීමක් කියලා මම හිතන්නේ. මොකද සද්ධානුසාරී හෝ ධම්මානුසාරී වෙන්න නම් අනිවාර්යයෙන් කල්‍යාණමිත්‍ර ඇසුරක් තියෙන්න ඕනේ. සද්ධර්මය ඇහෙන්න ඕනේ. **අරියානං දස්සාවී** කියලා තියෙන්නේ. ආර්ය ධර්මය දකිනවා, නැත්නම් සත්පුරුෂයෝ ඇසුරු කරනවා. එතකොට තමයි අශ්‍රැතවත්භාවයෙන් මිදිලා ශ්‍රැතවත් පැත්තට එන්නේ. එතකොට මම

මෙතන අදහස් කරන්නේ ධර්මය ඇහුවාටම මදි, ඡානං කියන මට්ටම නේ ඇහුවා කියන්නේ. ඒ සුතමය ඥානය විතරයි. ඇහුවාටම ආර්ය ශ්‍රාවකයෙක් වෙන්නේ නැහැ. මේක තමන් නුවණින් විමසන්නත් ඕනේ. චින්තාමය ඥානය තියෙන්නත් ඕනේ. ඒ මට්ටමේ දී තමයි කෙනෙකුට මාර්ගයට වැටෙන්න පුළුවන් කියන මට්ටම මම අදහස් කරන්නේ. ඒ කියන්නේ සම්මාදිට්ඨිය කියන එක - මෙහෙම දෙයක් තියෙනවා කියලා අදහසක් එන්න ඕනේ. එහෙම ආපු කෙනා කවදවත් මාර්ගඵලයක් නො ලබා ආපහු හැරීමක් නැහැ කියන අදහසක් තමයි මට තියෙන්නේ. ඒ කියන්නේ නිකම්ම ධර්මය ඇහුවා නෙවෙයි, ධර්මය ගැන නුවණිනුත් විමසන කොට, එහෙම කෙනා... (අපි දන්නේ නැහැ සමහර විට කෙනෙක් නැවත ආපහු හැරෙන්න පුළුවන්ද කියලා මාර්ගඵලයක් ලැබන කම්).

ආර්ය මාර්ගයට වැටුනහම, සේඛ පුද්ගලයා කියන එකෙන් මට අදහස් වෙන්නේ එයාව ආපහු හැරවීමක් නැහැ කියන එකයි. ඒක මගේ අදහසක් වෙන්න පුළුවන්, ඒක එහෙමම ගන්න ඕනේ නැහැ.[11] එතකොට අපි ඔතැනින් එහාට යන්න මේක උදව් කරගන්න විදිහයි අපි සොයන්න ඕනේ. කොහොමද මේක යොදගන්නේ ආර්ය දර්ශනය ඇති කරගන්න. එතකොට ආර්ය දර්ශනය ගැන දළ අදහසක් ගන්න - දැන් අපට හිතෙනවා නේ එළියේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ තියෙනවා, එහෙම තියෙන තැනක තමයි මෙහෙම දෙයක් පෙනෙන්නේ කියන එක.

ඒක තව ටිකක් පැහැදිලි කරගන්න එක විදිහක් තමයි රෝස මලේ රෝස පාට තියෙන්නේ එළියේ තියෙන පඨවි, ආපෝ, තේජෝ, වායෝ වල නේද කියලා හිතෙනවා නේ. එතකොට ඇත්තටම මේ දැකපු රෝස පාට එහේද තියෙන්නේ කියන එක බලන්න පොඩි පරීක්ෂණයක් තමයි අපි පාට කණ්ණාඩියකින් බැලුවොත් වෙන පාටක් පෙනෙනවා. එතකොට ඒ පෙනෙන පාටත් තියෙන්නේ මලේ ද? කියලා තමන්ට ඒ පැත්තෙන් හිතන්න පුළුවන්. එතකොට මේ දැකපු පාට ඇහැ උපද්දලා දීපු දෙයක්ද නැත්නම් එළියේ තියෙන දෙයක්ද කියන අදහස.

ඒක තව පැත්තකින් හිතන්න පුළුවන් දෘෂ්ටියක හිටියොත් අපි කොහොමද ගන්නේ කියන එක තේරුම් ගන්න අර වතුරට එබෙන බල්ලා දැන් බල්ලෙක් ඉන්නවා කියන මතයක ඉන්න කොට එයා අපි කරන භාවනා කරගෙන ආවොත් - බල්ලෙක් කියලා හිතුනාට ඔතන තියෙන්නේ දෙතිස් කුණපයක්, කෙස්, ලොම්, නිය, දත් වගේ කොටස් ගොඩක එකතුවක් තියෙන තැනක තමයි බල්ලෙක් ඉන්නවා කියලා හිතුනේ. දැන් එහෙම

---

[11] චක්ඛු සූත්‍රය (සංයුත්ත නිකාය>ඛන්ධ වර්ගය>ඔක්කන්ති සංයුක්තය)

හිතුවත් එතන මුළාවෙලා කියලා පෙනෙනවා නේ. වතුරේ තියෙන්න බැහැ නේ කෙස්, ලොම්, නිය, දත් ගොඩක්. එතනින් එහාටත් භාවනා කරන කෙනෙක් සමහර විට ශරීරයක් පෙනුනා නම් හිතන්න පුළුවන් කෙස්, ලොම්, නිය, දත් නෙවෙයි - ඔතන තියෙන්නේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතු ගොඩක්. දැන් එතන ධාතු ගොඩක් තියෙනවා කියලා හිතුවත්, නැත්නම් රූප කලාප ගොඩක් තියෙනවා කියලා හිතුවත් එතනත් යම්කිසි මුළාවක් තියෙනවා නේද? මොකද අර බල්ලෙක් ඉන්න සංඥාව තුළමයි ඔය ධාතු ගැන කතා කරන්න පුළුවන් - බල්ලා හැදිලා තියෙන හැටි. හැබැයි මේ නැති දෙයක් ගැන නේ ඔය කතා කරන්නේ? අපේ අවිද්‍යාවෙන්, මුළාවෙන් හදගත්ත දෙයක් ගැනමයි.

එතකොට ඔතන බුදුරජාණන්වහන්සේ මේවායේ ඇත්ත දකින්න විධි කීපයක් පෙන්නුවා. ඒ එකක් තමයි මේ ආයතන පිරිසිඳ දැකීම. එතකොට වතුරේ බල්ලෙක් ඉන්නවා කියලා හෝ මොකක් හරි මතයකට ආවේ මේ ඇහැ පාවිච්චි කරලා නේද? ඇහෙන් දැකලා, හිතෙන් හිතලා නේද? ඔන්න ඔය පැත්තෙන් මේක හොයාගෙන ගියොත් ඊට වඩා වෙනස් උත්තරයක් අපට එනවා. මේ පැත්තේ, මේ ගොඩ ඉන්න බල්ලාගේ ඇත්ත ඇතිහැටි නො දන්නාකම, අවිද්‍යාවයි, මුළාවයි හින්දම නේද - මේ ඇහැ ගැන අවබෝධයක් නැති හින්දම නේද එළියේ රූපයක් ගැන මේ කතා කරන්නේ කියන මට්ටමකට යන්න පුළුවන්. එතකොට ඒ රූපයේ සමුදය පැත්තක් දකින්න පුළුවන්. අපි සමුදය දකින්නේ එළියෙන් නෙවෙයි, තමන් තුළින්. එතකොට මේ සමුදය තිබුණොත් රූපය තියෙනවා, මේ සමුදය යෙදුනේ නැත්නම්, අපේ මට්ටමේ දී ඒ වතුරේ බල්ලෙක් පිහිටන්නේ නැහැ. අපි තුළ සමුදය යෙදෙන්නේ නැති හින්ද. එතකොට සමුදය යෙදුනොත් රූපය පිහිටනවා, සමුදය යෙදුනේ නැත්නම් ඒ රූපය පිහිටන්නේ නැහැ. මුළාවෙන් හදපු එක.

ඕකම දැන් අපි ඇහැට මුළාවෙලා දකින දකින දේවල් තියෙනවා කියනවා නම්, එතකොට මේ ඇහේ ඇත්ත දකින්නේ නැති හින්ද නේද ඔය මට්ටම වෙන්නේ. එතනත් මේ පැත්තේ යෙදෙන අවිද්‍යාවයි, මුළාවයි හින්ද නේද අපි අර පැත්තේ රූපයක් පිහිටවලා, භාර අරන් තියෙන්නේ. එතකොට ඒ භාර ගත්ත එකේ පඨවි, ආපෝ, තේජෝ, වායෝ හැදුවත්, අර බාහිරයෙන් ලෝකය හොයන්න ගියා. අපි දන්නේ නැහැ මේ අපිම හදගත්ත ලෝකයක නේද අපි මේ කඩාගෙන බිඳගෙන ගිහින් බලන්න හදන්නේ. ඒ ලෝකය හැදුවේ මේ පැත්තේ අවිද්‍යාවයි, මුළාවයි හින්ද, ආයතන වල ඇත්ත ඇතිහැටි දකින්නේ නැති හින්ද නේද? මේ අවිද්‍යාවයි, මුළාවයි සමුදය වෙලා නේද අර ලෝකය පිහිටියේ? මේ ආයතන ගැන පිරිසිඳ දැක්කා නම්, ඇත්ත ඇතිහැටි දැක්කා නම්, අවිද්‍යාව යෙදුනේ නැත්නම්

අපට ඒ වගේ දෙයක් පිහිටයි ද? කියන මට්ටමකිනුත් මේ අදහස ගැන බලන්න විදිහක් තියෙනවා. ඒ පැත්ත තමයි මම දකින්නේ බුදුරජාණන්වහන්සේ පෙන්නලා දුන්නා කියලා.

**ප්‍රශ්නයඃ** මේ මඤ්ඤණා කිරීමේ දී තණ්හා, මාන, දිට්ඨි වශයෙන් මඤ්ඤණා කිරීමක් වෙන්නේ. එතකොට සේඛ පුද්ගල තත්වයේ දී මඤ්ඤණා කෙරෙන්නෙත් නැහැ, නො කෙරෙන්නෙත් නැහැ වශයෙන් සඳහන් වුණා. එතන දී සේඛ පුද්ගලයෙක් නම් දෘෂ්ටීන් ඍජු වෙලා, දෘෂ්ටිය පැහැදිලි වෙලා තියෙන නිසා ඒ මඤ්ඤණාවේදී පෘථිවිය මගේ, එහෙම නැත්නම් මේ පෘථිවිය තුළ තියෙන දෙයක්, ඒ ආදී වශයෙන් තණ්හා, මාන වශයෙන් යෙදෙන නිසාමද ඒ වගේ තත්වයක් ඇතිවෙන්නේ?

**උත්තරයඃ** පොතේ පැහැදිලි කිරීමේ පොඩි අඩුවක් තියෙනවා කියන මට්ටමකින් තමයි මම මේ කතා කරන්නේ. ඒකයි මම එක පැත්තකින් තණ්හා, දිට්ඨි, මාන නො දම මේක කතා කරන්න උත්සාහ කළේ. මේ සම්බන්ධව තව කියවලා බලන්න හොඳයි කටුකුරුන්දේ ඤාණානන්ද හාමුදුරුවන්ගේ පොතේ මඤ්ඤණාව ගැන හුඟාක් විස්තර කරපු පොතක් තියෙනවා. දැන් ඒකේ සිංහල පරිවර්තනයත් ළඟදි පිටවුණා. Concept and Reality කියලා පොතක් තියෙනවා. සිංහල පොතේ නම පැරණි බෞද්ධ චින්තාවේ සංකල්පය සහ යථාර්ථය. ඒක download කරන්න පුළුවන්. ඒ පොතේ මඤ්ඤණා ගැන දීර්ඝ විස්තරයක් තියෙනවා. ඒක කියෙව්වොත් තව ටිකක් පැහැදිලි වෙයි.

දැන් මඤ්ඤණා කිරීම තුළ අපට තණ්හා, දිට්ඨි, මාන ඇතිවෙන්න පුළුවන්. නැතුව තණ්හා, දිට්ඨි, මානයම මඤ්ඤණාව නෙවෙයි ඒ ගැන ටිකක් ගැඹුරෙන් හිතුවොත්. දැන් වතුරේ බල්ලෙක් ඉන්නවා කීම ඒ තුළ යෙදෙන කෙලෙස් ටිකක් තමයි - ඒක මත තණ්හාව ඇතිවෙන්න පුළුවන්, දිට්ඨිය යෙදෙන්න පුළුවන්, මානය ඇතිවෙන්න පුළුවන්.

ඕකේ අනිත් පැත්ත කියන කොට සියුම් වෙනසක් තියෙනවා. ඒක කෙනෙකුට හිතලා බලන්න පුළුවන් පැත්තක්. දැන් මෙතන සේඛ පුද්ගලයාට මඤ්ඤණා වෙන්නත් පුළුවන්, නැති වෙන්නත් පුළුවන් කියන කොට එක අදහසක් තමයි එහෙනම් සිහියෙන්, නුවණින් ඉන්න කොට මඤ්ඤණා වෙන්නේ නැහැ, අනිත් වෙලාවට මඤ්ඤණා වෙනවා කියන අදහසද මේ කියන්නේ කියලා. ඒක එක පැත්තක්. මට නිකම් හිතෙනවා ඊට වඩා මෙතන වෙනස් පැත්තක් තියෙනවා. මෙතන මම දකින්නේ

ඇත්තටම ලෝකයට අයිති දර්ශනයේ ඉඳලා ලෝකෝත්තර දර්ශනයට හැරෙන තැන කියලා.

ඒ කියන්නේ හුඟාක් අය එක එක භාවනා වල යෙදෙනවා නේ. එතකොට ලෝකෝත්තර දර්ශනය ඇතුවත්, එහෙම දර්ශනයක් නැතුවත් ඒ භාවනා වල යෙදෙන්න පුළුවන්. උදහරණයක් විදිහට අපි දෙතිස් කුණප භාවනාව කරනවා කියලා හිතන්න. මේ ශරීරය කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර වලින් හැදිලා තියෙනවා, මේ කෙස් පිළිකුලයි, දුගඳයි, අසුභයි, අසාරයි, මේවා අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියලා ඔහොම බලන්න පුළුවන්. දැන් මේ බලන්නේ කෙස් කියලා දෙයක් තියෙනවා කියන සංඥාවේ ඉඳගෙන. ඒ කියන්නේ මොනවායින් හරි හැදුනු, ලෝකයට අයිති කෙස් කියලා ජාතියක් තියෙනවා. එතකොට බලන්න ඔතන දැන් මඤ්ඤණා වීමක් තියෙනවා. මම ඕක උපමා කරන්නේ වතුරට එබෙන බල්ලා බල්ලෙක් ඉන්නවා කියලා හිතලා, ඒ බල්ලාගේ කොටසක් අරගෙන මෙනෙහි කරනවා. තව විදිහකට කිව්වොත් රූපයට අහුවෙලා, නැත්නම් ලෝකයට අහුවෙලා කරන භාවනාවක්. ඉතින් මේ භාවනාව කරන්න එපා කියන එක නෙවෙයි මේ කියන්නේ. මේක වරදවා ගන්න එපා. මොකද පූර්ව ප්‍රතිපදාව වැඩෙන්න ඕනේ. මේක පූර්ව ප්‍රතිපදාවට අයිති භාවනාවක්. ඒකෙන් අපේ නීවරණ යටපත් කරනවා. ඒ හින්දා ඒක කරන්න ඕනේ.

හැබැයි ඕකෙන් තවම ලෝකෝත්තර දර්ශනයට ආවාද කියන එක ගැන ඊටවඩා එහාට පොඩ්ඩක් හොයන්න තියෙනවා මේ දහමත් එක්ක. එතන දී අපිට බලන්න වෙනවා මේ කෙස් කියන එක තියෙනවා කියලා, නැත්නම් මේ ශරීරයක් තියෙනවා කියලා දැනගත්තේ කොහොමද? එතන දී අපට බලන්න පුළුවන් එක විදිහක් තමයි මොන ආයතනය උදව් කරගෙනද මේක තියෙනවා කියලා දැනගත්තේ? එතකොට ආයතන ගැන වෙන වෙනම බලලා තිබුණොත්, මේ ආයතනයේ හැකියාව මොකක්ද, ඒකට ඕක කරන්න පුළුවන්ද කියන මට්ටමින් ආයතන ගැන මෙනෙහි කිරීමක් කරලා තිබුණොත් පෙනෙයි එතකොට ඒ කෙස් හරි, රූපයක් හරි, ශරීරයක් හරි, බාහිර දෙයක් හරි අපි ආයතන මුළාවෙන් පනවලා, ඒ පනවපු දෙය ගැන නේද මේ භාවනා කරන්නේ? එතකොට අපි බාහිර ලෝකයෙන් නේද ඔය ලෝකය හොයන්න යන්නේ?

ඒකේ අනිත් පැත්ත තමයි මේ ආයතන මුළාවෙන් ඕක පැනෙව්වා නම්, ආයතනයේ මේ මුළාව යෙදුනේ නැත්නම් ඔහොම දෙයක් පනවයි ද? කියන පැත්තකුත් තියෙනවා. අපි මීට කලින් සාකච්ඡා වල කතා කළා අනිච්ච සඤ්ඤා සූත්‍රයේ දී රූපයේ අනිත්‍ය වඩනවා කියන කොට කරුණු

තුනක් යෙදෙනවා. තියෙන රූපය වෙනස් වෙනවා කියන එක විතරක් නෙවෙයි. ඒකේ කරුණු තුනක් බලන්න තියෙනවා.

**ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථඞ්ගමො**[12] කියලා. රූපය මේකයි, ඒ රූපය හටගත්තේ කොහොමද? සමුදය පැත්ත බලන්න ඕනේ. සමුදය නැති වුණොත් ඔහොම රූපයක් පිහිටයිද කියලා. එතන දී තමයි මම දකින්නේ ලෝකයට අයිති දැක්මේ ඉඳලා ලෝකෝත්තර දර්ශනයකට එනවා කියලා. මොකද එදාට අපි බාහිරයෙන් නෙවෙයි ලෝකය බලන්නේ. මෙන්න මේ ආයතන තුළින් එන දැක්මකට එනවා. එතන දී තමයි මම දකින්නේ නියම විදර්ශනය පටන්ගන්න තැන. තමන් තුළින් ලෝකය හොයන්න පටන්ගන්න දවස. එදාට අර බාහිර ලෝකයෙන් යම්කිසි මිදීමකට ඇවිල්ලා. මේක හටගන්නේ මෙන්න මේ හේතු නිසායි කියලා නුවණින් දැකලා. ඔය හේතු නැත්නම් බාහිර ලෝකයකට අහුවෙන්නේ නැහැ කියන දැක්මක් එනවා. ඒ දැක්ම තමයි මම අර ලෝකය ඉක්මවා යන කියන, නැත්නම් ලෝකෝත්තර දැක්ම විදිහට ගන්නේ - ලෝකෝත්තර සම්මාදිට්ඨිය.

මේ ලෝකෝත්තර සම්මාදිට්ඨිය ඇති වෙන්නේ දහමක් අහලා තේරුම් ගැනීමක් තුළින්මයි. ඔතන මම දකිනවා අන්‍ය ශාසනයේ කෙනෙකුටත් ඔය භාවනා ටිකම කරන්න පුළුවන්. හැබැයි මෙතනින් එහාට කරන්න පුළුවන් බුදුදහම අහලා තේරුම් ගත්ත කෙනෙකුට විතරමයි. එයාව තමයි මම අර සේඛ පුද්ගල ගණයට ගන්නේ. එතෙන්ට එනකම් පෘතග්ජන මට්ටමේ ඉඳන් කරන යම්කිසි උත්සාහයක්. මේ සම්බන්ධව අපේ සුදස්සන ස්වාමීන්වහන්සේ ගන්නවා හොඳ උපමාවක් - ගිනිගොඩක් ඇතුළේ බේරෙන්න ඕනේ කියලා එහාට මෙහාට පනිනවා. හැබැයි පනින්නේ ගිනිගොඩ ඇතුළේමයි. එතකොට ඒ පනින එක්කෙනාගෙයි, ඕවා කරලා වැඩක් නැහැ කියලා කම්මැලිව එකතැනක ඉඳගෙන කෙනෙක් ඉන්නවා නම්, ඒ දෙන්නාගේ වෙනස මොකක්ද? දෙන්නාම ගින්න ඇතුළේ ඉන්නේ. තවම දෙන්නාම පිච්චෙනවා. කෙනෙක් මේ ගිනිගොඩෙන් එළියට යන මාර්ගයක් දැකලා නැතුව ගිනිගොඩ ඇතුළේම නම් එහාට මෙහාට පැන පැන ඉන්නේ, ඒක හරියට අර ලෝකයට අහුවෙලා, ලෝකය තුළ කරන භාවනාවක් වගෙයි - ආර්ය දර්ශනය නැතුව. එතකොට ඒ ආර්ය දර්ශනය ඇති කරගන්න මේ ලෝකෝත්තර සම්මාදිට්ඨිය ඇති කරගන්න තමයි අපි මේ බුදුදහම අහන්න ඕනේ, නුවණින් විමසන්න ඕනේ කියන කරුණ තමයි මම මතුකරන්න උත්සාහ කරන්නේ.

---

[12] අනිච්ච සඤ්ඤා සූත්‍රය (සංයුක්ත නිකාය, ඛන්ධ වර්ගය, ඛන්ධ සංයුක්තය, පුප්ඵ වර්ගය)

මඤ්ඤණා කිරීම කියන එක මූලපරියාය සූත්‍රයට අනුව නම්, පෘථග්ජනයා **මඤ්ඤති. පඨවිං පඨවිතො මඤ්ඤති.** සේඛ පුද්ගලයා **පඨවිං පඨවිතො මා මඤ්ඤති.** රහතන්වහන්සේ යි, තථාගතයන් වහන්සේ යි **න මඤ්ඤති.**

**පිළිතුරක්** :- ඒක ඉතින් තමන්ට පුළුවන් මට්ටමෙන් හොයාගන්න දල අදහසක් තමයි අර උපමාවෙන් කිව්වෙ. දැන් පෘථග්ජනයා ඉන්නේ අවිද්‍යාවෙද නැද්ද? අවිද්‍යාවේ. එතකොට අවිද්‍යාවෙන් කරන වැඩකට තමයි මේ **මඤ්ඤති** කියලා කියන්නේ. රහතන්වහන්සේ අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරුකළා. ශේෂයක් නැතිවම, අසේස යි. අවිද්‍යාව සම්පූර්ණයෙන් දුරුකිරීම තමයි ප්‍රඥාවේ උපරිම මට්ටම, ඒ කියන්නේ රහතන්වහන්සේ. එතකොට රහතන්වහන්සේ **න මඤ්ඤති.** පෘථග්ජනයා **මඤ්ඤති.** රහතන්වහන්සේ **න මඤ්ඤති.** එතකොට මොනවා ගැනද දැනට මඤ්ඤණා කරන්නේ? **පඨවිං පඨවිතො මඤ්ඤති.**

**පිළිතුරක්** :- ඔව්. කල්පනා කරලා එතනින් නවත්තල නෑ. ඒක ඇත්ත කියලා පිළිඅරගෙනත් ඉවරයි. අවිද්‍යාවෙන් කල්පනා කරපු එක ඇත්ත කියලා භාරඅරගෙනත් ඉවරයි මඤ්ඤණා කරන කොට. අපට දැන් එහෙම අදහසක් ගන්න වෙනවා. රහතන්වහන්සේගේ එහෙම මඤ්ඤණා කිරීමක් වෙන්නේම නැහැ. වෙන්න හේතු යෙදෙන්නෙ නෑ. ඇයි, අවිද්‍යාව නැති හින්ද. **න මඤ්ඤති.**

එතකොට සේඛ පුද්ගලයා, සෝවාන් කෙනා කියමු, එයා, මඤ්ඤණා වෙන්නේ නෑ කියන්න බැහැ එයාට. **න මඤ්ඤති** නෙවෙයි. මඤ්ඤණා වෙන ගතියේ ඉන්නවා. හැබැයි ඒක වැරැදියි කියලා දැනගෙන ඉන් මිදෙන්න උත්සාහයකුත් තියෙනවා. මාර්ග වැඩීමක් තියෙනවා. එතකොට එයා මඤ්ඤණා කරනවා. ඒ වුනාට කොහේදෝ නුවණක් තියෙනවා, ඔහොම හිතුණාට ඕක වැරැදියි කියලා. ඒකෙන් මිදෙන්න උත්සාහයක් තියෙනවා. ඒක තමයි **මා මඤ්ඤති.** අපට අන්න ඒ වගේ අදහසක් ගන්න වෙනවා නේද?

එතකොට අපි, දැන් අපි ඉන්න තත්ත්වය හඳුනගන්න, ඔන්න ඕක කියල බුදුරජාණන්වහන්සේ අපව අසරණ කරලා නැනේ. අපට තව ටිකක් උදව් කරලා තියෙනවා. මේ ඇත්ත දකින්න නම් ක්‍රම ටිකක් කියලා දීලා තියෙනවා නේද? ස්කන්ධ වශයෙන් දකින්න, ධාතු වශයෙන් දකින්න, ආයතන වශයෙන් දකින්න. ඔහොම ටිකක් උදව්වක් කරලා තියෙනවා.

ආයතන පිරිසිඳ දකින්න, ඇත්ත ඇති හැටියට දැනගන්න ඕන නම්. ආයතන පිරිසිඳ දකින්නේ නැතුව නිවනක් පනවන්නේ නෑ කියනවා.

එතකොට දැන් අපි මඤ්ඤණා කරන මට්ටමෙන් මිදෙන්න එක විදියක් තමයි ආයතන පිරිසිඳ දකින එක. එහෙම නැත්නම් ආර්‍ය අෂ්ටාඞ්ගික මාර්ගය වඩන්න ඕන. (දැන් ඔය වචනවල තේරුම වෙනම හොයන්න ඕන.) ඊළඟට සතර සතිපට්ඨානය වඩන එක. එහෙම නැත්නම් ත්‍රිලක්ෂණය වඩන එක. මේවායේ ප්‍රතිඵලය වෙන්න ඕන මොකක්ද **න මඤ්ඤති** මට්ටමට එන්න ඕන. අන්න ඒ අවබෝධය ඇතුවයි අපි භාවනා අඳුරාගන්නේ. මේ භාවනාව කළොත් මේ අවබෝධය එයිද කියන නුවණක් ඇතිකරගන්න ඕන. එතැන තමයි සම්මා දිට්ඨිය එන්නේ. සම්මා දිට්ඨිය ඇතිකරගන්න ඕන. මොකද, බුදුරජාණන්වහන්සේ පැහැදිලිව දේශනා කරනවා මේ මාර්ගය තියෙන්නෙ දන්න දකින කෙනාට. ආස්‍රව ක්ෂය කරන්න පුළුවන් දන්න දකින කෙනාට. **ජානතො පස්සතො. න අජානතො න අපස්සතො.** නො දන්න, නො දකින කෙනාට මෙහෙම මාර්ගයක් වැඩෙන්නේ නෑ. ආස්‍රවක්ෂය කරන්න බැහැ. කරන්නත් වාලේ මොනවා හරි කරලා වැඩක් නෑ. දැනගෙනමයි කරන්න ඕන. දැනගෙන, දැකලාමයි කරන්න ඕන. **ජානතො පස්සතො.** දැනගන්න, දකින්න. එතකොට අපට දැනගන්න දකින්න වෙනවා දැන් ආයතන ගැන, ස්කන්ධ ගැන, ධාතු ගැන. නො දන්නාකම හින්ද නේ අපි මඤ්ඤණා කරන්නේ. ඇත්ත ඇතිහැටියේ අවබෝධ කරගන්න නො දන්නා හින්දයි මේ මට්ටමට අහුවෙලා තියෙන්නේ.

ඒක ඊළඟට මහා සළායතන සූත්‍රයේ දී පෙන්නනවා, මොනවා ගැනද මේ? **අජානතො අපස්සතො** වෙලා තියෙන්නේ මොනවා ගැනද? **අජානං අපස්සං යථාභූතං** - ඇත්ත ඇතිහැටි දන්නේ නෑ. යථාභූත ස්වභාවය දන්නේ නෑ. මොනවා ගැන ද දන්නේ නැත්තේ? සළායතන සූත්‍රයේ තියෙන්නේ, **චක්ඛුං භික්ඛවෙ අජානං අපස්සං යථාභූතං.** ඇහැ ගැන දන්නේ නෑ. **රූපෙ අජානං අපස්සං යථාභූතං.** ඇහෙන් දැනගන්න රූප ගැන දන්නේ නෑ. ඊළඟට **චක්ඛු විඤ්ඤණං අජානං අපස්සං යථාභූතං. චක්ඛුසම්ඵස්සං අජානං අපස්සං යථාභූතං. යම්පිදං චක්ඛුසම්ඵස්සපච්චයා උප්පජ්ජති වෙදයිතං සුඛංවා දුක්ඛං වා අදුක්ඛම සුඛං වා තම්පි අජානං අපස්සං යථාභූතං.** අන්න ඒ වේදනාවේ, ඒක ගැන ඇත්ත ඇති හැටි දන්නේ නෑ.

අපට අද වෙලා තියෙන්නෙ **අජානං අපස්සං යථාභූතං.** දන්නෙත් නෑ, දැකලත් නෑ මොකක් ද, ඇත්ත ඇති හැටිය. එතකොට බුදුරජාණන්වහන්සේ පෙන්නනවා, **ජානං පස්සං යථාභූතං** වෙන්න.

මොනවා ගැන ද? ඇහැ ගැන. **චක්ඛුං ජානං පස්සං යථාභූතං. අජානං අපස්සං යථාභූතං** වුණොත් එහෙම, , ඒ අපි ඉන්න තත්වය , ලෝකයා ඉන්න තත්වය පෙන්නුවේ. මොක ද ඒ? ඒවායේ ඇලෙනවා, බැඳෙනවා, සිහි මුලාවෙනවා. ඇත්ත ඇතිහැටි දන්නෙත් නෑ, දැකලත් නෑ. **අජානං අපස්සං යථාභූතං** වෙනකොට වෙන්නේ ඇලෙනවා, බැඳෙනවා, සිහි මුලාවෙනවා. සිහිමුලාවෙන කොට තණ්හාව වැඩිවෙනවා. **තණ්හා පවඩ්ඪති.** තණ්හාව වැඩිදියුණු වෙනවා. වැඩෙනවා. එතකොට **ආයතිං පඤ්චූපාදනක්ඛන්ධා උපචයං ගච්ඡති.** තව තව පංචඋපාදනස්කන්ධ රැස්කරනවා. පංචඋපාදනස්කන්ධ කියන එක අපි අහල තියෙනව තව පැත්තකින් මොනවා කියලද? දුකයි. තව තව පංචඋපාදනස්කන්ධ රැස්කරනවා කිව්වත්, තව තව දුක් රැස්කරනවා කිව්වත් එකයි. **ආයතිං පඤ්චූපාදනක්ඛන්ධා උපචයං ගච්ඡති.** කවුද? මේ තණ්හාව වැඩෙන කෙනා. කාගේද තණ්හාව වැඩෙන්නේ? මේවා ගැන සිහි මුලා වෙන කෙනාගේ. මොනවා ගැන ද සිහි මුලා වෙන්නේ? ඇහැ ගැන, රූපය ගැන. කන ගැන, ශබ්දය ගැන. නාසය ගැන, ගන්ධය ගැන. දිව ගැන, රසය ගැන. කය ගැන, ස්පර්ශය ගැන. ආයතන හයම ගැන.

එතකොට ඒව ගැන අපි සිහිමුලාවුනේ මොකක් හින්ද ද? ඇත්ත ඇති හැටියේ දන්නෙත් නෑ, දැකලත් නෑ. **අජානං අපස්සං යථාභූතං.** එහෙනම් කියනවා මේවායේ **ජානං පස්සං යථාභූතං** වෙන්න. එහෙම වුනොත් ඇලෙන්නේ නෑ, බැඳෙන්නේ නෑ, සිහිමුලාවෙන්නේ නෑ. ඇහෙන් දකින රූප ගැන, කනෙන් අහන ශබ්ද ගැන, ඇලෙන්නේ නෑ, බැඳෙන්නේ නෑ, සිහිමුලාවෙන්නේ නෑ, ඇත්ත ඇති හැටියට දැක්කොත්. එදාට තණ්හාව වැඩිවෙන්නේ නෑ. පංචඋපාදනස්කන්ධ ආයෙ ආයෙ රැස්කරන්නේ නෑ. එයාට කියනවා සම්මා දිට්ඨිය ඇතිවුන කෙනා කියලා. **සාස්ස හොති සම්මා දිට්ඨි. ආයතිං පඤ්චූපාදනක්ඛන්ධා අපචයං ගච්ඡති.** රැස්කරන්නේ නෑ. එයාට කියනවා සම්මා දිට්ඨිය ඇතිවුන කෙනා කියලා. **සාස්ස හොති සම්මා දිට්ඨි.** එයාගෙ තමයි අනිත් මාර්ගාංග තියෙන්නෙ. එතකොට අපට ආයතන ගැන සම්මා දිට්ඨිය ඇතිකරගන්න වෙනවා. තව විදියකට කියනවා : ආයතන පිරිසිඳ දකින්න. ඇත්ත ඇති හැටියට දැකලා නෑ. ඒකයි සිහිමුලාවෙලා ඕවාට ඇලෙන්නේ ඇහෙන් දැනගන්න රූපවලට, කනෙන් දැනගන්න ශබ්දවලට.

දැන් අපි කතා කළේ ඇහෙන දැනගන්න රූප ගැනයි. බල්ලා වතුරට එබෙනවා. බල්ලෙක් ගැන දැනගත්තා. අපිත් ඇහෙන් දැකලා ඔය කියන බාහිර රූප ගැන දැනගත්තා. ඕවායින් කොටසක් පන තියෙන ඒවා, කොටසක් පන නැති ඒවා. ඒවා දැනගත්තේ ඇහෙන් දැකලා නේ. නේද?

එතකොට ඒකෙ අපි දැන් ඇත්ත දන්නේ නෑ කියලා නිකං අහලා තියෙනවා. දැන් ඇත්ත දකින්න කරන වැඩ පිළිවෙළක් තියෙනවා. ඒ වැඩ පිළිවෙල ගැන තමයි අපි කතා කළේ. ඇහෙන් දැකලා දැනගත්තු රූපයේ ඇත්ත දකින්න කරන වැඩ පිළිවෙළ. මොකක් ද, පන තියෙන රූපයක් අරං, ශරීරයක් අරං, කඩලා බැලුවා මේක කෙස්-ලොම්-නිය-දත්-සම්-මස්-නහර කියන කොටස් වලට කැඩුවා. ඊළඟට කැඩුවා ඕක රූප කලාපවලට. සතරමහාධාතු, කෙස්-ලොම්-නිය-දත් කියලා දෙයක් නෑ. ඔතන තියෙන්නේ රූපකලාප ගොඩක්. ඒවාත් හැදිලා තියෙන්නේ පඨවි-ආපෝ-තේජෝ-වායෝ වලින්. ඒවා වෙන් කරන්නත් බැහැ. ඊළඟට රූපකලාපයට ආයුෂයක් තියෙනවා, හටගැනීමක් තියෙනවා, පැවැත්මක් තියෙනවා, නිරුද්ධවීමක් තියෙනවා. ඔය ටික දැන් බැලුවා.

එතකොට දැන් බුදුරජාණන්වහන්සේ ඕක කරන්න කියලත් තියෙනවා. නෑ කියලා නෑ. ඒක එපා කියන එක නෙවෙයි මේ කියන්නේ. ඒක කරන්න ඕන. දැන් ඔතන කෙළවරද කියන එකයි නුවණින් අහන්න ඕන. ආර්ය මාර්ගයට වැටිල ද? මාර්ග ඵල ලැබෙන පැත්තට වැටිල ද? අවබෝධය ඇවිල්ල ද? ඔන්න ඕක ගැනයි දැන් අපි ප්‍රශ්න කරන්නේ. මේ මේ භාවනා තුළින් අපට සම්මා දිට්ඨිය ඇවිල්ලා ද? කියන එකයි දැන් මේ ප්‍රශ්නය. ඒ නිසා මේ කරපු ඒවා අපරාදේ කියලා දැන් දුක්වෙන්න එපා. ඒවායින් ප්‍රයෝජනයක් තියෙනවා. ඒවායින් යම්කිසි කෙලෙස් තුනී කිරීමක්, අඩු කිරීමක්, තියෙනවා. නීවරණ යටපත් කිරීමක් තියෙනවා. අපි බල්ලාට ඔය භාවනා ටික උගන්නල කෙරුව්වත්, අර බුරන එක නවත්වයි. එතන තියෙන්නේ මේ රූප කලාප ගොඩක් නම් මම මොකට ද බුරන්නේ. ඔතන තියෙන ඒවා සතරමහාධාතු නම් ඉතින් මොකටද මම සතරමහාධාතුවලට තරහා අරන් බුරන්නේ. ඔතන තියෙන ඒවා ඇතිවෙලා පැවතිලා වෙනස්වෙලා යනවා නම් මෙහේ මොකට ද බුරන්නේ. තරහ ගන්නේ කියලා බිරීම නවත්වනවා. ඒ මට්ටමට එනවා නේද? එත් ඇත්ත දැකලා නෑ. ඇලීම් ගැටීම තුනීවීමක් තියෙනවා. කෙලෙස් තුනීවීමක් තියෙනවා ඒ භාවනා තුළ. ඒක නැතුවා නෙවෙයි. හැබැයි ඒක කරන්න ඕන.

**ප්‍රශ්නයක්** :- මහාචාර්ය තුමා, ඔය සමථ මට්ටම ද?

**පිළිතුර** : ඒක තමයි තේරුම් ගන්න ඕන. දැන් ඔය ලෝකයට අයිති කෙලෙස් යටපත් කිරීමක්. තවම ලෝකයෙන් මිදෙන, ලෝකෝත්තර දැක්මකට ඇවිල්ලා නෑ. ඇයි ඇවිල්ලා නැත්තේ? අතන සතරමහාධාතුව තියෙනවා. ඒ බව දැනගන්න මේ පැත්තේ මම ඉන්නවා. එහෙනම් තවම සක්කාය දිට්ඨිය තියෙනවා. එහෙම නම් දැන් සෝවාන් මාර්ගයක් ද ඔය වඩන්නේ? නැහැ. සෝවාන් ඵලය ලැබෙන්න පුළුවන් ද? බැහැ. සක්කාය

දිට්ඨිය තියෙනවා. අරගේ පඨවිය තියෙනව කියලා දැන ගන්නා මම මෙහෙ ඉන්නවා. එහෙනම් තවම ආයර්‍ය මාර්ගයට වැටිලා නෑ. ලෝකයෙන් එතෙරවන මාර්ගයට ඇවිල්ලා නෑ. සක්කාය දිට්ඨිය දුරු වෙන මාර්ගයට ඇවිල්ලා නෑ. කෙලෙස් තුනී කරන්න සම්මා දිට්ඨිය තියෙනවා.

**පිළිතුරක්** :- ඔව්. තවම අර මඤ්ඤණා කරනවා කියන එක තියෙනව. අර නිත්‍ය සංඥවට අහුවෙනවා. නිත්‍යයි කියන්නේ පවතිනවා. තියෙනවා. දැන් මොනවා ද තියෙන්නේ? පඨවිය තියෙනවා, ආපෝ තියෙනවා, තේජෝ තියෙනවා, වායෝ තියෙනවා. අපි මුලින්ම හිතපු ඒවා දැන් නෑ එතන. ශරීරයක් නෑ. දෙතිස් කුණප නෑ. රූප කලාප ගොඩක් තියෙනවා. රූප කලාප නිත්‍යයි දැන්. ඒකේත් අනිත්‍යය බලන්න හදනවා. තියන එක ඇතිවුනා, පැවතුනා, නැතිවුනා. එහෙම කියලා බලන්න හදනවා. ප්‍රශ්නය තියෙන්නේ ඒ බැලීම තවම ලෝකොත්තර දැක්ම ද ?

දැන් අපට හොයන්න වෙනවා, බුදුරජාණන්වහන්සේ අනිත්‍ය සංඥව කියලා දේශනා කළේ මොකක් ද? අපි දන්න අනිත්‍යය නේ ඔය. ඕක වෙනස්වෙලා යනවා කියලා. බුදුරජාණන්වහන්සේ අනිත්‍ය සංඥව පැහැදිළි කළේ කොහොමද? ඔන්න තියනවා අනිත්‍ය සංඥ සූත්‍රය. ඒකේ තියෙනවා මේ පංචඋපාදානස්කන්ධයේ අනිත්‍ය සංඥව වඩන්න ඕන මේ කෙලෙස් දුරු කරන්න නම්. මේ පෘතග්ජන භාවයේ ඉඳලා රහත්භාවය දක්වා යන්න නම් පංචඋපාදනස්කන්ධයේ අනිත්‍ය සංඥව වඩන්න ඕන. රූපයේ අනිත්‍ය සංඥව වඩන්න. වේදනාවේ අනිත්‍ය සංඥව වඩන්න. සංඥවේ අනිත්‍ය සංඥව වඩන්න. සංඛාරයේ අනිත්‍ය සංඥව වඩන්න. විඤ්ඤණයේ අනිත්‍ය සංඥව වඩන්න.

ඊළඟට අහනවා, කෙසේ වඩන අනිත්‍ය සංඥවෙන් ද මේ කෙලෙස් දුරුවෙන්නේ? ඒකට උත්තරය දෙනවා බුදුරජාණන්වහන්සේ ම, රූපයේ මෙන්න මෙහෙම වඩන අනිත්‍ය සංඥවෙන් කෙලෙස් දුරුවෙනවා - කොහොම ද? **ඉති රූපං, ඉති රූපස්ස සමුදයො, ඉති රූපස්ස අත්ථගමො.** ජාති තුනක් බලන, ඔන්න ඕකට තමයි අනිත්‍ය සංඥවයි කියන්නේ. **ඉති රූපං** කියන්නේ මොකක් ද? මෙන්න මේකයි රූපය. රූපය කියන්නේ මෙන්න මේකයි. එතැනින් පටන්ගන්න ඕන. රූපය කියන්නේ මේකයි. ඊළඟට **ඉති රූපස්ස සමුදයො** කිව්වේ සමුදයට යි. මෙන්න මේ හින්දයි ඔය රූපය හටගත්තේ. හටගන්නේ ඇයි කියලා බලන්න වෙනවා සමුදය. ඊළඟට **අත්ථගමො** කියන කොට නිරුද්ධවීම. නිරුද්ධවීමටත් තව ගැඹුරු තේරුම් තියෙනවා. දැන් අපි යන්න හදන්නේ නිරෝධයට යි. නැත්නම් හට නො ගන්නා ගතියට යි. නැවත නූපදින ගතියකට නේ යන්න හදන්නේ. නොහටගැනීම. උපදින්නේ නැති ස්වභාවයකට පත්වීමට මෙයින් උත්සාහ

කරනවා. ඒ කියන්නේ රහතන්වහන්සේ කියන්නේ නැවත උපතක් නැති කරපු කෙනා. ජාතිය කියන එක කොහෙත්ම නෑ. ජාතිය සම්පූර්ණයෙන් නැතිකරලා.

ජාති කියන්නේ මොකක් ද? ඉපදීම, හටගැනීම. එතකොට අපි දන්න ඉපදීමකුත් තියෙනවා. අපි මව් කුසෙන් ඉපදුනා. ඊළඟට මැරිලත් යනවා. මැරිලා ගිහින් ආයෙත් තව සැරයක් උපදිනවා. ඒකත් ඉපදීම තමයි. එතකොට ඕක විතරක් නෙවෙයි ඉපදීම. ජාති කියන එක බුදුරජාණන්වහන්සේ කොහොම ද විස්තර කරන්නේ? **ජාති, සඤ්ජාති, ඔක්කන්ති, අභිනිබ්බත්ති, ඛන්ධානං පාතුභාවො, ආයතනානං පටිලාභො, අයං වුච්චති ජාති.** ඔන්න ඕක තමයි ජාතිය කිව්වේ. ඉපදීම. එතකොට මව්කුසයෙන් ඉපදීම විතරක් නෙවෙයි. තව ඉපදීම් රාශියක් තියෙනවා. **ඛන්ධානං පාතුභාවො** - ස්කන්ධයන්ගේ පහළවීම. මොනවා ද ස්කන්ධ කියන්නේ? රූප-වේදනා-සංඥා-සංඛාර-විඤ්ඤාණ. එතන තමයි පංචස්කන්ධයක් තියෙන්නේ.

එතකොට පංචස්කන්ධයේ පහල වීමත් ඉපදීමක්. ජාති. රහතන්වහන්සේ කියන්නේ ඉපදීම නැති කළ කෙනා. දුරුකරපු කෙනා. තමන් දන්න ඇත්තයි, ධර්මයයි දැන් ඔන්න ගලපන්න ඕන. දැන් අපි හිතාගෙන ඉන්න එක මොකක් ද? ධර්‍මයේ සඳහන්වෙන එක මොකක් ද? **ඛන්ධානං පාතුභාවො** - කියන්නේ ඉපදීම. **ආයතනානං පටිලාභො** - කියන්නේ ඉපදීම. ආයතනයන්ගේ පහළවීමටත් ඉපදීම කියනවා. ස්කන්ධයන්ගේ පහළවීමටත් ඉපදීම කියනවා. දැන් රහතන්වහන්සේ ඉපදීම නතරකරලා. දුරුකරලා. නැවත ඉපදීම නවත්වලා. නැවත ඉපදීම නැවැත්වූවා කියපු ගමන් අපිට මතක් වෙන්නේ මැරුණායින් පස්සේ ඉපදීම නැහැ. ඒකත් හරි.

දැන් ඒක විතර ද? දහමේ මෙහෙම දෙයක් තියෙනවා නේද? **ඛන්ධානං පාතුභාවො, ආයතනානං පටිලාභො** - මේවත් ඉපදීම නම් එහෙනම් රහතන්වහන්සේ ඒවත් නවත්තලා තියෙන්න ඕන නේද? හැබැයි ඒකේ අනිත් පැත්ත අපට තේරෙන්න ඕන - අවිද්‍යාව තියන කෙනාටයි ඕවා උපදින්නේ. අවිද්‍යාව දුරුකරපු දවසට ඕවා උපදින්නේ නෑ.

**ප්‍රශ්නයක්** :- ස්කන්ධ පරිහරණයක් කරනවා ද රහතන්වහන්සේ?

**පිළිතුර** :- මම දන්නේ නෑ. දහමට අනුව බලමු. අපි දන්න දේ එකක්. දහම එකක්. ඔය දෙක අතරේ වෙනසක් හින්දනෙ අපි පෘතග්ජන මට්ටමේ ඉන්නේ. රහතන්වහන්සේගේ මට්ටමේ කියන එක දහමට ගලපලා බලන

එක තමයි කරන්න තියෙන්නේ. මොකද, දැනට දන්න ටික හරි වුනා නම් අපිත් රහත් වෙලා තියෙන්න ඕන. එහෙම නැත්නම් මොකක්දෝ මෙහි අඩුවක් තියෙනවා. ඒ මට්ටමින් තමයි ධර්මය මාර්ගය හොයන්න ඕන.

එතකොට දැන් **ඛන්ධානං පාතුභාවො**, ස්කන්ධයන් කියන්නේ රූප-වේදනා-සංඥ-සංඛාර-විඤ්ඤාණ යි. දැන් ඕවා උපදින්නේ කොහේ ද? ඉපදීම නැතිකරන්න නම් උපදින්නේ කොහේ ද කියලා හොයාගන්න ඕන නේ. ආයතනවල.

**පිළිතුර** :- ඔව්. රූපයක් උපදින්නේ කොයි වෙලාවේ ද? ඇහෙන් දකිනකොට නේද රූපයක් තියෙනවා කියලා දැනගත්තේ? අපි මුලින්ම කිව්වේ දැනගන්න යි. විඤ්ඤාණය කියන්නේ දැනගැනීමට නේ. විඤ්ඤාණය පහළවුනේ මොන වෙලාවේ ද? ආයතනයත් සමග යි. එක්කෝ ඇහැ, නැත්නම් කන, මොකක් හරි ආයතනයක් උච්කරගෙන නේ විඤ්ඤාණය පහළවුනේ. දැනගත්තේ මොනවා ගැන ද? රූප ගැන, වේදනා ගැන, සංඥ ගැන, සංඛාර ගැන. විඤ්ඤාණය දැනගන්නේ ඔය හතර ගැන යි. වෙන මොනවා ගැන දැනගන්න ද? දැන් ඇහැ නිසා දැනගන්නේ රූප ගැන යි. රූපයක් ගැන දැනගන්න කොට, අන්න අරෙහෙ රූපයක් තියෙනවා කියලා දැනගන්න කොට, ඒ රූපය විතර ද දැනගෙන තියෙන්නේ? නෑ. ඒ රූපයට අදාල වේදනාවක් හටගෙන තියෙනවා. ඒ රූපයට අදාල සංඥවක් හටගෙන තියෙනවා. ඒක ගැන අදහස් චේතනා කියලා සංඛාර හටගෙන තියෙනවා. ඒ ගැන දැනගන්න විඤ්ඤාණයක් හටගෙන තියෙනවා. පංචඋපාදනස්කන්ධයක් හටගෙන තියෙනවා. කොයි වෙලාවෙද හටගෙන තියෙන්නේ. විඤ්ඤාණය පහළවෙන මොහොතෙ. ආයතනය වැඩ කරන මොහොතේ. දැන් ආයතනය පහළවෙලා ද නැද්ද එතකොට? පහළවෙලා. **ආයතනානං පටිලාභො** කියන එකත් වෙලා. **ඛන්ධානං පාතුභාවො** කියන එකත් වෙලා. ජාති, ඉපදිලා.

දැන් ඉපදුනේ කොයි මොහොතෙ ද? මැරිලා ඉපදුනා ද? නෑ. මේ මොහොතෙ. ආයතනය පාවිච්චි කළ මොහොතේ දැන් ඉපදුනේ. ඇහැත් ඉපදුනා. පංච උපාදනස්කන්ධයත් ඉපදුනා. බුදුරජාණන්වහන්සේ දේශනා කරන්නේ දුක ඉපදුනා කියලා. **සංඛිත්තෙන පංචූපාදනක්ඛන්ධා දුක්ඛා** කියනවානේ. අපි තවම දුක දුක විදියට පෙනිලා නෑ. දුක පිරිසිඳ දැකලා නෑ. **දුක්ඛෙ අඥනං**. ඒකත් මතක තියා ගන්න. පෘථග්ජනයා හඳුන්වාපු තව විදියක් දුක්ඛෙ අඥනං - දුක දුක හැටියට දන්නේ නෑ. දුක සැපයි කියලා තමයි දන්නේ. දුක්වූ පංචඋපාදනස්කන්ධය සැපයි කියලා තමයි අපි දන්නේ. අතන රූපයක් තියෙන හින්දා මට ආශ්වාදයක් කියන මට්ටමේ තමයි අපි ඇහැ පාවිච්චි කරන්නේ. ඒක පෘතග්ජන ස්වභාවය. මේක

වැරැදියි කියලා දැනගෙන ඒකෙන් මිදෙන්න උත්සාහ කරන එක, අන්න මා **මඤ්ඤති**. සේඛ පුද්ගලයාගේ ස්වභාවය. වැරැදියි කියලා දැනගනනත් නුවණක් ඕන. **ජානං පස්සං යථාභූතං** කෙනාට තමයි ඒක කරන්න පුළුවන්. දහමක් අහලා දැනගත් කෙනාට තමයි එහෙම අවබෝධයක් එන්නේ. මේ වැරද්දක ඉන්නවා කියන එක. දුක් දේ සැපයි කියලා භාරගන්න මට්ටමක අපි ඉන්නවා. පංචඋපාදනස්කන්ධය, එළියේ රූපයක් තියෙනවා කියන්නේ, පංචඋපාදනස්කන්ධයක්ම තියෙනවා නේ. ඕක අපි සැපයි කියලා භාර අරන් තියෙන්නේ ඕක හොඳයි කියලා. සතුටුයි නේ. ඒ දැනගත්තු එකේ සතුටක් අපට ඇවිල්ලා. ඇහැ වැඩකරන එකේ සතුටක් අපට ඇවිල්ලා තියෙන්නේ. ඕකේ මොන දුකක්ද නේද? ඒක තමයි මේ පෘථග්ජනයාගේ මඤ්ඤණා කරන ස්වභාවය. ලෝකෙට අයිති ස්වභාවය. දැන් බල්ලා වතුරට එබුනා. අන්න බල්ලෙක් ඉන්නවා දැනුත්, කියලා දැනගන්නේ හරි සතුටින්. මගේ ඇහැ පෙනෙන නිසා තමයි මම ඕක දැනගත්තේ. ඇහැ පෙනුනේ නැත්නම් ඕක දැනගන්නත් විදියක් නෑ නේ. පංචඋපාදනස්කන්ධය භාරගන්නේ හරි ආශ්වාදයෙන්. ඊට පස්සේ ඒක එක්ක ගැටෙන එක වෙනම එකක්. බල්ලෙක් ඉන්නවා කියලා භාරගත්තේ හරි සතුටෙන්. ඒ භාරගත්ත එකේ ඇලෙන්න ගැටෙන්න පුළුවන්. භාරගත්තේ? අපේ ඇහැ වැඩකරනවා. ඒ නිසයි මම දැනගත්තේ. එතන ආශ්වාදයක් තියෙන්නේ. සතුටක් තියෙන්නේ. සතුටෙන් භාර අරන්. ආයතනයයි පංචඋපාදනස්කන්ධයයි. එතකොට ඔය මුලාවේ ඉන්නවා. ඒකයි මේ බුදුරජාණන්වහන්සේ පෙන්නන්නේ මේ ආයතන පිරිසිඳ දකින්න. ඇත්ත ඇති හැටි දකින්න. ආයතනයෙන් දැනගන්න රූපය පිරිසිඳ දකින්න. ඕක ඇත්ත ඇති හැටියට දකින්නම ඕන. ඒ දකින නුවණයි සම්මා දිට්ඨිය. ඒ සම්මා දිට්ඨිය තියෙන කෙනාටයි මාර්ගය වඩන්න පුළුවන්. නැත්නම් **මා මඤ්ඤති** ස්වභාවයට එන්නෙ. **මා මඤ්ඤති** ස්වභාවයට නිකම් එන්නේ නැහැ. සද්ධර්මය අහලා, තේරුම් අරන්, සම්මා දිට්ඨිය ඇතිකරගැනීම තුළිනුයි මා මඤ්ඤති ස්වභාවයට එන්නේ. එතකං ඉන්නේ මඤ්ඤති.

එතකොට අපට ඇහෙන් දැකීම කියන එක හුඟාක් තේරුම්ගන්න වෙනවා. ස්කන්ධ හට ගැනීම හුඟාක් තේරුම්ගන්න වෙනවා. නැත්නම් ඕවායේ ඉපදීම නැතිකරන්න බැහැ. ආයෙ උපදින එකක් නැහැ කියලා හිතන් හිටියට මේ මොහොතේ ඊළඟ එක උපද්දවනවා නම් මැරුණායින් පස්සේ උපදින එක නවත්වන්න බැහැ. ඒකේ අනිත් පැත්ත තමයි, රහතන්වහන්සේ කියන්නේ නැවත ඉපදීම නවත්වාපු කෙනෙක්. ඒකෙ ටිකක් ගැඹුරක් තියෙනව දැන් දන්න දෙයට වඩා. රහත්වීම කියන්නේම නැවත ඉපදීම නැවැත්වුවා. දුක ඉතුරු නැතුව නිරුද්ධ කළා. අපි තමයි

කියන්න හදන්නෙ රහතන්වහන්සේට තව ටිකක් දුක ඉතුරුවෙලා තියෙනවා පිරිනිවන්පාන තෙක් කියලා. බුදුරජාණන්වහන්සේ කියන්නේ, රහතන්වහන්සේ කියන්නේ, දුක සම්පූර්ණයෙන්ම නිරුද්ධයි. **කතං කරණීයං** - කළ යුතු සියල්ල කරලා ඉවරයි. ආයේ ඉපදීමක් නෑ. අපි විස්තර කරන එක වෙනම කතාවක්. දහමේ තියෙන්නේ එහෙම යි.

එතකොට ඕක තේරුම්ගන්න තියෙන්නේ සම්මාදිට්ඨියත් එක්ක යි. ඔතනයි ඕකේ වැඩේ තියෙන්නේ. ස්කන්ධයන්ගේ පහළවීම මොකක් ද කියන එක, ආයතනයන්ගේ පහළවීම මොකක් ද? ඕක අවිද්‍යාවෙන්ම කරන එකක්.

**පිළිතුරක්** :- අපි මේ පෘතග්ජන මට්ටමෙන් කියන කතාවක් නේ. අපි තමයි රහතන්වහන්සෙත් ඉන්නවා, රහතන්වහන්සෙගේ ශරීරයත් තියෙනවා. ඔක්කොම තියෙනවා. ලෝකෙත් තියෙනවා රහතන්වහන්සේට. රහතන්වහන්සේ ලෝකයේ ජීවත්වෙනවා. ඕක අපි කියන කතාවක් මිසක්, ලෝකයෙන් එතෙරවුණ රහතන්වහන්සේට ඕක අදාළ නෑ. අපි තමයි ලෝකයක් හදලා රහතන්වහන්සේට දුන්නේ. ශරීරයක් හදලා රහතන්වහන්සේට දුන්නේ. හරියට අර වතුරේ බල්ලෙක් හදලා ඒ බල්ලා ගැන දූත් ප්‍රශ්න කරනවාවගේ වැඩක්.

අපි අවිද්‍යාවෙන් හදපු ලෝකයේ අවිද්‍යාවෙන් හදපු රූප. ඒවා අයිති කරනවා අවිද්‍යාව දුරුකරපු රහතන්වහන්සේට. ඒක නුවණින් පෙනෙයි, මොකක් ද මේ කරන මෝඩ වැඩේ. ඒක ගැන කතාකරන එක නෙවෙයි දැන් කරන්න ඕන. මේ **මඤ්ඤති** ස්වභාවයේ ඉඳලා **මා මඤ්ඤති** ස්වභාවයට වත් වැටෙන්න ඕන. දහමෙන් ප්‍රයෝජනය ගන්න.

පිළිතුර :- පඨවිතො කියන්නේ පඨවිය යි. පඨවිය කියා භාරගන්නවා. පඨවිතො විතරක් නෙවෙයි. ඕකේ ඔය ව්‍යාකරණ අනුව එන වචන ටික ඔක්කොම එනවා. පඨවියා මඤ්ඤති. පඨවිං මඤ්ඤති. වර නගන්නේ එක එක විදිහට. ඒ ඔක්කෝම ඔතන එනවා. මම මේ පළවෙනි එක විතරයි ගත්තෙ. මෙක තියනවා කියලා ගත්තාට පස්සේ ඒකෙන් කියලා එනවා. ඒකට අයිතියි කියලා එනවා. ඒක තුළ කියලා එනවා. ඒක සම්බන්ධ කියලා එනවා. පඨවිය පඨවිය ලෙස භාර අරන්. ඒත් රහතන්වහන්සේලා **න මඤ්ඤති**. ඒක තවම අපට පෙනෙන්නේ නැහැ. අපේ මට්ටමට අපි භාරගන්නවා. ධර්මය අහලා තේරුම්ගත්තොත් මා මඤ්ඤති වෙනවා. ඒකෙන් මිදෙන්න උත්සාහ ගන්නවා. රහතන්වහන්සේ න මඤ්ඤති කියන එකෙන් තමයි අපිට දළ අවබෝධයක් ගන්න පුළුවන්.

මේක අර උපමාවෙන් පැහැදිලියි. දැන් බල්ලා බල්ලෙක් ඉන්නවා කියන තැන අන්තිමට එනවා එතැන සතරමහාධාතුයි කියන තැනට. ඒකත් මඤ්ඤණා කිරීමක් කියලා අපට පෙනෙනවා නේ. පඨවියත් තියෙනවා නේ එයාට. ඒ මානසිකත්වයට තියෙනවා. අවිද්‍යාවට තියෙනවා. හැබැයි අපට පිහිටනවාද ඒක? අපට මඤ්ඤණා කරන්න පඨවියක් එතැන ඉතුරුවෙන්නේ නෑ. පිහිටන්නේ නෑ. අපි ගන්න, අපි ආයතනවලින් දැකලා දැනගන්න අනික් රූප වලටත්, ආයතන නො පිහිටන, ආයතන නිරුද්ධවන ආයතන ඉක්මවා ගිය රහතන්වහන්සේ කොහොමද? ආයතනෙන් එතෙර උන. අපි තාම ආයතන තුළ ඉඳන් නේ ඕක බලන්නේ.

**පිළිතුරක්** :- ඒක තමයි මම කියන්නේ අර බල්ලා වතුරේ බල්ලා භාරගත්තා වගේ තමයි අපි ඇහෙන් දැකලා රූපය භාරගන්නේ. ඔන්න ඕක තේරුම්ගන්න ඕන. ඒක තමයි ඒ උපමාව දැක්කොත් නුවණක් ඇතිකරගන්න පුළුවන් නේ. එකත් ඒ විදියේ සිද්ධිදියක් නේද? අපි මේ ඇහේ මුළා වී ඉන්නකම් නේද අපි එළියේ රූප භාර ගන්නෙ. බල්ලා කරපු වැඩේම නේද අපිත් කරන්නේ. ආයතන පිරිසිඳ දැකලා නැති හින්ද. ආයතනයට කරන්න පුළුවන් මොකක්ද කියලා දැකලා නැති හින්ද.

දැන් ඕක ගැන තව දළ අවබෝධයක් ගන්න තමයි තව පැත්තකින් කිව්වෙ, ඇහැට ගෝචරවෙන්නේ මොනවාද? වර්ණ රූපය විතරයි නේද ඇහැට ගෝචර වෙන්නේ? කනට ගෝචරවෙන්නේ මොනවාද? ශබ්ද රූපය විතරයි නේද කනට ගෝචර වෙන්නේ? වෙන මොකුත්ම ගෝචර වෙන්නේ නෑ. එතකොට අපි ඇහෙන් දකින්නේ වර්ණය විතර නම් ඊට අමතරව දාපු ඔක්කෝම ඇහෙන් දැනගත්තු ඒවා ද, අපි හදලා දාපු ඒවා ද? අපි හදලා දාපු ඒවා. අරක උදව්කරගෙන අපි හදපු ඒවා. එතකොට අපි දකින්නේ වර්ණය විතර නම්, ඇහැට ගෝචර වර්ණය විතර නම්, ඔතන පඨවිය තියෙනවා කියන එක ඇහැට ගෝචරද? ඇහෙන් දකින්න පුළුවන් ද පඨවිය? බැහැ. ආපෝ දකින්න පුළුවන් ද? බැහැ. තේජෝ දකින්න පුළුවන් ද? බැහැ. වායෝ දකින්න පුළුවන් ද? බැහැ. ශබ්දය දකින්න පුළුවන් ද? බැහැ. ගඳ සුවඳ දකින්න පුළුවන් ද? බැහැ. රස දකින්න පුළුවන් ද? බැහැ. හැබැයි අපි ඇහින් දැකපු එකට ඔය ඔක්කෝම දාලා. අඹ ගෙඩියක් දැක්කොත් ඒක මේ රහයි කියන එකත් දාලා. ඇහැට ගෝචර ද ඒක?

දැන් පෙනෙනවා ද ඇහෙන් දැකීමට අමතරව අපි බොහෝම දේවල් හදලා දාලා කියලා. එතකොට ඒවා කොහෙන් ද හැදුවේ. මනසෙන්. ඕක ගැන හිතන කොට හදපුවා. මන ධම්ම මනෝ විඤ්ඤණ. චක්ඛායතනයට අයිති වැඩ නෙවෙයි ඒවා. චක්ඛයතනයට දැනගන්න පුළුවන් වර්ණයක් තියෙනවා කියල විතරයි. ගෝචර නානාත්වයක් සඳහන් වෙන්නෙ ඕකට

යි. අපි මොකද, ඇහෙන් දැකලා අර අනිත් ඔක්කෝම ටික හදලා, එතැනින් ගිහින් තියනවා. ඕක නේද බල්ලා කරලා තියෙන්නේ? හිතේ හදපු ටික එළියේ තියෙනවා කියලා විශ්වාස කිරීම නේද? දැන් පඨවි-ආපෝ-තේජෝ-වායෝ හැදුවේ මේ පැත්තේ හිතේ. ඒක තමයි අරහේ වතුරේ ඉන්න බල්ලාගේ තියෙනවයි කියලා දන්නේ. අපේ මට්ටමට මේක පෙනෙනවා නේද? අපිට ඒවා පිහිටන්නේ නැහැ නේ. වතුරට එබිලා බල්ලා කරපු වැඩේ අපට පෙනෙනවා. එතකොට මතක තියාගන්න එහෙනම් අවිද්‍යාව දුරුවෙන නුවණකින් තමයි අවිද්‍යාවෙ මට්ටම පේන්නේ. බල්ලාට ඕක කිව්වාට කවදාවත් තේරෙන්නේ නැහැ. එතකොට අපිත් එළියේ ශරීරය තියෙනවා කියාගෙන ඕක කොච්චර කඩලා බිඳලා හෙව්වත්, අන්තිමට තව මොනවා හරි දනවා. එකකින් බේරෙන්න තව එකක් අල්ලාගන්නවා. ඒකෙන් බේරෙන්න තව එකක් අල්ලාගන්නවා. කොහොමහරි අරහේ මොනවා හරි තියෙනවා, ඕක දැනගන්න මෙහේ මම ඉන්නවා කියන එක කැඩෙන්නේ නෑ. ඒක කැඩෙන්න නම් මේ ආයතනයේ කෘත්‍යය තේරුම් අරගෙන හිතෙන් හදලා දන වැඩේ තේරුම් ගන්න වෙනවා. චක්ඛායතනයෙනුත් තේරුම්ගන්න වෙනවා, මනායතනයෙනුත් තේරුම්ගන්න වෙනවා. ඒවාට පුළුවන් හැකියාව මොකක් ද? ඒවා මවලා පෙන්නන ටික මොකක් ද? ඒකට අපි දැනගන්න ඕන විඤ්ඤාණයේ ඇත්ත හැකියාව මොකක් ද, විඤ්ඤාණයේ මායාකාරී ස්වභාවය මොකක් ද කියලා

මම පටන්ගත්තේ **මායූපමඤ්ච විඤ්ඤාණං** කියලා බුදුරජාණන්වහන්සේ පෙන්නනවා කියලා. එතකොට මේ විඤ්ඤාණ හයෙන්ම අපව ඔය මායාවට පත්කරවන ගතියක් තියෙනවා. මොකද ඒ මායාකාරයෙක්. ඇත්ත ඇතිහැටි පෙන්නන එක්කෙනෙක් නෙවෙයි විඤ්ඤාණය කියන එක. විඤ්ඤාණය කියන එක අපිව මුළාකරන එක්කෙනෙක්. එහෙම නම් ඒකේ ඇත්ත ඇතිහැටි අපට තේරුම්ගන්න වෙනවා. එතකොට ඒ සඳහා උදව්වෙන මාර්ගය තමයි බුදුරජාණන්වහන්සේ පෙන්නලා දෙන්නේ. සද්ධර්මය කියන එක. මේ අපි ඉන්න මුළාවෙන් මිදෙන්න මාර්ගයක් මේ පෙන්නලා දෙන්නේ. ඒ සඳහා කියනවා ආයතන පිරිසිඳ දකින්න, ස්කන්ධ පිරිසිඳ දකින්න, ධාතු පිරිසිඳ දකින්න. පිරිසිඳ දකිනවා කියන්නේ අපි හිතන එක දකිනවා නෙවෙයි. යථාභූත ස්වභාවය හඳුනාගන්නවා කියන එකයි. යථාභූත ස්වභාවය තමයි රහතන්වහන්සේ **න මඤ්ඤති**. අපි ඉන්න තැනත් තේරුම්ගන්න ඕන. **මඤ්ඤති** ද **මා මඤ්ඤති** ද කියලා. **මා මඤ්ඤති** වෙන්න පුළුවන් දහම අහලා නුවණක් යෙදිලා නම්. ඒක තමයි මට පෙන්නන්න තියෙන ඕනැකම මේ සාකච්ඡාවෙදී.

ඕක දන්න කෙනාටයි විදර්ශණාව තියෙන්නේ. ඕක නො දන්න කෙනාට විදර්ශණාවක් නෑ. මම විදර්ශණා කරනවා කියලා කියයි. ඒක තම තමන් තේරුම් ගන්න.

**පිළිතුරක්** :- ආයතනවල කුසල වෙන්න ඕන. ආයතනවල දක්ෂ වෙන්න ඕන. ඒකට උත්සාහවත් වෙන්න ඕන. මුළාවෙන් මිදෙන්න. ඇත්ත ඇතිහැටි දකින්න.

**පිළිතුරක්** :- ආයතනවල කුසල වෙන්න බුදුරජාණන් වහන්සේ මොකක්ද දේශනා කරන්නේ? මේ සාමාන්‍ය කෙනා **අජානං අපස්සං යථාභූතං.** කුසලය නම් **ජානං පස්සං යථාභූතං.** ආයතනයේ හැකියාව මොකක්ද කියල හොඳට දකින්න ඕන. ඒකටත් අපට උදව් කරල තියෙනව, ඇහැට ගෝචර වෙන්නේ වර්ණය විතරයි. ඕක තේරුම් ගන්න බැරිකමක් නැහැ නේ. පොඩ්ඩක් නුවණ තියෙන කෙනෙකුට ඇහැට ගෝචර වර්ණ කියන එක. ඔය ගෝචර නානත්වය කියලා වෙනම පෙන්නනවා පටිසම්භිද මග්ගයේ. බලන්න ඛුද්දක නිකායේ තියෙන්නෙ. ගෝචර නානත්වය. එතන තමයි පෙන්නන්නේ. වත්ථු නානත්වය. ඇහැ කියන එකේ ලක්ෂණ ටික පෙන්නනවා. ඇහෙන් දැනගන්න රූපයේ ලක්ෂණ ටික පෙන්නනවා. ඕවා සංඛත යි. පටිච්චසමුප්පන්න යි. පෙර නො තිබීම හටගන්නවා. ඉතුරු නැතුවම නිරුද්ධ වෙනවා. ඔන්න ඔහොම ධර්මතාවයක් තියෙනව. දැන් ඔය ධර්මතාවයද අපි දකින්නේ ඇහෙන් දැකලා දෙයක් තියෙනවා කියලා? පෙර නො තිබීම හටගත්ත දෙයක් ද අර තියෙන්නේ, ඔය ශරීරයේ. මේ දකින මොහොතෙද ඔය ඉපදුනේ? අහක බලනකොට මෙය නිරුද්ධ ද? ඔය යථාභූත දර්ශණයයි. අපි දකින ස්වභාවය නෙවෙයි.

**පිළිතුරක්** :- එහෙම අදහසින්ද අපි අරන් තියෙන්නෙ? දැන් මඤ්ඤණා කෙරුවාද නැද්ද කියලා පෙනෙනවා. නිත්‍ය සංඥවෙන් ද නැද්ද අපි අරන් තියෙන්නේ? නිත්‍ය සංඥව තමයි මඤ්ඤණා කිව්වේ. බුදුරජාණන්වහන්සේ පෙන්නනවා, අනිත්‍ය යි. අනිත්‍ය දකින්න. මොහොතකටවත් පිහිටන්න බැරි ස්වභාවයයි අනිත්‍යයි කියන්නේ. නිත්‍ය කරන්න බැහැ. අපි නිත්‍ය කරලා ඉවරවුණ එකම අනිත්‍ය කරන්න යනවා. තියෙන දේ අනිත්‍ය කරන්නයි අපි හදන්නේ. ඒක කරලා කවදාවත් නූපදින මට්ටමට එන්න බැහැ. ජාතිය ක්ෂය කරන්න බැහැ ඔය විදියට කරලා. නිත්‍ය කරලයි එහි අනිත්‍ය බලන්න හදන්නේ. මඤ්ඤණා කරලා ඉවර වෙලා ඕක අනිත්‍යයි, ඕක වෙනස් වෙලා යනවා. ඒ වෙනස් වීම නෙවෙයි බුදුරජාණනාවහන්සේ පෙන්නුවේ.

එහෙම එකක් දේශනා කරලා නෑ බුදුරජාණන්වහන්සේ. මේ රූපය මොකක් ද? ඕක හටගෙන තියෙන්නේ කොහොම ද? සමුදය බලන්න. සමුදය තමන් තුළ තියෙන්නේ. අපියි ඕක පිහිටුවේ. නිත්‍ය සංඥවෙන් ගත්තේ අපි. මෙහෙ මුළාව යෙදුනේ නැත්නම් එහෙ පිහිටන්නේ නැහැ. මේ ජාතිය උපදින්නේ නැති ස්වභාවය තියෙනවා ඇත්ත දකින කොට. සමුදය දකිනකොට උපදින්නේ නැහැ. සමුදයට අහුවුණොත් උපදිනවා. එහෙම ධර්මතාවයක් තියෙනවා.

අන්න එදාට තේරෙයි සම්මා දිට්ඨිය කියන්නේ මොකක් ද? ලෝකොත්තර දර්ශනය කියන්නේ මොකක් ද? අපි මඤ්ඤණා කරපු එකෙන් මිදීමේ ගතියක් තියෙනවා. න මඤ්ඤති ස්වභාවයක් තියෙනවා. දැනට අපට ඒක හිතාගන්නවත් බැහැ. මඤ්ඤණාවේ ඉන්නකම් න මඤ්ඤති කියන එක මොකක් ද කියලා වත් දන්නේ නැහැ. ලෝකෝත්තර තත්ත්වය එහෙම තත්ත්වයක්. ඒක අපට දහම විමසලා බුදුරජාණන්වහන්සේ ගැන ශ්‍රද්ධාවෙන් තමයි පිළිගන්න වෙන්නේ. දැන් ඕක මම කිව්ව හින්ද පිළිගන්න එපා. දහමේ මෙන්න මෙහෙම කියලා තියෙනවා. ඕක තමන්ගේ නුවණින් බලන්න. ප්‍රයෝගිකව බලන්න.

ඕක තමයි දෙන්න ඕන පණිවිඩය. මම හැමදම ඕක තමයි විස්තර කරන්නේ එක එක විදියට. මොකද අපි කරන්නන් වාලේ භාවනා කරලා හරියන්නේ නෑ. ඒක තේරුම්ගන්න ඕන. වෙන කෙනෙක් කිව්ව පලියට, මගෙන් භාවනා ඇහුවාට මම කියා දෙන්නේ නැහැ. සමථය නම් කියා දෙනවා. විදර්ශණය කියා දෙන්න බැහැ. කියා දෙන්න පුළුවන් සම්මා දිට්ඨිය ඇතිකරගන්නේ මෙන්න මෙහෙම යි. සම්මා දිට්ඨිය ඇතිකරගත්තු කෙනාට විදර්ශණය තියෙනවා. **ජානං පස්සං යථාභූතං** වුනොත්, එයාට මාර්ගය තියෙනවා. ඒ මාර්ගය වෙන කෙනෙකුට කියා දෙන්න බැහැ. දහම කියා දෙන්න විතරයි පුළුවන්. මාර්ගය උපද්දවාගන්න ඕන තමන්. ඒකට **ජානං පස්සං යථාභූතං.** නැත්නම් සම්මා දිට්ඨිය. ආර්‍ය සම්මා දිට්ඨිය. ලෝකයෙන් එතෙරවෙන දැක්ම.

අපි මෙහෙම ලෝකයට අහුවෙනවා. රහතන්වහන්සේ ඕකට අහුවෙන්නේ නැහැ කියන දැක්මක් ගන්න ඕන. පෘථග්ජනයා මඤ්ඤති. රහතන්වහන්සේ න මඤ්ඤති. ඕක දැක්ක කෙනා තමයි මා මඤ්ඤති වෙන්නේ.

ඔන්න ඔහොම ප්‍රශ්නයක් තියෙනව කියලවත් තේරුම්ගත්තහම ඒකෙ වටිනාකමක් තියෙනවා. දහම කියන්නේ හැමතිස්සේම මතක තියාගන්න, බුදුරජාණන්වහන්සේම දේශනා කළ විදිහට පෙර නො ඇසූ විරූ ධර්මතාවයක්. අපි දන්නා ටික දහම වුණා නම් අපිට අවබෝධ කරන්න

දෙයකුත් නැහැ. ඒක එහෙම වෙන්නේ නෑ. **පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු** - පෙර නො ඇසූ විරූ ධර්මතාවයකුයි බුදුරජාණන්වහන්සේ දුක්ඛ සත්‍යය කියලා අවබෝධ කළේ. අපි දන්න දුක නෙවෙයි ඒ. ඊට වඩා මහා ගැඹුරක්තියෙන්නේ. **සංඛිත්තෙන පඤ්චූපාදනක්ඛන්ධා** කියන කොට පංචඋපාදනස්කන්ධයේ පහළවීමම දුකයි. රහතන්වහන්සේ දුක ඉතුරු නැතුවම නිරුද්ධ කරලා. එදට රහතන්වහන්සේ ඉන්න තැන ගැන ප්‍රශ්න එන්නේ නැහැ ඔන්න ඕක තේරුම් ගත්ත දවසට.

හොඳයි දැන් සතුටුවෙන්න පුළුවන් අපි භාවනාවල යෙදුනා සමාධිය වැඩෙන. මේ කාලය තුළ ලොකු සීලයක් රැකුනා. ප්‍රඥාව වැඩෙන සාකච්ඡාවල යෙදුනා. සීල, සමාධි, ප්‍රඥාවන්ගෙන් යුක්ත මහානිසංස කුසල සම්භාරයක් රැස්කර ගත්තා කියලා සතුටුවෙන්න පුළුවන්. ඒවා මහානිසංස වෙන්නෙ යම්කිසි දවසක නිවන් අවබෝධ කර ගන්නකන්ම විපාක දීමේ ශක්තියක් තියෙන නිසා.

මෙම දහම් පොත කියවීමෙන් පසු තවත් අයකුට ලබා දීමෙන්
ඔබටත් මෙම ධර්ම දානයට දායක විය හැක.

## රවී කොග්ගලගේ මහතා විසින් මෙහෙයවන භාවනා/ධර්ම සාකච්ඡා වැඩසටහන් පැවැත්වෙන ස්ථාන

**1) කොළඹ**
i) සෑම සෙනසුරාදා දිනයකම පෙ.ව. 8.30 සිට ප.ව. 1.00 දක්වා
සුභද්‍රාරාම විහාරස්ථානය
ගම්සභා හන්දිය, නුගේගොඩ.

ii) මල්ලිකා නිවාසය, විසාකා පාර, බම්බලපිටිය
බදාදා 9.30 සිට 12.00 දක්වා
විමසීම්: සෙනෙවිරත්න මිය 0777715815

**2) මාතර**
සෑම මසකම සතියේ පළමු සහ තුන්වැනි සතියේ ඉරිදා දිනයන්හි
පෙ.ව. 9.00 සිට ප.ව. 1.00 දක්වා
'ජය නිවස' - මාතර බෝධි ආරක්ෂක සභාවේ භාවනා මධ්‍යස්ථානය
කුමාරතුංග මාවත (නූපෙ හන්දියෙන් හැරෙන්න), මාතර.
විමසීම්:
දේශබන්ධු කේ. ජී. මුනිදාස මහතා - දුරකථන අංක: 071 4438747

**3) නුවර**
සෑම මසකම සතියේ දෙවැනි ඉරිදා දින පෙ.ව. 9.30 සිට ප.ව. 1.30 දක්වා
පල්ලේකැලේ ඔරලෝසු කණුව අසලින් හැරෙන පාර දිගේ ඇවිත්,
බන්ධනාගාර පාරට පසුව හමුවන දකුණට ඇති පාරේ කන්ද උඩට යන විට ඇති ප්‍රජාශාලාවේ.
විමසීම්:
රත්නතිලක මහතා - දුරකථන අංක: 077 1933519

4) **උතුවන්කන්ද**
සෑම මසකම සතියේ අවසන් ඉරිදා දින පෙ.ව. 9.00 සිට ප.ව. 5.00 දක්වා
විමසීම්:
මෛත්‍රී මහතා - දුරකථන අංක: 0718317583

**5) අන්තර්ජාලයේ සිංහල ධර්ම සාකච්ඡාව**
සෑම මසකම තුන්වැනි සතියේ ඉරිදා සවස 3.30 සිට 5.30 දක්වා.
http://www.savanatasisilasa.org

6) The Buddhist TV - Dhammahadaya (English Discussion)
Monday 9.00 pm

## කතෘගේ වෙනත් පොත්

- බුදු දහම දැක ගනිමු - 1 පටිච්ච සමුප්පාද සාකච්ඡා
- බුදු දහම දැක ගනිමු - 2 මධ්‍යම ප්‍රතිපදාව
- බුදු දහම දැක ගනිමු - 3 අනිච්චසඤ්ඤා සූත්‍රය
- බුදු දහම දැක ගනිමු - 4 තජ්ජෝ සමන්නාහාරෝ
  (මහා හත්ථිපදෝපම සූත්‍ර දේශනාව)

මෙම පොත් වල අන්තර්ජාල සංස්කරණය (pdf) සහ සාකච්ඡා (mp3) ශ්‍රවණය/බාගත කිරීම සඳහා පහත සඳහන් වෙබ් අඩවියට පිවිසෙන්න.

To download mp3, right click and select save as
http://ravi.harimaga.com

- ඔබගේ පුණ්‍යානුමෝදනාවක් සහිතව පොත් නැවත මුද්‍රණය සඳහා කතෘ අමතන්න.